328 වන කාණ්ඩය - 06 වන කලාපය
தொகுதி 328 - இல. 06
Volume 328 - No. 06

2026 ජූලි 22 වන බදාදා
2026 யூலை 22, புதன்கிழமை
Wednesday, 22nd July, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය [තීරුව 901]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 905-1100]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ශකිලා බානු අසරක් මහත්මියට එරෙහි චෝදනා [තීරුව 1100]
සංචාරක කර්මාන්තයේ කාර්ය සාධනය සහ සංවර්ධනය [තීරුව 1105]

**ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1108]

**ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1109]

**කල් තැබීමේ ප්‍රශ්න** [තීරු 1109-1117]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 1117-1118]

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை [ப: 901]

**வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 905-1100]**

**தனி அறிவித்தல் மூல வினா:**
திருமதி சகிலா பானு அசரக் மீதான குற்றச்சாட்டு [ப: 1100]
சுற்றுலாக் கைத்தொழிலின் அபிவிருத்தியும் செயலாற்றுகையும் [ப: 1105]

**இலங்கை ஊடக உயர்தொழிலர்களின் பட்டயம்பெற்ற நிறுவகம் சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1108]

**பெண்களையும், இளம் ஆட்களையும் மற்றும் பிள்ளைகளையும் தொழிலுக்கமர்த்துதல் (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1109]

**ஒத்திவைப்பு வினாக்கள் [ப: 1109-1117]**

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 1117-1118]**

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 901]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 905-1100]

QUESTION BY PRIVATE NOTICE:
Allegations against Mrs. Shakila Banu Asarak [Col. 1100]
Performance and Development of Tourism Industry [Col. 1105]

CHARTERED INSTITUTE OF MEDIA PROFESSIONALS OF SRI LANKA BILL:
Read the First time [Col. 1108]

EMPLOYMENT OF WOMEN, YOUNG PERSONS AND CHILDREN (AMENDMENT) BILL:
Read the First time [Col. 1109]

ADJOURNMENT QUESTIONS [Cols. 1109-1117]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1117-1118]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ජූලි 22 වන බදාදා***
*2026 யூலை 22, புதன்கிழமை*
*Wednesday, 22nd July, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2026 ජූලි 21 දින "ජාතික පාරිසරික (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 ජූලි 22 බදාදා, එනම් අද දින, මධ්‍යාහ්න 12.00ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the Board of Investment of Sri Lanka for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Annual Report of the Ocean University of Sri Lanka for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Annual Performance Report of the Office of the Parliamentary Commissioner for Administration (Ombudsman) for the year 2025.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024/2025 වර්ෂය සඳහා සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

கௌரவ சபாநாயகர் அவர்களே, 2025ஆம் ஆண்டுக்கான நன்னடத்தை மற்றும் சிறுவர் பராமரிப்புச் சேவைகள் திணைக்களத்தின் செயலாற்றுகை அறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

இவ்வறிக்கை சுகாதாரம், வெகுசன ஊடகம் மற்றும் மகளிர் வலுவூட்டல் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமென நான் பிரேரிக்கின்றேன்.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) අම්බලන්තොට, ගොඩවාය, විහාර පාර, අංක 489/20 යන ලිපිනයෙහි පදිංචි ජී.එම්. රමණී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) අම්බලන්තොට, මාමඩල, 3 කණුව යන ලිපිනයෙහි පදිංචි ජේ.එල්.පී. සිලිනෝනා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) තිස්සමහාරාම, පාදිලිගම, පුස්සදේව මාවත යන ලිපිනයෙහි පදිංචි කේ.ජී.ජී. ෂෙහාන් හංසක මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
ගරු කථානායකතුමනි, නුවරගල, පිහිටිවැව, අංක 290 යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්.අයි.ජ්. දිසානායක මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### යෝජිත සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය: අවලංගු කිරීම
### உத்தேச இலகுரக புகையிரதக் கருத்திட்டம்: இரத்துச் செய்தல்
### PROPOSED LIGHT RAIL PROJECT: TERMINATION

138/2024

**1. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජපන් රජයේ ණය ආධාර මත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය අවලංගු කිරීමට තීරණය කරන ලද දිනය කවරේද;

(ii) එම තීරණය ගැනීම සඳහා බලපාන ලද සාධක කවරේද;

(iii) එම තීරණය හේතුවෙන් ශ්‍රී ලංකා රජයට සිදු වූ අලාභය කොපමණද;

(iv) ඒ සම්බන්ධයෙන් විගණන වාර්තාවේ සඳහන් කර ඇති නිර්දේශ කවරේද;

(v) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யப்பான் அரசின் கடன் உதவித் திட்டத்தின்கீழ் அமுல்படுத்தத் திட்டமிடப்பட்டிருந்த இலகுரக புகையிரதக் கருத்திட்டத்தை இரத்துச் செய்யத் தீர்மானிக்கப்பட்ட திகதி யாது;

(ii) மேற்படி தீர்மானத்தை மேற்கொள்வதில் தாக்கம் செலுத்திய காரணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி தீர்மானம் காரணமாக இலங்கை அரசுக்கு ஏற்பட்ட நட்டம் எவ்வளவு;

(iv) அது தொடர்பாக கணக்காய்வு அறிக்கையில் குறிப்பிடப்பட்டுள்ள விதப்புரைகள் யாவை;

(v) மேற்படிக் கருத்திட்டம் தொடர்பிலான அரசின் நிலைப்பாடு யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House the -

(i) date on which the decision was taken to terminate the light rail project that was to be implemented with a credit facility from the Government of Japan;

(ii) factors that influenced that decision;

(iii) loss incurred by the Government of Sri Lanka as a result of the aforesaid decision;

(iv) recommendations made in the audit report regarding that matter; and

(v) stance of the Government on the aforesaid project?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය අවලංගු කිරීමට තීරණය කළ දිනය ජනාධිපති ලේකම්ගේ 2020 සැප්තැම්බර් 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (ඇමුණුම 01) ලද දිනයයි.

(ii) ප්‍රවාහන අමාත්‍යාංශය විසින් 2020 සැප්තැම්බර් මස 24 දාතමින් යුක්තව ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සන්දේශයේ අංක 2 යටතේ මෙකී අමාත්‍ය මණ්ඩල සන්දේශය ඉදිරිපත් කිරීමට හේතු වූ සාධාරණීකරණය 2.1 සහ 2.2 කරුණු අනුව එම තීරණය ගැනීමට පහත කරුණු බලපා ඇත.

2.1 යටතේ දක්වා ඇති පරිදි විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ 2020 සැප්තැම්බර් මස 18වන දින පැවති සාකච්ඡාවේදී මෙම ව්‍යාපෘතියේ පිරිවැය ප්‍රතිලාභ ඵලදායී නොවන බැවින් අවසන් කිරීම සුදුසු බවට ඔහු විසින් නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

2.2 2020 සැප්තැම්බර් මස 21 දිනැතිව ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති ලිපිය මඟින් මෙම ව්‍යාපෘතිය

a) මිල අධික

b) ඵලදායී නොවන ව්‍යාපෘතියක් බවත්

c) කොළඹ නාගරික ප්‍රවාහන යටිතල පහසුකම් සැපයීම සඳහා සුදුසු ව්‍යාපෘතියක් නොවන බැවින් කියන සාධක මත තමයි මෙය අහෝසි කරන්න තීරණය කරලා තිබෙන්නේ.

(iii) ශ්‍රී ලංකා රජයට සිදු වූ අලාභය ගණනය කර නොමැත.

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු කථානායකතුමනි, නමුත් මේ ගිවිසුම අවලංගු කිරීම නිසා පහත සඳහන් පරිදි වන්දි ගෙවා තිබෙනවා.

| ගෙවීම් සඳහා වන අයදුම්පත් අංකය | මුදල් ඒකකය | ගෙවූ මුදල | ගෙවීම් කළ දිනය |
|---|---|---|---|
| CO1 -FY017 | JPY | 189,771,596.00 | 23 අගෝස්තු 2024 |
| CO1 -FD017 | USD | 1,031,848.84 | 27 අගෝස්තු 2024 |
| CO1-LR017 | LKR | 108,791,299.82 | 24 සැප්තැම්බර් 2024 |

ඊට අමතරව තව අමතර ගෙවීමකට, ඒ කියන්නේ එම සමාගම මේ ගෙවීම් ප්‍රමාද වීම නිසා ඒගොල්ලන්ට තවත් පොලී - interest - ලැබිය යුතුයි කියලා ඉල්ලීමක් කර තිබෙනවා. නමුත් ඒවා තවම ගෙවලා නැහැ. ඒ සම්බන්ධව සාකච්ඡා කිරීමට කමිටුවක් පත් කර තිබෙනවා. හරියාකාරව අලාභය ගණනය කරලා නැහැ. නමුත් අලාභය ගණනය කරනවා නම් මේ විධියට තමයි කරන්න වෙන්නේ කියන එක තමයි මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නයට පිළිතුර වන්නේ.

(iv) විගණකාධිපතිගේ අංක SIF/D/SPR/01/10 හා 2022.12.05 දිනැතිව නිකුත් කර ඇති නිර්දේශ විගණන වාර්තාවේ අංක 07හි සඳහන් කර ඇත.

ගරු කථානායකතුමනි, එහි විස්තර රාශියක් තිබෙනවා. විගණකාධිපතිතුමාගේ නිර්දේශ 9ක් තිබෙනවා. ඒ ඔක්කොම කියවන්න ගියොත් වෙලාව ගත වෙයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එවකට හිටපු කාගේ හරි වංචාවක් සිද්ධ වුණා කියන කාරණය විගණකාධිපති වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවාද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, විගණකාධිපති වාර්තාවේ සඳහන් වෙලා තිබෙන නිර්දේශ කිහිපයක් මම ඉතාම ඉක්මනින් කියවන්නම්. ඔබතුමා අහන විධියේ දේවල් මේකේ ලියලා නැහැ. නමුත්, එම වාර්තාවේ නිර්දේශ 7.1හි සඳහන්ව තිබෙනවා, "මෙම ව්‍යාපෘතිය ඒකපාර්ශ්වීයව අවලංගු කිරීමට ගත් තීරණයේ විචක්ෂණශීලීභාවය තවදුරටත් සමාලෝචනය කර ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමේ හෝ මෙම ව්‍යාපෘතිය සඳහා මේ වනවිටත් වැය කර ඇති නිරාකරණය නොවූ බැඳීම් මෙන්ම පවරාගෙන ඇති දේපළ විකල්ප වැඩ පිළිවෙළක් සඳහා හෝ උපයෝගී කර ගෙන මෙම වියදම්වල පවතින අනාර්ථක ස්වරූපය ආර්ථිකමය තත්ත්වයට පත් කිරීම සඳහා උපරිම ප්‍රයත්න දැරිය යුතුය" කියලා.

එහි 7.2හි සඳහන් වෙනවා, "2021 දෙසැම්බර් වනවිට ලබා ගෙන ඇති රුපියල් මිලියන 5,066ක ණය මුදල නියමිතව තිබූ සහනදායක කොන්දේසි මත ආපසු පියවීමේ සහනය ණය ගිවිසුම ඒකපාර්ශ්වීයව අවසන් කිරීමෙන් පසුව වුවද එලෙසම පවත්වා ගෙන යාමට අවශ්‍ය එකඟතාව ලබා ගැනීම" කියලා. එහෙම නිර්දේශ 9ක් තිබෙනවා.

(v) කලින් ගත්ත තීරණය තමයි තිබෙන්නේ. මෙම ව්‍යාපෘතිය අවලංගු කරන්න ගත්ත තීන්දුව තමයි, රජයක් වශයෙන් පසුගිය කාලයේදී අරගෙන තිබෙන්නේ. ඒ අනුව අප මේ පිළිබඳව සමාලෝචනයක් කරලා, අලුතින් තීරණයක් අරගෙන නැහැ, ගරු කථානායකතුමනි. ඒ කාරණා තමයි දැනුවත් කරන්න තිබෙන්නේ.

(ආ) අදාළ නොවේ.

මේ සම්බන්ධව වැඩි විස්තර සහිත පසුබිම් වාර්තාව සහ ඊට අදාළ ඇමුණුම් මම **සභාගත*** කරනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතියි. ගරු කථානායකතුමනි, අද දවසේ න්‍යාය පත්‍රයේ තිබෙන වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 50 ඇසීමේ කටයුත්ත දැන් ඉඳන්ම පටන් ගන්නවා නේද? ඒ කාරණය සම්බන්ධයෙනුත් ඔබතුමාට ස්තුතියි;

ගරු කථානායකතුමනි, ඇමතිතුමා ලබා දුන් පිළිතුර අනුව විශේෂ කාරණාවක් හැටියට මම කියන්නේ (අ) (iv) සම්බන්ධයෙනුයි. ඔබතුමා පැවසූ ආකාරයට විගණකාධිපතිවරයාගේ ඉල්ලීම වෙලා තිබෙන්නේ මේ සඳහා යොදවා තිබෙන යම් පිරිවැයක් තිබෙනවා නම් ඒ පිරිවැයට සාපේක්ෂව මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනියනවා නම් හොඳයි කියන එකයි. මොකද, ඒ මුදල් ඉතුරු වීම සහ එය ඵලදායී කාරණයක් නිසා රටට වටිනවා කියන අදහස තමයි ඔබතුමා කියපු කාරණා දෙක තුළ මට හැඟෙන්නේ. ඒ කියන්නේ, යම්කිසි ආකාරයකින් රටට ඵලදායී වැඩ පිළිවෙළක් කරන්න කියන එක. නමුත් පසුගිය ආණ්ඩුව ගත් තීරණය මතම ඔබතුමන්ලා ඉන්නවා. හැබැයි, ඒ ගැන සාකච්ඡා කරනවා කියන කාරණය තමයි සඳහන් කළේ.

විගණකාධිපතිවරයාගේ වාර්තාවත්, ඔබතුමා සඳහන් කළ කාරණයත් අනුව, දරපු පිරිවැයත් එක්ක ඒ ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යනවා නම් හොඳයි කියන මතය තමයි තිබෙන්නේ, මට දැනුණු විධියට. මේවා රටට, වර්තමානයට, අනාගතයට අහිමි වෙච්ච ව්‍යාපෘති. සාමාන්‍යයෙන් ගත්තොත්, 76 අවුරුද්දක ශාපයේ එකක්, මේ. ඒ කියන්නේ මේවා රටට අහිමි වීම. විවිධ වූ කාරණා තිබෙන්න පුළුවන්. හොරකම තිබෙන්න පුළුවන්, වංචාව තිබෙන්න පුළුවන්. ඊට අමතරව මේ ව්‍යාපෘති පිළිබඳව බිල්ලෝ මැව්වා. සමහර අවස්ථාවලදී කිව්වේ ගරු ඇමතිතුමනි, ඒකේ ගෙන යන්නේ බඩු විතරයි කියලායි. ලෝකයේ දියුණු වෙච්ච රටවලට ගියාම අපි දැක තිබෙනවා, ඒ වාගේ ව්‍යාපෘතිවලින් විශාල සේවාවක් ඉටු වන බව. ඒවා මඟින් සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නවා. නමුත් ඉතිහාසයේ කිව්වේ, "ඒවා බඩු ගෙන යන්න තිබෙන්නේ. කණුවක නගින්න ඕනෑ, බාන්න බැහැ" වාගේ විවිධ කථා. ඒ වාගේ විවිධ වූ මතවාද හදලා, ඒක සමාජයෙන් ඇත් කළා. මේවා තමයි 76 අවුරුද්දක ශාපය කියන්නේ. ඒ කියන්නේ රටට එන්න තිබ්බ්ච, රටේ අනාගතයට, මතු පරම්පරාවට ලැබෙන්න තිබුණු බොහෝ දේවල් අහිමි වුණා. හැබැයි අද අපි දකිනවා, ඒ වාගේ රටට අහිමි වෙච්ච, විවිධ කලකෝලාහල හරහා එපා වෙච්ච බොහෝ දේවල් ඔබතුමන්ලා දැන් සමාජයට ගෙනෙන බව. දැන් අර විකිණීම, බදු දීම වාගේ-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා-

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

අහන්නේ අතුරු ප්‍රශ්නය තමයි. ගරු කථානායකතුමනි, අහන්නේ ඒක තමයි. අද දවසක් තිබෙනවා නේ. අද දවසම තිබෙනවා; ප්‍රශ්න 50ක් තිබෙනවා. ඔබතුමාට මම එක කාරණයක් කියන්නත් ඕනෑ, ගරු කථානායකතුමනි. හරි අසාධාරණයි, ඔබතුමා. ඔබතුමා අපෙන් point of Order එක අහනවා. ඊයේ දිනයේ වෙච්ච දේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විනාඩි දෙකක්-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

අපි point of Order එක කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අදාළ ප්‍රශ්නය-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

හැබැයි ඒ point of Order එක ඇතුළේ තිබෙන දේ ඔබතුමා දන්නේ නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

අහන්න තමයි හදන්නේ. ඉතින් ඔබතුමා කලබල වෙලා නේ. ඔබතුමා පාර්ලිමේන්තුවේ කථානායකතුමා වෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා දැන් විනාඩි දෙකක් ගත්තා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඇත්තටම අපි ඔබතුමාව දකින්නේ, මේ ආණ්ඩුවේ කථානායක හැටියට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා විනාඩි දෙකක් ගත්තා, ගරු මන්ත්‍රීතුමා. ප්‍රශ්න 50ක් අහන්න තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඉන්නකෝ. අහන්න දෙන්නකෝ ඉතින්. අහන්නේ, වැදගත් විධියට. ඔබතුමා ආණ්ඩුවට ප්‍රශංසා කරලා ආණ්ඩුව දැන් පසුගිය- *[බාධා කිරීමක්]* ඒ කියන්නේ, අවුරුදු 76ක් තිස්සේ විරුද්ධ වුණු, එපා වුණු, සමාජයට වටිනා කියන සමහර දේවල් කරනවා. ඒ නිසා මේකත් මම හිතන විධියට රටට වටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා, පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඔබතුමන්ලා තවම තීන්දු ගන්නේ නැතුව ඉන්නවා. විගණකාධිපතිවරයාත් කියන නිසා මේ පිළිබඳව ඉදිරියට ඉතාම ඉක්මනින් ක්‍රියාත්මක වෙලා, ඔය තිබෙන හොරකම, වංචාවත් අල්ලලා මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න කියන යෝජනාව මම කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව පිළිගන්නවා. විගණකාධිපති වාර්තාවේ මේක පටන් ගන්න කියලා නිශ්චිත නිර්දේශයක් කරලා නැහැ. එතුමන්ලා යෝජනා කරලා තිබෙන්නේ මේ වාගේ දෙයක් පටන් ගන්නකොට කටයුතු කළ යුතු ආකාරයයි. ඒ වාර්තාවේ නිර්දේශ 7.5හි සඳහන්ව තිබෙනවා, "විශේෂයෙන් මෙවැනි රාජ්‍යාන්තික එකඟතා ඒකපාර්ශවීයව අවසන් කිරීමේ තත්ත්වයන් ඇති වුවහොත්, එම කටයුතුවලට අදාළව නීතිපති මතය පූර්වයෙන් ලබා ගත යුතුවීම" කියන කරුණ. ඒ වාගේම අමාත්‍ය මණ්ඩලයේ හෝ විධායකයේ තීරණ ක්‍රියාත්මක කරන නිලධාරින් සම්බන්ධවත් තිබෙනවා. ඒ කියන්නේ ඒවාට අදාළ පූර්ව තොරතුරු ලබා ගන්න කියන එක මිසක් මේක පටන් ගන්න හෝ අවලංගු කිරීම කියන දෙකෙන් එකක්වත් විගණකාධිපති යෝජනා කරන්නේ නැහැ. මේවා අධ්‍යයනය කරන එකත් ගරු කථානායකතුමනි, සාමාන්‍ය නිලධාරින්ට කරන්න බැහැ. ඒ අධ්‍යයන කරන්නත් අපි විශේෂඥයන් පත් කරන්න ඕනෑ. ඒ නිසා මන්ත්‍රීතුමාගේ යෝජනාව අදහසක් ලෙස අපි භාර ගන්නවා. නමුත් ගරු මන්ත්‍රීතුමා, අපේ තිබෙන ප්‍රමුඛතා අනුව, හැකියාවත් අනුව තමයි ඉදිරියට ඒක ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න වෙන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නයත් අහනවා.

ගරු ඇමතිතුමනි, මම සාධාරණ වෙන්නේ නැහැ, ඔබතුමාගේ ඔය අධ්‍යයනය සම්බන්ධ කාරණයට. අගමැතිතුමියට එහා පැත්තෙන් ඉන්නවා, වසන්ත සමරසිංහ ඇමතිතුමා. මේ ව්‍යාපෘතිය පිළිබඳව විපක්ෂයේ ඉඳිද්දී ගොඩක් අධ්‍යයනය කළා. නේද, අපේ වසන්ත ඇමතිතුමා? මට මතකයි, ඔබතුමා ටීවී එකේ විවාදවලට ඇවිල්ලා කියනවා, මේකට නැගලා යන්න ඕනෑ; බැහැලා යන්න ඕනෑ; මේවා හොඳ නැහැ කියලා. එතකොට ඒ වෙලාවේ තිබුණු මතයයි, දැන් තිබෙන මතයයි දෙකක් වාගේ අපට පෙනෙනවා. මොකද, සමාජයට ලොකු බිල්ලෙක් මැව්වා, මේ ව්‍යාපෘතිය

[ගරු චමින්ද විජේසිරි මහතා]

පිළිබඳව. ඒ වාගේම මේකේ තව හොරකමක් පිළිබඳවත් කිව්වා, හිටපු ඇමතිවරයෙක් විශාල වංචාවක්, දූෂණයක්, කොමිස් එකක්, අල්ලසක් ගත්තා කියලා. ඒක මේ විගණන වාර්තාවේ නැහැ. එතකොට ඒ පිළිබඳවත් අපේ සමාජය දැනුවත් වෙන්න ඕනෑ.

මොකද, ගරු ඇමතිතුමනි, බලය ගැනීම වෙනුවෙන් තමුන්නාන්සේලාට තිබුණු එක mandate එකක් තමයි, මේ වාගේ දැවැන්ත මූල්‍ය වංචා තුළ හිටපු අය සම්බන්ධව ඔවුන්ගේ තරාතිරම නොබලා කටයුතු කරනවා කියන කාරණය. අපි හිතුවා, මේ ප්‍රශ්නය තුළත් එදා කියපු ඒ අදාළ හොරකම, වංචාව පිළිබඳව නම නැතුව ඒ ප්‍රමාණය හෝ කියයි කියලා. නමුත්, ඒ නමත් නැහැ, ප්‍රමාණයත් නැහැ. මේවාට කාලයක් ගන්න එකට අපි එකඟ වෙන්නේ නැහැ. මොකද, ඔබතුමන්ලා විපක්ෂයේ ඉඳිද්දී මේ ව්‍යාපෘතිය පිළිබඳව පමණක් නොවෙයි, මීට වඩා දැවැන්ත ව්‍යාපෘති පිළිබඳවත් විශාල අධ්‍යයනයක් කරලා තිබුණේ. එහෙම නම් දැන් පැහැදිලිව කියන්න ඕනෑ, ගරු ඇමතිතුමනි, "අපි විපක්ෂයේ සිටියදී දරපු ස්ථාවරයම තමයි දැන් තිබෙන්නේ. ඒක අපි කරන්නේ නැහැ, ඒක හොඳ නැහැ" කියලා. මට හැඟෙන දේ තමයි, ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ඉතා වටිනා කියන, සමාජයට අභිමි වෙච්ච බොහෝ ව්‍යාපෘති අද ක්‍රියාත්මක කරනවා. ඒක හොඳයි. මේ ව්‍යාපෘතිය සම්බන්ධව ඒ මවපු කාරණය ඇත්තටම බිල්ලෙක් ද, නැත්නම් බොරුවක් ද කියන එක කියන්න. බොරුවක් නම් බොරුවක් කියන්න. එහෙම නැත්නම් තමුන්නාන්සේලා ඉදිරියේදී මේක කරන්නේම නැද්ද කියන කාරණය කියන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙතුමා දේශපාලන වශයෙනුත්, ප්‍රතිපත්තිමය වශයෙනුත් ප්‍රශ්න කළ නිසා මම මේ පිළිතුර ලබා දෙනවා. මට කියන්න තිබෙන පළමු කරුණ මේකයි. මේ ව්‍යාපෘතිය අලාභයි කියලා තිබෙන්නේ එවකට පැවැති පාලනය, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා, අගමැති සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් සිටියදී දාපු කැබිනට් පත්‍රිකා මඟින්. ඒ ආණ්ඩුවෙනුත් කිව්වා නම් මේක පාඩුයි කියලා, මම හිතනවා ඒක ආයෙත් තව කෙනෙක් හොයන්න ඕනෑ නැහැ කියලා. දෙවැනි කරුණ තමයි, අපි පක්ෂයක් වශයෙන් ගත්තාට පස්සේ මේ රටට ප්‍රයෝජනවත් වන වැව් හදන්න කියලා තිබෙනවා, ඇළ මාර්ග හදන්න කියලා තිබෙනවා, පාරවල් හදන්න කියලා තිබෙනවා. ඒවා දියුණු කරන්න ඕනෑ කියන ස්ථාවරයේ අපි පක්ෂයක් වශයෙන් හැම දාම ඉඳලා තිබෙනවා. හැබැයි, පාරවල් තුනක් හදන්න යන මුදල් හොරකම් කරලා එක පාරක් හැදුවාම ඒකට අපි විරුද්ධ වෙනවා.

ගරු කථානායකතුමනි, අප දැන් කරන ඒ සමහර ව්‍යාපෘති කෝටි ගණන් නාස්ති කරලා, සහමුලින් විනාශ කරලා, ජනතාව සහ පරිසරය අනාථ කරලා අතරමඟ නතර කර දමා තිබුණු ඒවායි. උදාහරණයක්, මත්තල ගුවන් තොටුපොළ. ඒකට මොකද කරන්නේ? ඒ වාගේ සමහර ව්‍යාපෘති තිබෙනවා හොරකම් කරලා, නාස්ති කරලා, රට ණය කරලා කරපු ඒවා. රාජපක්ෂලා විතරක් නොවෙයි, ඔය ඔක්කෝමලා. එසේ අතරමඟ නතර කරපු, දැන් අප කරන ඒ සමහර ව්‍යාපෘති කැමැත්තෙන් කරන දේවල් නොවෙයි. මොකද, ඒවායින් රටට වෙලා තිබෙන පාඩුව අසීමාන්තිකයි. නමුත්, ඒවායේ ඉතිරි කොටස අවසන් කරන්න ඕනෑ. දැන් මේ කරන දේවලින් තහවුරු වෙන්නේ නැහැ ඒවා ඒ විධියටම තමයි කරන්න තිබුණේ කියලා.

ගරු ලාල් කාන්ත ඇමතිතුමාත් දන්නවා උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතිය ගැන. ඒවා, අතිවිශාල ලෙස මුදල් නාස්ති කරන ව්‍යාපෘති. ඒ වාගේ සමහර අධිවේගී මාර්ග ව්‍යාපෘතිත් තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේ අහලා තිබෙන ව්‍යාපෘතියේ හොරකම ගැන කියන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මගේ පිළිතුරයි මා දෙන්නේ. මේ ව්‍යාපෘතියේ හොරකම සම්බන්ධව මම කිව්වේ, ගෙවා තිබුණු වන්දි අනුවයි. මම හිතනවා විගණකාධිපතිවරයා සහ අදාළ අංශවලින් ඒ අවශ්‍ය කටයුතු කරයි කියලා. අවශ්‍ය නම් ඔබතුමාට පුළුවන්, මෙහි හොරකමක් පිළිබඳව තවදුරටත් පැමිණිලි කරන්න. මෙහි හොරකම කරන්න වුණේ නැහැ නේ. හොරකම කරන්න ගියා වෙන්න පුළුවන්. නමුත්, එය කරන්න වුණේ නැහැ ඒ මට්ටමින්. මොකද, ඒක අතරමඟදී අවලංගු කළා. අවලංගු කරලා වෙන දෙයකට යන්න ගියා. අන්තිමට ඒකත් කරන්න වුණේ නැහැ. වැඩිපුර කාලය අරගෙන කාලය නාස්ති කරන්න මට බැහැ. මොකද, අද අපට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 50ක් ගන්න තිබෙනවා.

මට කියන්න තිබෙන්නේ මේකයි. එදා අතරමඟ නතර කරපු ව්‍යාපෘතිවලින් සමහර දේවල් අප කරන්නේ කැමැත්තෙන් නොවෙයි. මොකද, ඒවා මේ මාතෘ භූමියට 76 අවුරුද්ද තුළ කළ අපරාධයි. නමුත් ඒ සමහර ඒවා කරන්න සිදු වෙලා තිබෙනවා. මම උදාහරණයක් කියන්නම්. කළුතර දිස්ත්‍රික්කයේ සමහර පාරවල් තිබෙනවා, හදලා බාගෙට නතර කරලා අවුරුදු 6ක්, 7ක් පමණ වන. දැන් ඒවා ප්‍රවාහන ප්‍රශ්න නොවෙයි; සමාජ ප්‍රශ්න. ගරු කථානායකතුමනි, ඒවායේ සමහර කොන්ත්‍රාත්කාරයෝ මෙතුමන්ලාගේ පක්ෂ නායකයෝ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අල්ලලා හිරේ දාන්නකෝ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි මේ සමහර දේවල් කරන්නේ damage control විධියට, ගරු කථානායකතුමනි. එහෙම නැතුව, ඒ අපරාධවලට කැමැත්තෙන් කර ගහනවා නොවෙයි.

බොහොම ස්තුතියි.

## ශ්‍රී ලංකා දුම්රිය සේවය: ආදායම/ වියදම සහ ලාභය/ අලාභය
### இலங்கை புகையிரத சேவை: வருமானம்/செலவு மற்றும் இலாபம்/நட்டம்
### SRI LANKA RAILWAYS: REVENUE/ EXPENDITURE AND PROFIT/ LOSS

469/2025

**2. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන දුම්රිය මාර්ග සහ ඒවායේ දිග වෙන් වෙන් වශයෙන් කිලෝමීටර්වලින් කොපමණද;

(ii) මෙම දුම්රිය මාර්ගවල වාර්ෂික මුළු නඩත්තු පිරිවැය කොපමණද;

(iii) මුළු කාර්ය මණ්ඩල සංඛ්‍යාව සහ වැටුප් සහ වේතන සඳහා වන මුළු වාර්ෂික වියදම කොපමණද;

(iv) පසුගිය වර්ෂ 5 තුළ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායම, මුළු පිරිවැය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ලැබූ ලාභය හෝ අලාභය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) දුම්රිය මාර්ග පෞද්ගලික අංශය සමඟ බෙදාගෙන තිබේද;

(vi) එසේ නම්, සම්බන්ධ වන පෞද්ගලික ක්‍රියාකරුවන් සහ එවැනි මාර්ග බෙදා ගැනීමෙන් උපයන වාර්ෂික ආදායම කොපමණද;

(vii) දෙපාර්තමේන්තුව සතු මුළු වත්කම් වටිනාකම කොපමණද;

(viii) යෝජිත නවීකරණ සැලසුම් කවරේද;

(ix) කාර්යක්ෂමතාව සහ මුදලට සරිලන වටිනාකමක් සහිත සේවාවක් වැඩිදියුණු කිරීම සඳහා ගැනීමට අදහස් කරන පියවර කවරේද;

(x) පසුගිය වර්ෂ 5 සඳහා දුම්රිය ප්‍රවාහනයෙන් ලැබුණු වාර්ෂික ඉපැයීම් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து,நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது இலங்கையில் பயன்பாட்டிலுள்ள புகையிரதப் பாதைகளையும் அவற்றின் நீளத்தை கிலோமீற்றரிலும் வெவ்வேறாகவும்;

(ii) இந்தப் புகையிரதப் பாதைகளின் பராமரிப் புக்கான வருடாந்த மொத்தச் செலவையும்;

(iii) மொத்த பணியாட்டொகுதியினரின் எண்ணிக்கை யாது என்பதையும் அவர்களுக்கான சம்பளம் மற்றும் ஊதியம் ஆகியவற்றுக்கான வருடாந்த மொத்தச் செலவினம் யாது என்பதையும்;

(iv) கடந்த 05 வருடங்களில் ஒவ்வொரு வருடத் துக்குமான இலங்கை புகையிரதத் திணைக் களத்தின் மொத்த வருமானம், மொத்தச் செலவு மற்றும் அதன் விளைவாக ஈட்டப்பட்ட இலாபம் அல்லது ஏற்பட்ட நட்டம் ஆகியவற்றை வெவ்வேறாகவும்;

(v) புகையிரதப் பாதைகள் தனியார்துறையுடன் பகிரப்படுகிறதா என்பதையும்;

(vi) அவ்வாறெனில், சம்பந்தப்பட்டுள்ள தனியார் செயற்பாட்டாளர்கள் யார் என்பதையும் அத்தகைய புகையிரதப் பாதைகள் பகிரப் படுவதனால் ஈட்டப்பட்ட வருடாந்த வருமானத் தையும்;

(vii) திணைக்களத்தின் மொத்தச் சொத்துகளின் பெறுமதியையும்;

(viii) முன்மொழியப்பட்டுள்ள நவீனமயப்படுத்தும் திட்டங்களையும்;

(ix) வினைத்திறனை மேம்படுத்தி பணத்தின் பெறுமதிக்கு உரிய சேவையை வழங்குவதற்காக மேற்கொள்ள எதிர்பார்க்கப்படும் நடவடிக்கை களையும்;

(x) கடந்த 05 வருடங்களில் புகையிரதப் போக்கு வரத்து மூலமாக ஈட்டப்பட்ட வருடாந்த வருமானத்தை வெவ்வேறாகவும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the railway lines currently operating in Sri Lanka with their lengths in kilometres, separately;

(ii) the annual total maintenance cost of these railway lines;

(iii) the total number of staff, and the total annual expenditure on salaries and emoluments;

(iv) the total revenue, total cost and, resulting profit or loss of the Department of Sri Lanka Railways for each of the last five years, separately;

(v) whether railway tracks are shared with the private sector;

(vi) if so, the private operators involved and the annual revenue earned from such track sharing;

(vii) the total asset value of the Department;

(viii) the proposed modernization plans;

(ix) the measures intended to improve efficiency and value for money service; and

(x) the annual earnings from railway transportation, for each of the last five years, separately?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ගරු මන්ත්‍රීතුමා අහන්නේ, ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන දුම්රිය මාර්ග සහ ඒවායේ දිග වෙන් වෙන් වශයෙන් කිලෝමීටර්වලින්. Sectors වශයෙන් ගත්තොත්, 14ක් තිබෙනවා. තනි මාර්ගවල මුළු දුර ප්‍රමාණය කිලෝමීටර 1436.707යි. මාර්ග තුනක තිබෙනවා double lines. ඒ, double-line මාර්ගවල මුළු දුර ප්‍රමාණයේ එකතුව කිලෝමීටර 282.912යි. ගරු මන්ත්‍රීතුමනි, මරදාන - රාගම විතරක් triple-track මාර්ග තිබෙනවා. එතැන තිබෙන මුළු දුර ප්‍රමාණය කිලෝමීටර 40.938යි. හතරවන track එකක් තිබෙනවා, මරදාන - කොළඹ කොටුව අතර. එහි මුළු දුර ප්‍රමාණය කිලෝමීටර 7.580යි.

සමස්ත දුම්රිය මාර්ගවල මුළු දුර ප්‍රමාණය ගත්තොත්, කිලෝමීටර 1,640.137යි.

වර්තමානය වන විට පවතින දුම්රිය මාර්ගයේ දුර ප්‍රමාණය පිළිබඳ සමස්ත විස්තරය ඇමුණුම 01 ලෙස පහත දක්වා ඇත.

[ගරු බිමල් රත්නායක මහතා]

ඇමුණුම - 01

**තනිමඟ (A)**

| අංකය | මාර්ගයේ නම | සිට - දක්වා | මුළු දුර (Km) වර්ෂය- 2026 |
|---|---|---|---|
| 1. | ප්‍රධාන මාර්ගය | රඹුක්කන - බදුල්ල | 207.956 |
| 2. | උතුරු මාර්ගය | පොල්ගහවෙල - කන්කසන්තුරේ | 339.463 |
| 3. | මිහින්තලේ මාර්ගය | අනුරාධපුර - මිහින්තලේ සන්දිය | 15.000 |
| 4. | තලෙයිමන්නාරම මාර්ගය | මැදවච්චිය - තලෙයිමන්නාරම ජැටිය | 106.057 |
| 5. | ත්‍රිකුණාමලය මාර්ගය | ගල්ඔය - ත්‍රිකුණාමලය | 70.233 |
| 6. | මඩකලපුව මාර්ගය | මහව - මඩකලපුව | 211.107 |
| 7. | මාතලේ මාර්ගය | පේරාදෙණිය - මාතලේ | 33.758 |
| 8. | පුත්තලම මාර්ගය | මීගමුව - පුත්තලම | 96.269 |
| 9. | මුහුදුබඩ මාර්ගය | පයාගල දකුණ- බෙලිඅත්ත | 134.307 |
| 10. | කැළණිවැලි මාර්ගය | මරදාන - අවිස්සාවේල්ල | 59.277 |
| 11. | කොලොන්නාව මාර්ගය | | 2.000 |
| 12. | වරාය මාර්ගය | | 2.000 |
| 13. | ගුවන්තොටුපල මාර්ගය | | 2.000 |
| 14 | අරුවක්කාළු මාර්ගය | පුත්තලම - අරුවක්කාළු | 29.280 |
| | **මුළු දුර ප්‍රමාණය** | | **1436.707** |

**ද්විත්ව මාර්ගය (B)**

| මාර්ගයේ නම | සිට - දක්වා | දුර ප්‍රමානය (Km) |
|---|---|---|
| ප්‍රධාන මාර්ගය | රාගම- රඹුක්කන | 68.891 |
| මුහුදුබඩ මාර්ගය | කොළඹ කොටුව -පයාගල දකුණ | 49.261 |
| පුත්තලම මාර්ගය | රාගම - මීගමුව | 23.304 |
| **මුළු දුර ප්‍රමාණය** | | **141.456** |
| **මුළු දුර ප්‍රමාණය (141.456 X 2)** | | **282.912** |

**තුනවන මාර්ගය (C)**

| මාර්ගයේ නම | සිට - දක්වා | දුර ප්‍රමානය (Km) |
|---|---|---|
| ප්‍රධාන මාර්ගය | මරදාන - රාගම | 13.646 |
| **මුළු දුර ප්‍රමාණය** | | **13.646** |
| **මුළු දුර ප්‍රමාණය (13.646 X 3)** | | **40.938** |

**හතරවන මාර්ගය (D)**

| මාර්ගයේ නම | සිට - දක්වා | දුර ප්‍රමානය (Km) |
|---|---|---|
| මුහුදුබඩ මාර්ගය | මරදාන -කොළඹ කොටුව | 1.895 |
| **මුළු දුර ප්‍රමාණය** | | **1.895** |
| **මුළු දුර ප්‍රමාණය (1.895 X 4)** | | **7.580** |

**දුම්රිය මාර්ගයන්හි මුළු දුර (Km)**

| අංකය | විස්තරය | වර්ෂය – 2026 (Km's) |
|---|---|---|
| 1 | තනිමඟ (A) | 1308.707 |
| 2 | ද්විත්ව මාර්ගය (B) | 282.912 |
| 3 | තුන්වන මාර්ගය (C) | 40.938 |
| 4 | හතරවන මාර්ගය (D) | 7.580 |
| | **මුළු දුර ප්‍රමාණය (A+B+C+D)** | **1640.137** |

(ii) ගරු මන්ත්‍රීතුමනි, 2026 රුපියල් බිලියන 5.6ක් නඩත්තුව සඳහා වෙන් කර තිබෙනවා. ඒකෙන් මේ අවුරුද්දේ ජුනි 30වන දාට රුපියල් බිලියන 2.014ක actual expenditure එකක් තිබෙනවා. මෙහි තොරතුරු කරුණු වශයෙන් ඇමුණුම 02 ලෙස පහත වගුවෙහි දැක්වෙනවා.

ඇමුණුම - 02

| Prog. | Proj. | Sub Proj. | Object | Item | Financing Code | Vote Particualrs | 2025 Actual Exp (Rs) | 2026 Allocation Rs) | Expenditure upto 30.06.2026 (Rs) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 22 | 2105 | 0 | | Concrete Sleeper Production Plant Unit | 43,977,489.42 | 300,000,000.00 | 29,254,948.73 |
| | | 21 | 2105 | | | Rehabilitation of the P'Way with New Rails & Sleepers | 4,450,000,000.00 | 5,000,000,000.00 | 1,961,461,885.70 |
| | | 18 | 2104 | 0 | | Steel Bridges Retention | 68,876,246.80 | 150,000,000.00 | 23,757,557.37 |
| | | 24 | 2105 | 0 | | Kelanivalley Railway Line | 1,172,586.67 | 150,000,000.00 | 376,406.29 |
| | | | 2105 | 1 | | Improvement of Matale railway line | 48,189,581.51 | - | - |
| | | | | | | | 4,612,215,904.40 | 5,600,000,000.00 | 2,014,850,798.09 |

- මෙම මාර්ග අංශයේ නඩත්තු මුළු පිරිවැය සඳහා සේවකයින්ගේ වැටුප් හා වේතන සඳහා වැය වූ මුදල එකතු කළ යුතුය.

(iii) අනුමත සේවක සංඛ්‍යාව - 20,609

2026.03.31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව - 14,908 වර්ෂය වැටුප් හා වේතන සඳහා වැය වූ මුදල (රුපියල්)

| | |
|---|---|
| 2021 | 9,598,762,424.65 |
| 2022 | 11,082,993,345.24 |
| 2023 | 10,851,861,039.44 |
| 2024 | 13,118,658,216.66 |
| 2025 | 15,119,714,874.99 |

(iv) ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ යටතේ අහලා තිබෙන්නේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ලාභය, අලාභය ගැන. මාත් මේ ප්‍රශ්නය අහලා තිබෙනවා, ගරු කථානායකතුමනි. දුම්රිය දෙපාර්තමේන්තුව කියන්නේ, ඔවුන් කවදාවත් ලාභ, අලාභ ගණනය කරලා නැහැ කියලා. ඔවුන් කියන්නේ දුම්රිය තිබීමම ලාභයක් කියලා. මේක ටිකක් විවාදාත්මක කරුණක්. ඇත්තටම මමත් විශ්වාස කරනවා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ආදි තැනකිනුත් යම්කිසි උපදෙසක් දෙනවා නම් හොඳයි කියලා, දුම්රිය වාගේ සේවයක ලාභ අලාභ ගණනය කිරීම සඳහා වන ප්‍රශස්ත ක්‍රමවේදයක් තිබුණා නම් හොඳ බවට.

මම ඉතාම ඉක්මනින් ආදායමයි, වියදමයි ගැන කෙටියෙන් කියන්නම්. ඒක ලාභය ද අලාභයද කියලා කියන්නම බැරි වෙයි. 2021 මුළු වියදම, එනම් Capital Expenditure and Recurrent Expenditure දෙකම ගත්තාම, Rs. 40.41 billion; ආදායම, Rs. 2.6 billion. 2022 මුළු වියදම, Rs. 42.53 billion; ආදායම, Rs. 10.335 billion. 2023 මුළු වියදම, Rs. 39.739 billion; ආදායම, Rs. 16.079 billion. 2024 මුළු වියදම, Rs. 39.508 billion; ආදායම, Rs. 16.468 billion. 2025 මුළු වියදම, Rs. 47.176 billion; income එක, Rs. 17.165 billion.

මීට අදාළ විස්තරය ඇමුණුම 03 වශයෙන් පහත වගුවෙහි දක්වා ඇත.

[ගරු බිමල් රත්නායක මහතා]

ඇමුණුම - 03

- **මෙම දෙපාර්තමේන්තුව ලාභ අපේක්ෂාවෙන් තොරව ජනතාවට සේවය සපයන දෙපාර්තමේන්තුවක් බැවින් ලාභ අලාභ ලෙස වෙන් වෙන් වශයෙන් සඳහන් කල නොහැකිය.**

| වර්ෂය | ආදායම (රු.) | පුනරාවර්තන වියදම (රු.) | ප්‍රාග්ධන වියදම (රු.) | මුළුවියදම (පුනරාවර්තන වියදම + ප්‍රාග්ධන වියදම) (රු.) | වෙනස(ආදායම ඉක්මවූ - පුනරාවර්තන වියදම) (රු.) |
|---|---|---|---|---|---|
| 2021 | 2,678,724,988.46 | 12,979,212,374.69 | 27,436,855,319 | 40,416,067,693.69 | 10,300,487,386.23 |
| 2022 | 10,335,603,440.66 | 23,512,620,096.00 | 19,018,811,151.00 | 42,531,431,247.00 | 13,177,016,655.34 |
| 2023 | 16,079,474,195.75 | 27,842,052,950.59 | 11,897,838,178.04 | 39,739,891,128.63 | 11,762,578,754.84 |
| 2024 | 16,468,344,008.55 | 27,964,455,523.53 | 11,544,153,326.36 | 39,508,608,849.89 | 11,496,111,514.98 |
| 2025 | 17,165,992,777.48 | 28,242,088,410.27 | 18,934,228,543.51 | 47,176,316,953.78 | 11,076,095,632.79 |

(v) නැත.

(vi) පෞද්ගලික අංශය සමඟ බෙදාගෙන නැත.

(vii) දැනට දෙපාර්තමේන්තුව සතුව ඇති සම්පූර්ණ වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 915ක් පමණ වෙනවා. ආසන්න වශයෙන් එය රුපියල් ට්‍රිලියනයක් වෙනවා.

(viii) 2026 වර්ෂය සඳහා මේ වනවිටත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතින අතර, 2027-2029 වර්ෂය සඳහා පහත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ සැලසුම් සකස් කරමින් තිබේ.

1. දුම්රිය විද්‍යුත්කරණය පිළිබඳ ව්‍යාපෘතිය.
2. කැලණි පාලම නවීකරණය.
3. දුම්රිය පාලම් 10ක් ප්‍රතිස්ථාපනය කිරීම. (කොම්පඤ්ඤවීදිය, නාරාහේන්පිට, අලුත්ගම, ඉඳුරුව, ගිංතොට, දොඩන්දූව, වැල්ලවත්ත, පිංවත්ත, හික්කඩුව සහ පානදුර)
4. ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා බලවේග කට්ටල 05ක් ප්‍රසම්පාදනය කිරීම සහ ඩීසල් විදුලි එන්ජින් 05ක් ප්‍රසම්පාදනය කිරීම.
5. කුරුණෑගල - පොල්ගහවෙල ද්විත්ව මාර්ග ව්‍යාපෘතිය.
6. මරදාන සිට රත්නපුර දක්වා කැලණිවැලි දුම්රිය මාර්ගය සංවර්ධනය.
7. නව එන්ජින් 05ක් සහ තදාසන්න ප්‍රවාහන කටයුතු සඳහා සැහැල්ලු දුම්රිය කට්ටල 05ක් මිලදී ගැනීම.
8. දුම්රිය ස්ථාන නවීකරණ හා ප්‍රමිතිකරණ වැඩසටහන - Dream Destination (2027-2029)
9. රත්මලාන Workshops 27 and 28 ප්‍රතිසංස්කරණය කිරීම.

(ix) කොළඹ තදාසන්න දුම්රිය සේවා නවීකරණය කර මහජනයාට හිතකර සුවපහසු, ආරක්ෂිත හා ලාභදායී ප්‍රවාහන සේවාවක් ලබා දීමට කටයුතු කිරීම තුළින් දුම්රිය භාවිත කරන මගී සංඛ්‍යාව ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව දුම්රිය ස්ථාන නවීකරණය කිරීම හරහා ද කාර්යක්ෂමතාව සහ පහසුව ලබා දෙන්න කටයුතු කරනවා.

නව දුම්රිය එන්ජින් ධාවනයට එක් කිරීම, දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය, දුම්රිය ස්ථාන නවීකරණ හා ප්‍රමිතිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඩිජිටල් ක්‍රම හඳුන්වා දීම තමයි බලාපොරොත්තු වෙන්නේ.

(x) මම එහි සමස්ත ඉපැයීම් කියන්නම්. ඒක කාණ්ඩ තුනක් යටතේ තිබෙනවා. මගීන්ගෙන්, භාණ්ඩවලින් සහ වෙනත් විධියට තිබෙන කාණ්ඩවල එකතුව තමයි ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, මම කියන්නේ. 2021 වර්ෂයේදී බිලියන 2.6යි; 2022 වර්ෂයේදී බිලියන 10.335යි; 2023 වර්ෂයේදී බිලියන 16.079යි; 2024 වර්ෂයේදී 16.468යි; 2025 වර්ෂයේදී බිලියන 17.165යි. මේ පිළිබඳ සවිස්තරාත්මක පිළිතුර ඇමුණුම 04 මඟින් දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම 04

| වර්ෂය | මගී (රු.) | භාණ්ඩ (රු.) | වෙනත් (රු.) | මුළු එකතුව (රු.) |
|---|---|---|---|---|
| 2021 | 1,606,842,920.03 | 490,458,840.60 | 581,423,227.83 | **2,678,724,988.46** |
| 2022 | 8,486,241,020.72 | 1,004,155,715.96 | 845,206,703.98 | **10,335,603,440.66** |
| 2023 | 13,239,174,994.94 | 1,993,700,945.89 | 846,598,254.92 | **16,079,474,195.75** |
| 2024 | 13,748,664,705.98 | 1,778,989,046.20 | 940,690,256.37 | **16,468,344,008.55** |
| 2025 | 13,499,030,959.90 | 2,462,436,390.96 | 1,204,525,426.62 | **17,165,992,777.48** |

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මේ ප්‍රශ්නය යොමු කරන්නේ වැඩක් කරන ඇමති කෙනෙක් නිසායි. ඔබතුමා ඉදිරිපත් කරපු දත්ත මම මිනිත්තු තුන හතරක කාලයක් තුළ පරිශීලනය කරලා තමයි මේ ප්‍රශ්නය අහන්නේ. වැඩියෙන්ම වත්කමක් තිබෙන දෙපාර්තමේන්තුව තමයි, දුම්රිය දෙපාර්තමේන්තුව. ඔබතුමා දීපු උත්තරය තුළ එය දවසකට මිලියන 90ක් පාඩු ලබනවා. ඒ කියන්නේ කෝටි 3,800ක් අවුරුද්දකට අලාභයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේම නියෝජ්‍ය ඇමති මීට දවස් 20කට විතර ඉස්සෙල්ලා කිව්වා, SLTB එක දවසකට කෝටියක් පාඩු ලබනවා කියලා. මේක digitalize කරලා ඒක තුළින් ආදායම ගන්නවා වාගේම, ඔබතුමාට තිබෙන asset base එක, ඒ කියන්නේ ලංකාව වටේ තිබෙන ඉඩම් ප්‍රමාණය ගත්තොත්, ඒවායින් ලැබෙන ආදායම සොච්චමක් ලෙස තමයි සලකන්නේ. ඉතින්, ඒක කොහොමද වැඩිදියුණු කරන්නේ public-private partnerships තුළින්? දුවන දුම්රිය තුළින්ම ආදායම හොයාගන්න බැහැ. නමුත් වෙන රටවල් අරගෙන බැලුවොත්, ඒගොල්ලන් කරන දේ තමයි, asset build-up එකක් කරන එක. ඒ තුළ වෙනත් දේවල් ඇති වෙනවා. ඇයි ඒ වාගේ නවීකරණයකට යන්නේ නැත්තේ? මම හිතන හැටියට ඒක තමයි ප්‍රථමයෙන්ම කරන්න අවශ්‍ය වන්නේ.

ගරු ඇමතිතුමනි, මම මේකත් දැනගත්තේ ඔබතුමාගෙන්ම ලැබුණු තොරතුරක් තුළින්. දවසකට රුපියල් කෝටි 2.5ක් හම්බ වෙනවා, සුද්දෝ 10,000ක් සීගිරියට ගිහිල්ලා රුපියල් 25,000 බැගින් ගෙවන එකෙන්. ඒ කියන්නේ රුපියල් බිලියන 10ක් - රුපියල් කෝටි 1,000ක් - අවුරුද්දකට හම්බ වෙනවා, සංචාරකයන් එක තැනකට විතරක් ගිහිල්ලා. දැන් කොළඹ ඉඳන් රඹුක්කනට විතරයි දුම්රිය යන්නේ. නුවර යන්න සුද්දෝ එන්නේ නැහැ. ඇල්ලේ යන්න සුද්දෝ එන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් මීට වැඩිය විධිමත් ක්‍රියාමාර්ගයක් ගන්නවාද, නැද්ද කියන එක ඔබතුමාගෙන් අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පළමුවැනි කරුණ මෙයයි. මුලින්ම නියෝජ්‍ය ඇමතිතුමා ගැන කියපු කාරණය සම්බන්ධයෙන් වචනයක් කියලා ඊළඟ කරුණට යන්නම්. SLTB එක දවසකට රුපියල් කෝටි 2ක් පාඩු ලබන්නේ විශේෂ කරුණක් නිසා නොවෙයි. ඒකේ ඉන්න සමහර සේවක මහත්වරු කරන ටිකට් මුදල් වංචා නිසා. ඒක තමයි නියෝජ්‍ය ඇමතිතුමා කිව්වේ. *[බාධා කිරීමක්]* ඒක වැරදියට වාර්තා කරලා තිබුණා, සමහර තැන්වල. අපි වැටුප් වැඩි කරලා, සේවක අයිතිවාසිකම් සුරක්ෂිත කරලා SLTB එක දියුණු කරන්න කටයුතු කරනවා. දැන් බස් 800කට ආයෙත් ජනතාවගේ බදු මුදල් වෙන් කරනවා.

ඒ ඔක්කෝම තියෙද්දිත් සමහර සේවකයෝ, - *[බාධා කිරීමක්]* සමහර විට **ඒ අය** ඔබතුමන්ලාම පුරවපු කට්ටිය වෙන්න පුළුවන්. කවුරු පිරෙව්වත් එහෙම තමයි වැඩිපුර ඒ නාස්තිය වෙන්නේ. ඊට අමතරව SLTB එකේ මිලදී ගැනීම්වලදී දූෂණවලට සම්බන්ධ නිලධාරින් තවම ඉන්නවා කියලා මම විශ්වාස කරනවා. නමුත් නියෝජ්‍ය ඇමතිතුමා කිව්වේ සමහර කොන්දොස්තරලා, සමහර ඩ්‍රයිවර් මහත්වරු කරන වංචා ගැන. ඒ ගැන තමයි එතුමා කිව්වේ.

ගරු කථානායකතුමනි, මෙතුමා දුම්රිය ගැන අහපු අතුරු ප්‍රශ්නය සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ, - *[බාධා කිරීමක්]* නැහැ, මම පළමුවැනි අතුරු ප්‍රශ්නයට උත්තරය දෙන්නම්. දුම්රිය සම්බන්ධව ගත්තොත්, අපි විශාල වශයෙන් සංවර්ධන වැඩසටහන් කරනවා. එහි ප්‍රධානම දේ විධියට 2029, නැත්නම් 2030 වාගේ වෙනකොට විද්‍යුත් දුම්රිය මාර්ග - කොළඹ ඉඳලා පානදුර, කොළඹ ඉඳලා මාකුඹුර, කොළඹ ඉඳලා රාගම - හදලා අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි ඒ සඳහා විශාල වශයෙන් මැදිහත් වීමක් කරමින් තිබෙනවා.

අපි digitalization පටන් අරගෙන තිබෙනවා. රජයේ සේවකයන්ට ජූලි ඉඳලා සීසන් ටිකට් එක online ගන්න පුළුවන්. මේවා පොඩි දේවල් වුණාට, කරලා තිබුණේ නැහැ. අපි සැප්තැම්බර් වනකොට private sector එකටත් සීසන් ටිකට් එක digitalize කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේ දේවල් අපි කර ගෙන යනවා. තව ගොඩක් දේවල් කරන්න තිබෙනවා, ගරු කථානායකතුමනි.

දුම්රියේ ලාභ පාඩු ගණන් කරන්නත් එක විධියක් තිබෙනවා. මොකද, ප්‍රවාහනය කියලා කියන්නේ අධ්‍යාපනය වාගේ මෙහෙන් සල්ලි දැම්මාම ඒකෙන් ගණන් හදන්න පුළුවන් දෙයක් නොවෙයි.

මම එක කාරණයක් විශේෂයෙන් කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මෑතකදී කරපු ප්‍රවාහන අමාත්‍යාංශ සමාලෝචනයේදී ජනාධිපතිතුමා ප්‍රකාශ කළා ප්‍රවාහනය, අධ්‍යාපනය, සෞඛ්‍ය හා සමාන සේවාවක් විය යුතුයි කියලා. ඒක තමයි අපේ motto එක වෙන්නේ. අපේ මේ ආණ්ඩුව ඉස්සරහට අධ්‍යාපනය, සෞඛ්‍ය කියන ක්ෂේත්‍ර දෙකට සමාන investment එකක් කරලා, ඒ හා සමාන බරකින් ප්‍රවාහනයටත් සලකනවා. ඒ මාර්ගය තුළින් ගිහිල්ලා, අපට අවුරුදු කිහිපයකදී ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුවක් ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. මම මැජික්කරුවෙක් නොවෙයි. මට මාසයෙන් කරන්න පුළුවන් දේවල් මම ගොඩක් කරලා ඉවරයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2017දී දුම්රිය එන්ජින් 79කුත්, prime locomotives 92කුත් තිබුණා. අද දුම්රිය එන්ජින් 72කුත්, prime locomotives 78කුත් තිබෙනවා. මීට අවුරුදු 10කට ඉස්සෙල්ලා දවසකට දුම්රිය 410ක් ගමනාගමනයට යොමු වුණා. අද මේක 310 සිට 250ටත් අඩුවෙන අවස්ථා තිබෙනවා. ඉබේම තමන්ගේ ආදායම අඩු වෙන ස්වරූපය අහන්න දෙයක් නොවෙයි. මේ ආයතනයේ දූෂණ වෙන්න පුළුවන්. ඒකයි මම කිව්වේ digitalize කරන්න කියලා. ඒක එකක්. දෙවැනි එක, අපේ operative tracks lay කරලා තිබෙනවා. පෞද්ගලික අංශයේ මට්ටමට commercialization එක කරන්න පුළුවන්. ඉස්සෙල්ලා දුම්රිය නුවරට, බදුල්ලට ගියා. ඒවාගේ තැන්වලට නැවත දුම්රිය යොමු කරන්න බැරිද කියලා මම අහනවා.

සුනාමිය තමයි මේ රටේ ඇතිවුණු ලොකුම ව්‍යසනය. ඒ අවස්ථාවේ - 2004දී - නැති වුණු දුම්රිය මාර්ග පද්ධතිය දවස් 97කින් යථා තත්ත්වයට පත් කරන්න පුළුවන් වුණා. අද කොළඹ සිට රඹුක්කනට විතරයි දුම්රිය යන්න පුළුවන්. ඒ නිසා සුද්දන්ට දුම්රියෙන් ඉන් එහාට ගමන් කිරීමේ අවස්ථාව අහිමි වෙලා තිබෙනවා. අපට කොයි ආකාරයෙන්ද මේක යථා තත්ත්වයට පත් කරන්න පුළුවන් වන්නේ කියන එක මම අහනවා. මම හිතන විධියට ඔබගේ නවීකරණ වැඩ පිළිවෙළ හොඳ අදහසක්. නමුත් අනිවාර්යයෙන් මේක අවුරුදු දෙකෙන් වෙන්න බැහැ. ඒ වාගේම මේකට යටිතල පහසුකම්වල සහ power and energyවල ප්‍රශ්නයත් යොමු වෙනවා. අටුව කඩා පුටුව හදනවාට වඩා, මේ

[ගරු රවී කරුණානායක මහතා]

තිබෙන පද්ධතියම සංවර්ධනය කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම මේ සම්බන්ධව ඉදිරියට කටයුතු කරන්නේ කොහොමද කියන එකත් මම කාරුණිකව අහන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, දුම්රිය එන්ජිමට කෝච්චි පෙට්ටි අමුණනවා වාගේ ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාත් ප්‍රශ්න අමුණ-අමුණා අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අතුරු ප්‍රශ්නයේ තව ප්‍රශ්න කිහිපයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

දුම්රිය නිසා කමක් නැහැ, අනෙක් ඒවාට එහෙම කරන්න එපා. මම ඉක්මනින් උත්තර දෙන්නම්. අපි බලාපොරොත්තු වනවා, මාතලේ-වත්තේගම කොටස හැර මේ වසර තුළදී බදුල්ල, නුවර කියන මාර්ග දෙකෙහිත්, අනෙකුත් සියලු දුම්රිය මාර්ගත් ප්‍රතිසංස්කරණය කරලා ඒ මාර්ගවල දුම්රිය ධාවනය ආරම්භ කරන්න.

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරපු අනෙක් කරුණු සම්බන්ධව මම දැනටමත් පිළිතුරු දීලා තිබෙන්නේ. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ පවතින ප්‍රධාන ප්‍රශ්නය තමයි, තාක්ෂණික නිලධාරීන්ගේ හිඟය. ඊට අමතරව, දුම්රිය සේවයේ කාර්ය මණ්ඩලවල - සමහර කණ්ඩායම්වල - කාර්යක්ෂමතාව පිළිබඳවත් සැලකිය යුතු ප්‍රශ්නයක් තිබෙනවා. ඒක මම විවෘතව කියලාත් තිබෙනවා. දුම්රිය නිලධාරීන්ටත් මම කියලා තිබෙනවා, කෝච්චිය miss කර ගන්න එපා, මේ රටේ මිනිස්සු මේ ආණ්ඩුව හදලා රට හදන්නයි යන්නේ, කරුණාකරලා මේ කෝච්චියට එකතු වෙන්න කියලා.

උදාහරණයක් හැටියට ගත්තොත්, ඔබතුමා කියපු ඉලක්කම එහෙ මෙහෙ වුණත් එහි ඇත්තක් තිබෙනවා. දිනකට භාවිතාවේ යෙදෙන මඟී දුම්රිය වාර ප්‍රමාණය සාමාන්‍යයෙන් 285ත්, 300ත් අතර වනවා. ඇත්තටම මීට කලින් මඟී දුම්රිය වාර 310ක්, 340ක්, 350ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ධාවනය වී තිබෙනවා. මේ වනකොට හරියාකාරව දුම්රිය එන්ජින් නඩත්තු කරන්නේ නැහැ. අවුරුද්දකට දුම්රිය ප්‍රධාන එන්ජින් 9ක්, 10ක් හදලා දෙන්න වුණාට සමහර අවුරුදුවල දෙන්නේ 2යි, නැත්නම් 4යි. ගරු කථානායකතුමනි, කොටුව දුම්රිය ස්ථානය තුළත් දුම්රිය පීලි පැනීම නිසා දුම්රිය පෙරළෙනවා. ඒ පිළිබඳව මම කනගාටු වනවා. මම පැහැදිලිව දන්නවා, එම කටයුතුවල බරපතළ අකාර්යක්ෂමතාවක් තිබෙනවා කියලා. එහි කළමනාකරණ ගැටලුවක් තිබෙනවා. ඒ ගැටලු නිරාකරණය සඳහා අපි දැන් මහන්සි වෙමින් ඉන්නවා. අපි හිතනවා, දුම්රිය සේවයේ ඉන්න සාධාරණ, රටට ආදරය කරන නිලධාරීන් - සේවක මහත්වරුන් - මේ තත්ත්වය තේරුම් අරගෙන එය වෙනස් කරන්න ඉදිරිපත් වෙයි කියලා. ඔවුන් හරහා මෙම දුම්රිය සේවය ගොඩනඟනවා හැර, පෞද්ගලීකරණය මෙයට උත්තරයක් කියලා මම හිතන්නේ නැහැ.

## මාර්ග අංක 104 වත්තල-බම්බලපිටිය බස් සේවාව: නැවත ආරම්භ කිරීම
### வழித்தட இல. 104 வத்தளை-பம்பலப்பிட்டி பேருந்துச் சேவை: மீள ஆரம்பித்தல்
### ROUTE NO. 104 WATTALA-BAMBALAPITIYA BUS SERVICE: RECOMMENCEMENT

783/2025

**3. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මීට වර්ෂ කිහිපයකට පෙර මාර්ග අංක 104 වත්තල-බම්බලපිටිය බස් රථ සේවාවක් ක්‍රියාත්මක වූ බව දන්නේද;

(ii) මේ වන විට එම බස් රථ සේවාව ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(iii) ජා-ඇළ ඩිපෝවේ බස් රථයක් සහ රත්මලාන ඩිපෝවේ බස් රථයක් යොදවා එම බස් රථ සේවාව නැවත ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சில வருடங்களுக்கு முன்பு, 104 எனும் வீதி இலக்கத்தைக் கொண்ட வத்தளை - பம்பலப்பிட்டி வீதியில் பேருந்துச் சேவையொன்று இயங்கியதை அவர் அறிவாரா என்பதையும்;

(ii) தற்போது மேற்படி பேருந்துச் சேவை இயங்காதிருப்பதை அவர் அறிவாரா என்பதையும்;

(iii) ஜா-எல டிப்போவின் பேருந்தொன்றையும், இரத்மலானை டிப்போவின் பேருந்தொன்றையும் பயன்படுத்தி மேற்படி பேருந்துச் சேவையை மீண்டும் ஆரம்பிக்க நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) whether he is aware that a bus service was operated as Wattala-Bambalapitiya on Route No. 104 a few years ago;

(ii) whether he is aware that the said bus service is not operational at present; and

(iii) whether steps will be taken to restart the said bus service by deploying a bus from the Ja-Ela Depot and a bus from the Ratmalana Depot?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මීන් වසර 25කට පෙර ශ්‍රීලංගම ජා-ඇල ඩිපෝව මඟින් මෙම බස් රථ සේවාව ක්‍රියාත්මක වී ඇත.

(ii) වසර ගණනක සිට ශ්‍රීලංගම පවතින රියැදුරු සහ කොන්දොස්තර පුරප්පාඩු හා ධාවනයට සුදුසු බස් රථ ඇණිය ප්‍රමාණවත් නොවීම යන කරුණු මෙම සේවාව ක්‍රියාත්මක නොවීමට බලපා ඇත.

(iii) ඔව්.

ඉදිරියේදී ශ්‍රීලංගම වෙත ලැබෙන නව බස් රථ ඇණිය මත හා කොළඹ, ගම්පහ ප්‍රාදේශිකයන්හි අවශ්‍යතාව මත ලැබෙන රියැදුරු සහ කොන්දොස්තර නව බඳවා ගැනීම් මත මෙම සේවාව නැවත ආරම්භ කිරීම පිළිබඳව සොයා බලන්න පුළුවන්.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, 154 සහ 104 කියන මාර්ග අංක දෙකේම බස් රථ දෙමටගොඩ සිට බම්බලපිටිය දක්වා ධාවනය වුණා. ගරු ඇමතිතුමනි, දැන් මෙම මාර්ග අංක දෙකෙන් එක මාර්ග අංකයකට අදාළ බස් රථ පමණක් ධාවනය වීම නිසා ජනතාව අපහසුතාවට පත් වී තිබෙනවා. මොකද, මගීන්ගේ ප්‍රමාණය වැඩියි. නමුත් එක මාර්ග අංකයක බස් රථ පමණයි ධාවනය වන්නේ. මාර්ග අංක 155 ගල්කිස්ස-මට්ටක්කුලිය බස් රථ සේවාව ඔබතුමන්ලාගේ ආණ්ඩුව පැමිණි පසු රතිඤ්ඤා පත්තු කරලා, පීත්ත පටි කපා, උත්සවයක් පවත්වා ආරම්භ වුණා. හැබැයි, මේ වන විට එම මාර්ග අංකයේ බස් රථ ධාවනය වන්නේ නැහැ කියලා තොරතුරු අනාවරණ වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, එය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නවාද කියා මා දැනගන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පළමුවෙන්ම කියන්න ඕනෑ, මෙම පිළිතුර තුළ සඳහන් කර තිබෙන්නේ පොදු තත්ත්වය බව. නමුත් අපේ මිනිසුන්ගේ ගමනාගමන ක්‍රමත් වෙනස් වනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මාර්ග අංක 104 වත්තල-බම්බලපිටිය බස් රථ සේවාව නැවත ආරම්භ කරනවාද කියන එක අපට හඳුනාගන්න පුළුවන් වන්නේ, demand survey එකක්, ඒ කියන්නේ මගී අවශ්‍යතාව පිළිබඳ යම් සමීක්ෂණයක් කිරීමෙන් පසුවයි. ශ්‍රීලංගම සේවාවට ඉදිරියේදී ලැබෙන බස් රථ ප්‍රමාණයත් එක්ක අපි බලාපොරොත්තු වනවා, අලුතින් ගමන් වාර ආරම්භ කරන්නට. මාර්ග අංක 154 තුළ දැනට Metro Bus Service එක හරහා බස් රථයක් ධාවනය වනවා. අපි හිතනවා, සැප්තැම්බර් මාසය වාගේ වන විට මාර්ග අංක 154 තුළ එවැනි බස් රථ තවත් වැඩිපුර ධාවනය වෙයි කියා. ඒක තමයි අපට පැහැදිලිව කියන්න තිබෙන්නේ. මිනිස්සුන්ගේ ගමන් රටාවල වෙනස්කමකුත් වෙලා තිබෙනවා. ඒ වාගේම කලින් තිබුණු විධියටම සමහර බස් රථ සේවා දැන් අවශ්‍ය වන්නේ නැහැ, නාගරික ප්‍රදේශවලට. අපි දැන් වැඩි උත්සාහයක් දරනවා, ග්‍රාමීය, දුෂ්කර ප්‍රදේශවලට බස් රථ ලබා දෙන්නට.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා අවස්ථා කිහිපයකදීම කිව්වා, මගී ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු කරන්න ඕනෑය කියලා. නමුත් අපි දකිනවා, bus permits පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන බව. විශේෂයෙන්ම bus permits හරවන්න බැරි ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම අලුතින් bus permits දෙන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද කියන ප්‍රශ්නයත් තිබෙනවා. ඒ හා සමගාමීව සාමාන්‍ය bus permit එක A/C bus permit එක දක්වා upgrade කරන්න අදහසක් තිබෙනවාද කියලාත් මා දැනගන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එතුමා කියපු ප්‍රශ්න දෙකම අපි විසඳලා ඉවරයි. පළමුවැනි කාරණය තමයි, bus route permitsවල අයිතිය මාරු කරන්න අවශ්‍ය නීතිය අපි සංශෝධනය කරලා, දැන් ඕනෑම කෙනෙකුට bus route permit එකක් හරියට මාරු කරන්න නීත්‍යානුකූලව රටේ අවසර දීලා තිබෙනවා. දැන් ඒ කටයුත්ත ආරම්භ කරලා ඉවරයි. දෙවැනි එක තමයි, ගරු මන්ත්‍රීතුමා කියපු bus route permit issue කරන එක. කලින් bus route permit issue කළේ දේශපාලන හිතවත්කම්වලට සහ පගාවට. අපි දැන් ඒක නතර කරලා, කැබිනට් මණ්ඩලය අනුමත කර තිබෙනවා, අලුත් ක්‍රමවේදයක් හරහා bus route permits ලබා දෙන්න. ඒ වැඩ දැන් ආරම්භ කර තිබෙනවා. ඒ ක්‍රමවේදයම, ඒ රාජ්‍ය ප්‍රතිපත්තියම ආරම්භ කරන්න කියලා පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියටත් අපි යෝජනා කර තිබෙනවා,.

ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍ය bus route permit එකක් A/C bus route permit එකක් කර ගන්න ඕනෑ නම් ඒවාට අදාළ කරන demand survey එකක් කරලා ඒගොල්ලන් එය ටෙන්ඩර් කරනවා. මේ දිනවලත්, ඉදිරි මාස තුන හතර තුළදීත් විශාල වශයෙන් ඔය ටෙන්ඩර් ඉදිරිපත් වෙයි. ඒවාට සුදුසු බස් රථ තිබෙන, ඒ සඳහා කැමැති බස් රථ හිමියන්ට ඒකට යන්න පුළුවන්. හැබැයි, අපි automatically එහෙම එම බලපත්‍ර දෙන්නේ නැහැ. ඒ කියන්නේ, දැන් සාමාන්‍ය බස් රථ සේවාව කරන කෙනාටම A/C bus route permit එක දෙන්න විධියක් අපට නැහැ. එහෙම කළොත් යම්කිසි අසාධාරණයක් වනවා. ඒ වාගේම අපි මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා, අලුත් ව්‍යවසායකයින්ට, අලුත් ව්‍යාපාරිකයින්ට මේ බස් කර්මාන්තයට එන්න කියලා. මේ බස් කර්මාන්තය සමහර තැන්වලදී දේශපාලන ඇඟිලි ගැසීම් මත ගොඩ නැඟිච්ච ව්‍යාපාරයක් වෙලා තිබුණා. ඒ වෙනුවට, ව්‍යාපාර, ව්‍යාපාර ලෙස කරන්න කැමැති අලුත් ව්‍යාපාරිකයින්ට අපි ආරාධනා කරනවා, ටෙන්ඩර් දාලා බස් ව්‍යාපාරයට සම්බන්ධ වන්න කියලා.

## වේලනෛතුරෙ-පුන්ගුඩුතිව් පාලම: ප්‍රතිසංස්කරණය

வேலணை-புங்குடுதீவு பாலம்: புனரமைப்பு
VELANAITHURAI-PUNGUDUTIVU BRIDGE: RENOVATION

1192/2025

**4. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ වේලනෛ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වේලනෛතුරෙ සිට පුන්ගුඩුතිව්, මඩත්තුවෙළි දක්වා ඉදිකර ඇති පාලමේ දිග කොපමණද;

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

(ii) එම පාලම අවසන් වරට ප්‍රතිසංස්කරණය කරන ලද වර්ෂය සහ අරමුදල් සපයා ගන්නා ලද ප්‍රභවය කවරේද;

(iii) එය ප්‍රතිසංස්කරණය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම පාලම මතින් ගමන් කිරීම ඉතාම අවදානම් බවත්, අනතුරු සිදුවන බවත් දන්නේද;

(ii) එසේ නම්, එම අනතුරු සිදුවීමට බලපාන හේතු කවරේද;

(iii) එම පාලම සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாண மாவட்டத்தின் வேலணை பிரதேச செயலகப் பிரிவில் வேலணைத்துறையிலிருந்து புங்குடுதீவு, மடத்துவெளி வரையில் நிர்மாணிக்கப்பட்டுள்ள பாலத்தின் நீளம் யாது;

(ii) மேற்படி பாலம் இறுதியாகப் புனரமைக்கப் பட்டுள்ள வருடம் மற்றும் இதற்கான நிதி பெற்றுக்கொள்ளப்பட்டுள்ள மூலம் யாவை;

(iii) மேற்படி பாலத்தைப் புனரமைப்பதற்காகச் செலவிடப்பட்டுள்ள நிதித் தொகை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி பாலத்தின் ஊடாகப் பயணிப்பது மிகவும் ஆபத்தானது என்பதையும் விபத்துகள் இடம்பெறுகின்றன என்பதையும் அறிவாரா;

(ii) ஆமெனில், மேற்படி விபத்துகள் இடம் பெறுவதற்கான காரணங்கள் யாவை;

(iii) மேற்படி பாலம் முழுமையாகப் புனரமைக்கப் படும் திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House the -

(i) length of the bridge constructed from Velanaithurai in the Velanai Divisional Secretary's Division of the Jaffna District to Pungudutivu, Madaththuveli;

(ii) year in which the said bridge was last renovated and the source of funds used for the purpose; and

(iii) total cost of its renovation?

(b) Will he also inform this House -

(i) whether he is aware that travelling on the said bridge is very risky and that accidents occur;

(ii) if so, the reasons for the occurrence of such accidents; and

(iii) the date on which the said bridge will be fully renovated?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙහි සඳහන් කර ඇති ව්‍යුහය පාලමක් නොව මුහුද හරහා ඉදිකළ ගොඩබිම් මාර්ගයක් - causeway එකක් - වන අතර, එහි මුළු දිග කිලෝමීටර 4කි.

(ii) • 2024 වර්ෂයේදී මෙම මාර්ගයේ නඩත්තු සහ මතුපිට ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදී.

• මෙම නඩත්තු කටයුතු සඳහා අරමුදල් සපයනු ලැබුවේ මාර්ග නඩත්තු කටයුතු වෙනුවෙන් වෙන් කරනු ලබන ශ්‍රී ලංකා රජයේ - GoSL - ප්‍රතිපාදන මඟිනි.

(iii) නඩත්තු කටයුතු සඳහා රුපියල් මිලියන 60ක් පමණ වැය කර ඇත.

(ආ) (i) ඔව්.

(ii) මාර්ගයේ පළල පටුවීම, ආරක්ෂිත බාධක නොමැති වීම සහ මාර්ගයේ මතුපිට අසමාන වීම.

(iii) ප්‍රතිපාදන ලැබීම අනුව 2027 වර්ෂයේදී මෙම මාර්ගය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කර ඇත. පවතින වෙළෙඳ පොළ මිල ගණන් අනුව මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ආසන්න වශයෙන් රුපියල් බිලියන 4ක් පමණ වැය වේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் குறிப்பிட்டது போல, வேலணைத்துறையில் இருந்து புங்குடுதீவு வரையான, causeway உடன்கூடிய இந்த 4 கிலோமீற்றர் பாதை ஒரு முக்கியத்துவம் வாய்ந்த பாதை. புங்குடுதீவு மக்கள் உட்பட நெடுந்தீவு, நயினாதீவு முதலான தீவுப் பகுதியின் பெரும்பகுதி மக்களின் போக்குவரத்துக்குரியதும் இந்தப் பாதைதான். இப்பொழுதும் இது ஒரு மிக நெருக்கடியான சூழலில் இருக்கின்றது. இந்தப் பாதைப் புனரமைப்புத் தொடர்பாக நீண்டகால முயற்சிகள் மேற்கொள்ளப்பட்டது. ஒருமுறை high-impact project ஊடாக அராலியில் இருந்து நேரடியாக இந்தப் பாதையை அமைப்பதற்கான திட்டங்கள்கூட வகுக்கப்பட்டது. தற்போது அந்தப் பாலம் ஆபத்தான ஒரு நிலையில் இருக்கின்றது. நீங்கள் குறிப்பிட்டதுபோல 2027இல் அந்த வேலைகள் நிறைவுக்கு வருமா? என்பதே எனது என்னுடைய முதலாவது மேலதிகக் கேள்வி.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි 2027 වර්ෂය තුළදී මෙම කටයුත්ත සම්පූර්ණ කිරීමට අදහස් කරනවා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிகக் கேள்வி:

மிக முக்கியமாக, யாழ்ப்பாணத்திலுள்ள வழுக்கையாறு, அராலி, வேலணை, புங்குடுதீவு, குறிகட்டுவான் வரையான இந்தப் பாதை அமைக்கப்பட வேண்டும் அல்லது திருத்தப்பட வேண்டும் அல்லது புனரமைக்கப்பட வேண்டும் என்று நீண்ட நாட்களாகப் பேசப்பட்டு வருகின்றது. மேற்குறிப்பிட்ட இந்தப் பாதையையே பெரும்பாலான மக்கள் - குறிப்பாக வேலணை, புங்குடுதீவு, நயினாதீவு, நெடுந்தீவு, ஊர்காவற்றுறையின் சில பகுதிகளில் உள்ளவர்கள் மற்றும் அனலைதீவு, எழுவைதீவுப் பகுதிகளில் உள்ள மக்கள்கூட - பயன்படுத்தவேண்டி இருக்கிறார்கள். ஆகவே, இந்தப் பாதையினுடைய முக்கியத்துவம் கருதி, வழுக்கையாறு, அராலி, வேலணை, புங்குடுதீவு, குறிகட்டுவான்துறை வரைக்கும் அதனை முழுமையாகப் புனரமைப்பதற்கு ஏதாவது திட்டம் உங்களுடைய அமைச்சுக்குக் கீழாக முன்னெடுக்கப் பட்டிருக்கிறதா? என்பதைத் தெரியப்படுத்த முடியுமா?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එතුමා අහපු ප්‍රශ්නයට අදාළ මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් මම පිළිතුරු ලබා දුන්නා. ඊට අමතරව, යාපනය ඇතුළු උතුරු පළාතේ AB මාර්ගත්, ග්‍රාමීය මාර්ගත් සංවර්ධනය කිරීම සඳහා අපි විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒවායේත් යම්කිසි ගැටලුවක් තිබෙනවා. මට මතක හැටියට, යාපනය දිස්ත්‍රික්කයේ විතරක් කොන්ත්‍රාත්කාර සමාගම් විසින් ලබා ගත් ව්‍යාපෘති 13ක් ඔවුන් විසින් ඉදි කරන්නේ නැති නිසා ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. ඒක මේ ළඟදී ඇති වෙලා තිබෙන ගැටලුවක් නොවෙයි. එවැනි ප්‍රශ්නත් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. කොන්ත්‍රාත් සමාගම් පුරුදු වෙලා තිබෙනවා, කොන්ත්‍රාත් අරගෙන ඒවා තමන්ට පුළුවන් කාලයේදී සිදු කරන්න. ඒ පීඩාවත් ඔතැන තිබෙනවා. මේ නිසා අපට වෙන් වන මුදල්වලින් ජනතාවට හොඳම ප්‍රතිලාභ ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. එම නිසා මුදල් වෙන් කිරීම නොවෙයි උතුරු පළාතේ ගැටලුව වෙලා තිබෙන්නේ. එලෙස වෙන් කරන මුදල්වලින් අදාළ කොන්ත්‍රාත් සමාගම් කටයුතු සම්පූර්ණ නොකිරීමයි එතැන තිබෙන ගැටලුව. ඔබතුමා සඳහන් කළ මාර්ගය සම්බන්ධයෙන් පවතින ප්‍රශ්නය ඇතුළුව අනිකුත් ප්‍රශ්න පිළිබඳව මගේ උපරිම අවධානය යොමු කර තිබෙනවාය කියන එක ඔබතුමාට මම කියන්න කැමතියි.

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය: වායු විමෝචන පරීක්ෂණ ආයතන සහිත ඩිපෝ
## இலங்கை போக்குவரத்துச் சபை: புகை உமிழ்வு சோதனை நிலையங்களுள்ள டிப்போக்கள்
## SRI LANKA TRANSPORT BOARD: DEPOTS WITH EMISSION TESTING CENTRES

1280/2025

**5. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථවල වායු විමෝචන පරීක්ෂණ සිදු කිරීම සඳහා මණ්ඩලයේ ඩිපෝවල වායු විමෝචන පරීක්ෂණ ආයතන පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එම ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටුවා ඇති ඩිපෝ කවරේද;

(iv) එම වායු විමෝචන පරීක්ෂණ ආයතන පිහිටුවීම සඳහා වැය කර ඇති මුළු මුදල කොපමණද;

(v) මේ වනවිට එම වායු විමෝචන පරීක්ෂණ ආයතනවලින් සේවා සපයන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை போக்குவரத்துச் சபைக்குச் சொந்த மான பேருந்துகளில் புகை உமிழ்வு சோதனையை மேற்கொள்வதற்காக, சபையின் டிப்போக்களில் புகை உமிழ்வு சோதனை நிலையங்கள் அமைக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், அத்தகைய நிலையங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அந்நிலையங்கள் அமைக்கப்பட்டுள்ள டிப்போக்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி புகை உமிழ்வு சோதனை நிலை யங்களை அமைப்பதற்காகச் செலவிடப் பட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதையும்;

(v) இன்றளவில், அத்தகைய புகை உமிழ்வு சோதனை நிலையங்களால் சேவைகள் வழங் கப்படுகின்றனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) whether emission testing centres have been established in the depots of the Sri Lanka Transport Board to conduct emission tests on the Board's buses;

(ii) if so, the number of such centres;

(iii) the depots in which they have been established;

(iv) the total cost incurred in establishing those emission testing centres; and

(v) whether those emission testing centres are currently providing services?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ජංගම වායු විමෝචන බස් රථ 09ක් නවීකරණය කිරීමේ කටයුතු සිදු කර ඇත.

[ගරු බිමල් රත්නායක මහතා]

(iii)
- රත්මලාන ඩිපෝව
- අම්පාර ඩිපෝව
- යාපනය ඩිපෝව
- බදුල්ල ඩිපෝව
- මාතර ඩිපෝව
- යටිනුවර ඩිපෝව
- මැදවච්චිය ඩිපෝව
- කුරුණෑගල ඩිපෝව
- ඇඹිලිපිටිය ඩිපෝව

(iv) 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව යෝජිත ව්‍යාපෘතියෙහි ශ්‍රීලංගම ප්‍රතිපාදන මඟින් රුපියල් මිලියන 9ක් වැය කිරීමට යෝජනා වී තිබුණි. නවීකරණ කටයුතු සඳහා පළමු කාර්තුවේ රුපියල් මිලියන 5ක්ද, දෙවන කාර්තුවේ රුපියල් මිලියන 2ක්ද, තෙවන කාර්තුවේදී රුපියල් මිලියන 2ක්ද ආදී වශයෙන් ශ්‍රීලංගම ප්‍රතිපාදන වෙන් කිරීම සැලසුම් කර තිබුණි.

(v) ජංගම වායු විමෝචන පරීක්ෂණ බස් රථ වශයෙන් සංවර්ධනය කර සේවා සැපයීම මුඛ්‍ය අරමුණ නමුදු දැනට ක්‍රියාත්මක මට්ටමේ නොපවතී. වායු විමෝචන බස් රථවල නවීකරණ කටයුතු සඳහා අදාළ කට්ටල් සවි කරමින් පවතින අතර ඉදිරියේදී සේවා සැපයීම සිදු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත.

ගරු මන්ත්‍රීතුමනි, අමතර වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ලංගම බස් රථවල මේ ජංගම වායු විමෝචන කටයුතු කාලාන්තරයක් තිස්සේ හරියට කරලා නැහැ. එහෙම කරපු ඒවාත් තිබෙන්න පුළුවන්. ඇත්තටම ගත්තොත්, ඒ කටයුතු කරලා නැහැ. මේවා VETTF කියන fund එකෙන් අවුරුදු ගණනකට කලින් ලබා දීපු බස් රථ. මට මතක හැටියට නම් මේ බස් රථ ලබා දීලා මේ වනවිට අවුරුදු 5කටත් වඩා වැඩියි. නමුත්, ඒ බස් රථ පාවිච්චි කරලා නැහැ. ඒ නිසා අපි බලපෑම් කරලා දැන් ඒවා නවීකරණය කරනවා. දැනට බස් රථ 5ක් නවීකරණය කර අවසන් කරලා තිබෙන බව දැනුම් දී තිබෙනවා. ඒ කටයුතු අපි ඉතාම ඉක්මනින් පටන් ගන්න බලාපොරොත්තු වනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ඇමතිතුමාගේ පිළිතුරට අනුව මැදවච්චිය, ඇඹිලිපිටිය වාගේ ස්ථානවල වායු විමෝචන මධ්‍යස්ථාන ඉදිකර තිබෙනවා. විශාල වශයෙන් මුදල් වියදම් කරලා ඉදිකර තිබෙන ඒ වායු විමෝචන මධ්‍යස්ථාන වසර ගණනාවක් තිස්සේ වසා දමා තිබෙන්නේ. ඒවායෙන් ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. ඇමතිතුමා මීට පෙර සඳහන් කළ ඒ ස්ථානවල වායු විමෝචන මධ්‍යස්ථාන තවදුරටත් පවත්වා ගෙන යන්න හෝ එහෙම නැත්නම් ඒවා අලුතින් ආරම්භ කරන්න සූදානමක් තිබෙනවාද, ඒ සඳහා හැකියාවක් තිබෙනවාද, එහෙම නම් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ස්ථාන නවයේම එම වැඩ කටයුතු පටන් ගන්නවා. ඒකෙන් මධ්‍යස්ථාන පහක පරීක්ෂණ කටයුතු කරන්න තිබෙනවා. ජංගම දුම් පරීක්ෂණ කටයුතු කරන්න බස් රථයක්ම තමයි හදලා තිබෙන්නේ. ඒ කටයුතු පටන් ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මම විශ්වාස කරනවා, මේ වසර තුළදී අවම වශයෙන් පහක ඒ වැඩ කටයුතු කරන්න පුළුවන් වෙයි කියලා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, අපේ රටේ ග්‍රාමීය මාර්ගවල මඟී ප්‍රවාහන බස් රථ සේවාව විශාල වශයෙන් දුර්වල වෙලා තිබෙන බව. අනෙක් පැත්තෙන් නාගරීකරණයට එනකොට අපි දකිනවා, මෙට්‍රෝ බස් සේවාව කොළඹ හා තදාසන්න ප්‍රදේශවල ආරම්භ කර තිබෙන බව. ඊළඟට එම බස් සේවාව නුවර ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන්න සූදානම්. බොහෝ දෙනෙක් ඉතා කැමැත්තෙන් සහ ආසාවෙන් දැන් මේ සේවාව ලබා ගන්නා බවක් අපි දකිනවා. මේ බස් රථ සේවාව ව්‍යාප්ත කිරීමට අදාළව තිබෙන සැලැස්ම මොකක්ද කියන එක මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි මේ සැප්තැම්බර් මාසයේදී තමයි බස් 122ක සීමාවට යන්නේ. එය ප්‍රධාන වශයෙන්ම කොළඹ නගරය ඉලක්ක කරගෙන තමයි සිද්ධ වෙන්නේ. ලබන වසර තුළදී තවත් බස් රථ 100කුත්, මෑතකදී ජනාධිපතිතුමා සමඟ කරපු සාකච්ඡාවේදී මේ වසර තුළදීම තවත් බස් රථ 50ක් ආනයනය කරන්නත් අපට බලතල ලබා දුන්නා. ඒ අනුව අපි හිතනවා, 2027 අවුරුද්ද වනකොට මේ බස් රථ ප්‍රමාණය - 122ට තවත් බස් රථ 150ක් එකතු වුණාම - 272ක සීමාවට යයි කියලා.

රාජ්‍ය ප්‍රතිපත්තිය වශයෙන් ජනාධිපතිතුමා දැනුම් දුන්නා, වසර කිහිපයක් යනකොට නාගරික ප්‍රවාහනය සහමුලින්ම මේ මෙට්‍රෝ බස් කියලා අපි හඳුන්වන ඔය low-floor busesවලින් පමණක් සිදු කළ යුතුයි කියලා. ඒක තමයි රජයේ ප්‍රතිපත්තිය. දැනට තිබෙන සැලසුම ගත්තොත්, 2029 අවුරුද්ද වාගේ වනකොට මෙට්‍රෝ බස් 500ක සීමාවට යන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ.

ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, මේ සම්බන්ධව රටේ සම්පූර්ණ අවශ්‍යතාව සොයා බලා පෞද්ගලික අංශයටත්, නගර සභාවලටත්, සමුපකාරවලටත්, pension fundsවලටත් මේ කර්මාන්තයට එන්න කියලා ආරාධනා කරන්න. 2032 අවුරුද්ද, එහෙම නැත්නම් 2035 අවුරුද්ද වාගේ වනවිට ලංකාවේ නාගරික ප්‍රවාහනය සම්පූර්ණයෙන් මේ මෙට්‍රෝ බස්වලින් තමයි සිද්ධ විය යුත්තේ කියා අපි හිතනවා. ඒකෙන් කොටසක් මෙට්‍රෝ බස් සමාගමත්, අනෙක් කොටස පෞද්ගලික අංශයත් කළ යුතුයි කියන ස්ථාවරයේ තමයි අපි ඉන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -1376/2025 - (1), ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

## මාර්ග සහ දුම්රිය රක්ෂිත ඉඩම්වල අනවසර ගොඩනැඟිලි: ඉවත් කිරීම
## வீதிகள் மற்றும் புகையிரத ஒதுக்குக் காணிகளிலுள்ள சட்டவிரோத கட்டடங்கள்: அகற்றுதல்
## UNAUTHORIZED BUILDINGS ON ROAD AND RAILWAY RESERVATIONS: REMOVAL

1825/2026

**7. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු වන මාර්ග සහ දුම්රිය මාර්ගයන්හි රක්ෂිත ඉඩම් අත්පත් කරගෙන අනවසර ගොඩනැඟිලි ඉදිකර ඇති බව දන්නේද;

(ii) එම ගොඩනැඟිලි ඉවත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉහත ආයතන මඟින් නඩත්තු වන මාර්ගයන්හි වැසි ජලය බැස යෑම සඳහා පවතින ඇළ මාර්ග නඩත්තු කිරීම සහ පිරිසිදු කිරීමේ කටයුතු සිදු කරනු ලබන ආයතන කවරේද;

(iv) වැසි ජලය බැස යෑම සඳහා පවතින ඇළ මාර්ග අවහිර වීමෙන් ඇති වන ගංවතුර තත්ත්වය වැළැක්වීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතු ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வீதி அபிவிருத்தி அதிகாரசபை மற்றும் இலங்கை புகையிரதத் திணைக்களம் ஆகியவற்றால் பராமரிப்புச் செய்யப்பட்டு வருகின்ற வீதிகள் மற்றும் புகையிரதப் பாதைகளில் ஒதுக்கப்பட்ட காணிகளை கையகப்படுத்தி சட்டவிரோத கட்டடங்கள் நிர்மாணிக்கப்பட்டுள்ளன என்பதை அறிவாரா;

(ii) மேற்படி கட்டடங்களை அகற்றுவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

(iii) மேற்படி நிறுவனங்களால் பராமரிப்புச் செய்யப் பட்டு வருகின்ற வீதிகளில் மழைநீர் வழிந்தோடு வதற்காகக் காணப்படுகின்ற கால்வாய்களைப் பராமரிப்புச் செய்யும் மற்றும் சுத்தம் செய்யும் நடவடிக்கைகளை மேற்கொள்ளும் நிறுவனங்கள் யாவை;

(iv) மழைநீர் வழிந்தோடுவதற்குள்ள கால்வாய்கள் தடைப்படுவதனால் ஏற்படுகின்ற வெள்ள நிலைமையைத் தடுப்பதற்காக மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

(v) மேற்படி நடவடிக்கைகளை அமுல்படுத்த வேண்டிய நிறுவனங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) whether he is aware that unauthorized buildings have been constructed by encroaching on reservation lands of roads and railways maintained by the Road Development Authority and the Department of Sri Lanka Railways;

(ii) the measures that will be taken to remove the buildings referred to above;

(iii) the institutions responsible for the maintenance and cleaning of the canals that facilitate the drainage of rainwater on the roads maintained by the institutes mentioned above;

(iv) the measures that will be taken to prevent flooding caused by the obstruction of the canals that facilitate the drainage of rainwater; and

(v) the institutions that should implement the measures referred to above?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) මාර්ග සංවර්ධන අධිකාරිය සහ දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු වන මාර්ග සහ දුම්රිය මාර්ගයන්හි රක්ෂිත ඉඩම් අත්පත් කරගෙන ඉදිකර ඇති අනවසර ගොඩනැඟිලි ඉවත් කිරීමට අදාළව එම ආයතන දෙක විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.

(iii)
- ➢ වැසි ජලය බැස යාම සඳහා මාර්ග රක්ෂිත තුළ පවතින කානු හා ඇළ මාර්ග පමණක් නඩත්තු කිරීමේ බලතල මාර්ග සංවර්ධන අධිකාරිය සතු අතර, එම කටයුතු අධිකාරිය විසින් සිදු කරයි. මාර්ග රක්ෂිතවලින් බාහිර ඇළ මාර්ග නඩත්තු කිරීම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත නොපැවරේ.
- ➢ දුම්රිය රක්ෂිතයේ දුම්රිය මාර්ගය දෙපස ජලය බැස යන කානු පද්ධතිය දුම්රිය දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරයි.

(iv) ඇළ මාර්ගවලින් ගලා යන ජලය දුම්රිය මාර්ගය හරහා ගලා බැසීම සඳහා ඇති බෝක්කු ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී අදාළ පළාත් පාලන ආයතන හා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආදී ආයතන විසින් වැසි ජලාපවහන පද්ධති වැඩිදියුණු කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ඉල්ලීම් කරන අවස්ථාවලදී එම ස්ථාන පුළුල් කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කරයි.

[ගරු බිමල් රත්නායක මහතා]

(v) එම ඇළ මාර්ග අයත් ආයතන හෝ අදාළ පළාත් පාලන ආයතන විසින් සිදු කළ යුතුය.

- අදාළ පළාත් පාලන ආයතන (ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා)
- වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ දෙපාර්තමේන්තුව

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! வீதி அபிவிருத்தித் திணைக்களத்துக்கும் இலங்கை புகையிரதத் திணைக் களத்துக்கும் சொந்தமான ஒதுக்குக் காணிகள் இப்போதும் தனியார் நிறுவனங்களாலும் தனியாராலும் வெவ்வேறு தேவை களுக்காகக் கையகப்படுத்தப்பட்டுக்கொண்டு இருப்பதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கிறது. இப்போது இந்த நாட்டில் மிக மோசமான டெங்கு நோய்ப் பிரச்சினை இருப்பதற்குக் காரணம், நீர் வழிந்தோடுகின்ற பிரதேசங்கள் கையகப்படுத்தப்படுவதால், அங்கு நீர் தேங்கும் நிலை உருவாகி, டெங்கு நோயைப் பரப்பக்கூடிய நுளம்புகள் பெருக்கமடைவதும், அந்த வடிகானில் தேங்கிக் கிடக்கின்ற சிரட்டைகள், பேணிகள் போன்றவை டெங்கு நுளம்புகள் பெருக்கமடைவதற்குக் காரணமாகக் காணப்படுவதுமாகும்.

வவுனியா, மன்னார், முல்லைத்தீவு மாவட்டங்களின் DCC கூட்டங்களின்போது, இந்த வடிகான்களில் நுளம்புப் பெருக்கம் சம்பந்தமாகவும், மழை நேரத்தில் வெள்ள அனர்த்தங்கள் ஏற்படுவதற்கு முக்கிய காரணமாக இவற்றை மக்கள் அபகரித்தல் அல்லது அதில் தடைகளை ஏற்படுத்துதல் முதலான பிரச்சினைகளையும் நாங்கள் கதைக்கின்ற நேரத்திலே, நீங்கள் சொன்ன மாதிரி அந்த வீதி அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமான வடிகான்களைத் துப்புரவு செய்வதற்கான பணியாட்டொகுதி -ஆளணி- தங்களிடம் இல்லை என்றும் சம்பந்தப்பட்ட உள்ளூராட்சி நிறுவனங்கள் சொல்கின்றன. ஆனால், வீதி அபிவிருத்தி அதிகாரசபை அவற்றை maintain பண்ணுவது தங்களுடைய பொறுப்பல்ல, அதை உள்ளூராட்சித் திணைக்களம் செய்ய வேண்டும் என்று சொல்கின்றது. இது இப்போது ஏற்பட்ட பிரச்சினையல்ல; நீண்ட காலமாக இந்த விடயத்தில் இவை இரண்டும் மோதிக்கொண்டே இருக்கின்றன.

கௌரவ அமைச்சர் அவர்களே, நாங்கள் உங்களிடம் கேட்பது என்னவென்று சொன்னால், உள்ளூராட்சி அமைச்சரும் நீங்களும் சேர்ந்து ஒரு திட்டத்தை வகுத்து அல்லது உள்ளூராட்சி நிறுவனங்களுக்கு ஆளணியைக் கூட்டுவதற்கு ஒரு recommendationஐக் கொடுத்து, அவற்றைத் துப்புரவு செய்வதற்கு உங்களால் நடவடிக்கை எடுக்க முடியுமா? ஏனென்று சொன்னால், எதிர்வரும் ஒக்ரோபர், நவம்பர் மாதமளவில் பாரிய வெள்ள அனர்த்தம் ஒன்று ஏற்படும் என்று ஓர் எச்சரிக்கை இப்போது பலராலும் விடுக்கப்படுவதால், இந்தப் பிரச்சினைகளையும், இட அபகரிப்பையும் நிறுத்துவதற்கு உள்ளூராட்சி நிறுவனத்துடன் சேர்ந்து ஒரு திட்டத்தை உங்களால் முன்வைக்க முடியுமா? என்பதை என்னுடைய முதலாவது மேலதிகக் கேள்வியாகக் கேட்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එතුමාගේ අදහසට මා එකඟ වෙනවා. නමුත් ඒ මාර්ග රක්ෂිතවල තිබෙන කානු හෝ ඇළ මාර්ග පමණයි මාර්ග සංවර්ධන අධිකාරියෙන් නඩත්තු කරන්නේ. ඒ වාගේම වවුනියාව දිස්ත්‍රික්කය තුළ මාර්ග රක්ෂිතයේ අනවසර ඉදිකිරීම් නැති බව දැනුම් දීලා තිබෙනවා. මන්ත්‍රීතුමාගේ දිස්ත්‍රික්කය නිසා මම විශේෂයෙන් ඒ ගැන ඇහුවා. අනෙක් ඒවා ඇත්තටම කළ යුතු වෙන්නේ, මම කලින් කිව්වා වාගේ අදාළ ආයතන, අදාළ පළාත් පාලන ආයතනවලින්. නමුත් මේ ඩෙංගු ප්‍රශ්නය නිසා අපි ලංගමයටත්, දුම්රිය දෙපාර්තමේන්තුවටත් විශේෂ දින කිහිපයක් දීලා ශ්‍රමදාන කරන්න යොදාගෙන තිබෙනවා. ඒගොල්ලන් සතු අත්හැර දමා තිබෙන, භාවිතයට නොගෙන තිබෙන ඉඩම් පිරිසිදු කිරීමට ශ්‍රමදාන දින දෙකක්ම අපි යෝජනා කළා. ඒ වාගේම අපි තවත් ඒකාබද්ධ ක්‍රියාමාර්ගයකටත් අපේ නිලධාරීන් පත් කරලා තිබෙනවා, ඩෙංගු මර්දනයට. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර වෙන්නේ, පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම තමයි.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ சபாநாயகர் அவர்களே, இது எனது இரண்டாவது மேலதிகக் கேள்வியல்ல, முதலாவது கேள்வியின் ஓர் உப கேள்வியாகவே நான் இதனைக் கேட்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, வவுனியா மாவட்டத்தை எடுத்துக்கொண்டால், வவுனியா மாநகர சபைக்கு உட்பட்ட பிரதேசத்தில் குறிப்பாக, railway drainage -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

අනේ, මේක අපට තිබෙන ලොකුම ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය අහන්න ඕනෑ. ඒ නිසා මට පොඩ්ඩක් ඉඩ දෙන්න.

கௌரவ அமைச்சர் அவர்களே, வவுனியா நகரத்துக்கு உள்ளே railway roadக்குப் பக்கத்தால்தான் மழைநீர் வழிந்தோடுகிற பிரதான கால்வாய் அமைக்கப்பட்டிருக் கின்றது. அது ஈரப்பெரிய குளத்திலே இருந்து தாண்டிக்குளம் வரை இப்போது மக்களால் முழுமையாக அபகரிக்கப்பட்ட நிலையில் காணப்படுகின்றது. அதேமாதிரி, A9 வீதிக்கும் railway roadக்கும் இடையிலே இருக்கிற reservationஉம் பலரால் அபகரிக்கப்பட்டு, அங்கே வீடுகள் அமைக்கப் பட்டிருப்பதைப் பார்க்க முடியும். ஆனபடியால், சம்பந்தப்பட்ட அதிகாரிகள் உங்களுக்கு அனுப்பிய பதிலில் "அந்த இடம் அவ்வாறு அபகரிக்கப்படவில்லை" எனக் குறிப்பிட்டது தவறானது என்பதை உங்களுக்குச் சுட்டிக்காட்டிக்கொண்டு, என்னுடைய இரண்டாவது மேலதிகக் கேள்விக்கு நான் போகிறேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
හොඳයි. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්නම්, ගරු ඇමතිතුමනි.

எங்களுடைய பிரதேசத்துக்கான Metro Bus Service சம்பந்தமாக அந்தக் கேள்வியைக் கேட்கிறேன். வடக்கு மாகாணத்தில் மிகவும் பெருந்தொகையான விசேட தேவைக்கு உட்பட்டவர்கள் இருக்கிறார்கள் என்பது உங்களுக்குத் தெரியும். மன்னார், வவுனியா, முல்லைத்தீவு மாவட்டங்களில் இருக்கின்ற பெரும்பாலான நோயாளிகள், அதிலும் குறிப்பாக சக்கர நாற்காலி - wheelchair - பாவிக்கின்ற ஆட்கள் எல்லோரும் யாழ்ப்பாண வைத்தியசாலைக்குப் போக வேண்டிய ஒரு சூழல் இருப்பதால், இந்தப் பிரதான நகரங்களில் இருந்து, அதாவது மன்னாரில் இருந்து யாழ்ப்பாணம், வவுனியாவில் இருந்து யாழ்ப்பாணம், முல்லைத்தீவில் இருந்து யாழ்ப்பாணம் வரை குறைந்தது ஒரு நாளைக்கு ஒரு Metro Bus Serviceஐ ஆவது உங்களால் ஒழுங்கு செய்ய முடியுமாக இருந்தால், பெரும்பாலான நோயாளர்கள் அதனால் பயன்பெறுவார்கள். எனவே, அதைச் செய்ய முடியுமா? என்று கேட்க விரும்புகின்றேன்.

அத்தோடு, இந்த வீதி அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமான வீதி ஓரங்களில் இருக்கின்ற பழைய மரங்களை - 100 ஆண்டுகளுக்கும் மேற்பட்ட மரங்களை - பண்டைய நினைவுச் சின்னங்களாக அல்லது மரபுரிமைச் சின்னங்களாக அறிவிக்க முடியும் என்று தொல்பொருள் கட்டளைச் சட்டம் சொல்லுகிறது. ஆனால், 100 ஆண்டுகளுக்கும் மேற்பட்ட பாரிய மரங்கள் வீதி அபிவிருத்தி அதிகாரசபையால் வெட்டி அகற்றப்படுகிறது. இங்கே இருக்கின்ற எங்களுடைய கௌரவ அமைச்சர் ஹினிதும சுனில் செனெவி அவர்களும் இதை ஏற்றுக்கொள்வார் என்று நினைக்கிறேன். அந்த வகையில், அவ்வாறு வெட்டப்படுகின்ற மரங்களுக்கு மாற்றீடாகப் புதிய மரங்களையாவது நாட்டுவதற்குரிய ஏற்பாட்டை உங்களால் செய்ய முடியுமா? என்று நான் கேட்க விரும்புகிறேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පිළිතුර වශයෙන් දුන්නේ වවුනියා දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉඩම්වලට අනවසර පදිංචිකරුවන් නැහැ කියන එක. එහෙම නැතිව, දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම්වල අනවසර පදිංචිකරුවන් නැහැ කියලා නොවෙයි. වවුනියාවේ මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම්වල තමයි නැහැ කියලා තිබෙන්නේ.

Metro Bus Service එක ගැන කිව්වොත්, මම කලින් කිව්වා වාගේම අපි ලබන වසර තුළදී උතුරු පළාතේ යාපනය ඇතුළු තවත් නගර කිහිපයකට මේ මෙට්‍රෝ බස් සේවාව හඳුන්වා දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒක තමයි මට පැහැදිලි කරන්න තිබෙන්නේ මූලික වශයෙන්. මාර්ග දෙපස ගස් පැළ කිරීම වාගේ කාරණා ගැන කිව්වොත්, සාමාන්‍යයෙන් RDA එක දිගටම ඒ කටයුත්ත කරනවා. ඉතින් මම හිතනවා, ඒක අපි කාටත් එකතු වෙලා කරන්න පුළුවන්, කළ යුතු දෙයක් කියන එක.

## මෝදර, රජයේ මාතෘ රෝහල: ගොඩනැඟිලි සහ පහසුකම්
## முகத்துவாரம், அரச மகப்பேற்று மருத்துவமனை: கட்டடங்கள் மற்றும் வசதிகள்
## GOVERNMENT MATERNITY HOSPITAL, MODARA: BUILDINGS AND FACILITIES

907/2025

**8. ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මෝදර, රජමල්වත්ත රජයේ මාතෘ රෝහලේ ගොඩනැඟිලි මේ වනවිට අබලන් තත්ත්වයක පවතින බව දන්නේද;

(ii) එම රෝහල් ගොඩනැඟිලි සහ අනෙකුත් පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முகத்துவாரம், ரஜமல்வத்த அரச மகப்பேற்று மருத்துவமனை கட்டடங்கள் தற்போது சேதமடைந்த நிலையில் உள்ளன என்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி மருத்துவமனை கட்டடங்களையும் ஏனைய வசதிகளையும் அபிவிருத்தி செய்வதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he is aware that the buildings of the Government Maternity Hospital, Rajamalwatta, Modara are currently in a dilapidated condition; and

(ii) the measures that will be taken to develop the buildings and the other facilities of the said hospital?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෝදර මාතෘ මධ්‍යස්ථානය ගොඩනැඟිලි තුනකින් සමන්විතය.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

1. නව සායන ගොඩනැඟිල්ල
2. පැරණි වාට්ටු ගොඩනැඟිල්ල
3. පවුල් සෞඛ්‍ය නිලධාරි කාර්යාලය

මෙම පැරණි වාට්ටු පැවති ගොඩනැඟිල්ලේ සිවිලිම අබලන්ව පැවතීම නිසා අනතුරු සිදුවීමේ අවදානම ඉවත් කිරීමට අබලන් වූ සිවිලිම ගලවා ඉවත් කර තිබෙනවා. එසේම නව සායන ගොඩනැඟිල්ල ඉදි කිරීම් කටයුතු සිදුවන අවස්ථාවේ දී පැරණි වාට්ටු පැවති ගොඩනැඟිල්ලේ බිත්තිය ඉරිතලා ගොස් තිබෙනවා. මෙම හානි දෙකම අවදානම් සහගත තත්ත්වයක නොමැති බැවින් දැනට ගොඩනැඟිල්ල භාවිතයට ගනිමින් පවතිනවා.

(ii) එම හානි වූ කොටස් ප්‍රතිසංස්කරණය සඳහා 2027 වර්ෂයේ අයවැය යෝජනාව සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර තිබෙනවා. 2026 වසරේ මේ කටයුතු සිදු වුණේ නැහැ.

(ආ) පැන නොනඟී.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මේ මෝදර, රජමල්වත්ත රජයේ මාතෘ රෝහල තිබෙන්නේ උතුරු කොළඹ ප්‍රදේශයේ. ඒ වාගේම මුළු උතුරු කොළඹ ප්‍රදේශයටම තිබෙන්නේ ඒ මාතෘ රෝහල සහ වාසල පාරේ තිබෙන මාතෘ රෝහල පමණයි. එම රෝහල් දෙකම පාලනය වෙන්නේ කොළඹ මහ නගර සභාවෙන්. අධික ජනගහනයක් සිටින ප්‍රදේශයක් තමයි ඔය උතුරු කොළඹ ප්‍රදේශය. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි, කොළඹ මහ නගර සභාව විසින් මේවා හරියාකාරව නඩත්තු නොකිරීම හා මේ තිබෙන අඩුපාඩු පිළිබඳව. ගැබිනි මව්වරුන්ට සහ එතැනට එන අයට අවශ්‍ය මූලික යටිතල පහසුකම්වත් එතැන නැහැ. අඩුම ගණනේ පුටුවක්වත් නැහැ වාඩි වෙන්න. ඒ තත්ත්වයට දැන් වැටිලා තිබෙන්නේ. ඒ නිසා ඒ සම්බන්ධව ඔබතුමාගේ විශාල මැදිහත්වීමක් බලාපොරොත්තු වෙනවා. කොළඹ මහ නගර සභාව දැන් ඔබතුමන්ලාගේ පාලනයේ තිබෙන නිසාම, කොළඹ මහ නගර සභාවත් එක්ක සම්බන්ධ වෙලා ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් හෝ මැදිහත් වෙලා මේ ප්‍රතිපාදන ඉතා ඉක්මනින් ලබා දීලා මේක ඉක්මනට නවීකරණය කරන්න. මොකද, උතුරු කොළඹ ප්‍රදේශය කියන්නේ, ජනගහනය ඉතාම අධික, අඩු ආදායම්ලාභීන් බහුතරයක් ජීවත් වන ප්‍රදේශයක්. මේ ප්‍රදේශයට මාතෘ නිවාස දෙකයි තිබෙන්නේ. ඒ නිසා මම බලාපොරොත්තු වෙනවා, ඔබතුමා මේ කාරණයට මැදිහත් වෙලා ඉතා ඉක්මනින් ඒ ජනතාවට අවශ්‍ය පහසුකම් ටික ලබාදෙයි කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම ඒ අවශ්‍යතාව ඉතාම පැහැදිලියි. අපට - රජයේ අමාත්‍යාංශයට සහ පළාත් සභාවට - අයත් රෝහල්, මාතෘ හා ළදරු සායන නඩත්තුව සහ ඒවායේ කටයුතු පිළිබඳව වගකීම තිබුණාට, අපේ තිබෙන ක්‍රමවේදය අනුව ඇත්තටම මහ නගර සභාවලට අයිති සායන සහ ගොඩනැඟිලි පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය විශේෂයෙන් මැදිහත්වීමක් සිදු කරන්නේ නැහැ. ඒක තමයි සාමාන්‍ය ක්‍රමවේදය. අපි සාකච්ඡා වට කිහිපයක් පැවැත්වුවා, විශේෂයෙන්ම කොළඹ මහ නගර සභාවත් එක්ක. ගාල්ල සහ මහනුවර තිබෙන්නේ සුළු ප්‍රමාණයක්. මේක අපට පවරා ගැනීමක් නොවුණත්, සෞඛ්‍ය විෂයයට අදාළ කාරණයක් නිසා අපි ඒ ආයතන එක්ක අවබෝධයකින් කටයුතු කළ යුතුයි. ඒකට දැන් වැඩසටහන් දියත් කරමින් පවතිනවා. මොකද, අපි මේ ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමේ වැඩසටහනේදී පළාත් පාලන ආයතනවලට අයිති මේ ආයතනත් එක්ක සම්බන්ධීකරණයෙන් තමයි කටයුතු කරන්නේ. විශේෂයෙන්ම කොළඹ මහ නගර සභා භූමියේ තිබෙන ඒ සමහර සායන මධ්‍යස්ථාන, මේ වාගේ මාතෘ සායන අපි ඒ සම්බන්ධීකරණයෙන් කරගන්න තමයි කටයුතු කරමින් යන්නේ. ඒ නිසා ඔබතුමන්ලාගේත් අවධානය, මැදිහත් වීම අපි ඒකට බලාපොරොත්තු වෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ඔබතුමන්ලා දන්නවා දැන් ඩෙංගු රෝගය සම්බන්ධව තිබෙන තත්ත්වය. ඊයේ රිජ්වේ ආර්යා ළමා රෝහලේ අධ්‍යක්ෂතුමා පැවසුවා, ඩෙංගු රෝගීන්ගේ ප්‍රමාණය ඉහළ ගිහින් ඒ රෝහලට දරන්න පුළුවන් ධාරිතාවට වඩා වැඩිවෙලා තිබෙනවාය කියලා. මේ වනකොට දවසකට ඩෙංගු රෝගීන් 1,000ක් වාගේ ප්‍රමාණයක් හමු වෙනවා. ඔබතුමා පසුගිය සතියේ කිව්වා ඒ සංඛ්‍යාව 500ක් කියලා. නමුත් මේ වනකොට එය 1,000ක ප්‍රමාණයකට ඇවිල්ලා තිබෙනවා.

ඩෙංගු රෝගය මැඩපැවැත්වීම සම්බන්ධව පළාත් පාලන ආයතනවලට විශාල කාර්යභාරයක්, කටයුතු ප්‍රමාණයක් තිබෙනවා. අපට පෙනෙනවා විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කය තුළ හුඟක් පළාත් පාලන ආයතන කුණු කසළ බැහැර කිරීම සම්බන්ධව ඉතාම නිද්‍රාශීලී ප්‍රතිපත්තියක ගමන් කරන බව. නමුත් ගෙවල්වලට ගිහිල්ලා ජනතාවට දඩ ගහනවා. සෞඛ්‍ය නිලධාරින්, පරීක්ෂණ නිලධාරින් ගිහිල්ලා ජනතාවගේ ගෙවල් පරීක්ෂා කරලා "ටක්" ගාලා ජනතාවට දඩය ගහනවා. නමුත් පළාත් පාලන ආයතන එතුමන්ලාගේ වගකීම ඉෂ්ට කරන්නේ නැහැ. එතුමන්ලා කාටවත් වග කියන්නේත් නැහැ. එතුමන්ලා සම්බන්ධව කවුරුවත් ක්‍රියාමාර්ග ගන්නේත් නැහැ. දැන් හැම දේම ජනතාවට පටවලා එතුමන්ලා ඇඟ බේරා ගන්නවා.

ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් අහනවා, විශේෂයෙන්ම එවැනි පළාත් පාලන ආයතන සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගන්නේ නැද්ද කියලා. මොකද, කොළඹ දිස්ත්‍රික්කය තුළ පළාත් පාලන ආයතන කිහිපයක් තිබෙනවා, කුණු කසළ බැහැර කිරීම ඉතාම නරක තත්ත්වයක තිබෙන.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මම හිතනවා අප කාටත් පැහැදිලි අවබෝධයක් ඇති කියලා වර්ෂාපතන රටාවේ වෙනස්වීම සහ නිරිතදිග මෝසම් වර්ෂාවත් එක්ක ඩෙංගු ව්‍යාප්තියේ යම් වර්ධනයක් තිබෙනවාය කියන කාරණය ගැන. ජූනි සහ ජූලි මාසවල රෝගීන් වාර්තා වීම වැඩි වුණා. නමුත් මම මේ වෙලාවේ කියන්න කැමැතියි, ගම්පහ, බදුල්ල සහ පුත්තලම කියන දිස්ත්‍රික්ක තුන හැරුණාම දැන් ජනතාව, සෞඛ්‍ය අංශ, රජයේ ආයතන, පළාත් පාලන ආයතන ගෙන යන ඒකාබද්ධ යන්ත්‍රණය තුළ ඩෙංගු ව්‍යාප්තිය වැඩි වීමේ ප්‍රවණතාව අඩු වෙමින් පවතින

බව. විශේෂයෙන් කොළඹ මහ නගර සභා සීමාව තුළත් ඩෙංගු රෝගීන් වැඩි වීමේ ප්‍රවණතාව අඩු වෙලා තිබෙනවා. මීට සතියකට විතර කලින් කොළඹ දිස්ත්‍රික්කයෙන් තමයි වැඩිම රෝගීන් ප්‍රමාණයක් වාර්තා වුණේ. දැන් ගම්පහ දිස්ත්‍රික්කයේත් යම් ප්‍රමාණයක් වාර්තා වෙනවා. නමුත් ගම්පහ වැඩි වීමේ අවදානම එක සීමාවක පවතිනවා. ඊයේ දවස ඇතුළතදී ස්ථාන 19,043ක් පරීක්ෂා කළාම ඩෙංගු කීටයන් - larvae - බෝ වන ස්ථාන 445ක් හඳුනාගෙන තිබෙනවා. ඒවායේ හිමිකරුවන්ට දඩ ගැසීම් කරනවා; අවවාද කරනවා; ධූමායන කටයුතු කරනවා. ඒ සඳහා ජනතාවගේ සහාය ලැබෙනවා.

රෝගීන් 75,000යි, 76,000යි, 77,000යි කියලා අපි සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්නේ, ඩෙංගු මර්දනයට අඛණ්ඩ ජනතා සහායක් වුවමනා නිසායි. දැන් ඒ trend එක අඩු වෙන්න පටන් ගත්තත් අඩු තරමින් අගෝස්තු මාසයේ මැද වනකල්වත් මෙය සැහැල්ලුවට ගන්න, අවධානය අඩු කරන්න එපා කියන ඉල්ලීමයි අප කරන්නේ.

සෞඛ්‍ය අංශ දැනට පැය 24ම වැඩ කරමින්, ජනතාවගේ සහාය ලබා ගනිමින් ඩෙංගු මර්දන කටයුතු කරගෙන යනවා. ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම පළාත් පාලන ආයතනත් විවිධ දුෂ්කරතා මැද ලොකු සහායක් ලබා දෙනවා, මේ වෙනුවෙන්. සමහර තැන්වල සේවක හිඟයක් තිබෙනවා. සමහර විට කුණු ගෙනිහිල්ලා දමන තැන් පිළිබඳ ප්‍රශ්න තිබෙනවා; වාහන ප්‍රශ්න තිබෙනවා. එවැනි ප්‍රශ්න තිබෙන අතරේත් ඒ අය ලොකු සහායක් ලබා දෙනවා. ඒ සියලුදෙනාගේ සහයෙන් තමයි අපි එම කටයුතු මේ තත්ත්වයට පාලනය කර ගනිමින් පවතින්නේ. රෝගීන් වාර්තා වන ප්‍රමාණය වැඩි වන කොට අපි සමහර රෝහල්වල වෙනම වාට්ටු ඇති කළා. අපි medical wardsවල සිටි රෝගීන් එසේ වෙනත් වාට්ටුවලට යොමු කළා. සමහර තැන්වල වෙනම ඩෙංගු වාට්ටු පවා හදලා තිබෙනවා; ඒවාට අවශ්‍ය කරන කාර්ය මණ්ඩලයත් ලබා දීලා තිබෙනවා. HDUs අලුතින් හදලා තිබෙනවා. අපට වුවමනා වෙලා තිබෙන්නේ ඒ මරණ සංඛ්‍යාව හැකිතාක් සීමා කර ගන්නයි. ඔබතුමාට මතක ඇති, 2017දී රෝගීන් 187,000ක් වාර්තා වෙලා මරණ 447ක් සිදු වුණු බව. ඉන් පසුව අපි අපේ clinical management සැලකිය යුතු මට්ටමකට දියුණු කරගෙන තිබෙනවා. ඒ අනුව, මරණ හැකිතාක් අඩු කර ගන්නයි බලාපොරොත්තු වන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය අහපු නිසාම මේ අවස්ථාව උපයෝගි කරගෙන මම ජනතාවගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ උණ රෝගය වැලඳුනාට පසුව වෙන වෙන ප්‍රතිකාර කරමින් ඉන්නේ නැතිව, එසේ කරමින් කල් ගන්නේ නැතිව කඩිනමින් අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු වෙන්න. එයයි අපේ ඉල්ලීම. මොකද, අප තොරතුරු පරීක්ෂා කර බලන කොට හෙළි වුණා, මිය ගිය රෝගීන්ගෙන් විශාල ප්‍රමාණයක් එක එක අත් බෙහෙත් අරගනිමින් කාලය ගත කර තිබෙන බව. ඒ අය වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු වන කොට ඇත්තටම ටිකක් අසාධ්‍ය තත්ත්වයේයි පසු වෙලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -908/2025- (1), ගරු මුජිබුර් රහුමාන් මහතා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන්නේ 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ කටයුතු සම්බන්ධයෙන්. ඇත්තටම මම උත්සාහ කළා මෙම ප්‍රශ්නයට අද පිළිතුරක් ලබා දෙන්න. නමුත්, එම ආයතනය දිගටම ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවතුණු ආයතනයක් නොවෙයි. එය කාලයක් ජනාධිපති කාර්යාලය යටතේ පැවතුණා. ඊට පසුව, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පැවතුණා. ඒවායෙන් තොරතුරු ලබා ගැනීම සඳහා දැනටමත් දැනුම් දීලා තිබෙනවා. මට ලැබී තිබෙන පිළිතුරේ තිබෙන්නේ අපේ අමාත්‍යාංශයට අයිති කොටස විතරයි. එම නිසා එය අසම්පූර්ණයි. ගරු කථානායකතුමනි, මේ කාරණයට ආයතන කිහිපයක් සම්බන්ධ නිසා සම්පූර්ණ පිළිතුරක් ලබා දීමට මට කාලය අවශ්‍යයි.

ඒ අනුව එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල: වෛද්‍ය නිලධාරි පුරප්පාඩු
## அநுராதபுர மாவட்ட பிரதேச MOH அலுவலகங்கள்: வைத்திய அதிகாரிகளுக்கான வெற்றிடங்கள்
## REGIONAL MOH OFFICES IN ANURADHAPURA DISTRICT: MEDICAL OFFICER VACANCIES

1281/2025

**10. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ වෛද්‍ය නිලධාරි පුරප්පාඩු තිබේද;

(iii) එසේ නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත සඳහන් එක් එක් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල යටතේ පවතින මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසය අනුව පිහිටු විය යුතු මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාන සංඛ්‍යාව හඳුනාගෙන තිබේද;

(vi) එසේ නම්, එම සංඛ්‍යාව එක් එක් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுர மாவட்டத்தில் தாபிக்கப்பட்டுள்ள பிரதேச சுகாதார வைத்திய அதிகாரி அலுவலகங் களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவற்றில் வைத்திய அதிகாரிகளுக்கான வெற்றி டங்கள் காணப்படுகின்றனவா என்பதையும்;

(iii) ஆமெனில், அத்தகைய வெற்றிடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி ஒவ்வொரு பிரதேச சுகாதார வைத்திய அதிகாரி அலுவலகத்தின்கீழ் இயங்கும் தாய்-சேய் கிளினிக்குகளின் எண்ணிக்கை வெவ் வேறாக யாது என்பதையும்;

(v) அநுராதபுர மாவட்டத்திலுள்ள ஒவ்வொரு பிரதேச சுகாதார வைத்திய அதிகாரி பிரிவுக் கமைய தாபிக்கப்பட வேண்டிய தாய்-சேய் கிளினிக்குகளின் எண்ணிக்கை கண்டறியப் பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், அந்த எண்ணிக்கை பிரிவு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the total number of Offices of the Regional Medical Officers of Health established in the Anuradhapura District;

(ii) whether there are any vacancies for medical officers in the said offices;

(iii) if so, the number of vacancies;

(iv) the number of maternity and child clinics functioning under each of the above-mentioned Offices of the Regional Medical Officers of Health, separately;

(v) whether the number of maternity and child clinics that are required to be established in each division of the Regional Medical Officers of Health in the Anuradhapura District has been identified; and

(vi) if so, the said number of clinics, separately in terms of each division?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල සංඛ්‍යාව 23යි.

(ii) ඔව්. ඒවායේ වෛද්‍ය නිලධාරි පුරප්පාඩු පවතිනවා.

(iii) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තනතුරු පුරප්පාඩු 7ක් පවතිනවා.

පුරප්පාඩු පවතින MOH කාර්යාල පහත පරිදි වනවා.

- මිහින්තලේ
- නාච්චාදූව
- රාජාංගනය
- කැබිතිගොල්ලෑව
- පලුගස්වැව
- අනුරාධපුර මහ නගර සභා MOH
- නැගෙනහිර නුවරගම් පළාත MOH

(iv)

| MOH ප්‍රදේශය | මාතෘ හා ළමා සෞඛ්‍ය සායන මධ්‍යස්ථාන සංඛ්‍යාව |
|---|---|
| ගලෙන්බිඳුණුවැව | 9 |
| ගල්නෑව | 13 |
| හොරොව්පතාන | 16 |
| ඉපලෝගම | 11 |
| කහටගස්දිගිලිය | 13 |
| කැබිතිගොල්ලෑව | 11 |
| කැකිරාව | 15 |
| මහවිලච්චිය | 7 |
| මැදවච්චිය | 15 |
| මිහින්තලේ | 10 |
| නාච්චදූව | 7 |
| නොච්චියාගම | 15 |
| නුවරගම් පළාත මධ්‍යම | 12 |
| නුවරගම් පළාත නැගෙනහිර | 11 |
| පදවිය | 6 |
| පලාගල | 14 |
| පලුගස්වැව | 6 |
| රාජාංගනය | 7 |
| රඹෑව | 13 |
| තලාව | 15 |
| තඹුත්තේගම | 10 |
| තිරප්පනේ | 9 |

(v) අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස මට්ටමින් පිහිටුවිය යුතු මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාන හඳුනා ගෙන තිබෙනවා.

(vi) මාතෘ හා ළමා සායන සංඛ්‍යාව මූලික වශයෙන් MOH බල ප්‍රදේශයේ සමස්ත ජනගහනය පදනම් කර ගනිමින් තීරණය කරනු ලබනවා. සාමාන්‍යයෙන් ජනගහනය 10,000කට එක් සායනයක් යන ප්‍රමිතිය මත අවශ්‍ය සායන සංඛ්‍යාව ගණනය කරනු ලබනවා. එම

ගණනයට අනුව අදාළ MOH බල ප්‍රදේශ සඳහා අවශ්‍ය සායන සංඛ්‍යාව ඇමුණුමෙහි දක්වා තිබෙනවා. එම ඇමුණුම මම **සභාගත*** කරනවා.

තවද, ඇතැම් MOH බල ප්‍රදේශවල භූගෝලීය ව්‍යාප්තිය, ජනතාවගේ ප්‍රවේශ පහසුව, දුරස්ථ ප්‍රදේශ ආවරණය කිරීම හා ප්‍රවාහන අපහසුතා සැලකිල්ලට ගනිමින් ප්‍රමිතිය වඩාත් වැඩි සායන සංඛ්‍යාවක් පවත්වාගෙන යනු ලබනවා.

(ආ) පැන නොනඟී.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි. මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, විශාල වශයෙන් මුදල් වියදම් කරලා ඉදි කළ ග්‍රාමීය සායන මධ්‍යස්ථාන ගොඩනැඟිලි ග්‍රාමීය මට්ටමෙන් තිබෙන බව; ඒ වාගේම භෞතික සම්පත් ද යම් ප්‍රමාණයක් තිබෙන බව. නමුත්, ඒවා විශාල සංඛ්‍යාවක් වසා දමලායි තිබෙන්නේ. ඒ සායන මධ්‍යස්ථාන ටික ප්‍රයෝජනයට අරගෙන ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් වර්ධනය කිරීම වෙනුවෙන් යොදා ගත හැකියි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ "ආරෝග්‍යා" ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර මධ්‍යස්ථාන සංකල්පය ඉතාම හොඳ වැඩසටහනක්. ගම් මට්ටමින් ජීවත් වන ජනතාව අතරට පහසුකම් සහිත ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිරි වසර කිහිපය තුළ ගෙන යන්න හදලා තිබෙන සැලැස්ම මොකක්ද කියා මා දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එතුමා අහපු මාතෘ හා ළමා සායන ගම් මට්ටමින් පැවැත්වීම නිසා සහ අපේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ඒවායේ කටයුතු කිරීම නිසා ප්‍රජා සෞඛ්‍ය පැත්තෙන් ඉතා ඉහළ ජයග්‍රහණ අත්පත් කර ගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. උදාහරණයක් හැටියට, ප්‍රතිශක්තිකරණය සියයට 95කට වැඩි අගයක පවත්වාගෙන යන්නේ, උපත් ලක්ෂයකට මාතෘ මරණ 25කට ආසන්න ප්‍රමාණයකට, සජීවී උපත් 1,000කට ළදරු මරණ 5ත්, 7ත් අතර ප්‍රමාණයකට අඩු කරගෙන තිබෙන්නේ ඒ සේවාව නිසායි. අපි මේ සංකල්පයම තමයි "ආරෝග්‍යා" සුවතා මධ්‍යස්ථානවලටත් භාවිත කරන්න බලාපොරොත්තු වන්නේ. ඒ අනුව නිශ්චිත ජනගහනයක් සහිත ප්‍රදේශයකට සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ලබා දෙන්න අපි කටයුතු කරනවා.

ඒ අනුව, මේ වසරේ නොවැම්බර් මාසය අවසන් වනවිට අලුතින්ම "ආරෝග්‍යා" සුවතා මධ්‍යස්ථාන 25ක් ලංකාවට ලැබෙනවා සහ සියලු පහසුකම් සහිතව ඒවා ඉදිකරනවා. ඊට අමතරව, ඔබ සඳහන් කළ දැනට පවතින මාතෘ හා ළමා සායන පවත්වාගෙන යන රජයේ ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීමකට ලක් කරලා, එම ආරෝග්‍යා මධ්‍යස්ථාන ප්‍රමාණය 300 දක්වා වැඩි කරනවා. අපි ඒ කටයුතු ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ ආරම්භ කරලා මේ වනවිට එවැනි මධ්‍යස්ථාන 41ක් රට පුරා ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම, ඒවායේ සේවය කරන අපේ වෛද්‍යවරු සහ Public Health Nursing Officers ඇතුළු කණ්ඩායම කරන කාර්යභාරය සලකා බලමින් අපි ඒවා වැඩිදියුණු කරමින් යනවා. මේක අලුත් සංකල්පයක්. ඒ අනුව, මෙම ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය වෙනුවෙන් වසර 3ක් තුළදී ජනගහනය 10,000කට එක් මධ්‍යස්ථානයක් සාමාන්‍යයෙන් කිලෝමීටර දෙකහමාරක දුරක් ඇතුළත ලබා දීමට අපට හැකියාව ලැබේවි.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ග්‍රාමීය ආරෝග්‍යා වැඩසටහන ක්‍රියාත්මක කරනකොට, ඒ වාගේම primary රෝහල් සංකල්පය ක්‍රියාත්මක වෙනකොට දැනටත් අපි මුහුණ දෙන අර්බුදයක් තිබෙනවා. ඈත දුෂ්කර ප්‍රදේශවල තිබෙන රෝහල්වල pharmacistsලා හිඟයි. ඒ වාගේම කනිෂ්ඨ කාර්ය මණ්ඩලය හිඟයි. මෙන්න මේ පුරප්පාඩු නිසා එම රෝහල් අවට ප්‍රදේශවල ජීවත් වන ජනතාව බරපතළ ලෙස පීඩාවට පත්වෙලා තිබෙනවා. පවතින මේ පුරප්පාඩු පිරවීම සඳහා මේ වෙනකොට අමාත්‍යාංශය ගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය කාර්ය සහායකයන් 1,989ක් බඳවා ගැනීමට කටයුතු කරලා, දැන් 1,200කට පත්වීම් ලබා දී තිබෙනවා. ඒ අයට දින තුනක පුහුණුවක් ලබා දීලා මධ්‍යම රජයේ රෝහල්වලට අනුයුක්ත කරනවා. 2017 cadre එක අනුව එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ වීමට තවත් 800ක් පමණ බඳවාගත යුතුයි. 2026 cadre එක අපි revise කරගෙන යනවා. එතකොට, ඒ ප්‍රමාණය තව වැඩි කර ගන්න පුළුවන්. ඒ වාගේම, attendantsලා හැටියටත් පිරිසක් promote වන නිසා තවත් පුරප්පාඩු ප්‍රමාණයක් ඇති වෙනවා. පළාත් සභා මට්ටමින් සමහර පළාත් සභාවලට අනුමැතිය ලබා දී තිබෙනවා, සෞඛ්‍ය කාර්ය සහායකයන් බඳවා ගැනීමට. මම හිතන විදියට උතුරු පළාතේ මේ සම්බන්ධයෙන් නඩු කටයුත්තකුත් පවතිනවා. අනෙක් පළාත් සභාවලට අනුමැතිය ලබා දුන් පසු බඳවා ගන්න පුළුවන්. මොකද, ඔබතුමා අහන රෝහල් තිබෙන්නේ පළාත් සභා මට්ටමින් නිසා.

ඒ වාගේම ඔබතුමා pharmacistsලා ගැන ඇහුවා. උපාධිධාරින් තමයි අපි ඒ සඳහා බඳවා ගන්නේ. අපි දැනට එක කණ්ඩායමක් බඳවාගෙන තිබෙනවා. අනෙක් අය බඳවා ගැනීම සඳහා ගැසට් කරනවා. විශ්වවිද්‍යාලයෙන් එළියට එන එම උපාධිධාරින්ගේ ප්‍රමාණයට අනුව අපි පුරප්පාඩු ගැසට් කරමින් පවතිනවා. අවශ්‍ය පුහුණුව ලබා දීලා ඒ අය රාජ්‍ය සේවයට අනුයුක්ත කර ගන්නවා. ඊට අමතරව, අපි dispensersලා බඳවා ගැනීමටත් කටයුතු කරමින් සිටිනවා.

## මහමෝදර පැරණි මාතෘ රෝහල: වර්තමාන තත්ත්වය
## மஹமோதர பழைய மகப்பேற்று வைத்தியசாலை: தற்போதைய நிலை
## OLD MATERNITY HOSPITAL, MAHAMODARA: CURRENT STATUS

1658/2025

**11. ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාල්ල, මහමෝදර පැරණි මාතෘ රෝහලේ මුළු භූමි ප්‍රමාණය කොපමණද;

---

** පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු චානක මාදුගොඩ මහතා]

(ii) එම රෝහල් පරිශ්‍රයේ දැනට ඉතිරිව ඇති රජය සතු දේපළ කවරේද;

(iii) එම රෝහල් ගොඩනැඟිල්ල තුළ දැනට සෞඛ්‍ය කාර්යයන් සිදු කරනු ලබන්නේද;

(iv) එම පරිශ්‍රය වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරන්නේද;

(v) එසේ නම්, සැලසුම් කර ඇති කාර්යය කවරේද;

(vi) මහමෝදර පැරණි මාතෘ රෝහලට වඩා කරාපිටිය හෙල්මුට් කෝල් අනුස්මරණ මාතෘ (ශික්ෂණ) රෝහල මඟින් ලබාදෙන සේවාවන් සහ පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி, மஹமோதர பழைய மகப்பேற்று வைத்தியசாலையின் மொத்த நிலப்பரப்பு யாது;

(ii) மேற்படி வைத்தியசாலை வளாகத்தில் தற்போது எஞ்சியுள்ள அரசாங்கத்துக்குச் சொந்தமான ஆதனங்கள் யாவை;

(iii) இன்றளவில் மேற்படி வைத்தியசாலைக் கட்ட டத்தில் சுகாதாரப் பணிகள் முன்னெடுக்கப் படுகின்றனவா;

(iv) மேற்படி வளாகத்தை வேறு நடவடிக்கைக்காகப் பயன்படுத்த எதிர்பார்க்கப்படுகின்றதா;

(v) ஆமெனில், அதற்கென திட்டமிடப்பட்டுள்ள நடவடிக்கை யாது;

(vi) மஹமோதர பழைய மகப்பேற்று வைத்திய சாலையைவிடவும் கராப்பிட்டிய, ஹெல்முட் கோல் ஞாபகார்த்த மகப்பேற்று (போதனா) வைத்தியசாலை மூலமாக வழங்கப்படுகின்ற சேவைகள் மற்றும் வசதிகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House-

(i) the total extent of land of the old Mahamodara Maternity Hospital in Galle;

(ii) the government properties currently remaining on the said hospital premises;

(iii) whether health services are currently being conducted within the said hospital building;

(iv) whether there are plans to utilize the said premises for any other purpose;

(v) if so, such planned activity; and

(vi) the services and facilities provided by the Helmut Kohl Memorial Maternity (Teaching) Hospital' in Karapitiya compared to the old Mahamodara Maternity Hospital?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ගාල්ල, මහමෝදර පැරණි මාතෘ රෝහලේ මුළු භූමි ප්‍රමාණය අක්කර 6.8යි.

බාහිර රෝගී අංශ ගොඩනැඟිල්ල, නිල නිවාස සහ ගාල්ල හෙද විද්‍යාල සහිත ඉඩමෙහි භූමි ප්‍රමාණය අක්කර 4.8යි.

මුළු භූමිප්‍රමාණය අක්කර 11.6යි.

(ii) වාට්ටු හා ඒකක පවත්වාගෙන යන ලද ගොඩනැඟිලි. දැන් ඒවායේ වාට්ටු පවත්වාගෙන යන්නේ නැහැ.

විදුලි ජනක යන්ත්‍ර සහිත ගොඩනැඟිල්ල.

වාට්ටු අංක 4 වහලය මත සූර්ය පැනල සවි කර තිබෙනවා.

ජල මෝටර් සහිත ජලය රැස් කරන ටැංකිය පවතිනවා.

(iii) ඔව්. එම රෝහල ගොඩනැඟිල්ල තුළ පහත පරිදි සෞඛ්‍ය කාර්යයන් සිදු කරනවා.

දෛනික බාහිර රෝගී අංශ සහ දන්ත සායන සේවා පවත්වාගෙන යනවා.

ලිංගාශ්‍රිත රෝග මර්දන ඒකකයේ සායන පවත්වාගෙන යෑමේ කටයුතු සිදු කරනවා.

බාහිර රෝගී අංශ ගොඩනැඟිල්ලේ කොටසක ගාල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය පවත්වාගෙන යනවා.

වාට්ටු අංක 08 ගොඩනැඟිල්ල නවීකරණය කර සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ඒකකයේ සෞඛ්‍ය පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනවා.

වාට්ටු සහිත ඉඩමේ එම වාට්ටු අංක 01, 02, 03, 06, 07 ගොඩනැඟිලි වෛද්‍ය සැපයීමේ අංශයේ ගබඩා ලෙස භාවිත කර තිබෙනවා.

ජර්මන් - ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහල තුළ හෙද නිලධාරිනියන් සඳහා නේවාසික පහසුකම් නොමැති නිසා ඒ සඳහා මහමෝදර රෝහලේ හෙද නේවාසිකාගාර ගොඩනැඟිල්ල භාවිත කරනවා.

(iv) තාවකාලිකව වෙනත් කාර්යයන් වෙනුවෙන් යෙදවීමට යෝජිත අතර 2026.06.11 දින ජනාධිපති කාර්යාලයේ පැවති සාකච්ඡාවේදී මෙම ඉඩම යෙදවීම සම්බන්ධ උපදෙස් ලබා දී ඇත.

(v) මහමෝදර රෝහල් භූමියෙන් කොටසක් තාවකාලික පදනම මත රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබ ඇති අය රඳවා තබා ගැනීම පිණිස බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත ලබා දීම

සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2026.01.21 දින ලබා ගෙන තිබෙනවා. එය ඇමුණුම මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

එහි අක්කර 4යි, පර්චස් 3.91 වපසරියක් සහිත ඉඩම් කොටස මීගමුව බන්ධනාගාරයේ උද්ගත වූ ගැටලුසහගත තත්ත්වය මත වැට ආවරණ කටයුතු සිදු කිරීමට ආරක්ෂක හමුදා අංශ වෙත භාර කර ඇති බවද, අලුත්වැඩියා කටයුතු සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව මේ වනවිට කටයුතු කරමින් සිටිනවා.

ඒ වාගේම 2026.06.11 දින මේ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේ සාකච්ඡාවක් පැවති අතර, එහි දැනට යෝජිත ගාල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත එම ඉඩමෙන් කොටසක් ලබා දීම හා සබැඳිව පහත කරුණු සාකච්ඡා වෙලා තිබෙනවා.

i. ගාල්ල හෙද විද්‍යාලය දැනට පවතින ස්ථානයෙන් ඉවත් කර කරාපිටිය ප්‍රදේශයේ හඳුනාගෙන ඇති භූමි ප්‍රදේශයකට විතැන් කිරීම.

ii. මහමෝදර පැරණි වාට්ටු තිබූ ස්ථානය දැනට යෝජිත පරිදි තැපැල් කාර්යාලය සහ පොලිස් ස්ථානයක් සඳහා යොදා ගැනීමට තාවකාලිකව වෙන් කරදීම.

iii. වෛද්‍ය සැපයුම් ඒකකය සතු ගබඩා අලුතින් ඉදිකිරීම සඳහා සුදුසු භූමියක් හඳුනා ගැනීම.

iv. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි පුහුණු මධ්‍යස්ථානය ලෙස භාවිත කරන ස්ථානය පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග ඉදිරියේදී තීරණය කිරීම.

v. මනෝ වෛද්‍ය බාහිර රෝගී අංශය පැවැති ස්ථානය තවදුරටත් පවත්වාගෙන යන බැවින් එහි අවශ්‍යතාවක් පවතීද යන්න තීරණය කිරීම.

(vi) මහමෝදර රෝහලේ පවත්වාගෙන යන ලද සේවාවලට අමතරව ජර්මන් - ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහලේ පහත සඳහන් සේවා පවත්වාගෙන යනු ලබනවා.

ETU - හදිසි ප්‍රතිකාර ඒකකයක් ස්ථාපිත කිරීම.

Subfertility ඹnit - මඳසරුභාවය සඳහා ප්‍රතිකාර කිරීමේ ඒකකයක් ආරම්භ කර පවත්වාගෙන යෑම.

Surgical Oncology Gin Unit - නාරිවේද පිළිකා සඳහා ප්‍රතිකාර කිරීමේ වාට්ටුවක් ස්ථාපිත කර පවත්වාගෙන යෑම.

(ආ) පැන නොනඟී.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, පිළිතුරු ලබාදීම පිළිබඳව. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මහමෝදර රෝහලේ බාහිර රෝගී අංශය -OPD- දැනට ඉතා සක්‍රියව පවතින තැනක්. ඒක ඉතා සක්‍රියව පවත්වාගෙනත් යනවා. පසුගිය දිනෙක ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී යම් තීන්දුවක් ගත්තා, බාහිර රෝගී අංශය එම ස්ථානයෙන් ඉවත් කරනවා කියලා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, මේ කාරණය කෙරෙහි. ගාල්ලට ආසන්නයේම, ගාල්ල නගරයේම පිහිටි රෝහලක් විධියට තමයි මහමෝදර රෝහලේ බාහිර රෝගී අංශය එම ස්ථානයේ ඉතා හොඳින් තිබෙන්නේ. ගාල්ල නගරයේ ප්‍රධාන පාසල් 10කට වඩා ප්‍රමාණයක් තිබෙනවා. ගාල්ලේ ප්‍රධාන කාර්යාල සියල්ල තිබෙන්නේත් ඒ රෝහල ආශ්‍රිතව. විශේෂයෙන්ම ගත්තොත්, දඩල්ල, මාගාල්ල, ගිංතොට, බූස්ස, වීන කොරටුව ඇතුළු ප්‍රදේශය විශාල ජනගහනයක් ඉන්න ප්‍රදේශයක්. ගරු ඇමතිතුමනි, මේ ප්‍රදේශය රෝහලක අවශ්‍යතාවකුත්, බාහිර රෝගීන් සඳහා බෙහෙත් ලබාගන්න අවශ්‍යතාවකුත් තිබෙන ප්‍රදේශයක් නිසා මේ ස්ථානය පිළිබඳව ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ගත් තීන්දුව ගැන මම අහන්න කැමැතියි. මා විශ්වාස කරනවා, ඒ තීන්දුව එතරම් හොඳ තීන්දුවක් නොවෙයි කියා. මොකද, මේ රෝහලෙන් විශාල සේවාවක් සිද්ධ වෙනවා. ගරු ඇමතිතුමනි, මේක ගාල්ල නගර මධ්‍යයේ තිබෙන රෝහලක් නිසාත්, ගාල්ල නගරය වැනි ඉතාම ජනප්‍රිය ප්‍රදේශයක මෙහි අවශ්‍යතාව දැඩිව තිබෙන නිසාත් අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඔබතුමාගේ අවධානය යොමු කරලා පුළුවන් නම් මේ රෝහලට තවත් පහසුකම් දීලා මේ බාහිර රෝගී අංශය ඒ ස්ථානයෙන් ඉවත් කරන්නේ නැතුව ඒ ස්ථානයේ රඳවාගන්න ඉඩකඩ ලබා දෙන්න පුළුවන්ද කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, සමහර නගරවල රෝහල් ඉදි වෙලා තිබෙන්නේ නගර සංවර්ධන සැලැස්මක් ඇතුව නොවෙයි. ගාල්ලට එහෙම විශේෂ නගර සංවර්ධන සැලැස්මකුත් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා එම ස්ථානයේ ඉඩකඩ මදිකම නිසා අපි කරාපිටියේ අලුත් රෝහල් සංකීර්ණයක් හැදූ බව. මහමෝදර රෝහල ජර්මන් - ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහල හැටියට එතැනට අරගෙන ගියා. සායන සහ බාහිර රෝගී අංශවලට කලින් පැවති රෝහල්වලම ඉඩකඩ පහසුකම් ලබාදීමේ අවශ්‍යතාවක් නැහැ. අපි සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සමාලෝචනය කරලා ජනතාවට ඊට වඩා පහසු තැන් ලබාදෙමින් පවතිනවා. සමහර විට අපට එතැන භූමියේම කොටසක් ඒවාට යොදාගන්න වෙයි, නගර සංවර්ධන සැලැස්මට අනුකූල වන පරිදි. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු දඩල්ල ඇතුළු ප්‍රදේශවල ජනතාවට අපහසුවක් නොවන පරිදි, තිබෙන රජයේ ගොඩනැඟිල්ල භාවිත කර හෝ එහෙම නැත්නම් අලුතින් ඉදි කරලා හෝ ඒ බාහිර රෝගී අංශය සහ සායන පහසුකම් ලබා දෙන්න අපි කටයුතු කරනවා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, පිළිතුර ලබා දීම වෙනුවෙන්. ඔබතුමා මුලින් සඳහන් කළා, මේ වන විට සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් තවත් සේවා රාශියක් සඳහා එතැන ඉඩකඩ ලබා දීලා තිබෙනවා කියලා. ඒ කියන්නේ හෙද නිලධාරින්ට නවාතැන් වාගේම වෙනත් කටයුතු සඳහාත් ඉඩකඩ ලබා දීලා තිබෙනවා කිව්වා. ඒ වාගේම ඔබතුමා කිව්වා, නගර සැලැස්ම යටතේ, සෞඛ්‍ය අංශයේ වෙනත් කාර්යයන් සඳහා පළාත් සෞඛ්‍ය කාර්යාංශය ඇතුළු විවිධ ආයතන දැනට එතැන

[ගරු චානක මාදුගොඩ මහතා]

ස්ථාපනය කරලා තිබෙනවා කියලා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, බාහිර රෝගී අංශය පවත්වාගෙන අනෙකුත් ආයතන ඉවත් වෙනවාද කියන කාරණය.

බන්ධනාගාරය සඳහා මහමෝදර රෝහලේ පැරණි භූමිය තාවකාලික පදනම මත ලබා දුන්නා කියලා තමයි ප්‍රකාශ කළේ. තාවකාලික පදනම කියන එකට, කොතරම් කාලයක්ද කියලා නිශ්චිත කාල රාමුවක් තිබෙනවාද, එහෙම නැත්නම් කාලයක් තීරණය කරලා නැද්ද, ඒ කාලය දීර්ඝ කාලයක්ද කියලා යම් එකඟතාවක් තිබෙනවාද කියන එකත් දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

සාමාන්‍යයෙන් මේ බන්ධනාගාරයේ ඉන්න පුළුවන් ප්‍රමාණය 13,000යි. 2024 අගෝස්තු විතර වෙනකොටත් 29,000ක් හිටියා. දැන් 41,000 දක්වා වැඩි වෙලා තිබෙන්නේ. අපි මේ අවුරුද්ද, ලබන අවුරුද්ද වනකොට සැලකිය යුතු බන්ධනාගාර ප්‍රමාණයක් එක්කෝ අලුතින් ඉදිකරනවා, එහෙම නැත්නම් තිබෙන බන්ධනාගාර පුළුල් කරනවා. ඒ අතර සමහර ස්ථාන අපට තාවකාලිකව යොදා ගන්න සිදු වුණා. මෙතැන තිබුණු අපේ වෛද්‍ය සැපයීම් ඒකකයට අයිති ගොඩනැඟිල්ල ලබා දීමේ ගැටලුවක් පැවතුණේ නැහැ. ඇත්තටම ඒක තාවකාලික පදනමින් තමයි ලබා දුන්නේ. ගාල්ල නගර සංවර්ධන සැලැස්මට බාධාවක් වන ලෙස අපි කටයුතු කරන්නේ නැහැ. ඔබතුමාත් දන්නවා, ගාල්ල නගරයේ අවශ්‍යතාව, ජනතාවගේ අවශ්‍යතාව අනුව තමයි මේ භූමිය යොදා ගැනීමට බලාපොරොත්තු වෙන්නේ කියන එක. ආයතන කිහිපයක් මෙකට ඉල්ලීම් කරලා තිබෙනවා. ඒ නිසා මට කියන්න පුළුවන් දැන් පවතින සමහර සේවා ඉවත් කිරීම කියන්නේ ඒ සේවා නොලැබීම කියන එක නොවෙයි, වඩා උචිත ස්ථානවලදී ඒ සේවා ජනතාවට ලැබෙනවා කියන එක බව. නමුත්, අවසාන සංවර්ධන සැලැස්ම මොකක්ද කියන එක මට මේ වෙලාවේ කියන්න බැහැ.

## ප්‍රාදේශීය මාධ්‍යවේදීන්: රක්ෂණාවරණයක් හඳුන්වා දීම සහ මූල්‍ය ප්‍රතිලාභ
## பிராந்திய ஊடகவியலாளர்கள்: காப்புறுதிக் காப்பீடு அறிமுகம் மற்றும் நிதிசார் நன்மைகள்
## REGIONAL CORRESPONDENTS: INTRODUCTION OF INSURANCE COVERAGE AND FINANCIAL BENEFITS

1828/2026

**12. ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් සහ රක්ෂණාවරණයක් හඳුන්වාදීමට කටයුතු කරන්නේද;

(ii) මාධ්‍ය උපකරණ මිලදී ගැනීමට හෝ ප්‍රවාහන පහසුකම් (විදුලි යතුරුපැදි) සපයා ගැනීම සඳහා සහනදායි පොලී පදනම මත ණය ක්‍රමයක් හඳුන්වාදීමට පියවර ගන්නේද;

(iii) අවම වශයෙන් වර්ෂ 10ක සේවා කාලයක් සපුරා ඇති, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි මාධ්‍යවේදීන්ට ස්ථිර වැටුප් ක්‍රමයක් හෝ විධිමත් දීමනා ක්‍රමයක් සැකසීමට සැලසුමක් තිබේද;

(iv) ප්‍රවෘත්ති ආයතනය මඟින් ගෙවනු ලබන ප්‍රවෘත්තියක් සඳහා අවම ගාස්තුව ඉහළ නැංවීමට සහ මාධ්‍ය හැඳුනුම්පතට නිසි පිළිගැනීමක් ලබාදීමට මැදිහත් වන්නේද;

(v) නොඑසේ නම්, ඔවුන් මුහුණ දෙන ආර්ථික දුෂ්කරතා විසඳීමට ගනු ලබන කඩිනම් පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பிராந்திய ஊடகவியலாளர்களுக்கு ஓய்வூதிய முறையியலொன்றையும் காப்புறுதித் திட்ட மொன்றையும் அறிமுகப்படுத்த நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(ii) ஊடக உபகரணங்களைக் கொள்வனவு செய்வதற்கோ அல்லது போக்குவரத்து வசதிகளை (மின்சார மோட்டார் சைக்கிள்கள்) வழங்குவதற்கோ, சலுகை வட்டி அடிப்படையில் கடன் திட்டமொன்றை அறிமுகப்படுத்த நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iii) குறைந்தபட்சம் 10 ஆண்டுகால சேவைக் காலத்தை நிறைவுசெய்துள்ள, அரசாங்கத் தகவல் திணைக்களத்தில் பதிவுசெய்யப்பட்டுள்ள ஊடக வியலாளர்களுக்கு நிரந்தர சம்பள முறை யொன்றை அல்லது முறையான கொடுப்பனவு முறையொன்றை ஏற்படுத்துவதற்கான திட்ட மொன்று உள்ளதா என்பதையும்;

(iv) செய்தி நிறுவனங்கள் செய்தியொன்றுக்குச் செலுத்தும் குறைந்தபட்ச கட்டணத்தை உயர்த்து வதற்கும், ஊடக அடையாள அட்டைக்கு உரிய அங்கீகாரத்தைப் பெற்றுக்கொடுப்பதற்கும் தலையீடுகள் மேற்கொள்ளப்படுமா என்ப தையும்;

(v) இன்றேல், இவர்கள் முகங்கொடுக்கும் பொருளாதார சிக்கல்களைத் தீர்ப்பதற்கு மேற்கொள்ளப்படும் துரித நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether actions will be taken to introduce a pension scheme and insurance coverage for regional correspondents;

(ii) whether steps will be taken to introduce a concessional loan scheme to purchase media equipment or to provide transport facilities (such as electric motorcycles);

(iii) whether there is a plan to formulate a permanent salary structure or a formal allowance scheme for journalists registered

with the Department of Government Information who have completed a minimum of 10 years of service;

(iv) whether measures will be taken to increase the minimum fee paid for a news story by the media institution and to ensure due recognition to the media identity card; and

(v) if not, the actions that will be taken forthwith to address the economic difficulties faced by these journalists?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatiss)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අපි කෙටුම්පත් කරමින් පවතිනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරි අය වැය සඳහා ඒක ඉදිරිපත් කරන්නට.

(ii) දැනට අමාත්‍යාංශයේ පවතින සැලැස්ම අනුව අපට කරන්න පුළුවන්කම තිබෙන්නේ, ජනමාධ්‍යවේදීන්ට උපකරණ ලබා දීම වෙනුවට මම ඉහත කියපු යෝජනාව ක්‍රියාත්මක කිරීමයි.

(iii) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින් මාධ්‍යවේදීන් ලියාපදිංචියක් සිදු නොකරන අතර, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් මාධ්‍යවේදීන්ට බාධාවකින් තොරව මාධ්‍ය ආවරණ කටයුතු සිදු කිරීම සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සිදු කරනවා.

මාධ්‍යවේදීන්හට වැටුප් හා දීමනා ගෙවීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වන්නේ, එම මාධ්‍යවේදීන් හා ඔවුන්ගේ සේවාව ලබා ගන්නා සේවා යෝජක ආයතන අතර පවතින රැකියා ගිවිසුම් කොන්දේසිවලට අනුව සේවා යෝජක ආයතන විසින්. ඒකට ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වගකීමක් නැහැ, ඇත්තටම.

(iv) ප්‍රවෘත්ති සඳහා අවම මිල ඉහළ නැංවීම සඳහා මැදිහත් වීමට ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යාංශයට දැනට හැකියාවක් නැහැ.

නමුත්, මේ වනවිට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීමට අදාළ පනත් කෙටුම්පත මෙම කාරණාව සාකච්ඡාවට ගැනීමට ඉතා හොඳ අවස්ථාවක් වනු ඇත.

මාධ්‍ය හැඳුනුම්පතට නිසි පිළිගැනීමක් ලබා දීම සම්බන්ධයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු කරනවා.

(v) කම්කරු දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවීමට නියමිත පුවත්පත් කලාවේදීන් සඳහා වන පඩි පාලක සභා සඳහා නාම යෝජනා නිර්දේශ ලබා දී එය පත් කිරීමට ඉදිරි කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.

එසේම පෞද්ගලික මාධ්‍ය ආයතනවල රැකියා අහිමි වූ මාධ්‍යවේදීන්ගේ ගැටලුවලදී ද කම්කරු දෙපාර්තමේන්තුව හරහා එම ගැටලු විසඳා ගැනීමට හා මාධ්‍යවේදීන්ගේ රැකියා සුරක්ෂිතතාව තහවුරු කිරීමට ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යාංශය ලෙස අප මැදිහත්වීමක් කරනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට ලබා දුන් පිළිතුර පිළිබඳව සෑහීමට පත් වෙන නිසා අතුරු ප්‍රශ්න යොමු කරන්නේ නැහැ.

## ශ්‍රී ලංකාවේ ජනාධිපති මන්දිර: විස්තර
## இலங்கையிலுள்ள சனாதிபதி மாளிகைகள்: விபரம்
## PRESIDENT'S HOUSES IN SRI LANKA: DETAILS

137/2024

**13. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති ජනාධිපති මන්දිර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) 2018 වර්ෂයේ සිට මේ දක්වා එම එක් එක් ජනාධිපති මන්දිරය නඩත්තු කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත ජනාධිපති මන්දිර ඵලදායි කටයුතු සඳහා භාවිතා කරන බවට වර්තමාන රජය විසින් පසුගිය මැතිවරණ සමයේදී සිදු කරන ලද ප්‍රකාශ, යථාර්ථයක් බවට පත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது இலங்கையில் காணப்படுகின்ற சனாதிபதி மாளிகைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவை அமைந்துள்ள இடங்கள் யாவை என்பதையும்;

(iii) 2018ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரையில் மேற்படி ஒவ்வொரு சனாதிபதி மாளிகையையும் பராமரிப்பதற்காகச் செலவிடப்பட்ட தொகை ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி சனாதிபதி மாளிகைகள் பயனுறுதிமிக்க வகையில் பயன்படுத்தப்படுமெனத் தற்போதைய அரசாங்கத்தினால் கடந்த தேர்தல் காலத்தில் தெரிவிக்கப்பட்ட கூற்றுகளை யதார்த்தமாக்கு

[ගරු චමින්ද විජේසිරි මහතා]

வதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of President's Houses in Sri Lanka at present;

(ii) their locations;

(iii) annual cost of maintenance for each of those President's Houses from 2018 to date, separately for each year; and

(iv) measures that will be taken to turn the statements made by the current Government during the last election campaign, that these Presidential residences would be used for productive purposes, into reality?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති ජනාධිපති මන්දිර සංඛ්‍යාව 07කි.

(ii) 1. කොටුව ජනාධිපති මන්දිරය - ජනාධිපති මාවත, කොළඹ 01

2. මහනුවර ජනාධිපති මන්දිරය - හිල් ස්ට්‍රීට්, මහනුවර

3. නුවරඑළිය ජනාධිපති මන්දිරය - නුවර පාර, නුවරඑළිය

4. කතරගම ජනාධිපති මන්දිරය - කිරිවෙහෙර පාර, කතරගම

5. අනුරාධපුර ජනාධිපති මන්දිරය - පැරණි නගරය, අනුරාධපුරය

6. මහියංගනය ජනාධිපති මන්දිරය - මහියංගනය

7. බෙන්තොට ජනාධිපති මන්දිරය - බෙන්තොට

(iii) එක් එක් මන්දිර සඳහා දරා ඇති වියදම් වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කර නැත.

ගොඩනැගිලි නඩත්තු හා අලුත්වැඩියා වැය විෂයන්හි සමස්ත වියදම තුළ පහත සඳහන් කරුණු වෙනුවෙන් දරන ලද වියදම් ඇතුළත් වේ.

1. ජනාධිපති මන්දිර නඩත්තු
2. ජනාධිපති මන්දිරවල උද්‍යාන නඩත්තු
3. ජනාධිපති නිල නිවාස නඩත්තු
4. ජනාධිපති ආරක්ෂක නිලධාරින්ගේ නවාතැන් සඳහා වෙන් වූ ගොඩනැගිලි නඩත්තු

| | වර්ෂය | ගොඩනැගිලි නඩත්තු වියදම් 001-1-1-0-1303 (රු.මිලියන) | ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් 001-1-1-0-2001 (රු. මිලියන) | එකතුව (රු. මිලියන) |
|---|---|---|---|---|
| 1 | 2018 | 15 | 110 | 125 |
| 2 | 2019 | 15 | 62.2 | 77.2 |
| 3 | 2020 | 12 | 22.7 | 34.7 |
| 4 | 2021 | 10 | 18.8 | 28.8 |
| 5 | 2022 | 12 | 13.6 | 25.6 |
| 6 | 2023 | 26.4 | 11 | 37.4 |
| 7 | 2024 | 13.9 | 10.5 | 24.4 |
| 8 | 2025 | 7.5 | 3 | 10.5 |
| 9 | 2026 ජනවාරි-ජුනි | 3 | 0.4 | 3.4 |

(iv) රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය වන බංගලා නිවාස, විසුම්පාය හා විවිධ ප්‍රදේශයන්හි පවතින ජනාධිපති මන්දිර ආර්ථිකමය වශයෙන් ඵලදායීව උපයෝජනය කිරීම පිණිස යෝග්‍ය ක්‍රමවේදයක් හඳුන්වා දීම මැයෙන් ඉදිරිපත් කරන ලද අංක අමප/24/2134/816/008 හා 2024.12.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කමිටුවක් පත් කර ඇත.

කමිටු වාර්තාව මේ වන විට ලබා දී ඇති අතර, එහි නිර්දේශ මත වාණිජමය හා වෙනත් කටයුතු වෙනුවෙන් මෙම මන්දිර භාවිත කළ යුතු ආකාරය පිළිබඳව ඉදිරි කටයුතු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු අගමැතිතුමියනි, ස්තුතියි.

මම අහපු ප්‍රශ්න අංක (iii)ට ඔබතුමිය දුන් පිළිතුරට අදාළවයි මම මේක කියන්නේ. 2025 සහ 2026දී ජනාධිපතිවරු නිල නිවාසවල හිටියේ නැහැ. හැබැයි මේ අවුරුදු දෙකට රුපියල් මිලියන 13ක් වියදම් වෙලා තිබෙනවා; 2025දී රුපියල් මිලියන 10කුත්, 2026දී මිලියන 3කුත් - තවමත් අවුරුද්ද අවසන් වෙලා නැහැ - වශයෙන් රුපියල් මිලියන 13ක් වියදම් වෙලා තිබෙනවා. තවත් වැය බරක් බදු මුදලින් දරලා තිබෙනවා, ඒ වෙනුවෙන්. බදු මුදලින් ජනාධිපති මන්දිර නඩත්තු කිරීම පිළිබඳව ඔබේ පාලනය තුළ දැඩි විරෝධයක් තිබුණා. එතකොට, ජනාධිපතිවරු ඉඳලාත් රුපියල් මිලියන 15ත්, මිලියන 30ත් අතර මුදලක් අවුරුද්දකට වියදම් වෙලා තිබෙනවා, ගරු අගමැතිතුමියනි. ජනාධිපතිවරු හිටියේ නැතත් මේ නඩත්තු වියදම ගිහිල්ලා තිබෙනවා. දැන් අවුරුද්දයි, මාස 8ක් විතර ගිහිල්ලාත් තවම මේවාට මොකක්ද කරන්නේ කියන කාරණය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, ඔබ පාලනයට එන්න කලින් මේ පිළිබඳව සැලසුම් තිබුණා, ඔබතුමියගේ කථා ගත්තත්, වර්තමාන ජනාධිපතිතුමාගේ කථා ගත්තත්. මේවාට මෙන්න මේ මේ විශ්වවිද්‍යාල, කෞතුකාගාර ඇති කිරීම පිළිබඳ කථා වුණා. මේ පිළිබඳව සමාජයට එන්නේ බරපතළ විධියට. සමාජයේ මේ පිළිබඳව කථා වුණා, "ඒ කාලයේ කිව්වේ බොරු" කියලා. මොකද, ඒවා වෙන්න එපැයි එහෙම නම්. එහෙම නම්, ජනාධිපති මන්දිරයේ විශ්වවිද්‍යාලයක් ආලා

තිබෙන්න ඕනෑ, කෞතුකාගාරයක් දාලා තිබෙන්න ඕනෑ, හෝටලයක් දාලා තිබෙන්න ඕනෑ. ඔබ වේදිකාව තුළ කියපු කාරණයක් නේ, ගරු අගමැතිතුමියනි ඒක. අවුරුද්දයි, මාස 8ක් තුළත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ගන්න මේ තීන්දුව ඔබ එන්න කලින් අරගෙන තිබෙනවා.

ඒ නිසා මම හිතන විධියට මේ මන්දිරවලට ජනාධිපතිවරුන් සිටියදීත් වියදම් වෙලා තිබෙනවා, ජනාධිපතිවරුන් නැතුවත් වියදම් වෙලා තිබෙනවා. හැබැයි, එය ප්‍රමාණයෙන් අඩුයි. නමුත් ඒ අඩු වෙච්ච ප්‍රමාණය පිළිබඳව අපි සෑහීමකට පත් වන්නේ නැහැ. මොකද, එසේ අඩු වෙච්ච ප්‍රමාණය ජනතාවගේ පැත්තට ඇවිල්ලාත් නැහැ නේ. මීට කලින් ජනාධිපති මන්දිරවලට, ඇමති මන්දිරවලට කරන ලද වියදම වැඩි වුණත්, දැන් ඒ වියදම් අඩු වුණාම ජනතාවගේ දෛනික ජීවිතයේ තිබෙන වියදම් - කන බොන වියදම්, බඩු මිල - හෝ අඩු වෙයි කියලායි ඇත්තටම ජනතාව හිතුවේ. නමුත් එහෙම වෙලාත් නැහැ. එහෙම නොවෙන්න හේතුව මොකක්ද? ඒ කියන්නේ ජනාධිපතිවරුන් නැතත් ඒවාට වියදම් වෙලා තිබෙනවා. ඒ වුණාට මේ මන්දිරවලට කරන වියදම් සහ තවත් වියදම් අඩු කර තිබෙනවා, ඔබගේ ආණ්ඩුව. ඒ වියදම්වල යම් අඩුවීමක් පෙන්වුවත්, ජනතාවට තවම තුන් වේල කන්න යන වියදමට සහ අනෙකුත් අත්‍යවශ්‍ය දේවල්වලට යන වියදම්වලට මේ අඩුවීමෙන් බලපෑමක් වෙලා නැත්තේ ඇයි කියන කාරණය සම්බන්ධයෙන් තමයි ජනතාවගේ පැත්තෙන් අඳෝනාවක් එන්නේ, ගරු අගමැතිතුමියනි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, අපේ ජනාධිපතිතුමා හෝ අපේ අමාත්‍ය මණ්ඩලයේ කවුරුන් හෝ ඒ ජනාධිපති මන්දිර, බංගලා පාවිච්චි නොකරනවා කියන එක දේශපාලන ප්‍රතිපත්තියක් හැටියට අපි අනුගමනය කරන දෙයක්. හැබැයි, ඒවා මේ රජයට, මේ රටේ ජනතාවට අයිති ස්ථාන. එතකොට ඒවා අපි පාවිච්චි කළේ නැතත්, වෙනත් දේකට ප්‍රයෝජනයට ගන්නා තාක්කල් අපට ඒවා නඩත්තු කරන්න සිද්ධ වනවා. එහෙම නැත්නම් ඒවා නාස්ති වනවා. ජනාධිපතිතුමා මේ මන්දිර පාවිච්චි කළා නම් මේවාට යන වියදම මීට වඩා වැඩි වනවා නේ. අපිත් පෙන්නුම් කළා නේ, පසුගිය අවුරුදුවල මේවායේ තිබුණු වියදම්. දැනටත් අමාත්‍ය මණ්ඩලය අනුමත කර මේ සම්බන්ධව කමිටුවක් පත් කර තිබෙනවා. එම කමිටුවේ නිර්දේශ ඇවිල්ලා තිබෙනවා. එම නිර්දේශ අනුව ජනාධිපති මන්දිර ඇතුළු අනෙකුත් සියලු බංගලා සහ ස්ථාන වාණිජමය කටයුතු සඳහා හෝ වෙනත් කටයුතු සඳහා පාවිච්චි කරන විධිය ගැන අපි වැඩ කටයුතු ක්‍රියාත්මක කරමින් යනවා. ඒ නිසා අපි වේදිකාවලත්, වෙනත් තැන්වලත්, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළත් දුන් පොරොන්දු ඒ විධියට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ ගැන කිසිම සැකයක් තබා ගත යුතු නැහැ. ඒ විධියට ඒ වැඩේ වෙනවා.

ඇත්තවශයෙන්ම ඒ සමහර බංගලාවල අද වනකොට අධිකරණ කටයුතු පටන් ගෙන තිබෙනවා. ඒ හරහා අපට අධිකරණ ක්‍රියාවලිය යම්තාක් දුරකට වේගවත් කරන්නත් පුළුවන් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා අපි දුන් පොරොන්දු ඒ විධියටම ක්‍රියාත්මක වනවා කියන එක තමයි මට මේ අවස්ථාවේ අවධාරණය කරන්න පුළුවන් වන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්තටම පසුගිය සති කිහිපය තුළ මාධ්‍යයෙන් අනාවරණය වුණේ ඒවා කැලෑ වෙලා කියලායි. එක්කෝ, මාධ්‍ය බොරු කියනවා ඇති. එහෙම නැත්නම්, කවුද බොරු කියන්නේ කියන කාරණය පිළිබඳව සමාජයට ඇත්ත කියන්න ඕනෑ. ඒ නිසා තමයි අද අපි මේ පාර්ලිමේන්තුවේදී මේ ප්‍රශ්නය අහන්නේ. ගරු අගමැතිතුමියනි, සමහර වීඩියෝපටවලින්, පින්තූරවලින් පෙන්නුම් කර තිබෙනවා, එම ස්ථාන විශාල පරිහානියකට ලක් වෙලා තිබෙනවා කියලා. ඒ, ඔබ සද්භාවයෙන් ගත් තීන්දුව නිසා නොවෙයි. නමුත් රටට, රටේ අනාගතයට ඔබින විධියට මේවා දායාද කරන්න යෑමේදී විශාල වශයෙන් මූල්‍ය අලාභ සිදු වෙමින් පවතිනවා, දේපළ අලාභ සිදු වෙමින් පවතිනවා කියන කාරණය කියනවා.

පොරොන්දු රකිනවා කියන කාරණය ඔබ කිව්වාට, ඊයේ දිනයේ මේ පාර්ලිමේන්තුවේදී මොකක්ද වුණේ? ඒ කියන්නේ, පසුගිය ආණ්ඩු නියෝජනය කළ උදවිය බදු මුදල්වලින් පෝෂණය වන එකට ඔබ විරුද්ධ වුණා. හැබැයි, මේ වනකොට යම් පක්ෂයක නායකයෙකුගේ පවුලක් පෝෂණය කරන්න යම් මුදලක් වෙන් වනවාද කියා අපේ මන්ත්‍රීවරයෙක් අහද්දි, "ඒක අපේ වැඩක්" යනුවෙන් සඳහන් කළා. ගරු අගමැතිතුමියනි, එහෙම වෙන්න බැහැ නේ. ඔබතුමියන්ලා ඇවිල්ලා හොඳ තීන්දුවක් ගත්තා, බදු මුදල්වලින් යැපෙන සමහර කණ්ඩායම්වලට විශ්‍රාමය තියා කිසිම විධියක පෝෂණයක් ලබා දෙන්නේ නැහැ කියලා. හැබැයි, ඔබේ ආණ්ඩුව නියෝජනය කරන, දේශපාලනිකව සමහර තනතුරු දරන අය මොකක්ද කියන්නේ? මම මේ කාරණය කිව්වේ, පොරොන්දු ඉටු කරනවා කියලා ඔබතුමිය කියපු නිසායි. අපි බලාපොරොත්තු වුණා, ඒ දේවලුත් අයින් කරාවි කියලා. නමුත් එහෙම වුණේ නැහැ නේ. "අපේ ආණ්ඩුව, අපි ඒක කරනවා" කිව්වා. ඒ අයුරින් දෙයාකාරයකින් ඒ දේවල් වෙන්න බැහැ, ගරු අගමැතිතුමියනි. ඒ කියන්නේ, ඔබේ ආණ්ඩුව බලයට ආවාම පසුගිය කාලයේ ඒවා අයින් කළා. ඒක හරි, ඒක හොඳයි. හැබැයි, ඔබේ ආණ්ඩුවේ කවුරුන් හෝ දැන් බදු මුදල්වලින් පෝෂණය වෙනවා කියනවා නම් ඒක වැරදියි. ඒ නිසා මම හිතනවා, මේ මොහොතේ ඉක්මන් වෙන්න ඕනෑය කියලා. මොකද, නිර්දේශ බල බලා ඉන්නකොට, අවුරුදු දෙක තුනක් ගතවනවා.

ගරු අගමැතිතුමියනි, අපි දැකපු වීඩියෝපට සහ පින්තූරවලින් පෙනී යනවා සහ අපි දන්නවා, ජනාධිපතිවරුන් සිටි කාලවලට වඩා වැය බරක් දැන් ඒවා නඩත්තු කිරීමට යන බව. එක පැත්තකින් සමහර වෙලාවට මේ වරප්‍රසාද ගන්නේ නැහැ කියලා කිව්වාට, මම අහපු ප්‍රශ්නයක තිබෙනවා, ඇමතිවරු 8දෙනෙක් ඇමති බංගලා අරන් තිබෙනවා කියලා. ඒකට කමක් නැහැ. මොකද, ඇත්තටම ඇමතිවරුන්ට ගෙවල් නැහැ, යන්න දිහාවක් නැහැ. ඒ නිසා ඔවුන් මේ ආසන්නයේ ඉන්න ඕනෑ. එහෙම අදහසක් නැද්ද? ජනාධිපතිවරයා වුණත් මේ වරප්‍රසාද ගන්නේ නැහැ කිව්වාට, සමහර වෙලාවට ඕනෑ වෙලා ඇති. සමහර වෙලාවට, සමහර තැන්වලදී එහෙම වුවමනා වෙලා ඇති. අපි දැක්කා, සමහර අවස්ථාවලදී ජනාධිපතිතුමන්ලාට විවිධ වූ කාරණා ආවා, ගරු කථානායකතුමනි. අනුරාධපුරයට ගියාම ඉන්න තැනක් නැති නිසා ප්‍රශ්න ඇති වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අතුරු ප්‍රශ්නය අහලා අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මම මේ ජනාධිපතිතුමා ගැන කියන්නේ, ගරු කථානායකතුමනි. ජනාධිපතිතුමා අනුරාධපුරයට ගියාම ඉන්න තැනක් නැති නිසා විවිධ තැන්වල ඉන්නවා කියලා කියනවා. එම නිසා ගන්න පුළුවන් දේ ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් හදන්න පුළුවන් ද, ගරු අගමැතිතුමියනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා අතුරු ප්‍රශ්නයට විනාඩි 3ක් අරගෙන තිබෙනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මට යොමු කර තිබෙන්නේ ජනාධිපති මන්දිර පිළිබඳ ප්‍රශ්නයක්. ඒ සම්බන්ධයෙන් තමයි මම උත්තර දීලා තිබෙන්නේ. එක තැනකදී එතුමා කියනවා, ජනාධිපතිතුමා මේ මන්දිර පාවිච්චි නොකළත් ඒ වෙනුවෙන් වියදමක් යනවා කියලා. ඒකත් එතුමාගේ විවේචනයට ලක් වුණා. එතුමා විවේචනය කළා නේ, ඒක මුදල් නාස්තියක් කියලා. දෙවැනි අතුරු ප්‍රශ්නයේදී එතුමා කියනවා, ඒ මන්දිර සඳහා වියදම් කරන්නේ නැති නිසා ඒවා නාස්ති වෙනවා, ඒවා කැලෑ වැදිලා කියලා සමාජ මාධ්‍යයේ වාර්තා වෙනවා දැක්කා කියලා. එතකොට දෙකෙන් එකක් කරන්න වෙනවා නේ. මේ මන්දිර ජනාධිපතිතුමා පාවිච්චි කළත්, නැතත් අපේ ස්ථාවරය මේක ආර්ථිකව හෝ වෙනත් ප්‍රයෝජනයක් සඳහා භාවිතයට ගැනීමයි. මේ ගොඩනැඟිලි අධිකරණ සඳහා හෝ වෙනත් ප්‍රයෝජනයක් සඳහා පාවිච්චි කරනකම් ඒකේ අවම නඩත්තුවක් අපි කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, එම නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම යෝජනා කරනවා, සමාජ මාධ්‍යවල තිබෙන සියලු දේවල් විශ්වාස කරගෙන ඒවා මත පදනම් වෙලා මෙතැන ප්‍රශ්න නඟන එක එච්චර සුදුසු නැහැ කියලා. මම කියන්නේ, digital literacy කියලා දෙයකුත් තිබෙන්න ඕනෑ කියලායි. ඒ කියන්නේ, සමාජ මාධ්‍ය තුළ තිබෙන දේවල් කොහොමද අපි පරිහරණය කරන්නේ, ඒ සියල්ල තුළ තිබෙන්නේ ඇත්ත ද, නැද්ද කියන එක පිළිබඳව අඩුම තරමේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වනකොට අපට යම් අවබෝධයක් තිබෙන්න ඕනෑ. ඒ පිළිබඳ අදහසක් එක්ක ප්‍රශ්න නඟනවා නම් වඩාත් හොඳයි කියලා මම හිතනවා.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළ නැති වුණත් මෙතුමා කිව්වා, ඇමතිවරු බංගලාවල ඉන්නවා කියලා. ඒක මම ප්‍රතික්ෂේප කරනවා. අපේ ඇමතිවරුන් කවුරුවත් බංගලා අරගෙන කොළඹ ප්‍රදේශයේ නැහැ. අපේ අමාත්‍ය මණ්ඩලයේ කවුරුවත් එවැනි නිල නිවාසවල නැහැ. මාදිවෙල මන්ත්‍රී නිවාස සංකීර්ණයේ සිටින පිරිසක් ඉන්නවා. ඊට අමතරව මගේ මතකයේ හැටියට අපේ ඇමතිවරු දෙතුන් දෙනෙක් කොළඹ Longdon Place එකේ flatsවල ඉන්නවා. ඒ ඇරෙන්න අපේ අමාත්‍ය මණ්ඩලයේ කවුරුවත් වෙන කොහේවත් නැහැ කියලා මම මේ සභාව දැනුවත් කරන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 14 -608/2025- (1), ගරු දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## 2020 සිට රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නවක වද සිදුවීම්: ගෙන ඇති ක්‍රියාමාර්ග

### 2020 தொடக்கம் பல்கலைக்கழக கட்டமைப்பில் பகிடிவதை சம்பவங்கள்: நடவடிக்கை

### RAGGING INCIDENTS IN STATE UNIVERSITY SYSTEM FROM 2020: ACTION TAKEN

1034/2025

**15.ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නවක වද සිදුවීම් හේතුවෙන් මිය ගිය සහ තුවාල ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම සිදුවීම් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල මට්ටමින් පත් කරන ලද කමිටු සංඛ්‍යාව කොපමණද;

(iii) එම කමිටු වාර්තාවලට අනුව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාත්මක වන අමානුෂික නවක වදය වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் தற்போது வரை பல்கலைக்கழக கட்டமைப்பில் பகிடிவதைச் சம்பவங்கள் காரணமாக இறந்த மற்றும் காயமடைந்த மாணவர்களின் எண்ணிக்கை ஒவ்வொரு பல்கலைக்கழகம் வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படிச் சம்பவங்கள் தொடர்பாக பல்கலைக்கழக மட்டத்தில் நியமிக்கப்பட்ட குழுக்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அக்குழுக்களின் அறிக்கைகளுக்கு அமைவாக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) அரச பல்கலைக்கழக கட்டமைப்பில் நிகழும் மனிதாபிமானமற்ற பகிடிவதைகளைத் தடுப்ப தற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of students who died and got injured due to incidents of ragging in the university system from the year 2020 to date, separately for each university;

(ii) number of committees appointed at the university level regarding the said incidents;

(iii) measures taken based on the reports of those committees; and

(iv) actions that have been taken to prevent the inhumane ragging that is taking place in the State university system?

(b) If not, why

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නවක වද සිදුවීම් පිළිබඳව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත වාර්තා වූ පැමිණිලි අනුව,

මිය ගිය සංඛ්‍යාව - 01

තුවාල සිදුවීම් -

- පහරදීම් ඇතුළත් සිදුවීම් - 106
- එම සිදුවීම්වලට අදාළ පැමිණිලි සංඛ්‍යාව - 141
- තුවාල සිදු වූ බවට වාර්තා වූ බරපතළ ගණයේ පැමිණිලි සංඛ්‍යාව - 93

විස්තර ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල මට්ටමින් පත් කළ කමිටු සංඛ්‍යාව 28කි.

විස්තර ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල

- වාචික අවවාද කිරීම - අවස්ථා 01
- අවවාදාත්මක ලිපි නිකුත් කිරීම - අවස්ථා 04
- ශ්‍රී ලංකා පොලීසියට යොමු කිරීම - අවස්ථා 03
- ශිෂ්‍යභාවය අත්හිටුවීම
  - මාස 06ක් සඳහා - අවස්ථා 01
  - අවුරුදු 01ක් සඳහා - අවස්ථා 02
  - අවුරුදු 01යි මාස 06ක් සඳහා - අවස්ථා 02
  - අවුරුදු 02ක් සඳහා - අවස්ථා 06
  - අවුරුදු 03ක් සඳහා - අවස්ථා 02
- විශ්වවිද්‍යාලයෙන් නෙරපා හැරීම් - අවස්ථා 01

විස්තර ඇමුණුම 03 මඟින් දක්වා ඇත.

(iv) විශ්වවිද්‍යාල <u>ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග</u>

උසස් අධ්‍යාපන ආයතනවල නවක වදය වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් අරගෙන තිබෙනවා. මේ ආණ්ඩුව පත් වුණාට පස්සේ 2025.06.04වැනි දා නවක වදය සහ සියලුම ආකාරයේ හිංසනයන් වැළැක්වීම සඳහා සාමාජිකයන් 16 දෙනෙකුගෙන් සමන්විත කාර්ය සාධක බලකායක් අපි පත් කළා. මොකද, අපට නිරීක්ෂණය වුණා, ඇත්තවශයෙන්ම නවක වදය විතරක් නොවෙයි වෙනත් විධියේ හිංසනත් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තිබෙන බව. ඒ සියල්ලටම මැදිහත් වන විධියට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කරන්න, guidelines නිකුත් කරන්න අපි කාර්ය සාධක බලකාය පත් කරලා තිබෙනවා. ඒ කාර්ය සාධක බලකාය මේ වනකොටත් වැඩ කරමින් අපට උපදෙස් දෙමින් සිටිනවා. ගරු කථානායකතුමනි, ඒක UGC එක යටතේ තිබෙන විශ්වවිද්‍යාලවලට විතරක් නොවෙයි, සියලුම උසස් අධ්‍යාපන ආයතන සඳහා පත් කරපු කාර්ය සාධක බලකායක්. ඒක වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයටත්, වෙනත් diplomas and higher diplomas ලබා දෙන උසස් අධ්‍යාපන ආයතනයකුත් නියෝජනය වන පරිදි හදපු කාර්ය සාධක බලකායක්.

ඊට අමතරව, 2016 අවුරුද්දේ ආරම්භ වුණු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය සහ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය විසින් නවක වදය වැළැක්වීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

1. නවක වදය වැළැක්වීම සඳහා අදාළ චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇත.
   - ➢ 2010.01.15 දිනැති චක්‍රලේඛ අංක 919
   - ➢ 2011.02.10 දිනැති චක්‍රලේඛ අංක 946
   - ➢ 2019.11.22 දිනැති චක්‍රලේඛ අංක 12/2019
   - ➢ 2020.08.10 දිනැති චක්‍රලේඛ අංක 04/2020
   - ➢ 2022.10.04 දිනැති චක්‍රලේඛ අංක 14/2022
   - ➢ 2023.03.01 දිනැති චක්‍රලේඛ අංක 02/2023
   - ➢ 2025.02.24 දිනැති චක්‍රලේඛ අංක 01/2025
   - ➢ 2025.07.09 දිනැති චක්‍රලේඛ අංක 06/2025
   - ➢ 2025.09.19 දිනැති චක්‍රලේඛ අංක 07/2025
   - ➢ 2026.02.06 දිනැති චක්‍රලේඛ අංක 02/2026
2. ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය සහ සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුව පිහිටුවා එහි විධාන ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණය ලෙස ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය සහ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය පිහිටුවීම. නවක වදයට අදාළ සියලු පැමිණිලි, දැනුවත් කිරීම් සහ ප්‍රතිපත්ති නිර්මාණය කිරීම මෙම කේන්ද්‍රය හරහා 2016 වර්ෂයේ සිට සිදු කෙරේ.
3. නවක වද සිදුවීම්වලට අදාළ පැමිණිලි භාර ගැනීමට පැමිණිලි ද්වාරයක් සහ පැමිණිලි හැසිරවීමේ යන්ත්‍රණයක් 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පවතී. ඒ යටතේ,
   a) කාර්යාල වේලාවන් තුළ (පෙර වරු 8.30 - පස් වරු 4.30 දක්වා) ක්‍රියාත්මක වන විශේෂ දුරකථන සහාය සේවාව.
   b) නවක වදය හා ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (SGBV) සම්බන්ධ පැමිණිලි භාර ගැනීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක මාර්ගගත පැමිණිලි පද්ධතියක් පවත්වාගෙන යාම.
   c) ලිපි, විද්‍යුත් තැපැල, දුරකථන, වට්ස්ඇප් - WhatsApp - හෝ වෙනත් ක්‍රම මඟින් ලැබෙන සියලු පැමිණිලි CGEE විසින් පැමිණිලි පද්ධතියේ ලියාපදිංචි කරනු ලැබේ.
   d) මෙසේ ලැබෙන සියලුම පැමිණිලි විභාග කිරීම සඳහා අදාළ විශ්වවිද්‍යාලය වෙත යොමු කරනු ලැබේ.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

e) විශ්වවිද්‍යාල වෙත යොමු කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරම් කිරීම සහ අදාළ පැමිණිලි පිළිබඳව ස්ථාවර කමිටු රැස්වීම්වලදී පසු විපරම් කිරීමට ස්ථාවර කමිටු සාමාජිකයන් හරහා තොරතුරු රැස් කිරීම සිදු කරනු ලැබේ.

4. නවක වදයේ වින්දිතයන් වෙනුවෙන් සහායක යන්ත්‍රණයක් ගොඩනැඟීමට අවශ්‍ය කටයුතුත් දැන් සකස් කරමින් යනවා.

- ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය සහ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය (CGEE/UGC) විසින් නවක වදයේ වින්දිතයන්ට සහායක යන්ත්‍රණයක් ගොඩනැඟීමට අදාළ මූලික කටයුතු දැන් අවසන් කර තිබෙනවා.
- වින්දිතයන් සඳහා සහන සැපයීමේ මූලික ක්‍රියාවලියට අදාළව චක්‍රලේඛ කිහිපයක් නිකුත් කරලා තිබෙනවා. මේ අතර ප්‍රධාන වන්නේ හැකි සෑම අවස්ථාවකදීම ප්‍රථම වසර සිසුන් සඳහා වෙන් වූ නේවාසිකාගාර ලබා දීමට උපදෙස් ලබා දුන් 01/2025 චක්‍රලේඛයයි. ඒක විශේෂයි.
- නඩු අංක SC FR 216/2020හි ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට අනුව වින්දිතයන්ට සහාය දීම සඳහා වන කමිටු විශ්වවිද්‍යාලවල පිහිටුවා ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහිද මධ්‍යගත කමිටුව පිහිටුවා තිබෙනවා.
- නවක වදයට පාදක වන පුළුල් සමාජයීය සාධක පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රජාවට අවබෝධයක් ලබා දීම සඳහා විවිධත්වය සමඟ ජීවත් වීම - Learning to Live with Diversity - යනුවෙන් පාඨමාලාවක් හඳුන්වා දී ඇත. නවක වදය පවත්වාගෙන යාමට බලපාන විවිධ සමාජයීය කරුණු ශිෂ්‍ය-කේන්ද්‍රීය ආකාරයට සාකච්ඡා කරන මෙම පාඨමාලාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පුහුණුකරුවන් පුහුණු කිරීම සම්පූර්ණ කර ඇති අතර, ඇතැම් විශ්වවිද්‍යාලවල මෙම පාඨමාලාව දැනටමත් සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට හඳුන්වා දී ඇත. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2025 මඟින් "විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම" යන පාඨමාලාව විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයන්ගේ නම්නීකරණ වැඩසටහන්වලට ඇතුළත් කිරීමට අදාළ උපදෙස් පිළිබඳ චක්‍රලේඛය 2025.07.09වන දින නිකුත් කර ඇත.

5. මීට අමතරව විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක සයිබර් අවකාශයේ හිංසනය සහ සිසුන්ගේ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම් සම්බන්ධයෙන් "ELEVATE" නම් කෙටි චිත්‍රපට වැඩසටහන ඇසුරින් අවශ්‍ය මූලික දෘශ්‍ය මාධ්‍ය සම්පත් ගොඩනඟා ඇත. මෙම කෙටි චිත්‍රපට විශ්වවිද්‍යාල නම්නීකරණ පාඨමාලා සඳහා යොදා ගැනේ.

<u>ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව - නඩු අංක SC FR 216/2020ට අදාළ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග</u>

- විශ්වවිද්‍යාලයට ඇතුළත් වන සියලුම විද්‍යාර්ථීන්ට නවක වදයට අදාළ නීතිමය සහ මනෝසමාජයීය බලපෑම් ඇතුළු දැනුවත් කිරීම්වලට අවශ්‍ය මූලික පාඨමාලාවක් සකස් කිරීම. මීට අදාළ පාඨමාලාව දැනට සකස් කර අදාළ අනුමැතීන් ලබා ගනිමින් පවතී.
- ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය සහ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයට අනුබද්ධව මධ්‍යම වින්දිත සහාය කමිටුවක් - Central Victim Support Committee - ස්ථාපිත කිරීම.
- විශ්වවිද්‍යාලවල වින්දිත සහායක කමිටු ස්ථාපිත කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ද අදාළ විශ්වවිද්‍යාල කමිටු සඳහා සාමාජිකයන් නිර්දේශ කිරීම. දැනට මෙම කමිටුවල ආයතනික බලය සහ වගකීමට අදාළ ක්‍රියා පටිපාටිය සකස් කෙරෙමින් පවතී. නවක වදයේ වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට අවශ්‍ය නීති සහාය, මානසික සෞඛ්‍ය අවශ්‍යතා, වෛද්‍ය පහසුකම්, පොලීසියේ සහාය සහ වෙනත් අදාළ ආයතනවල සම්බන්ධීකරණය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය සම්පත් සංචිතයක් ගොඩනැඟීම මේ වනවිට සිදු වෙමින් පවතී.
- නවක වදය පිළිබඳව දැනුවත් කිරීමට සහ ආකල්ප වෙනස් කිරීමට අදාළව කලා හා මානව ශාස්ත්‍රමය මැදිහත්වීම් සඳහා වැඩසටහනක් සංවර්ධනය කිරීම වෙනුවෙන් බහු ආංශික මණ්ඩලයට සාමාජිකයන් පත් කරන ලදී.
- 2025 සැප්තැම්බර් 03 දින පැවති කොමිෂන් සභාවේ 1154වන රැස්වීමේදී, විශ්වවිද්‍යාල අරමුදලේ උපශීර්ෂයක් ලෙස වින්දිත සහාය අරමුදල පිහිටුවීමට තීරණය කරන ලදී. ඒ අනුව, 2025 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි මානව ප්‍රාග්ධන සංවර්ධන ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 20ක් වෙන් කර ඇත. මෙම අරමුදලට ඉදිරි වසර 5 සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 6 බැගින් වෙන් කිරීමට යෝජිතය.
- 2025 සැප්තැම්බර් 17 දින පැවති 1155 වන කොමිෂන් සභා රැස්වීමේදී තීරණය කළ පරිදි 2025 සැප්තැම්බර් 19 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07/2025 (SC FR 216/2020 ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ක්‍රියාත්මක කිරීම) නිකුත් කිරීම අනුමත කරන ලදී.

- 2025 ඔක්තෝබර් 28 දින සියලුම විශ්වවිද්‍යාල විනයාරක්ෂක නිලධාරීන්ගේ සංගමය සමඟ රැස්වීමකදී ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ක්‍රියාත්මක කිරීමට අදාළ දැනුවත් කිරීම් සිදු කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන් සහ පොලිස් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතර නවක වදය සම්බන්ධ පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීම ශක්තිමත් කිරීම පිළිබඳ සාකච්ඡාවකින් අනතුරුව විශ්වවිද්‍යාල සහ අදාළ පොලිස් ස්ථාන අතර සම්බන්ධය ශක්තිමත් කිරීමට දෙපාර්ශ්වයේ නිලධාරීන් පත් කිරීම.
- SC (FR) 216/2020 නියෝග දැඩිව ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවටම දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන්, විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්, ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය සහ සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුවට සහ සමාජ සංහිඳියාව පිළිබඳ ස්ථාවර කමිටුවට අයත්සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් රවීන්ද්‍ර පතිරණගේ මහතාගේ සම්පත් දායකත්වයෙන් එම දැනුවත් කිරීම් සිදුකොට ඇත.

6. ඇතැම් විශ්වවිද්‍යාලවල නවක සිසුන්ගේ නම්නීකරණ වැඩසටහන්වලට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය සහ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරිය සහ ඇතැම් අවස්ථාවලදී කොමිෂන් සභා සාමාජිකයන් පවා සහභාගී වෙමින් නවක සිසුන් දැනුවත් කිරීම.
7. සබරගමුව විශ්වවිද්‍යාලයේ ඩී.ජී.සී.සී.ඩී. දයානන්ද සිසුවාගේ මරණය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් පැවැත් වූ මූලික පරීක්ෂණයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාමාජිකයන් නිර්දේශ කිරීම සහ ඒ යටතේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය සහ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරිය අදාළ පරීක්ෂණ කමිටුවට සාමාජිකයෙකු වශයෙන් පත් වීම.
8. විවිධ නවක වද සිද්ධීන් සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන සිද්ධීන් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගැනීමට පාලක සභා සාමාජිකයෙකු -විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කළ සාමාජිකයන් අතුරින්- විශේෂ නියෝජිතයෙකු ලෙස පත් කිරීම. සමහර පැමිණිලි පිළිබඳව Council Membersලාගේ මැදිහත් වීම පිළිබඳ පසු විපරම් කිරීමටත් කොමිෂන් සභාව මැදිහත් වෙලා තිබෙනවා.
9. විවිධ නවක වද සිද්ධීන් සහ අදාළ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල පාලක සභාවලට පත් කරන ලද සාමාජිකයන් දැනුවත් කිරීම. මේ යටතේ දැනට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පාලක සභා සාමාජිකයන් -විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කළ සාමාජිකයන් අතුරින්- සමඟද රැස්වීම් පවත්වන ලදී.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමනි, ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

පිළිතුරු ලබා දුන්නාට ස්තුතියි, ගරු අගමැතිතුමියනි. ඔබතුමිය FR නඩු තීන්දුවක් ගැන කිව්වා නේ. 2020 වර්ෂයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයාගේ පැමිණිල්ල අනුව තමයි මම හිතන විධියට ඔය Central Victim Support Committee එක පිහිටුවන්නේ. ඒ වෙලාවේදී සියලුම විශ්වවිද්‍යාලවල උපකුලපතිවරු ගෙන්වලා, සාකච්ඡා කරලා ඒ කමිටුව පිහිටුවන්න සහ එය ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව විශ්වවිද්‍යාලවලට දැනුම් දී තිබෙනවා. ඔබතුමිය ඒ කරුණු ටික පැහැදිලි කළා. ඒ නියමයන් පැනෙව්වාට ඔබතුමිය ඒ ගැන සමාලෝචනය කරන්න මේ වනකොට ක්‍රමවේදයක් සකස් කර ඇති කියලා මම හිතනවා. ඒ ක්‍රමවේදය තුළ ඒ කටයුතු කරන්න බාධා තිබෙනවාද කියාත් ඔබතුමියන්ලා හඳුනා ගෙන ඇති. එහෙම බාධා තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා මම දැනගන්න කැමතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඇත්තවශයෙන්ම බාධා ගණනාවක් තිබෙනවා. නිලධාරීන් ඒවාට මැදිහත් වන වේගය, විශ්වවිද්‍යාල පාලක සභා මේවාට මැදිහත් නොවීම, නොදැනුවත්කමට වඩා ඔවුන්ගේ වගකීමක් හැටියට එය හරිහැටි භාර නොගැනීම වාගේ දේවල් නිසා මේවායේ ප්‍රමාදවීමක් සිද්ධ වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, එක අතකට මේ සම්බන්ධයෙන් යම් සමබරතාවකින් බලන්න ඕනෑ වෙලා තිබෙන්නේ කොමිෂන් සභාව විශ්වවිද්‍යාලවලට කොච්චර දුරට මැදිහත් විය යුතුද, මැදිහත් විය හැකිද කියන කාරණාව තිබෙන නිසායි. අපි ප්‍රතිපත්තියක් හැටියට විශ්වවිද්‍යාලවල autonomy එකට ගරු කරන්න ඕනෑ කියන පදනමේ ඉඳගෙන නේ, මේ විශ්වවිද්‍යාල එක්ක ගනුදෙනු කරන්නේ. එතකොට කොමිෂන් සභාවට එහෙම බලයක් නැහැ, උපකුලපතිවරයෙකුට හෝ Council එකකට "මෙහෙම කරන්න" කියලා නිර්දේශ කරන්න. යෝජනා කරන්න පුළුවන්. අවසාන වශයෙන් ඒ බලතල තිබෙන්නේ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාට සහ Council එකට. මේක සාකච්ඡා තුළින් සහ එකඟතාව තුළ සිද්ධ විය යුතු දෙයක් නිසා, ඒ වෙනුවෙන් මේ යන්ත්‍රණය තවත් ශක්තිමත් කිරීමටත්, මේ තොරතුරු හා දත්ත මත ප්‍රමාද වී ක්‍රියාත්මක කිරීම තුළින් වෙන්න පුළුවන් හානිය ගැන නිරන්තර සාකච්ඡා කරමින් තමයි, අපට මේක කරන්න වෙන්නේ. විශ්වවිද්‍යාලවල තිබෙන ස්වාධීනත්වයත් අපි රැක ගන්න ඕනෑ. විශ්වවිද්‍යාල උපකුලපතිවරුන් සහ Councilවල ස්වාධීනත්වයත් අපි රැක ගන්න ඕනෑ. නමුත්, public universities හැටියට, බදු

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

මුදලින් පවත්වා ගෙන යන විශ්වවිද්‍යාල හැටියට ජනතාවට වග වෙන විධියට ඒවා පවත්වා ගෙන යා යුතුයි කියන සංවාදය හරහා තමයි අපි මේවා කරගෙන යන්නේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මම පුංචි යෝජනාවක් කරන්න කැමැතියි. ගරු අගමැතිතුමියනි, මේ සමහර ප්‍රශ්නවලට උත්තර සභාගත කිරීම නේ, සිද්ධ වෙන්නේ. මම කියන්නේ, ඔබතුමියගේ ඒවා විතරක් නොවෙයි. මම යෝජනා කරනවා, ඒ ප්‍රශ්නවලට අදාළ උත්තර අපට කලින් ලැබෙනවා නම්, අතුරු ප්‍රශ්න අහන්න අපට පහසුයි කියලා. සමහර විට අපි අහන ප්‍රශ්නයට අදාළ උත්තර ඔබතුමිය සභාගත කරපු ඒවායේ තිබෙන්න පුළුවන්. ඒ නිසා මම ඒ යෝජනාව කරන ගමන්, දෙවැනි අතුරු ප්‍රශ්නය ඔබතුමියගෙන් අහනවා.

අපි දන්නවා, නවක වදය දීම තුළ බොහෝ දරුවන් මිය ගිහින් තිබෙනවා, තුවාල ලැබූ අයත් ඉන්නවා කියන එක. ඒ වාගේම මානසික පීඩාවන්ට ලක් වෙලා ප්‍රතිකාර සඳහා යොමු වෙච්ච අයත් ඉන්නවා. ඒ වාගේම තමයි, විශ්වවිද්‍යාලය හැර යන අයත් ඉන්නවා. ඒ වාගේ අවස්ථාවල තමයි, ඇත්තටම මේ Central Victim Support Committee එක ක්‍රියා කරන්නේ මොන විධියෙන්ද කියන එක වැදගත් වෙන්නේ. ඔබතුමිය පිළිතුරට අදාළ යම් යම් ලේඛන සභාගත කරපු නිසා, ඒවායෙන් ලැබෙන support එක මොකක්ද කියන එක මට දැන ගන්න විධියක් නැහැ. ඒ තොරතුරු ඇති කියලා මා විශ්වාස කරනවා. ඒ පිළිබඳවත් මේ ගරු සභාව දැනුවත් කරනවා නම් හොඳයි.

ඒ වාගේම මා දැන ගන්න කැමැතියි, සමහර වෙලාවට මේ වාගේ සිද්ධි සම්බන්ධයෙන් පොලීසියට ගිහින් පැමිණිලි කරන්නේ, එක්කෝ නවක වදයට ලක් වෙච්ච දරුවා, එහෙම නැත්නම් විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා හෝ ආචාර්ය මණ්ඩලයේ කෙනෙක්. ඒ අය තමයි පොලීසියට ගිහින් ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරන්නේ. එතැනදී පොලීසිය ඒ පැමිණිල්ල ඉදිරියට ගෙනියන්නේ නවක වදය සම්බන්ධයෙන් වන පනත යටතේ නොවෙයි. ඒ තුළ උපකුලපතිවරුන්, ආචාර්යවරුන් හෝ පැමිණිලිකරුවා අනතුරක වැටෙනවා, එහෙම නැත්නම් ගැටලුවකට මුහුණ දෙනවා. ඇතැම් අවස්ථාවල වින්දිතයාට විශ්වවිද්‍යාලයෙන් පරිබාහිරව නීතියේ සහාය අවශ්‍ය වුණොත්, ඒක ලබා දෙන්නට මේ කමිටුවල සහාය අවශ්‍ය වෙනවා. ඒ නිසා මම දැන ගන්න කැමැතියි, ඒකට කුමක් හෝ ක්‍රමවේදයක් තිබෙනවාද කියලා. මොකද, එහෙම නැත්නම් ඒගොල්ලන්ට මේ ප්‍රශ්නයට මැදිහත්වීම තුළ පෞද්ගලික මුදලින් ගෙවලා තමයි නීතියේ සහාය පතන්න වෙලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මෙවැනි දේවල්වලට සහාය වෙන්න තමයි අපි victim support centresවලට අරමුදලක් හදලා තිබෙන්නේ. ඒක අපි පටන් ගත්තේ ගිය අවුරුද්දේ. ගරු කථානායකතුමනි, ඒ කාරණාවලදී නීතිමය කටයුතු සඳහා විතරක් නොවෙයි - සමහර වෙලාවට counseling support අවශ්‍ය වෙනවා - වෙන වෙන විධියේ ආධාරත් අවශ්‍ය වෙන නිසා තමයි, අපි ඒ fund එකක් පටන් ගත්තේ. ඇත්ත වශයෙන්ම මේ committees ක්‍රියාත්මක වෙන්න ඒගොල්ලන්ට guidelines, උපකාර සහ අරමුදලක් දැන් තිබෙනවා. ඒ හරහා තමයි මේ සේවා අපි ලබා දෙන්නේ.

## රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින්: මහපොළ ශිෂ්‍යත්වය සහ ශිෂ්‍යාධාරය
## அரச பல்கலைக்கழகங்களிலுள்ள இளங்கலை மாணவர்கள்: 'மஹபொல' புலமைப்பரிசில் மற்றும் உதவுதொகை
## UNDERGRADUATES IN STATE UNIVERSITIES: MAHAPOLA SCHOLARSHIP AND BURSARY

1036/2025

**16.ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් අතරින් මහපොළ සහ ශිෂ්‍යාධාර දීමනා ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම එක් එක් දීමනාව යටතේ එක් සිසුවෙකුට ලැබෙන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම මුදල් නිසි පරිදි සහ නිසි දිනට සිසුන් වෙත ලබාදීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது இலங்கையின் அரச பல்கலைக்கழகக் கட்டமைப்பில் கல்வி பயிலும் மாணவர்களில், 'மஹபொல' மற்றும் மாணவர் உதவுதொகைக் கொடுப்பனவுகளைப் பெறும் மாணவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(ii) தற்போது மேற்படி ஒவ்வொரு கொடுப்பனவு வகையின் கீழும் ஒரு மாணவருக்குக் கிடைக்கும் தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி தொகைகளைச் சரியான முறையிலும் உரிய திகதியிலும் மாணவர்களுக்கு வழங்குவதற்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of undergraduates currently enrolled in State university system in Sri Lanka who receive the Mahapola Scholarship and bursary payments, separately;

(ii) amount received per student under each of the aforesaid schemes at present, separately; and

(iii) measures taken to ensure that these allowances are disbursed to students duly and on time?

(b) If not, why?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Prime Minister.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| විශ්වවිද්‍යාලය | මහපොළ | ශිෂ්‍යාධාර දීමනා |
|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන විශ්වවිද්‍යාල | 60,221 | 28,271 |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 79 | 347 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 40 | 491 |
| වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | - | *1,433 |
| සාගර විශ්වවිද්‍යාලය | - | *573 |
| ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | - | - |
| එකතුව | 60,380 | 31,115 |

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය හා සාගර විශ්වවිද්‍යාලය හරහා වෘත්තීය අධ්‍යාපනයට ප්‍රවේශ වන අඩු ආදායම්ලාභී සිසුන් සඳහා 2021 අය වැය යෝජනා යටතේ 2021 පෙබරවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි "නිපුණතා සිසු සවිය" නමින් ශිෂ්‍යාධාර ක්‍රමයක් ක්‍රියාත්මක වේ.

(ii) <u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් සඳහා</u>

| විස්තරය | භාණ්ඩාගාර දායකත්ව මුදල (රු.) | මහපොළ අරමුදලේ දායකත්ව මුදල (රු.) | එක් සිසුවෙකුට ලැබෙන මුළු මුදල (රු.) |
|---|---|---|---|
| මහපොළ | 5,200.00 | 4,800.00 | 10,000.00 |
| ශිෂ්‍යාධාර දීමනා | 9,000.00 | - | 9,000.00 |

ශිෂ්‍යාධාර දීමනාව සඳහා භාණ්ඩාගාරයෙන් තමයි සම්පූර්ණ දායකත්වය ලබා දෙන්නේ.

<u>ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය</u>

මහපොළ - රු.7,500

ශිෂ්‍යාධාර - රු.9,000

<u>වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය හා සාගර විශ්වවිද්‍යාලය (නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර ක්‍රමය)</u>

- පාඨමාලාවට නියමිත මාසික අධ්‍යයන පැය ගණනින් 90%ක් හෝ ඊට වැඩි පැය ගණනක් පාඨමාලාව සඳහා සහභාගි වී ඇති බව පැමිණීමේ ලේඛන අනුව අධිකාරිය ලත් බලධරයා සහතික කරන්නේ නම්, එවන් සිසුවෙකු රු.7,500ක් වන සම්පූර්ණ ශිෂ්‍යාධාරය ලැබීමට සුදුසුකම් ලබයි.
- මාසික පැමිණීමේ පැය ගණන, පාඨමාලාව සඳහා නියමිත මාසික පැය ගණනින් 75%-89% දක්වා නම් (75% හා 89% ඇතුළත්ව) එවන් සිසුවෙකු රු.6,500ක ශිෂ්‍යාධාරයක් ලැබීමට සුදුසුකම් ලබයි.
- 75%ට අඩු මාසික පැමිණීමේ පැය ගණනක් සහිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර හිමි නොවේ.

(iii) <u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල සිසුන්, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල සහ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල සිසුන් සඳහා</u>

මහපොළ හා ශිෂ්‍යාධාර දීමනා නිසි පරිදි සිසුන් වෙත ලබා දීම සඳහා එක් එක් මාසයට අවශ්‍ය භාණ්ඩාගාර දායකත්ව මුදල් එම මාසයේ මුල් දිනවල භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට කටයුතු සිදු කිරීම හා එම මුදල් ලැබුණු විගස මහපොළ භාරකාර අරමුදල වෙත හා විශ්වවිද්‍යාල වෙත යොමු කිරීමට කටයුතු කර තිබේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 ජූනි වන විට ප්‍රමාදයක් නැතුව මහපොළ ශිෂ්‍යාධාර ලබා දීමට අපි වැඩකටයුතු කරලා තිබෙනවා.

<u>වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය හා සාගර විශ්වවිද්‍යාලය (නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර ක්‍රමය)</u>

වෘත්තීය පුහුණු ආයතනවලින් කාර්තු පාදක ඇස්තමේන්තු යොමු කිරීමෙන් පසු අදාළ අක් මුදල් වෘත්තීය පුහුණු ආයතන වෙත ලබා දී මාසිකව සිසුන්ගේ බැංකු ගිණුම් වෙත ශිෂ්‍යාධාර මුදල් බැර කිරීම සිදු කරනු ලබයි.

(ආ) පැන නොනඟී.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ස්තුතියි, ගරු අග්‍රාමාත්‍යතුමියනි.

මම ඔබතුමිය දැනුවත් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. සාමාන්‍යයෙන් අවුරුද්දක් විතර යනවා, first-year ළමයින්ට මහපොළ ශිෂ්‍යාධාරය ලැබෙන්න. ඒ නිසා ඒ ළමයින්ට පළමුවැනි අවුරුද්ද තුළදී සෑහෙන දුක් විඳින්න වෙනවා, ජීවත් වෙන්න.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

හැබැයි, තව වෙනකල් first-year ළමයින්ටත්, final-year ළමයින්ටත් එය ලැබී නැති බවට විශ්වවිද්‍යාල කිහිපයක් එක්ක කථා කරනකොට තොරතුරු ලැබී තිබෙනවා. ඔබතුමිය (iii) වැනි ප්‍රශ්නයට උත්තර දෙමින් කිව්වා, ජුනි මාසය වෙනකොට ශිෂ්‍යාධාර දෙන්න කටයුතු කරලා තිබෙනවාය කියලා. ඒ නිසා ඒ පිළිබඳව සොයා බලන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු අග්‍රාමාත්‍යතුමියනි. ඔබතුමිය දන්නවා, මහපොළ ශිෂ්‍යාධාරය දෙනකොට බලන නිර්ණායක තිබෙන බව. ඒ නිර්ණායක අනුව යම් දරුවෙකුගේ දෙමව්පියන්ගෙන් එක් අයෙක් රජයේ සේවයේ නියුතු නම්, ඒ දරුවාට ශිෂ්‍යාධාර හිමි නැහැ. අපි දන්නවා, දරුවන් තුන්දෙනෙක් ඉන්න දෙමව්පියන්ට ඒ දරුවන් තුන්දෙනාම නොවෙයි එක දරුවෙක් විශ්වවිද්‍යාලයට ගියත් රජයේ සේවය කරලා ඒ අයව නඩත්තු කරන්න අමාරුයි, මේ පවතින උද්ධමනයත් එක්ක. මොකද, ඒ දෙමව්පියන්ගෙන් එක්කෙනෙක් ගුරුවරයෙක් වෙන්න පුළුවන්, පොලිස් නිලධාරියෙක් වෙන්න පුළුවන්, නැත්නම් ලිපිකරුවෙක් වෙන්න පුළුවන්. ඒ අය කියනවා, ඒ අයට ඒ දරුවන්ගේ වියදම් දරන්න හරි අමාරුයි කියලා. ඒ නිසා මම ඔබතුමියගෙන් අහනවා, ඒ නිර්ණායකය, දෙමව්පියන්ගෙන් එක්කෙනෙක් රජයේ සේවකයෙකු වීම තුළ ඒ දරුවන්ට මහපොළ ශිෂ්‍යාධාරය ලබා ගැනීමට තිබෙන ඒ බාධාව නැති කරන්න ක්‍රියාමාර්ගයක් ගන්නවාද කියලා. ඒ වාගේම මේ උද්ධමනයත් එක්ක ඒක එසේ විය යුතුයි කියලා මා හිතනවා. ඒ අනුව ළමයින් ප්‍රමාණයත් ඉදිරියේදී වැඩි වෙන්න ඉඩ තිබෙනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රජය යටතේ මහපොළ ශිෂ්‍යාධාරය දෙගුණයක් කළා. මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 10,000ක් කළේ, අපේ ආණ්ඩුව. එතෙක් කල් ළමුන්ට ලැබුණේ, රුපියල් 4,000ක වාගේ මුදලක්. අපි පළමුවැනි අවුරුද්දේදී රුපියල් 7,500ක් දක්වා වැඩි කළා; දෙවැනි අවුරුද්දේදී රුපියල් 10,000ක් කළා. ඒ අනුව රුපියල් 4,000ට තිබුණු ශිෂ්‍යාධාරය අපි දැන් රුපියල් 10,000ක් දක්වා වැඩි කරලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉදිරියටත් සුදුසු අවස්ථාවලදී අපි අනිවාර්යයෙන්ම ඒක අවශ්‍ය පරිදි සංශෝධනය කරන්න සූදානම්.

එතුමියත් කියූ පරිදි, විශ්වවිද්‍යාලයේ පළමු වසරේ දරුවන්ට එය ලබා ගැනීමේ යම් පමාවක් සිදු වන බව අපි දන්නවා. මොකද, ඒ ළමයින් register වෙලා ඒ තොරතුරු මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට ලැබෙන්න යම් කාලයක් ගන්නා නිසා යම් ප්‍රමාදයක් ඇති වෙනවා. ඒ ප්‍රමාදය පුළුවන් තරම් අඩු කිරීම සඳහා අපි කටයුතු කරගෙන යනවා. මහපොළ අරමුදලත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමත්, විශ්වවිද්‍යාලත් සමඟ අපි සාකච්ඡා කරමින් යනවා, ඒ සඳහා ගත වන කාලය තවත් අඩු කර ගැනීම සම්බන්ධයෙන්. ඒ ගත වන කාලය අඩු කරලා, ඒ ප්‍රමාදය වළක්වා, ඒ අරමුදලින් ලබා දිය යුතු දීමනාව ලබා දෙන්න අපි වැඩ කටයුතු කරමින් යනවා. මේ delay වීම අවුරුදු ගණනාවක් තිස්සේ තිබුණා. විශ්වවිද්‍යාලයේ පළමුවන අවුරුද්දේ ළමයින්ට විතරක් නොවෙයි, දෙවන, තුන්වන, හතරවන වසරවල ළමයින්ටත් මහපොළ ශිෂ්‍යාධාර දීමනා ලබා දීම delay වෙලායි තිබුණේ. දැන් delay එකක් නැතුව අපි එය ලබා දෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු අගමැතිතුමියනි, මා ඔබතුමියගෙන් ඇසූ ප්‍රශ්නය ඒක නොවෙයි. රජයේ සේවයේ නියුතු දෙමව්පියන්ගේ දරුවන් සම්බන්ධයෙන් තිබෙනවා නේ, නිර්ණායකයක්. දෙමව්පියන්ගෙන් එක් අයෙකු හෝ රජයේ සේවයේ නියුතු නම්, ඒ දරුවාට ඒ ශිෂ්‍යාධාර දීමනාව ලැබෙන්නේ නැහැ. එය ඉවත් කරන්න පුළුවන් ක්‍රමවේදයක් තිබෙනවාද කියා මම අහනවා. මොකද, රජයේ සේවකයෙකුට දරුවන් දෙන්නෙකු තුන්දෙනෙකු නොවෙයි එක දරුවෙකු හිටියත් කටයුතු කර ගන්න අමාරුයි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප ඒ කාරණාව සාකච්ඡාවට අරගෙනයි තිබෙන්නේ. ආදායම මත, ඒ කියන්නේ දෙමව්පියන්ගේ රැකියාව නොසලකා ආදායම මත මේ තෝරා ගැනීම සිදු කිරීම පිළිබඳව අපි සාකච්ඡා කරමින් යනවා. මහපොළ අරමුදලත් ඒක යෝජනා කරලා තිබෙනවා. අපිත් පිළිගන්නවා, එතැන ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඉදිරියේදී එය විසඳන්න අපි උත්සාහ කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය ගරු විපක්ෂ නායකතුමා අහනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු අගමැතිතුමියනි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියනවා මැයි මාසයේ සියයට 5.5ක්ව පැවැති වසරින් වසර ප්‍රධාන උද්ධමනය - year-on-year headline inflation - ජුනි මාසයේදී සියයට 6.8 දක්වා වැඩි වෙලා තිබෙනවා කියලා. එහෙම නම් මාසයක් ඇතුළත උද්ධමනය සියයට 1.3කින් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියනවා, 2026 මැයි මාසය වන කොට එක පුද්ගලයෙකුට දින 30ක් ජීවත් වෙන්න රුපියල් 17,315ක් ප්‍රමාණවත් කියලා. නමුත් මම දන්නේ නැහැ, මේ ගණනය කිරීම කොහෙන් කර තිබෙනවාද කියලා. මම නම් ඒක පිළිගන්නේ නැහැ. මම අහන්න කැමැතියි, මේ විධියට උද්ධමනය ඉහළ යෑම හමුවේ ඔය කියපු ප්‍රමාණයෙන් මහපොළ ශිෂ්‍යාධාර දීමනාව වැඩි කිරීම ප්‍රමාණවත් වන්නේ කොහොමද කියලා. ඇත්ත වශයෙන්ම විශ්වවිද්‍යාල දූ දරුවන්ට පමණක් නොවෙයි, රටේ සමස්ත ජනතාවටම මේ වැඩි වී තිබෙන ජීවන බර, මේ පීඩනය, අසහනය හේතුවෙන් ඉතාම දුෂ්කර ජීවිතයක් ගත කරන්න සිදු වෙලා තිබෙනවා. එක පැත්තකින්, වසරෙන් වසර ප්‍රධාන උද්ධමනය - year-on-year headline inflation - වැඩි වීම වේගවත් වෙලා තිබෙනවා. මැයි මාසයේ සියයට 5.5ක්ව පැවැති එය ජුනි මාසයේ සියයට 6.8ක් දක්වා සියයට 1.3කින් වැඩි වීම හමුවේ මහපොළ ශිෂ්‍යාධාර ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් පමණක් නොව, රටේම ජනතාව ජීවත් වන්නේ කොහොමද කියලා කල්පනා කර බලන්න. නමුත්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියනවා, දින 30ක් ජීවත් වෙන්න රුපියල් 17,315ක් ප්‍රමාණවත් කියලා. ගරු අගමැතිතුමියනි, මම ඔබතුමියගෙන් අහන්න කැමැතියි, ඔබතුමිය ඒක පිළිගන්නවාද කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මූලික ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ මහපොළ අරමුදල පිළිබඳවයි. Inflation එක පිළිබඳව විවාදයක් ගන්න ඕනෑ නම්, ඒක වෙනම ගනිමු. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ උද්ධමනය සියයට 70ට ගිය කාලයේත් මහපොළ ශිෂ්‍යාධාර වශයෙන් දුන්නේ රුපියල් 4,000යි. අපි ඒක දෙගුණයක් කරලා තිබෙනවා. අපේ කාලයේ උද්ධමනය සියයට 70ක් වුණේ නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් අපි ඒ මුදල දෙගුණයක් කරලා තිබෙනවා, වසර දෙකක් තුළ. මම මේ ප්‍රශ්නයට ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියටත් උත්තර දුන්නා. මට කියන්න තිබෙන්නේ එච්චරයි. අපි ඒ දීමනාව දෙගුණයක් කරලා තිබෙනවා, වසර දෙකක් ඇතුළත. ඉදිරියටත් අවශ්‍ය පරිදි එය සංශෝධනය කරන්න අපි සූදානම්. මීට පෙර, මීට වඩා උද්ධමනය තිබුණ කාලයක සත පහකින් වැඩි කරපු නැති මහපොළ ශිෂ්‍යාධාර දීමනාව අපි සියයට සියයක් වැඩි කරලායි තිබෙන්නේ. අපේ ප්‍රවේශය මොකක්ද කියලා මේ රටේ ජනතාවට ඒකෙන්ම තේරුම් ගන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of Opposition, what is your point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රශ්නය වශයෙන් ඇහුවේ මහපොළ,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
( மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

What is your point of Order, Hon. Leader of Opposition? The Hon. Prime Minister has answered that Question.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Yes, Hon. Deputy Speaker. I am trying to clarify. උද්ධමනය සියයට 70ක් වුණු අවස්ථාව සම්බන්ධයෙන් අපට වග කියන්න බැහැ. එතැන වෙනත් ආණ්ඩුවක් ක්‍රියාත්මක වුණේ. මම ගරු අගමැතිතුමියගෙන් පැහැදිලිව අහන්න කැමැතියි, රුපියල් 17,315කින් අපේ රටේ පුද්ගලයෙකුට දින 30ක් ජීවත් වෙන්න පුළුවන් කියා ඔබතුමිය විශ්වාස කරනවාද කියලා. ඔබතුමිය ඒක විශ්වාස කරනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක point of Order එකක් නොවෙයි. මම උත්තර බඳින්න අවශ්‍ය නැහැ, ඒකට. මා විශ්වාස කරන දේ මෙතැනට අදාළ නැහැ. අපට අවශ්‍ය වන්නේ දත්ත සහ ප්‍රතිපත්ති මත තීන්දු ගැනීමයි. ඉතින්, මා විශ්වාස කරන දේ මත නොවෙයි නේ අප තීන්දු තීරණ ගන්නේ. අප තීන්දු තීරණ ගන්නේ ප්‍රතිපත්ති, දත්ත සහ විද්‍යාත්මක කරුණු මතයි.

බොහොම ස්තුතියි.

## අධ්‍යාපනවේදී උපාධි පිරිනමන රාජ්‍ය සහ රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන: විස්තර
## கல்விமாணிப் பட்டமளிக்கும் அரச மற்றும் அரச சார்பற்ற கல்வி நிறுவனங்கள்: விபரம்
## STATE AND NON-STATE INSTITUTIONS AWARDING BACHELOR OF EDUCATION DEGREES: DETAILS

1883/2026

**17.ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනවේදී උපාධිය පිරිනමන රාජ්‍ය අධ්‍යාපන ආයතන කවරේද;

(ii) එම උපාධිය පිරිනමන රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන කවරේද;

(iii) රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලින් පිරිනමන අධ්‍යාපනවේදී උපාධිය ගුරු සේවයට බඳවා ගැනීමේදී සමානව සලකන්නේද;

(iv) නො එසේ නම්, ඒ මන්ද;

(v) රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලින් පිරිනමන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා කාලය හා අන්තර්ගතය සමාන වන්නේද;

(vi) නො එසේ නම්, ඒ මන්ද;

(vii) අදාළ ආයතන මඟින් පිරිනමන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවට ප්‍රායෝගික ඉගැන්වීමේ පුහුණුවක් අනිවාර්ය වන්නේද;

(viii) එසේ නම්, එම කාලය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் கல்விமாணிப் பட்டமளிக்கும் அரசாங்க கல்வி நிறுவனங்கள் யாவை;

(ii) மேற்படி பட்டமளிப்பிற்கான அரச சார்பற்ற கல்வி நிறுவனங்கள் யாவை;

(iii) அரச மற்றும் அரச சார்பற்ற நிறுவனங்களால் வழங்கப்படும் கல்விமாணிப் பட்டமானது ஆசிரியர் சேவைக்கான ஆட்சேர்ப்பின்போது சமமானதாகக் கருதப்படுகின்றதா;

(iv) இன்றேல், ஏன்;

(v) அரச மற்றும் அரச சார்பற்ற நிறுவனங்களால் வழங்கப்படும் கல்விமாணிப் பட்டப்படிப் பிற்கான கற்கைநெறிக் காலப்பகுதியும் உள்ளடக்கமும் சமமானதா;

(vi) இன்றேல், ஏன்;

[ගරු සුනිල් රාජපක්ෂ මහතා]

(vii) குறிப்பிட்ட நிறுவனங்களால் வழங்கப்படும் கல்விமாணிப் பட்டப்படிப்பிற்கான கற்கை நெறியில் செய்முறைக் கற்பித்தலுக்கான பயிற்சி கட்டாயமானதா;

(viii) ஆமெனில், அதற்கான காலப்பகுதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the State educational institutions in Sri Lanka that offer Bachelor of Education Degree;

(ii) the non-State educational institutions that offer the said degree;

(iii) whether the Bachelor of Education Degrees offered by State and non-State institutions are recognized as equivalent in the recruitment of teachers;

(iv) if not, why;

(v) whether the duration and content of the Bachelor of Education courses offered by State and non-State institutions are the same;

(vi) if not, why;

(vii) whether completion of a practical teacher training is mandatory for the Bachelor of Education Degree programmes offered by the relevant institutions; and

(viii) if so, the duration of the said training?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)
- කොළඹ විශ්වවිද්‍යාලය
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

(ii) අධ්‍යාපනවේදී උපාධිය ප්‍රදානය කරනු ලබන උසස් අධ්‍යාපන අංශය යටතේ නියාමනය වන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය යටතේ පිහිටුවා ඇති උපාධි පිරිනැමීමේ ආයතන 09කි.

- Sri Lanka Institute of Information Technology (Guarantee) Limited (SLIIT)
- CINEC Campus (Pvt.) Limited
- Horizon College of Business & Technology (Pvt.) Limited
- KIU Campus (Pvt.) Limited
- Aquinas College of Higher Studies
- Benedict XVI Catholic International Institute of Higher Education
- Royal Institute of Colombo (Private) Limited
- The Gateway College (Private) Limited
- The Lyceum Campus (Private) Limited

<u>**විදේශ විශ්වවිද්‍යාල**</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/92 ප්‍රකාරව විදේශීය විශ්වවිද්‍යාල පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල වාර්ෂික ප්‍රකාශනයේ - Commonwealth University Yearbookහි - හෝ ලෝක උසස් අධ්‍යාපන දත්ත පද්ධතියේ -World Higher Education Databaseහි - අන්තර්ගත වීම මත එම විශ්වවිද්‍යාල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනමන විශ්වවිද්‍යාල/ආයතන ලෙස සලකනු ලබන බවට ලිපි මඟින් තහවුරු කර ඇති විශ්වවිද්‍යාල.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/92 හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 යටතේ උපාධි සහතික පිළිගැනීම පිළිබඳව ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ. ඒ අනුව අංක 1885/38 හා 2014.10.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ වන ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවෙහි 13.8 වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි පිරිනමනු ලබන ආයතනයකින් පිරිනමනු ලබන අධ්‍යාපනවේදී උපාධි සහිත ඕනෑම උපාධිධාරියෙකු සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසුකම් පරීක්ෂා කර පසුව ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා, පවතින පුරප්පාඩු අනුව සුදුසුකම් ලබන්නේ නම් විෂයානුබද්ධව ගුරු සේවයේ 2-II ශ්‍රේණියට බඳවා ගැනීම සිදු කරයි. මෙම බඳවාගැනීම් සිදු කරනු ලබන්නේ දැනට බල පැවැත්වෙන ගුරු සේවා ව්‍යවස්ථාවෙහි පවතින ප්‍රතිපාදන යටතේ බව ද සඳහන් කරමි.

(iv) පැන නොනඟී.

(v) මෙම පාඨමාලා කාලය හා අන්තර්ගතය පිළිබඳව අංක (i) හා (ii) යටතේ සඳහන් උපාධි පිරිනමන විශ්වවිද්‍යාල හා ආයතන සඳහා පමණක් පහත පරිදි පිළිතුරු ඉදිරිපත් කරමි.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 (අ) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන, උපාධි පිරිනැමීමේ ආයතන මඟින් ලබාදෙන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවක අධ්‍යයන කාලය වසර 4කි. මෙය සාමාන්‍යයෙන් රාජ්‍ය විශ්වවිද්‍යාලයක් මඟින් පිරිනමනු ලබන උපාධියක අධ්‍යයන කාල සීමාවට සමාන වන අතර, අන්තර්ගතයද ජාතික අධ්‍යාපන ආයතනයේ නියෝජිතයෙකු සහිතව පත් කරන ලද සමාලෝචන කමිටුවක් මඟින් සකසන ලද විෂය

නිර්දේශයකි. එසේම මෙම උපාධි පාඨමාලා සියල්ලක්ම ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුව - SLQF - යටතේ පවතින අධ්‍යයන සම්භාර අනුව සකස් කර ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා ගැනීමේ කටයුතු සිදු කරන නමුත්, (සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණ) පවතින ක්‍රමය මඟින් බඳවා ගන්නා අධ්‍යාපනවේදී උපාධිධාරීන් අතරින් විදේශීය විශ්වවිද්‍යාලවලින් ලබාගත් උපාධිවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් මතවාද ගොඩ නැඟී ඇත. එසේ වුවද එය මැන බැලීම සඳහා එකී උපාධිවලට අදාළ පාඨමාලා තොරතුරු ප්‍රමාණවත් නොවීම හා ඒවා නියාමනයට ප්‍රතිපාදන නොවන බවත්, එය හඳුනා ගැනීමෙන් අනතුරුව එම උපාධිවල අධ්‍යයන කාල සීමාව, ඒවායේ අන්තර්ගතය හා ගුරු පුහුණුව ආදී නිර්ණායක සම්බන්ධයෙන් අධ්‍යාපනවේදී උපාධියක තිබිය යුතු සම්මත සැලකිල්ලට ගනිමින් ඒ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ජාතික අධ්‍යාපන ආයතනය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ආදී පාර්ශ්ව සමඟ සාකච්ඡා කර සුදුසු බඳවා ගැනීමේ නිර්ණායක හා ක්‍රමයක් සකස් කිරීමට සැලසුම් කර ඇත. (කමිටු දෙකක් මඟින් නිර්දේශ ලබා දී ඇත.) එකී කමිටු නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය වෙත යොමු කිරීමට කටයුතු සිදු කර ඇති අතර එම අනුමැතිය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත.

(vi) පැන නොනඟී.

(vii) ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවට අනුව අධ්‍යාපනවේදී උපාධිධාරීන් අනෙකුත් උපාධිධාරීන්ට වඩා ඉහළ ශ්‍රේණියක පිහිටුවීමට ඔවුන් සතු ගුරු පුහුණුවද පාදක කර ගෙන ඇත. රජයේ විශ්වවිද්‍යාලවල මෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 (අ) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් පිළිගත්, "උපාධි පිරිනැමීමේ ආයතන" මඟින් පිරිනමනු ලබන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවල ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණු සංරචක අන්තර්ගත වේ.

තවද ඉහත (i) හි දක්වන ලද විශ්වවිද්‍යාල හා (ii) පිළිතුරු යටතේ දක්වා ඇති විශ්වවිද්‍යාල පනතේ 25 (අ) වගන්තිය අනුව පිහිටුවා ඇති ආයතන සඳහා ඉහත පරිදි ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණු සංරචක ඇති බව නිරීක්ෂණය වේ. එහෙත් අධ්‍යාපනවේදී උපාධිය ලබා දෙන අනෙකුත් විශ්වවිද්‍යාල, ආයතන හෝ විදේශීය විශ්වවිද්‍යාල මඟින් ඉහත පරිදි ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන බවට නියාමනය කිරීමේ ක්‍රමයක් අමාත්‍යාංශය සතුව නොමැත.

විශ්වවිද්‍යාල හා ආයතන යටතට සලකා නොබැලෙන අනෙකුත් විශ්වවිද්‍යාල හෝ අධ්‍යාපන ආයතන සම්බන්ධ තොරතුරු නිරීක්ෂණය නොවන අතර, එකී විශ්වවිද්‍යාල හෝ ආයතන වෙතින් උපාධි ලබන අය සඳහා ගුරු පුහුණුව ලබාදීමට රජයේ පාසල් ලබාදීමේ ක්‍රමයක් අමාත්‍යාංශය සතුව නොමැත.

(viii) අවම සති දෙකක කාලයක් පුහුණුව ලැබිය යුතුය.

(ආ) පැන නොනඟී.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අධ්‍යාපනවේදී උපාධිධාරීන් කියන්නේ අධ්‍යාපනය පිළිබඳව පුහුණුව ලත් උපාධිධාරීන්. ප්‍රථම උපාධිය විතරක් තිබෙන කෙනෙක් ගුරු සේවයට බැඳුණොත් එක්කෝ අවුරුදු 5ක් ගියාට පස්සේ තමයි 2(II) ශ්‍රේණියට යන්නේ. එහෙම නැත්නම් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සම්පූර්ණ කළාට පස්සේ 2(II) ශ්‍රේණියට යනවා. නමුත් අධ්‍යාපනවේදී උපාධිය තිබෙන කට්ටිය බඳවා ගන්නේම ගුරු සේවයේ 2(II) ශ්‍රේණියට. එයින් අදහස් කරන්නේ ඒ කට්ටිය ඉගැන්වීමේ පුහුණුව ලද අය කියන එක.

එහෙම බඳවා ගන්නවා නම් රාජ්‍ය අංශයෙන් සහ පෞද්ගලික අංශයෙන් ලබා ගන්නා උපාධියේ ගුණාත්මකභාවය සමාන බවට පත් වෙන්න ඕනෑ. එතැනදී අපට පාඨමාලාවේ අන්තර්ගතය, පාඨමාලා කාලය, එහි තිබෙන course work වාගේ දේවල් සලකා බලන්න වෙනවා. කොළඹ විශ්වවිද්‍යාලය වාගේ රාජ්‍ය විශ්වවිද්‍යාලයකට ගන්නවා නම් උසස් පෙළ Z-score එක මත තමයි බඳවා ගන්නේ. ඊට පස්සේ පළමුවෙනි අවුරුද්ද ගියාට පස්සේ තමයි විශේෂ පාඨමාලාවට තෝරා ගන්නේ. එතකොට ඒ තේරීමට යම් සම්භාවිතාවක් තිබෙනවා.

නමුත්, A/L කරන්නේ නැතුව, O/L වලින් පස්සේ පදනම් පාඨමාලාව කරලාත් පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙන්න පුළුවන්. එහෙම අයත් මෙම පාඨමාලාව කළොත් quality එක පිළිබඳ ගැටලුවක් ඇති වනවා. එහෙම නම්, ඉහළ වැටුප් තලයකට quality එකෙන් අඩු කෙනෙක් බඳවා ගැනීම වැළැක්වීම සඳහා අපි ගන්නා ක්‍රියාමාර්ග මොනවාද? ඒ සඳහා අඩු ගණනේ බඳවා ගැනීමේ පටිපාටිය ආදියෙනුත් අපි පාලනයක් ඇති කර ගන්න ඕනෑ. ඒ සඳහා ඇති ක්‍රියාමාර්ග මොනවාද කියලා මම අහන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වන විට අධ්‍යාපනවේදී උපාධි පිරිනමන categories තුනක් තිබෙනවා. එකක්, රජයේ විශ්වවිද්‍යාල. ඊළඟ එක, රජයේ අනුමත පිළිගත්ත රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල. තුන්වන category එක තමයි, ජාත්‍යන්තර අධ්‍යාපනය. ඒ කියන්නේ transnational education කියන category එක යටතේ උපාධිය ලබා ගන්න කොටස. එතකොට දැන් ඇති වෙලා තිබෙන ගැටලුව මේකයි. මෙහෙම කාණ්ඩ තුනක් තිබුණාට පවතින බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ - අපි ගුරු ව්‍යවස්ථාව ගත්තත් - ඒ කාණ්ඩ තුන අතර වෙනසක් කරන්න අපට අවස්ථාවක් නැහැ. දැනට පවතින ව්‍යවස්ථාව හෝ නීතිය අනුව එක කට්ටියක් විතරක් බඳවා ගන්න ක්‍රමයක් නැහැ. එතැන තමයි ගැටලුව පැන නැඟිලා තිබෙන්නේ. ඒ නිසා තමයි මම කියපු දෙවන කණ්ඩායමේ, රජය පිළිගත්ත රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවල උපාධියේ ගුණාත්මකභාවය ගැන වගකීම අමාත්‍යාංශය ගන්න ඕනෑ. නමුත්, transnational education කියන කාණ්ඩය පිළිබඳව තවම අපට ක්‍රමයක් නැහැ, ඒකේ ගුණාත්මකභාවය මනින්නවත්. ඒකටත් අපි ක්‍රියාවලියක් යෝජනා කරමින් තිබෙනවා. නමුත්, ඒකට යම් කාලයක් ගත වනවා. ඒ අතරතුර තමයි මේ ගැටලුවට අපට විසඳුමක් ලබා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිසමට නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

ඒවා අපි කමිටුවක් හරහා ලබා ගත් නිර්දේශ. ඒ කියන්නේ, මේ තත්ත්වය තේරුම් අරගෙන, ගුරු ව්‍යවස්ථාවේ තිබෙන ඒ gap එකත් හඳුනාගෙන මේ මොහොතට අපට විසඳුමක් අවශ්‍යයි කියන එක අපි රාජ්‍ය සේවා කොමිසමට දැනුම් දීලා තිබෙනවා. ඉතින්, අපි බලාපොරොත්තු වනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තත්ත්වය තේරුම් අරගෙන රාජ්‍ය සේවා කොමිසම අපට ඒ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවසර දෙයි කියලා.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් අහන්නේ, දැනට අධ්‍යාපනවේදී උපාධිය සමත් අය පිළිබඳව.

මේ වනකොට අධ්‍යාපනවේදී උපාධිය සමත්ව තවම ගුරු පත්වීමක් නොලැබුණු පිරිසක් පද්ධතියේ රැඳිලා ඉන්නවා. ඒ අයට එතැනදී අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. එකම campus එකෙන් උපාධිය ගත්ත දකුණු පළාතේ සහ බස්නාහිර පළාතේ පදිංචි අයට දැන් පත්වීම් හම්බ වෙලා. ඒ කට්ටිය අවුරුද්දක් විතර සේවයේ ඉන්නවා. ඒ සමාන උපාධි ගත්ත කොටසක් - අනෙකුත් පළාත්වල පදිංචි අය - පත්වීමක් නැතුව ඉන්නවා. අන්න ඒ අය පළාත් සභා මට්ටමින් හෝ ජාතික මට්ටමින් මේ සේවයට එක් කිරීම සඳහා වැඩ පිළිවෙළක් අවශ්‍යයි. නැත්නම් අපරාධයක්. මොකද, ඒ අය වෙනුවෙන් රජය සෑහෙන ආයෝජනයක් කරලා තිබෙනවා. ඒ ආයෝජනය අපරාදේ. ගරු පුහුණුව ලත් උපාධිධාරීන් සේවයේ නොයොදා තිබීම ම රටට පාඩුවක්. ඒ සඳහා තිබෙන වැඩ පිළිවෙළ කුමක්ද කියලා මම අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මේ මතු කළේ ඇත්තටම සංවේදී ප්‍රශ්නයක්. එතැන බරපතළ ගැටලුවක් තිබෙනවා. ඒ උපාධිධාරීන්ට අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. අපි ඒක පිළිගන්න වනවා. නමුත්, ඔබතුමාත් දන්නා විධියට ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රියාවලියම නඩු හබ ගණනාවක් ඔස්සේ තමයි ක්‍රියාත්මක කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අපි අවුරුදු එකහමාරක් තිස්සේ උත්සාහ කළා ඒ නඩු ටික බේරාගෙන ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන්න. අවාසනාවකට, මේ නඩු තිබෙන අතරේ යම් පළාත් සභා හිතුමතේ තීන්දු තීරණ අරගෙන තිබෙනවා. ඒ තීන්දු තීරණ ඒ වෙලාවේ ගත්තාට, ඇත්ත වශයෙන්ම ඒවා නිවැරදි තීරණ නොවෙයි කියන එක අපට ගරු අධිකරණයෙන් දැනුම් දීලා තිබෙනවා. එතකොට, ඒ දැනුම් දීම තිබෙද්දී අපට ආයෙත් ඒ වැරැද්ද කරන්න බැහැ. ඒ නිසා තමයි අපි අධිකරණයේ හැප්පි හැප්පි තිබුණු මේ කාරණය විසඳා ගන්න මේ අවුරුද්දේ සමත් වෙලා තිබෙන්නේ. එතකොට ඒ ක්‍රියාවලිය තුළ තමයි අපට මේ අධ්‍යාපනවේදීන්ටත් සාධාරණයක් ලබා දෙන්න පුළුවන් වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත්, මෙතැන අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා කියන එකට මමත් එකඟ වෙනවා. ඒක නැහැයි කියලා අපට කියන්න බැහැ. හැබැයි, මේක ඉතා සංකීර්ණ තත්ත්වයක්. අපට තිබෙන ක්‍රමවේද, තිබෙන නීති, තිබෙන ව්‍යවස්ථා තුළ තමයි මේවාට විසඳුම් හොයන්න වෙන්නේ. නීතිය කඩලා, අපට මේවා කරන්න බැහැ. ඒ නිසා තමයි අපි මේ වෙලාවේ සුදුසුම ක්‍රියාමාර්ග ගන්න අවශ්‍ය උපරිම උත්සාහය ගන්නේ.

## විදෙස් රටවල ක්‍රියාත්මක සමාජ ආරක්ෂණ ක්‍රමවේද සඳහා දායක වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ මුදල්: නැවත ලබා ගැනීමේ ක්‍රමවේදය
## வெளிநாடுகளில் உள்ள சமூகப் பாதுகாப்பு முறைமைகளுக்குப் புலம்பெயர் தொழிலாளர்கள் நல்கும் பங்களிப்புகள்: மீளப் பெறும் நடைமுறை
## CONTRIBUTIONS MADE BY MIGRANT WORKERS TO SOCIAL SECURITY SYSTEMS IN FOREIGN COUNTRIES: RECLAMATION PROCEDURE

944/2025

**18. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට විදේශ රැකියාවල නිරත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සංඛ්‍යාව එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ශ්‍රමිකයින් අතරින්, අදාළ රටවල ක්‍රියාත්මක සමාජ ආරක්ෂණ ක්‍රමවේදවලට දායක වන පිරිස කොපමණද;

(iii) ඔවුන් සේවා කාලය නිමකර මෙරටට ආපසු පැමිණීමේදී, එම මුදල් නැවත ලබා ගැනීම පිළිබඳව ගැටලු මතුවී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, එම ගැටලු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது வெளிநாட்டு வேலைவாய்ப்புகளில் ஈடுபட்டுள்ள இலங்கைத் தொழிலாளர்களின் எண்ணிக்கை நாடு வாரியாக யாது;

(ii) மேற்படி தொழிலாளர்களில், அந்தந்த நாடுகளில் நடைமுறையில் உள்ள சமூகப் பாதுகாப்பு முறைமைகளில் பங்களிப்பு நல்குவோரின் எண்ணிக்கை யாது;

(iii) அவர்கள் தமது சேவைக் காலத்தை நிறைவு செய்து நாடு திரும்புகையில், மேற்படி பணத்தை மீளப் பெற்றுக்கொள்வதில் சிக்கல்கள் ஏற்பட்டுள்ளமை குறித்து அறிவாரா;

(iv) ஆமெனில், குறிப்பிட்ட பிரச்சினைகளைத் தீர்ப்பதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the number of Sri Lankan migrant workers currently employed abroad, separately according to each country;

(ii) the number of workers, out of those, who contribute to the social security systems implemented in the respective countries;

(iii) whether he is aware that issues have arisen regarding the reclamation of those funds when they return to this country upon completion of their service period; and

(iv) if so, the steps that will be taken to resolve those issues?

(b) If not, why?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2026.06.19 දින වනවිට ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල රැකියා හා සුබසාධන අංශ ක්‍රියාත්මක වන රටවල්හි විදේශ රැකියාවල නිරත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සංඛ්‍යාව, පහත සඳහන් පරිදි වෙන් වෙන් වශයෙන් දක්වා තිබෙනවා.

| අනු අංක | රට | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 350,000 |
| 2 | බහරේනය | 11,495 |
| 3 | සයිප්‍රසය | 9,718 |
| 4 | ඊශ්‍රායලය | 31,574 |
| 5 | ජෝර්දානය | 10,669 |
| 6 | කුවේට් රාජ්‍යය | 175,000 |
| 7 | ලෙබනනය | 4,519 |
| 8 | මැලේසියාව | 5,900 |
| 9 | මාලදිවයින | 21,911 |
| 10 | ඕමානය | 25,042 |
| 11 | කටාර් රාජ්‍යය | 140,000 |
| 12 | සෞදි අරාබිය | 248,000 |
| 13 | සිංගප්පූරුව | 11,791 |
| 14 | දකුණු කොරියාව | 31,044 |
| **එකතුව** | | **1,076,663** |

දළ වශයෙන් ගත්තොත්, 1,076,663ක් ලියාපදිංචි ශ්‍රමිකයන් විධියට අපි හඳුනා ගන්නවා. ඒ වාගේම, 185,765ක් අපේ labour section නැති රටවල ලියාපදිංචි වෙලා ඉන්නවා. ඒක තමයි සමස්ත සංඛ්‍යාව විධියට අපි දකින්නේ.

(ii) සමාජ ආරක්ෂණ ක්‍රමවේදය - social security systems - තිබෙන රටවල් විධියට අපි ගත්තොත්, සයිප්‍රසය, ජෝර්දානය, මැලේසියාව, කටාර් රාජ්‍යය, සෞදි අරාබිය වාගේ රටවල්වල තිබෙනවා. ඒ වාගේම තමයි සමහර රටවල්වල විශේෂයක් විධියට විදේශ ශ්‍රමිකයන්ටම අදාළ සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් නැහැ. නමුත්, ඒ රටේ තිබෙන domestic ක්‍රමවේදයත් එක්ක බද්ධ වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතැනදී ගත්තොත්, දකුණු කොරියාවේ තිබෙනවා, National Pension Service කියලා scheme එකක්. ඒ වාගේම, National Health Insurance කියලා තව එකක් තිබෙනවා. එතැනදී National Pension Service කියන කාණ්ඩය යටතේ 23,999ක්, ඒ වාගේම National Health Insurance කාණ්ඩය යටතේ 31,444ක් ලියාපදිංචි වෙලා ඉන්නවා. ඒ වාගේම එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කුවේට්, ලෙබනන්, මාලදිවයින වාගේ රටවල් ගත්තොත්, විදේශ ශ්‍රමිකයන්ට අදාළ වෙනම dedicated social security schemes නැති රටවල් විධියට තමයි අපි හඳුනා ගන්නේ.

(iii) ඔව්, මෙතැන ප්‍රශ්න, ගැටලු තිබෙන බව අපි දන්නවා.

(iv) මෙතැනදී ක්‍රමවේද දෙකක් අපි අනුගමනය කරනවා. එකක් තමයි, අපි case-by-case handle කරන ක්‍රමවේද තිබෙනවා; එක එක පුද්ගලයන්ට අදාළව විශේෂ ප්‍රශ්න මතු වනකොට ඒකට අදාළ කරන තානාපති සේවය හරහා අපි ලබාදෙන විසඳුම් තිබෙනවා. විශේෂයෙන්ම පරිවර්තන සම්බන්ධ ප්‍රශ්න වෙන්න පුළුවන්. ඒ වාගේම එයාලාගේ job contractsවල මතු වන ප්‍රශ්න වෙන්න පුළුවන්. ඒ වාගේ දේවල්වලට අදාළ මැදිහත්වීම් අපි කරනවා. සමහර රටවල් ගත්තොත් policy එකක් විධියට, විශේෂයෙන්ම සයිප්‍රසය වාගේ රටක් ගත්තොත් යම් කිසි ප්‍රතිපත්තිමය කරුණු කාරණා නිසා එවැනි තත්ත්වයක් මතුව තිබෙනවා. ඒ කියන්නේ, ලැබෙනවා නම් ඒකට සමත් සියලුදෙනාට ලැබෙන්න ඕනෑ, එහෙම නැත්නම් කාටවත් ලැබෙන්නේ නැති තත්ත්වයක් තමයි උදා වෙලා තිබුණේ. ඒ වාගේ දේවල් සම්බන්ධයෙන් අපි රාජ්‍ය තාන්ත්‍රිකව මැදිහත් වනවා.

ඒකට eligible කාණ්ඩය ගත්තොත්, මේ වන විටත් සමහර අයට ලැබී තිබෙන බවට අපට තොරතුරු ලැබී තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න ඉස්සෙල්ලා යම් කරුණු ප්‍රමාණයක් එකතු කරලා තමයි එය අහන්න වෙන්නේ. ඒ නිසා ඔබතුමා මූලාසනයේ ඉන්න එක හොඳයි. එහෙම නැත්නම් ඒ සඳහා අවස්ථාව ලැබෙන්නේ නැහැ. මොකද, අද මුළු දවසම වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නම ගන්නා නිසා.

එක පැත්තකින් කුවේට් වන්දි සඳහා එක් වරක් ගෙවූ මුදල් ප්‍රමාණයක් තිබෙනවා. මම හිතන විධියට යම් කිසි නීතිමය ප්‍රශ්නයක් හෝ වෙනත් කුමක් හෝ ප්‍රශ්නයක් තිබෙන නිසා ඒ

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

මුදල පාවිච්චි නොකර තවමත් තිබෙනවා. ඒ මුදල්වලට මොකක්ද කරන්නේ කියන එක සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්න කියලා ඉල්ලනවා. විශේෂයෙන්ම සමාජ ආරක්ෂණ ක්‍රමවේදය තිබෙන සමහර රටවල් තිබෙනවා. අපි රටවල්, රටවල් අතර කථා කරලා තවමත් ඒක නිවැරදි විධියට විසඳලා නැහැ කියන එකත් කියන්න ඕනෑ. එම ප්‍රශ්නය විසඳපු නැති, ප්‍රශ්න තිබෙන රටවල් ඒක විසඳන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළවල් සැදිය යුතුයි.

ඒ වාගේම ප්‍රධාන වශයෙන් තවත් කාරණයක් පිළිබඳව මම අහන්නට ඕනෑ. මේ වෙලාවේ ලෝකය බරපතළ යුද්ධයකට ගිහිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම මැදපෙරදිග රටවලට ඒ යුද්ධය බලපා තිබෙනවා. අපේ ශ්‍රී ලාංකිකයෝ වැඩි ප්‍රමාණයක් විදේශගත වෙලා සිටින්නේ මැදපෙරදිග රටවල්වලට කියලා තමයි දැන් ඔබතුමා ලබා දුන් සංඛ්‍යාලේඛනවල වැඩිපුර ප්‍රමාණයක් තිබුණේ. මම දැක්කා එම සංඛ්‍යාලේඛන අනුව කටාර්, සෞදි අරාබිය සහ කුවේට් කියන රටවල තමයි වැඩිපුර ප්‍රමාණයක් ගිහින් සිටියේ. ඒ රටවල්වලට තමයි දැන් බරපතළ ලෙස හානි සිද්ධ වෙලා තිබෙන්නේ. එක පැත්තකින් ඩුබායි වෙන්න පුළුවන්, දැන් කඩා වැටිලා තිබෙන ඒ රටවල සිටින බොහෝ දෙනෙක් ආපසු අපේ රටට එන්නත්, සමහර අය වෙනත් රටවලට යන්නත් අවශ්‍ය වැඩ කටයුතු සකස් කරමින් තිබෙනවා. මේ යුද්ධය තවත් දුර ගිහිල්ලා අපට බරපතළ විධියට බලපාමින්, රැකියා අවස්ථා ටික නැතිවෙලා ඔවුන්ට නැවත ලංකාවට එන්න සිදු වුණොත් හෝ අලුත් රැකියා අවස්ථා ටික නැති වුණොත්, විශේෂයෙන්ම මැදපෙරදිග කලාපයේ සිටින අපේ ශ්‍රමිකයන් වෙනුවෙන් ඔබතුමන්ලා දැනට අරගෙන තිබෙන පියවර මොකක්ද? මොකද, අවසාන මොහොතේ කිසිදු පියවරක් අරගෙන වැඩක් නැහැ. එවැනි කටයුත්තක් සිද්ධ වුණොත් විදේශ රැකියා සම්බන්ධයෙන් ඊළඟට ගතයුතු වැඩ පිළිවෙළ සැකසීම වාගේම, ඒ රටවල්වල සිටින පිරිස නැවත අපේ රටට ආවොත් ඔවුන්ට වන්දි ගෙවීම හෝ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය කටයුතු සහ අනෙකුත් කටයුතු සාධාරණීකරණය කරන්නේ කොහොමද කියන වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙන්නේ කොයි විධියටද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන විධියට එතැන ප්‍රශ්න දෙකක් තිබෙනවා. එම නිසා මම ඒ අතුරු ප්‍රශ්න දෙකම එකට ගන්නම්.

ගරු මන්ත්‍රීතුමා අහපු පළමුවැනි අතුරු ප්‍රශ්නය තමයි, කුවේට් අරමුදලට මොකක්ද වෙන්නේ කියන එක. පසුගිය අය වැය අවස්ථාවේදීම ගරු ජනාධිපතිතුමා ඒ සම්බන්ධයෙන් යම් කිසි ප්‍රකාශයක් කළා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ. අපි කුවේට් අරමුදලින් රුපියල් බිලියන 2.1ක මුදලක් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවේදය සඳහා වෙන් කරලා තිබෙනවා. නමුත්, අපි ළඟදී තව සාකච්ඡාවක් සඳහා දින වෙන් කළා. රුපියල් බිලියන 2.1ක මුදල ප්‍රමාණවත් නැත්නම් සමස්ත කුවේට් අරමුදලම දායක විශ්‍රාම වැටුප් ක්‍රමවේදයට යොදා ගන්නවා කියලා අපි හිතුවා. එතැන රුපියල් බිලියන 5ක් විතර තිබෙනවා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ශ්‍රී ලංකා රුපියල්වලින් රුපියල් බිලියන 5ක් තිබෙනවා. දළ වශයෙන් ගත්තොත්, රුපියල් බිලියන 5ක් තිබෙනවා. කලින් විවිධ යෝජනා ඇවිල්ලා තිබුණා, එම මුදල විවිධ ව්‍යාපෘතිවලට පාවිච්චි කරන්න පුළුවන් කියලා. නමුත් අපි, විශේෂයෙන්ම මේ ආණ්ඩුව එම මුදල සුබසාධන කටයුතු වෙනුවෙන්, ඒ කියන්නේ සමාජ ආරක්ෂණය පැත්තටම යොමු කරනවා කියලා එක තීරණයක ඉන්නවා. ඇත්තටම ඒ මුදල අහිංසක ජනතාව වෙනුවෙන් වෙන් කරපු මුදලක්. ඒ නිසා අපි අනිවාර්යයෙන් එවැනි ක්‍රමවේදයක් සකස් කරනවා. විශේෂයෙන්ම රුපියල් බිලියන 2.1ට අදාළව අපි මේ වෙනකොටත් කටයුතු කරගෙන යනවා. නමුත්, ඒ calculations ටික කරනකොට යම් කිසි අඩුපාඩුවක් වන බව අපට පෙනුණොත්, සමස්ත මුදලම ඒ සඳහා පාවිච්චි කරන්න අපි බැඳිලා ඉන්නවා.

ඒ වාගේම, මැදපෙරදිග කලාපයේ සිද්ධ වන ගැටුම්කාරි තත්ත්වය නිසා රැකියා අහිමි වන යම් කිසි තත්ත්වයක් තිබෙනවාද කියලා ප්‍රශ්නයක් අහලා තිබුණා. ඔව්, එවැනි තත්ත්වයක් තිබෙනවා. මේ මොහොත වන විට අපි දකිනවා, පසුගිය මාස කිහිපයකට කලින් තිබුණු තත්ත්වය නොවෙයි දැන් තිබෙන්නේ. ප්‍රගතිගාමී විධියට යම් කිසි පරිවර්තනයක් සිද්ධ වෙලා තිබෙනවා. නමුත්, මේ ප්‍රශ්නය ඉතාම නරක විධියට උග්‍රවෙලා තිබුණු කාල වකවානු තුළ සිට මෙයට අදාළ සංඛ්‍යාලේඛන සහ දත්ත අපි එකතු කරන්න පටන් ගත්තා. විශේෂයෙන්ම අපි වෙනම hotline අංක ලබා දීලා තොරතුරු ගත්තා. ඒ වාගේම, අපි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා අදාළ කරන සංඛ්‍යාලේඛන ගන්නත් පටන් ගත්තා. ඒ අනුව, තනි තනි පුද්ගලයින්ට රැකියා අහිමි වෙනකොට ඒ ආයතනත් එක්ක කථා කරලා ඒ සඳහා මොකක් හෝ විසඳුමක් ලබා දෙන්න අවශ්‍ය මැදිහත් වීමත් මේ මොහොත වන විට අපි පටන් ගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා මතු කළා වාගේ මීට කලින් කුවේට් යුද්ධයේදී විශාල සංඛ්‍යාවකට රැකියා අහිමි වුණා වාගේ දෙයක් සිදු වනවා නම් ඒකට අදාළව ගත හැකි ක්‍රමවේද දෙකක් තිබෙනවා. එවැනි තත්ත්වයක් නිර්මාණය වනකොට ඒ අදාළ රාජ්‍යයනුත් ඒකට අදාළව යම් දායකත්වයක් ලබා දෙනවා. නමුත් එහෙම දායකත්වයක් ලබා නොදෙන අවස්ථා බිහි වනවා නම් අනිවාර්යයෙන් රජයක් විධියට අපි ඒ වගකීම භාර ගන්න ලැහැස්තියි. ඒකට අදාළ කරන සාකච්ඡාව අපේ මට්ටමින් මේ මොහොත වනකොටත් අපි කරගෙන යනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා කියලා කිව්වා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

නැහැ, නැහැ. මම එතුමාට කිව්වා කැමැති නම් එකකට උත්තර දීලා අනෙක් එකට උත්තර නොදී ඉන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Deputy Minister, are you going to take on another question?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

කමක් නැහැ, ප්‍රශ්න තුනක් වුණත් අහන්න. *[බාධා කිරීම්]* තුන්වැනි ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

තුන්වැනි අතුරු ප්‍රශ්නය නොවෙයි, මේක දෙවැනි අතුරු ප්‍රශ්නය. ඔබතුමා ප්‍රශ්නයට උත්තර දෙනවා නේද?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා උත්තර දෙනවා කිව්වා.

මම අහන්නේ විශේෂ කාරණයක්. මේ අහන්නේ තමුන්නාන්සේලාට මඩ ගහන ප්‍රශ්නයක් නොවෙයි. ඒක නිසා බය වෙන්න එපා. මම අහන්නේ මේ ප්‍රශ්නයයි. විදේශගතවන ශ්‍රී ලාංකිකයින්ට බොහෝ තානාපති කාර්යාලවල වීසා ලබා දෙන වැඩ පිළිවෙළේදී බොහෝ වෙලාවට පොලිස් සහතිකයට සහ අනෙකුත් සහතිකවලට පිළිගැනීම ලැබෙන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් "ශ්‍රී ලාංකික නිවැරදි සහතිකයක්" කියලා නිර්දේශ කළාට පසුවයි. හැබැයි, තවමත් මේ ආයතනවල විශාල ප්‍රමාදයක් තිබෙනවා. විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඒ කටයුතු කරගන්න තිබෙන්නේ online හරහා. ඒකේ විනිවිදභාවයක් තිබෙනවා, ඒක අපි පිළිගන්නවා. එදා හිටපු ජාවාරම්කාරයින්ට යම්කිසි වැට බැඳිල්ලක් එතැන සිදු වෙලා තිබෙනවා. ඒක හරි. Online ක්‍රමයෙන් හරි විශාල කාලයක් ගත වුණොත් බොහෝ අයට වීසා ලබා ගනිද්දි බරපතළ ප්‍රශ්න එනවා. මේ නිසා අපට ඕනෑ දවසට වීසා ලබා ගැනීමේ වැඩ පිළිවෙළට ලියකියවිලි ඉදිරිපත් කරන්න බැහැ. ඒ ආයතනවලට අවශ්‍ය වෙලාවට තමයි අපට මේ ලියකියවිලි ඉදිරිපත් කරන්න වෙන්නේ. පොලිස් සහතිකයක් ගන්න ගියාමත් විශාල කාලයක් ගන්නවා, පොලිස් සහතිකය දෙන්න. එම නිසා විදේශ කටයුතු අමාත්‍යාංශයට විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කරලා අලුත් online ක්‍රම හරහා, ඩිජිටල් ක්‍රම හරහා වේගවත් වැඩ පිළිවෙළක් සකස් කරන්න බැරිද, ඉක්මනින් මේ අවශ්‍ය කරන ලියකියවිලි, තොරතුරු ඒක රාශි කරගෙන ඒවා නිර්දේශ කරමින් ඒ අදාළ ආයතනවලට යවලා ඒ වීසා බලපත්‍ර ලබා ගන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළට සහයෝගය ලබා දීමක් හැටියට?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා අපි මැදිහත් වෙච්ච කාරණා සම්බන්ධව තමයි දිගින් දිගටම ප්‍රශ්න මතු කරන්නේ. ස්තුතියි, මේ ප්‍රශ්නය මතු කළාට. මේ නිසා මටත් අවස්ථාවක් ලැබෙනවා, ඒ සම්බන්ධව කියන්න. හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, අපට මේ සම්බන්ධව විවිධ පැමිණිලි ලැබුණා, යම්කිසි ප්‍රමාදයක් තිබෙනවා කියලා. අපේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තමයි පොලිස් වාර්තා ලබා දීම සිදු වන්නේ. අපි විශේෂයෙන්ම clearance branch එකට අදාළව ඒ අයත් එක්ක සාකච්ඡා කළා. මෙතැන ක්‍රමවේද දෙකක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවුරු හරි පුද්ගලයෙක් ලංකාවේ ඉන්නවා නම් ඒ අදාළ පුද්ගලයා තමන්ට අයිති තමන්ගේ ගමේ පොලිස් ස්ථානයට ගිහිල්ලා ඒ ලබා ගන්නා clearance certificate එක නිවැරදි එකක් නම් විදේශ කටයුතු අමාත්‍යාංශය විධියට අපි ඒකට අදාළ කරන attestation එක ලබා දෙනවා. නමුත් මෙතැන පැන නඟින ප්‍රශ්නය මේකයි.

කවුරු හරි පුද්ගලයෙකු පිට රටක ඉඳලා application එකක් භාර දෙනකොට තමයි clearance branch එක හරහා මේක එන්න ඕනෑ. ඒකට යම්කිසි ප්‍රමාදයක් තිබෙන බව අපි දන්නවා. ජාතික ආරක්ෂාව සම්බන්ධව ක්‍රියා කරන අංශ එක්ක අපි සාකච්ඡා කරලා බලද්දී ජාතික ආරක්ෂාව සම්බන්ධව ගැටලු වගයක් තිබෙනවා. මේ ඩිජිටල්කරණය හරහා පිටරට ඉඳගෙන යම්කිසි පුද්ගලයෙකුට සහතික පත්‍රය ලබාගන්න ඕනෑ නම් ඒ ක්‍රමවේදය තවත් කඩිනම් කරන්නට අපි මේ මොහොත වන විට සාකච්ඡා කරගෙන යනවා. අපි බලාපොරොත්තු වනවා, මේ සහතිකය ඉක්මනින් ලබා දෙන්න. නමුත් මෙතැනට විවිධ ආයතන සම්බන්ධ වනවා. Police Narcotics Bureau එක, fingerprint සම්බන්ධ ආයතන මේකට සම්බන්ධ වනවා. මේ ක්‍රියාවලිය ඉතාම පුළුල් ක්‍රියාවලියක්. නමුත් අපි බලාපොරොත්තු වනවා, මේ කාලය තවත් කෙටි කර ගන්න. එහෙම කරන්න පුළුවන් නම් ඉතාම හොඳයි. ඒකට අදාළ මැදිහත් වීම අපි මේ මොහොත වන විට කරන්න පටන් අරගෙන තිබෙනවා. නමුත් යම්කිසි පුද්ගලයෙකු ලංකාවේ ඉන්නවා නම් ඒ පුද්ගලයාට අපි කියනවා, අපි attest කරන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ clearance branch එක හරහා ලබා ගන්නා සහතික පත්‍රය විතරක් නොවෙයි කියන එක. තමන්ගේ ගමේ පොලිස් ස්ථානයේදී ඒ අදාළ පුද්ගලයා ඒ clearance එක ලබා ගත්තොත්, විදේශ කටයුතු අමාත්‍යාංශය හැටියට අපට පුළුවන්, එයට අදාළ attestation එක ලබා දෙන්න. මේ මොහොත වනකොටත් අපි ඒක කරනවා. මෙහිදී කාල වකවානු දිහා බැලුවොත්, ඒ ක්‍රමවේදයට ගතවන කාලය ඉතාම අඩුයි. ඒ නිසා අපි ජනතාවට මේක කියනවා. ඒ සහතික පත්‍රයත් ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන්නේ. අපේ අමාත්‍යාංශය ඒකට අදාළ කරන attestation එක ලබා දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ ඉන්න පුද්ගලයෙකුට ප්‍රමාදයක් නොවී මීට අදාළ යම්කිසි කටයුත්තක් කරගන්න ඕනෑ නම් මේ ක්‍රමවේදය ඉතාම යෝග්‍ය ක්‍රමවේදය විධියට අපි හඳුනාගන්නවා.

## කෝකිලායි සහ නයාරු කළපු අවට තෙත්බිම් සහ පක්ෂීන්ගේ වාසස්ථාන: පාරිසරික සංචාරක සංවර්ධනය

### கொக்கிளாய் மற்றும் நாயாறு கடல்நீரேரிகளுக்கு அருகிலுள்ள ஈரநிலங்கள் மற்றும் பறவைகள் வாழிடங்கள்: சூழலியல் சுற்றுலா அபிவிருத்தி

WETLANDS AND BIRD HABITATS NEAR KOKKILAI AND NAYARU LAGOONS: DEVELOPMENT OF ECO-TOURISM

1527/2025

**19.ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ කෝකිලායි සහ නයාරු කළපු, ඒ අවට තෙත්බිම් සහ පක්ෂීන්ගේ වාසස්ථාන, පාරිසරික සංචාරක ව්‍යාපාරය සංවර්ධනය සඳහා සුදුසු පරිසරයක් බව දන්නේද;

(ii) එම ප්‍රදේශවල සංචාරකයින් සඳහා පරිසර හිතකාමී නවාතැන් (Eco-Hotels) ඇතුළු සංචාරක පහසුකම් සම්බන්ධ වත්මන් තත්ත්වය කවරේද;

(iii) එම ප්‍රදේශ, පාරිසරික සංචාරක ගමනාන්ත ලෙස සංවර්ධනය කර වැඩි සංචාරකයින් සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් හෝ ප්‍රධාන සැලසුමක් සකස් කර තිබේද;

(iv) තිරසර පාරිසරික සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සහ එම ප්‍රදේශවල පවතින ජෛව විවිධත්වය හා සංක්‍රමණික පක්ෂීන්ගේ වාසස්ථාන ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) පරිසර සංචාරක මඟපෙන්වීම, බෝට්ටු සේවා සහ නවාතැන් පහසුකම් ආදී ක්ෂේත්‍රවල ප්‍රදේශවාසී ජනතාව පුහුණු කිරීම ඇතුළුව, දැනට ක්‍රියාත්මක

[ගරු තුරෙයිරාසා රවිකරන් මහතා]

කරන සහ ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත ජීවනෝපාය අවස්ථා කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு மாவட்டத்தில் கொக்கிளாய் மற்றும் நாயாறு கடல்நீரேரிகள், அவற்றைச் சுற்றியுள்ள ஈரநிலங்கள் மற்றும் பறவைகள் வாழிடங்கள் என்பன சூழலியல் சுற்றுலா வணிகத்தை மேம்படுத்துவதற்குப் பொருத்தமான சூழல் என்பதை அறிவாரா என்பதையும்;

(ii) அப்பகுதிகளில் சுற்றுலாப் பயணிகளுக்கான சூழல் நேயமிக்க தங்குமிடங்கள் (Eco-Hotels) உள்ளிட்ட சுற்றுலா வசதிகள் தொடர்பான தற்போதைய நிலை என்ன என்பதையும்;

(iii) அப்பகுதிகளை சூழலியல் சுற்றுலாத் தளங்களாக அபிவிருத்திசெய்து அதிகளவான சுற்றுலாப் பயணிகளை ஈர்ப்பதற்கானதொரு சாத்தியவள ஆய்வு அல்லது முதன்மைத் திட்டம் தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) நிலைபேறான சூழலியல் சுற்றுலா வணிகத்தை மேம்படுத்துவதற்கும், அப்பகுதிகளில் காணப்படும் பல்லுயிர்ப் பெருக்கம் மற்றும் இடம்பெயர் பறவைகளின் வாழ்விடங்களைப் பாதுகாப்பதற்கும் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) சூழலியல் சுற்றுலா வழிகாட்டுதல், படகு சேவைகள் மற்றும் தங்குமிட வசதிகள் ஆகிய துறைகளில் பிரதேசத்தில் வாழும் மக்களை பயிற்றுவித்தல் உள்ளிட்ட தற்போது நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றதும் எதிர்காலத்தில் நடைமுறைப்படுத்த உத்தேசிக்கப்பட்டுள்ளதுமான வாழ்வாதார வாய்ப்புகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) whether he is aware that the Kokkilai and Nayaru lagoons in the Mullaitivu District, the wetlands and bird habitats near them are suitable environments for the development of eco-tourism;

(ii) the current situation of the facilities including eco-friendly accommodation (Eco -hotels) for tourists in those areas;

(iii) whether a feasibility study or a master plan has been prepared to develop those areas as eco-tourism destinations and attract more tourists;

(iv) the measures that are being taken to promote sustainable eco-tourism and protect the biodiversity and habitats of migratory birds in those areas; and

(v) the livelihood opportunities currently being implemented and planned to be initiated in the future, including training of local people in the fields of eco-tourism guidance, boat services and accommodation facilities?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)

(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

Sir, on behalf of the Minister of Foreign Affairs, Foreign Employment and Tourism, I answer the Question.

(a) (i) Yes.

The Kokkilai and Nayaru lagoons in the Mullaitivu District, the wetlands and bird habitats near them have been identified as areas with a very high potential for development of eco-tourism. The Tourism Development Plan 2026-2030 prepared by the Northern Provincial Tourism Bureau has also identified those as major tourist attractions. Also, the natural ecosystems in these areas provide habitats for numerous native - endemic - inhabitant and migratory bird species, and it has been identified that there is great potential for nature-based tourism activities such as bird watching, lagoon tours, environmental studies, photography and guided ecological tours supported by its rich biodiversity and scenic natural landscapes.

(ii) Considering the high environmental value of Kokkilai and Nayaru lagoons as well as their associated wetlands and bird habitats, there is significant potential for development of eco-hotels. However, at present, eco-hotel facilities are very limited in the Kokkilai and Nayaru areas of the Mullaitivu District and the existing facilities are mainly, small-scale guest houses and basic accommodation facilities, which are insufficient to meet the growing demand for nature and environmental tourism needs.

(iii) Yes.

The Northern Provincial Tourism Bureau has prepared the 2026-2030 Tourism Development Plan with the support of the Faculty of Postgraduate Studies of the University of Vavuniya and under the leadership of district-level stakeholders, through which the tourism potential, the major tourist attractions, resources,

development opportunities, environmental analysis, gap analysis, strategic intervention and risk mitigation measures have been identified. Considering the tourism potential and importance of development, 10 tourist destinations have been selected by the stakeholders in order to prioritize and among those, Puliyamunai area located in Kokkilai West Grama Niladhari Division has been identified as the tourist destination with highest priority. Furthermore, the Nayaru lagoon has also been identified as a special tourist destination. It is planned to implement the necessary programmes to further develop it and make it an attractive tourist destination for local and foreign tourists.

In addition, out of 13 project proposals received from the Mullaitivu District Secretary for the year 2027, the Tourism Section of the Ministry has already submitted the following two project proposals to the Department of National Planning for approval and to be implement under the 2027 Budget provisions of the Ministry.

- Development of access roads and income generating facilities on the Mullaitivu coastline and the project value is Rs. 80 million.
- Pulipentakal Beach Tourism Development Project in Maritimepattu and the project value is Rs. 53.5million.

(iv) Sustainable strategies will be taken to conserve biodiversity, protect the habitats of endemic and migratory birds, preserve beautiful natural landscapes and continue to protect the naturalness of those sensitive ecosystems by developing those areas sustainably through eco-friendly tourism programmes.

Furthermore, a provision of Rs. 9.58 million had been provided to the Mullaitivu District Secretary for the development of tourism infrastructure facilities at Kokkilai Puliyamunai Lagoon in the year 2024 and the project has already been completed.

In addition, provisions had been made for the following two projects for the year 2025, both of which have been completed now.

- Construction of a resting place with bathroom facilities at Kokkilai Puliyamunai Lagoon and the project value was Rs. 9.9 million
- Provision of passenger transport boats for Kokkilai Puliyamunai Lagoon and the project value was Rs. 9.92 million.

(v) Under the guidance of the Presidential Task Force for the implementation of the Sri Lanka Tourism Development Programme, a special team has carried out work in July to identify attractive tourism trails. It has identified bird sanctuaries and open trails which could enhance various tourism experiences and provide opportunities to create livelihoods for the local community (including the fisheries industry) by providing tourism services, and work will be done in the future to implement those opportunities. It is expected to create livelihood opportunities alongside sustainable eco-tourism development with the cooperation of relevant government institutions, local communities, the private sector and other stakeholders for the successful implementation of this programme.

(b) Not relevant.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

நன்றி, கௌரவ பிரதியமைச்சர் அவர்களே! எனது முதலாவது மேலதிகக் கேள்வி:

தற்போதைய சூழ்நிலையில் இலங்கைக்கு அதிகளவாக சுற்றுலாப் பயணிகள் வருகை தருகின்றனர். ஆனால், சமத்துவ அடிப்படையில் சுற்றுலாத் துறையில் முல்லைத்தீவு மாவட்டம் மிகவும் பின் தங்கிய நிலையிலேயே காணப்படுகின்றது. சில விடயங்களுக்கு நீங்கள் இப்போது நிதி ஒதுக்கியிருக்கின்றீர்கள்; 2027ஆம் ஆண்டுக்கான நிதியாக அது காணப்படுகின்றது. அந்த வகையில், கட்டிட நிர்மாணங்களில் அரசு தற்போது மெல்ல மெல்ல அக்கறையைக் காட்டினாலும், சுற்றுலா வழிகாட்டலைச் சிறந்த முறையில் செயற்படுத்தத் தேவையான ஆளணி மற்றும் நிருவாகக் கட்டமைப்பு முல்லைத்தீவில் மிகவும் பலவீனமான நிலையிலேயே காணப்படுகின்றது. சுற்றுலா தொடர்பான அபிவிருத்திச் செயற்றிட்டங்களை முன்னெடுப்பதற்கும் போதிய வழிகாட்டல்களை மேற்கொள்வதற்கும் மாவட்டத்துக்குரிய சுற்றுலா அலுவலகம் ஒரு முக்கிய தேவை! சுற்றுலா ஆளணியும் தேவை! எனவே, நிர்மாணங்களுக்கு மேலதிகமாக, வினைத்திறனான சுற்றுலா வழிகாட்டலை உறுதிப்படுத்தும் வகையில், தங்கள் அமைச்சின் கீழ் மாவட்டத்துக்குரிய சுற்றுலா அலுவலகம் மற்றும் சுற்றுலா அபிவிருத்திக்கான பிரத்தியேக உத்தியோகத்தர்களை முல்லைத்தீவுக்கு வழங்கும் ஏதுநிலை காணப்படுகின்றதா? என்று கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

Hon. Deputy Speaker, as I mentioned earlier, we have, in fact, identified the East as well the North including the Mannar region as having a significant potential for tourism. Several projects are being planned with World Bank funding to develop places with tourist attraction in that area. Under those projects, all the relevant stakeholders, especially the Tourism Bureau of the Northern Province and universities, are working to develop tourism. I would like to mention that tourism development in those areas is still at the initial level. Also, as I mentioned in my Answer, most of the accommodation facilities available now are either

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

substandard or do not suit high-end tourists and other visitors. Therefore, such facilities need to be developed. Under those development projects, we will declare the key areas as tourism zones and for those zones, we will appoint the required officers from the Tourism Development Authority. So, those things are being planned and we are working on those. In the future, once we declare the tourism zones, there will be staff assigned in charge of those particular areas.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

முல்லைத்தீவின் எல்லையோர அபிவிருத்திக்கும் தொடர் பயன்பாட்டுக்கும் சுற்றுலா அணுகலுக்கும் கொக்கிளாய் - புல்மோட்டைப் பகுதியை இணைக்கும் பாலத்தின் அபிவிருத்தி முக்கியமானதாகக் காணப்படுகிறது. அரசு கொக்கிளாய்ப் பாலம் அமைப்பதற்கான எமது தொடர் கோரிக்கைகளுக்குச் செவிசாய்த்து, இயலுமான அளவில் அதன் சாதக நிலைகளைப் பரிசீலிப்பதாகவே கருதுகின்றோம். கொக்கிளாய்ப் பாலம் தொடர்பாக அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டங்களிலும் நாங்கள் கதைத்துள்ளோம். கௌரவ சபை முதல்வர் அவர்கள் மிகவும் சாதகமாக, விரைவில் அவ்வாறான நிர்மாணத்துக்கான வாய்ப்புக்களுக்காகத் துணை நிற்கின்றார். அதற்காக அவருக்கு நன்றி! இந்தக் கிழமையும் முல்லைத்தீவில் இது சம்பந்தமான ஆய்வுகளை வீதி அபிவிருத்தி அதிகாரசபையினர் மேற்கொள்கின்றனர். எனவே, தங்கள் அமைச்சும் இவ்விடயத்தில் கூடுதல் அக்கறை எடுத்து, அடுத்த ஆண்டுக்கான வரவு செலவுத்திட்ட நிதி ஒதுக்கீட்டில், கொக்கிளாய்ப் பால நிர்மாணத்துக்கான ஏற்பாட்டிலும் கவனமெடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்வதோடு, கவனம் எடுப்பீர்களா? என்பதை எனது இரண்டாவது மேலதிகக் கேள்வியாகக் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

Sir, as the Hon. Member mentioned, accessibility is critically important for tourism, there is no argument about that. I am sure the Hon. Minister would prioritize in the coming Budget the construction of the proposed bridge so that tourists would have easy access to the tourist attractions there; we will facilitate that request as well.

## කොළඹ දිස්ත්‍රික්කය තුළ විදේශගත ශ්‍රමික පවුල්වල පාසල් දරුවන්: පාසල් උපකරණ ලබා දීම
### கொழும்பு மாவட்டத்திலுள்ள புலம்பெயர் ஊழியர்களின் குடும்பங்களைச் சேர்ந்த பிள்ளைகள்: பாடசாலை உபகரணங்கள் வழங்குதல்
### SCHOOL CHILDREN OF FAMILIES OF MIGRANT WORKERS IN COLOMBO DISTRICT: PROVISION OF SCHOOL EQUIPMENT

1924/2026

**20.ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කය තුළ විදේශගත ශ්‍රමික පවුල්වලට අයත් පාසල් යන දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේද;

(iii) එසේ නම්, එය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ක්‍රියාත්මක වන්නේද;

(iv) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරනු ලබන විදේශ සේවා නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) එකී නිලධාරීන් විසින් වාර්තා කර ඇති ආකාරයට වයස අවුරුදු 2-5, 6-10 සහ 11-18 දරන කාණ්ඩවල පාසල් දරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) 2025 වර්ෂය සඳහා ලබා දී ඇති පාසල් උපකරණ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලබා දෙන දත්ත මත ඉහත තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉහත අ(iv)හි සඳහන් නිලධාරීන්ට ලබා ගැනීමේ හැකියාවක් තිබේද;

(ii) පාසල් උපකරණ ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථා තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පවතින නිර්ණායක කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு மாவட்டத்தில் புலம்பெயர் ஊழியர்களின் குடும்பங்களைச் சேர்ந்ததும் பாடசாலை செல்வதுமான பிள்ளைகளின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி பிள்ளைகளுக்குப் பாடசாலை உபகரணங்களை வழங்கும் நிகழ்ச்சித்திட்டம் அமுல்படுத்தப்பட்டுள்ளதா;

(iii) ஆமெனில், அந்தத் திட்டம் இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தால் அமுல்படுத்தப்படுகின்றதா;

(iv) பிரதேச செயலகங்களுக்கு இணைக்கப்பட்டு சேவையாற்றி வருகின்ற வெளிநாட்டுச் சேவை அலுவலர்களின் எண்ணிக்கை யாது;

(v) மேற்படி அலுவலர்களால் அறிக்கையிடப்பட்டுள்ளவாறு 2-5, 6-10 மற்றும் 11-18 ஆகிய வயதுப் பிரிவுகளைச் சேர்ந்த பாடசாலை மாணவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(vi) 2025ஆம் ஆண்டுக்கென வழங்கப்பட்டுள்ள பாடசாலை உபகரணங்களின் அளவு யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) (i) இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தால் வழங்கப்படுகின்ற தரவுகளின் அடிப்படையில், மேற்படி தகவல்களை உள்ளடக்கிய அறிக்கையை மேற்படி அ(iv)இல் குறிப்பிடப்பட்டுள்ள அலுவலர்கள் பெற்றுக்கொள்வதற்கான சாத்தியம் உள்ளதா;

(ii) பாடசாலை உபகரணங்கள் வழங்கப்படுதல் மறுக்கப்படுவதற்கான சந்தர்ப்பங்கள் உள்ளனவா;

(iii) ஆமெனில், அது தொடர்பில் காணப்படுகின்ற அளவுகோல்கள் யாது;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the number of school children belonging to families of migrant workers in the Colombo District;

(ii) whether a programme to provide school equipment for the children referred to above is being implemented;

(iii) if so, whether the said programme is being implemented by the Sri Lanka Foreign Employment Bureau;

(iv) the number of Foreign Service Officers serving attached to the Divisional Secretariats;

(v) the number of school children in the age groups of 2-5, 6-10 and 11-18 years, separately, as reported by the said officers; and

(vi) the quantity of school equipment provided for the year 2025?

(b) Will he also inform this House -

(i) whether the officers referred to in (a)(iv) above have the ability to obtain a report containing the above information based on the data provided by the Sri Lanka Foreign Employment Bureau;

(ii) whether there are instances where the grant of school equipment is refused; and

(iii) if so, the criteria in that regard?

(c) If not, why?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් අපි ලබා ගත් තොරතුරු අනුව එම සිසුන් සංඛ්‍යාව 23,545යි.

(ii) ඔව්. එම දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දෙනවා.

(iii) එය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා තමයි ලබා දෙන්නේ.

(iv) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරනු ලබන විදේශ රැකියා සංවර්ධන නිලධාරීන්ගේ සමස්ත සංඛ්‍යාව 896යි. කොළඹ දිස්ත්‍රික්කයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරනු ලබන විදේශ රැකියා සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 32යි. එම තොරතුරු පහත වගුව මඟින් දක්වා ඇත.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අනුයුක්ත විදේශ රැකියා සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කඩුවෙල | 2 |
| 2 | කැස්බෑව | 3 |
| 3 | කොළඹ | 3 |
| 4 | කොලොන්නාව | 4 |
| 5 | කෝට්ටේ | 2 |
| 6 | තිඹිරිගස්යාය | 2 |
| 7 | දෙහිවල | 2 |
| 8 | පාදුක්ක | 2 |
| 9 | මහරගම | 2 |
| 10 | මොරටුව | 2 |
| 11 | රත්මලාන | 3 |
| 12 | සීතාවක | 1 |
| 13 | හෝමාගම | 4 |
| **එකතුව** | | 32 |

(v) අප සතුව තිබෙන සංඛ්‍යාලේඛන දත්ත අනුව එම වයස් කාණ්ඩවල දරුවන් සංඛ්‍යාව පහත වගුව මඟින් දක්වා ඇත.

| වයස් කාණ්ඩය | දරුවන් සංඛ්‍යාව |
|---|---|
| අවුරුදු 3-5 අතර | 449 |
| අවුරුදු 6-10 අතර | 9027 |
| අවුරුදු 11-17 අතර | 14069 |

(vi) 2025 අවුරුද්දේ මේ උපකරණ කට්ටල 6,734ක් විගමනික ශ්‍රමිකයන්ගේ දූ දරුවන් සඳහා ලබා දී තිබෙනවා.

(ආ) (i) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරනු ලබන විදේශ රැකියා සංවර්ධන නිලධාරීන්ට විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා අදාළ කරන තොරතුරු ලබා ගන්න පුළුවන්.

(ii) අදාළ විගමනික ශ්‍රමිකයා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නොවීම, ශ්‍රී ලංකාවට ඇවිල්ලා අවුරුදු 5ක් ඉක්මවා තිබීම, ඒ නිශ්චිත මොහොත වනවිට අදාළ ලියාපදිංචිය අවලංගු වීම කියන කාරණා මත තමයි එම පවුල්වල දරුවන්ට පාසල් උපකරණ ලබා දීම ප්‍රතික්ෂේප වෙන්නේ.

(iii) • ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වලංගු ලියාපදිංචියක් ලබා තිබීම.

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

- ශ්‍රී ලංකාවට පැමිණි විගමනික ශ්‍රමිකයෙකු නම් ශ්‍රී ලංකාවට පැමිණ වසර 5 නොඉක්මවීම.
- රජයේ හෝ පෞද්ගලික පාසලක හෝ පිරිවෙනක අධ්‍යාපනය ලබන දරුවෙකු වීම.
- ඒ බව සනාථ කිරීමට අදාළ පාසලෙහි විදුහල්පතිගේ සහතික කිරීම සහිතව උප්පැන්න සහතිකය ඉදිරිපත් කිරීම.
- මීට පෙර පාසල් උපකරණ කට්ටලයක් ලබා ගෙන නොතිබීම.
- අදාළ අයදුම්පත සංවර්ධන නිලධාරි/ග්‍රාම නිලධාරි/ප්‍රාදේශීය ලේකම් නිර්දේශ, අනුමැතිය මත විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි පළාත් භාර කළමනාකරුවන් වෙත නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම.

(ඇ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න අහනවාද?

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
ඔව්, ගරු කථානායකතුමනි. ගරු නියෝජ්‍ය ඇමතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, පිළිතුර ලබා දීම පිළිබඳව.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම අපේ රටේ විදේශගත වන අය ගත්තාම, එලෙස විදේශගත වන්නේ පවුලක එක්කෝ අම්මා, තාත්තා. මෙසේ විදේශගත වන්නේ බොහෝ විට ආර්ථික මට්ටමින් පහළම ඉන්න පවුල්වල අය. එලෙස විදේශගත වන අයගේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම් පහත වැටීම, එහෙම නැත්නම් අධ්‍යාපනය අතරමඟ නතර වීම වාගේම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම් සම්බන්ධයෙන් බරපතළ ලෙස කරුණු වාර්තා වනවා. ඊට අමතරව මේ පවුල් කඩාකප්පල්වීම් සහ සමාජ ආරක්ෂණය පිළිබඳව බරපතළ ප්‍රශ්න ගණනාවක් මතු වෙමින් තිබෙන බව අපට වාර්තා වනවා. අමාත්‍යාංශය විධියට මේ සම්බන්ධයෙන් මොකක් හෝ වැඩසටහනක් නිලධාරින් හරහා ක්‍රියාත්මකද කරනවාද, එහෙම නැත්නම් අමාත්‍යාංශය විධියට මේ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අපේ දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමාට ස්තුතිය පුද කරනවා, වැදගත් ප්‍රශ්නයක් යොමු කිරීම සම්බන්ධව. විශේෂයෙන්ම අපි දන්නවා, අපේ රටේ විවිධ නීති රීති තිබුණාට ඒවායෙහි අන්තර් සබඳතා අතර යම්කිසි ගැටලු ප්‍රමාණයක් පසුගිය කාලයේ නිර්මාණය වෙලා තිබුණු බව. එතැනදී අපි තීරණයක් ගත්තා, විශේෂයෙන්ම විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළව යම්කිසි ඒකාබද්ධ ක්‍රියාවලියක් අවශ්‍යයි කියලා. ඒකට අපි අලුතින් වැඩසටහනක් - programme එකක් - හඳුන්වා දෙනවා, "විගමනික ශ්‍රමික පවුල් සංවර්ධනය සඳහා වන ඒකාබද්ධ ක්‍රමවත් ප්‍රවේශය" කියලා; "Integrated Systematic Approach Project for the Development of Migrant Worker Families" කියන නමින් තමයි අපි ඒක launch කරන්නේ.

මෙහිදී මතුව තිබෙන ගැටලු දිහා බැලුවොත්, මේ ගැටලු තැන් තැන්වල තමයි තිබෙන්නේ කියලා අපි දන්නවා. ඒ නිසා ඉතාම කෙටි කාලයක් තුළ අලුත් ක්‍රමවේදයක් සකස් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එතැනදී සහකාර ප්‍රාදේශීය ලේකම් - ඒ අදාළ කෙනා - තමයි කණ්ඩායම් ප්‍රධානී විධියට අපි හඳුනා ගන්නේ. ඒ වාගේම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පළාත් කළමනාකරු, විදේශ රැකියා සංවර්ධන නිලධාරි, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි, වනිතා සංවර්ධන නිලධාරි, නිපුණතා සංවර්ධන නිලධාරි, ව්‍යවසාය සංවර්ධන නිලධාරි, කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි, අපනයන සංවර්ධන නිලධාරි ඒ වාගේම විද්‍යා හා තාක්ෂණ නිලධාරි ඇතුළු සියලු දෙනාම ඒකාබද්ධ කරගෙන අපි යම්කිසි ක්‍රමවේදයක් සකස් කරනවා. ඒකෙදි අපි බලාපොරොත්තු වනවා, කෙනෙකු පිට රටට යන්න පෙර සිට ඒ අදාළ කාරණා සම්බන්ධව කටයුතු කරන්න වාගේම මේ රටට ආවාට පසුව සමාජයත් එක්ක එකට ජීවත් වෙලා ඒ හම්බ කරපු මුදල හරි විධියට කළමනාකරණය කර ගෙන, reintegration process එකත් හරි විධියට කර ගෙන යාමට අදාළව කටයුතු කරන්න. එම නිසා මේ ක්‍රමවේදය ඉතාම වැදගත්. අපි බලාපොරොත්තු වෙනවා, සමාජය මුහුණ දෙමින් තිබෙන සමාජ අර්බුදයට ඒ ක්‍රමවේදය හරහා යම්කිසි විසඳුමක් හොයා ගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

## විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයට අයත් බදු දී ඇති තානායම්: වැල්ලවාය ප්‍රා.ලේ. කොට්ඨාසය

## வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சுக்குச் சொந்தமான குத்தகைக்கு விடப்பட்ட வாடி வீடுகள்: வெல்லவாய பிரதேச செயலாளர் பிரிவு

## LEASED REST HOUSES BELONGING TO MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM: WELLAWAYA DS DIVISION

2106/2026

**21. ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1):

(අ) (i) වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ තිබෙන අමාත්‍යාංශයට අයත් තානායම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තානායම්වල භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම තානායම් බදු පදනම යටතේ ලබා දී ඇති කාල සීමාව කොපමණද;

(iv) තානායම් බදු පදනම මත ලබාගෙන ඇති පුද්ගලයින් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වැල්ලවාය, ඇල්ල පාරේ පිහිටි තානායම අතුරු බදු දී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම අතුරු බදුකරු කවුරුන්ද;

(iii) එම තානායම බදුගෙන ඇති මුල් බදුකරු එහි ඇති දේපළ අයථා ලෙස පරිහරණය කරමින් තේක්ක ගස් 8ක් අවස්ථා දෙකකදී කිසිදු අවසරයකින් තොරව කපා විකුණා ඇති බව දන්නේද;

(iv) ඒ සම්බන්ධයෙන් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வெல்லவாய பிரதேச செயலாளர் பிரிவில் உள்ள அமைச்சுக்குச் சொந்தமான வாடி வீடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி வாடி வீடுகளின் காணிப் பரப்பளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி வாடி வீடுகள் குத்தகை அடிப்படையில் எவ்வளவு காலத்திற்கு வழங்கப்பட்டுள்ளன என்பதையும்;

(iv) வாடி வீடுகளை குத்தகை அடிப்படையில் பெற்றுக்கொண்டுள்ளவர்கள் யாவர் என்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வெல்லவாய, எல்ல வீதியில் உள்ள வாடி வீடு துணைக் குத்தகைக்கு வழங்கப்பட்டுள்ள தென்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வாறு துணைக் குத்தகைக்கு பெற்றுக்கொண்டவர் யார் என்பதையும்;

(iii) மேற்படி வாடி வீட்டை குத்தகைக்கு பெற்றுக் கொண்ட முதல் குத்தகைதாரர் அதில் இருந்த ஆதனங்களை முறைகேடான விதத்தில் பயன்படுத்தி 08 தேக்கு மரங்களை இரண்டு சந்தர்ப்பங்களில் எவ்வித அனுமதியும் இன்றி தறித்து விற்றுள்ளாரென்பதை அறிவாரா என்பதையும்;

(iv) அது தொடர்பில் எடுக்கப்பட்டுள்ள சட்ட நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House the -

(i) number of rest houses belonging to the Ministry that are located within the Wellawaya Divisional Secretary's Division;

(ii) extent of land of such rest houses, separately;

(iii) period for which such rest houses have been leased; and

(iv) names of the persons to whom such rest houses have been leased?

(b) Will he also inform this House -

(i) whether he is aware that the rest house located on Ella road, Wellawaya has been sub-leased;

(ii) if so, the name of the sub-lessee;

(iii) whether he is aware that the original lessee of the said rest house, while misappropriating the assets thereof, has cut down and sold eight teak trees on two occasions without obtaining any permission; and

(iv) the legal measures that have been taken in that regard?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)

(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) දෙකකි.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන ගිය තානායම් 38ක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත 1998.12.24 දිනැති ගැසට් පත්‍රය මඟින් පවරන ලදී. එම තානායම් අතරින් 2ක් පමණක් වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇත.

(ii) 1. වැල්ලවාය පැරැණි තානායම - අක්කර 00 රූඩ් 02 පර්චස් 09

2. වැල්ලවාය ඉන් - Inn - තානායම (ඇල්ල පාර පිහිටි) - අක්කර 01රූඩ් 03 පර්චස් 17.28

(iii) 1. වැල්ලවාය පැරැණි තානායම - 2008 වසරේ සිට 2035 වසර දක්වා අවුරුදු 27ක කාල පරිච්ඡේදයක් සඳහා

2. වැල්ලවාය ඉන් - Inn - තානායම (ඇල්ල පාර පිහිටි) - 2008 වසරේ සිට 2028 වසර දක්වා අවුරුදු 20ක කාල පරිච්ඡේදයක් සඳහා

(iv) 1. වැල්ලවාය පැරැණි තානායම - ජයන්ති රාජපක්ෂ මහත්මිය, දිඹුලමුරෙයි, වැල්ලවාය.

2. වැල්ලවාය ඉන් - Inn - තානායම (ඇල්ල පාර පිහිටි) - හේමා අයිරාංගනී විතානගේ මහත්මිය, නො. 565/12, ගල්ලෙදන්දුගොඩ, හොරණ.

(ආ) (i) 1. ඇල්ල පාරේ පිහිටි පැරැණි තානායම අතුරු බදු දී ඇති බව වාර්තා වී නොමැත.

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

2. ඇල්ල, වැල්ලවාය පාරේ පිහිටි වැල්ලවාය ඉන් - Inn - තානායම ද අතුරු බදු දී ඇති බව වාර්තා වී නොමැත.

(ii) 1. අදාළ නොවේ.

2. අදාළ නොවේ.

(iii) 1. ඇල්ල වැල්ලවාය පැරණි තානායමේ තෙක්ක ගස් 8ක් කැපීම පිළිබඳ වාර්තා වී නොමැත.

2. ඇල්ල වැල්ලවාය පාරේ පිහිටි වැල්ලවාය ඉන් - Inn - තානායමේ බදුකරු තේක්ක ගස් 8ක් කැපීම පිළිබඳව වාර්තා වී නොමැත. එක් අවස්ථාවකදී එනම්, 2025.04.02 දිනට ආසන්න දිනයකදී තේක්ක ගස් 2ක් කපා ඉවත් කළ බව දනී.

(iv) ඉහත (iii) 2 පිළිතුරෙහි සඳහන් ඇල්ල වැල්ලවාය ඉන් - Inn - තානායමේ ඇති තේක්ක ගස් 2 කැපීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මේ වන විටත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, එම ශීර්ෂගත කරුණට අදාළව වැල්ලවාය පොලිස් ස්ථානය මඟින් වැල්ලවාය මහෙස්ත්‍රාත් අධිකරණයේ අංක 77324 යටතේ සංජය ඉරසිංහ මහතාට (ඇල්ල පාරෙහි පිහිටි වැල්ලවාය ඉන් - Inn - තානායම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුම්ගතව සිටින හේමා අයිරාංගනී විතානගේ මහත්මියගේ ස්වාමිපුරුෂයා) විරුද්ධව නඩු පවරා ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ ප්‍රශ්නයට පිළිතුර ලබා දුන්නාට බොහොම ස්තුතියි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න කලින් මට කියන්න කාරණාවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අමාත්‍යාංශයේ නිලධාරින් ඔබතුමාට ලබා දී තිබෙන මේ පිළිතුරේ තිබෙන ඇතැම් කාරණා සම්බන්ධයෙන් ඇත්තටම ප්‍රායෝගිකව එකඟ වෙන්න බැරි තැන් කීපයක් තිබෙනවා. දැනට නඩු කටයුත්ත යන පුද්ගලයා දිගින් දිගටම අතුරු බදු දීමක් කරලා තිබෙනවා. මේ අතුරු බදු දීම කරලා තිබෙන පුද්ගලයා මේ තානායමේ කටයුතු ටික කරගෙන යන අවස්ථාවේදී පසුගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේදී තමයි අවසාන වතාවට කපපු තේක්ක ගස් දෙක කපන්නේ. හැබැයි, ඊට කලින් තෙක්ක ගස් 6ක ප්‍රමාණයක් ඔහු කපලා තිබෙනවා. ඒ ගැන නීතියට වාර්තා වීමක්වත්, අමාත්‍යාංශය හැටියට මැදිහත් වෙලා නීතිමය කාරණාවලට පිවිසීමක්වත් අපි දකින්නේ නැහැ. ඔහු නීතිය නොදන්නා පුද්ගලයෙක් නොවෙයි. වැල්ලවාය ඉන් - Inn - තානායමේ බදුකාරිනියගේ ස්වාමි පුරුෂයා වන මෙම පුද්ගලයා වැල්ලවාය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති හැටියට හිටපු කාලයේ තමයි මේ බදු ගිවිසුම ඇති කර ගන්නේ, ඔහුගේ බිරිඳගේ නමින්. ඊට පස්සේ දිගින් දිගටම තේක්ක ගස් කැපුවා. හැබැයි, ගිය අවුරුද්දේ තමයි අප මේක වාර්තා කරන්නේ. ඔහු SSP මහත්මයෙක් වෙලා සිටිද්දී තමයි එම කටයුත්ත කර තිබෙන්නේ. ඒ කියන්නේ, ඔහු නීතිය සම්බන්ධයෙන් නොදන්නා කෙනෙක් නොවෙයි. එවකට පැවැති දේශපාලන බලයේ හයියත් පාවිච්චි කරමින් ඔහු දිගින් දිගටම අනීතිකව කටයුතු කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. ඒ කාරණය විශේෂයෙන් කියන්න ඕනෑ. ඔහු හිටපු අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මහත්මයාගේ classmate කෙනෙකු - පන්ති සගයෙකු - හැටියට හිටපු අයෙක්. ඒ පුරුද්ද නිසාවෙන් වෙන්න ඇති එවැනි කටයුත්තක් කරන්න ඇත්තේ. විශේෂයෙන්ම එය අමාත්‍යාංශයේ පොදු දේපළක් වුණාට, අමාත්‍යාංශය මැදිහත් වෙලා ඒ කාරණයට අදාළව නඩු දාලා නැහැ. දිගින් දිගටම අතුරු බදුකරු සහ ප්‍රදේශවාසීන් මේ පැමිණිල්ල සම්බන්ධයෙන් අමාත්‍යාංශයට කරුණු යොමු කිරීමේදී අමාත්‍යාංශය කියපු කාරණාව තමයි, මේක ඔවුන්ට අදාළ නැහැ කියන එක. හැබැයි, වැල්ලවාය පොලිස් ස්ථානය ක්‍රියාත්මක වෙලා පොදු දේපළ පනත යටතේ නඩු දාලා තිබෙනවා. මේකට නඩුවක් දාලා තිබියදීත් අමාත්‍යාංශයේ නිලධාරින් හා එකඟතාවක් ඇති කර ගනිමින්, කපපු ඒ තේක්ක ගස් 2ට අදාළව තක්සේරුවක් අමාත්‍යාංශය විසින් කර තිබෙනවා සහ ඔහු තක්සේරු මුදල අමාත්‍යාංශයට ගෙවා තිබෙනවා. අපරාධමය වරදක් සම්බන්ධයෙන් නඩු කටයුත්තක් තිබියදීත් ඔහු එවැනි කටයුත්තක් කිරීමට අදාළව මා දකින්නේ ඒ ගෙවපු වන්දියෙන් සහ ඒ ගෙවපු තක්සේරු මුදලින් ඒ අපරාධමය වරද වහන්න බැරි බවයි. ඒ නිසා අමාත්‍යාංශය හැටියට මින් ඉදිරියට ඒ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් කරනවාද, ඒ බදුකරුගේ බද්ද අහෝසි කිරීමට කටයුතු කරනවාද කියන එක තමයි ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය වන්නේ.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම මේ කියන වැල්ලවාය තානායම පමණක් නොවෙයි, මීට පෙර ගිය මාසයේදීත් අපි මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කළා හඟුරන්කෙත ප්‍රදේශයේ හිටපු දේශපාලනඥයන්ට - හිටපු ඇමතිවරුන්ට - සම්බන්ධ මෙවැනි ආයතනයක් පිළිබඳව. ශ්‍රී ලංකාව පුරා තිබුණු, රජයට අයත්, විශේෂයෙන්ම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් මේ වාගේ තානායම් ප්‍රාදේශීය දේශපාලනඥයන්, මැති ඇමතිවරුන් ඔවුන්ගේ ඥාතින්ගේ නම්වලට පවරාගෙන ඒ අය තමන්ගේ දේපළ වාගේ තමයි ඒවා පරිහරණය කරමින් ඉඳලා තිබෙන්නේ. මා හිතන විධියට මේකත් ඒ හා සමාන සිද්ධියක්. මේ සිද්ධියට අදාළව ගත්තොත්, ඒ වෙච්ච ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම වැරැදි බවයි මා හිතන්නේ. ඒ ක්‍රියාවලිය හරහා එවැනි වන්දි මුදලකට කිසිසේත් එකඟ වෙන්න බැහැ. මට ඒ පිළිබඳව ලොකු අවබෝධයක් නැහැ. උසාවි නියෝගයක් මත නම් එහෙම ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ, ඒක තමයි ක්‍රමවේදය වෙන්න ඕනෑ. මා හිතන විධියට අමාත්‍යාංශය යටතේ නොව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය යටතේ තමයි ඒ දේපළ තිබෙන්නේ. එසේ උසාවියක නඩු කටයුත්තක් යනකොට ඒ අයට එහෙම එකඟතාවකට එන්න කිසිසේත් හැකියාවක් නැහැ. එහෙම වෙලා නම්, ඒක වැරැද්දක්. එහෙම නම් ඒ පිළිබඳව විමර්ශනයක් කරන්න අපි කටයුතු කරනවා.

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, විශේෂයෙන්ම අධිකරණයෙන් දීපු නඩු තීන්දුවකට අනුව ඔහු එම තක්සේරු මුදල ගෙව්වා නොවෙයි. තක්සේරු මුදල ගෙවලා එකඟතාවක් මත ඒ රිසිට් පත ඉදිරිපත් කිරීමේදී වැල්ලවාය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා කියා තිබෙනවා, අමාත්‍යාංශයේ ඒ නිලධාරින්ට ඇවිල්ලා කට උත්තරයක් සටහන් කරන්න කියලා. එවැනි ආකාරයකට තමයි ඒක සිදු වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. වැල්ලවාය ප්‍රදේශය කියන්නේ විශේෂයෙන්ම හැම දිශාවකින්ම එන සංචාරකයන් හුවමාරු වන කේන්ද්‍රස්ථානයක්. එම නිසා අමාත්‍යාංශය යටතේ තිබෙන තානායම් දෙක ඉතාම වටිනවා, දෙස් විදෙස් සංචාරකයන් සඳහා අවශ්‍ය නවාතැන්

පහසුකම් සහ අනෙකුත් පහසුකම් සැපයීමේදී. දැනට අවුරුදු ගණනාවකට කලින් ඉදි කරපු තානායම් දෙකක් ඒ තිබෙන්නේ. ඒ තානායම් දෙක වර්තමාන තත්ත්වයට ගැළපෙන විධියට සංවර්ධනය කරන්න පුළුවන් නම් වටිනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔය Wellawaya Inn තානායම ගත්තොත්, ඊට එහා පැත්තේ තිබෙන්නේ ගඟක්. ඒ තානායම වැසි කාලයේදී ගංවතුරට යට වෙනවා. එවැනි අවස්ථාවලදී එම තානායම කිසිසේත් භාවිතයට ගන්න බැරි තත්ත්වයකුත් තිබෙනවා. මා දැනගන්න කැමැතියි, අමාත්‍යාංශය මඟින් කෙරෙන ඉදිරි සංවර්ධන කටයුතුවලදී ඒ තානායම් දෙක සංවර්ධනය කිරීමට ඔබතුමන්ලාගේ සැලැස්මක් තිබෙනවාද කියලා.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

ඔව්, මගේ මතකය හරි නම් මේ වන කොට එක තානායමක් 2028 අවුරුද්ද වනකල් සහ අනෙක් තානායම 2030 අවුරුද්ද වනකල් ගිවිසුම්ගත වෙලා තිබෙනවා. නමුත්, ඒ ගිවිසුම්වල තිබෙන කොන්දේසි උල්ලංඝනය කරනවා නම්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට බලතල තිබෙනවා, ඒවා අහෝසි කරන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ අනුව කටයුතු කරන්නත්, ඒ වාගේම යම්කිසි නිලධාරින් පිරිසක් පවතින නීති රීතිවලට පිටින් ඒ ආකාරයට කටයුතු කර තිබෙනවා නම්, ඒ පිළිබඳව විමර්ශනයක් කරන්නත් ඉදිරියේදී අපි කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ප්‍රශ්න අංක 22 - 831/2025 - (1), ගරු කිංස් නෙල්සන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 23 - 883/2025 - (3), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 24 - 885/2025 - (2), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 25 - 945/2025 - (1), ගරු හෙක්ටර් අප්පුහාමි මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 26 - 1268/2025 - (1), ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 27 - 1449/2025 - (1), ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 28 - 1758/2025 - (1), ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! நான் அந்த வினாவைக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! ஏற்கனவே நான் கேட்ட நான்கு கேள்விகளுக்கு இரு வார கால அவகாசம் கோரப்பட்டிருந்தது. இன்று கேட்கப்பட்ட ஐந்தாவது கேள்விக்கும் அவ்வாறே கால அவகாசம் கோரப்படுகின்றது. இது தொடர்பில் உண்மையிலேயே கவலையடைகின்றேன். எனவே, விரைவாக இதற்கான பதில்களை எமக்குச் சமர்ப்பிக்குமாறு கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ප්‍රශ්න අංක 29 -1909/2026- (1), ගරු බී. ආරියවංශ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 30 -1926/2026- (2), ගරු ටී.කේ. ජයසුන්දර මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 31 -1770/2025- (2), ගරු ලාල් ප්‍රේමනාත් මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 32 -1645/2025- (1), ගරු ඉම්රාන් මහරූෆ් මහතා.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

ප්‍රශ්න අංක 33 -1020/2025 - (1), ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 34 -1021/2025 - (1), ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 35 - 2062/2026 - (1), ගරු ජේ.සී. අලවතුවල මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

## 2019.12.31 සිට 2026.04.30 දක්වා විශ්‍රාම ගිය රාජ්‍ය නිලධාරින්: විශ්‍රාම වැටුප් ගෙවීම්

## 2019.12.31 முதல் 2026.04.30 வரை ஓய்வுபெற்ற அரச ஊழியர்கள்: ஓய்வூதியம்

## PUBLIC OFFICERS RETIRED FROM 31.12.2019-30.04.2026: PENSION PAYMENTS

2109/2026

**36.ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා]

(අ) (i) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මේ වනවිට කාර්ය මණ්ඩලයේ සේවයේ නියුතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තුවේ දත්ත ආරක්ෂාව සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2019.12.31 දිනට, 2020.01.01 දින සිට 2024.12.31 දක්වා සහ 2025.01.01 දින සිට 2026.04.30 දක්වා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වා ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සමස්ත රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) 2025 අයවැයෙන් වැඩි කරන ලද විශ්‍රාම වැටුප් මේ වනවිට සියලු විශ්‍රාමිකයන්ට හිමි ගන්වා තිබේද;

(iv) නොඑසේ නම්, තවදුරටත් ගෙවීමට ඇති විශ්‍රාමිකයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(v) එසේ ප්‍රමාද වීමට හේතු සහ එම ගෙවීම් සිදු කිරීමට අපේක්ෂිත කාල වකවානු කවරේද;

(vi) 2026 වර්ෂයට පෙර විශ්‍රාම ගන්වා සිටි පුද්ගලයන් සඳහා ද එම විශ්‍රාම වැටුප් වැඩි කිරීම අදාළ වන්නේද;

(vii) මෙම විශ්‍රාම වැටුප් වැඩිවීමෙන් මූල්‍යමය ප්‍රතිලාභ නොලැබූ විශ්‍රාමිකයන් සංඛ්‍යාව කොපමණද;

(viii) එසේ මූල්‍යමය ප්‍රතිලාභ නොලැබීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஓய்வூதியத் திணைக்களத்தில் தற்போதுள்ள பணியாட்டொகுதியினரின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி திணைக்களத்தின் தரவுகளின் பாதுகாப்புக்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2019.12.31ஆம் திகதியன்று, 2020.01.01ஆம் திகதி முதல் 2024.12.31ஆம் திகதி வரையிலும், 2025.01.01 ஆம் திகதி முதல் 2026.04.30ஆம் திகதி வரையிலும் அரச சேவையிலிருந்து ஓய்வுபெறச் செய்யப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(ii) ஒட்டுமொத்த அரச ஊழியர்களின் ஓய்வூதியம், மொத்தத் தேசிய உற்பத்தியின் சதவீதமாக யாது;

(iii) 2025 வரவு செலவுத் திட்டத்தினால் அதிகரிக் கப்பட்ட ஓய்வூதியங்கள் தற்போது அனைத்து ஓய்வூதியர்களுக்கும் உரித்தாக்கப்பட்டுள்ளதா;

(iv) இன்றேல், மேலும் செலுத்தப்படுவதற்குள்ள ஓய்வூதியர்களின் எண்ணிக்கை யாது;

(v) அவ்வாறு தாமதமடைவதற்கான காரணங்களும், மேற்படி கொடுப்பனவுகள் மேற்கொள்ளப் படுவதற்கான காலப்பகுதிகளும் யாவை;

(vi) 2026ஆம் ஆண்டுக்கு முன்னர் ஓய்வுபெறச் செய்யப்பட்டவர்களுக்கும் மேற்படி ஓய்வூதி யத்தை அதிகரிப்பது ஏற்புடையதாக அமையுமா;

(vii) மேற்படி ஓய்வூதிய அதிகரிப்பின்மூலம் நிதிசார் நன்மைகளை அடைந்துகொள்ளாத ஓய்வூதியர் களின் எண்ணிக்கை யாது;

(viii) அவ்வாறு நிதிசார் நன்மைகள் அடையப் பெறாமைக்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House the -

(i) number of staff employed in the Department of Pensions at present; and

(ii) measures that have been taken to ensure the data security of the said Department?

(b) Will he also inform this House -

(i) the number of public officers who have been sent on retirement as at 31.12.2019, from 01.01.2020 to 31.12.2024, and from 01.01.2025 to 30.04.2026, separately;

(ii) the total public sector pension payments as a percentage of the Gross National Product;

(iii) whether the pensions increased by the 2025 Budget have been paid to all pensioners by now;

(iv) if not, the number of pensioners who are yet to be paid such payments;

(v) the reasons for such delay and of the expected time frame for making those payments;

(vi) whether the pension increase is also applicable to those who were sent on retirement prior to 2026;

(vii) the number of pensioners who have not received financial benefits from this pension increase; and

(viii) the reasons for not receiving such financial benefits?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මේ වනවිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සේවයේ නියුතු සංඛ්‍යාව ඇමුණුම 01 හැටියට ඉදිරිපත් කරනවා. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් අංශ වෙත අනුයුක්ත කර ඇති නිලධරයන් ද මීට ඇතුළත් වේ.

(ii) i විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය - SLCERT - සමඟ සම්බන්ධව කටයුතු කරන අතර, අදාළ ආයතනය යටතේ වන "ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය" හරහා පැය 24 ආවරණය වන පරිදි නිරීක්ෂණ සිදු කරනු ලබයි. ඒ අනුව පූර්ව අවදානම හඳුනා ගැනීමේ හැකියාව පවතී.

ii තවද, SLCERT ආයතනය හරහා ලබා දෙන Endpoint Detection and Response - EDR - ලබා ගෙන ඇති අතර, එමඟින් දත්ත ආරක්ෂාව පිළිබඳව පරීක්ෂාව SLCERT ආයතනය හරහා සිදු කරනු ලැබේ.

iii තවද, මේ වනවිට දෙපාර්තමේන්තුගත දත්ත පද්ධති ප්‍රතිෂ්ඨාපන අවස්ථාව සඳහා backup management solution ස්ථාපිත කර පරීක්ෂණ තත්ත්වයේ පවතී.

(ආ) (i)

| කාල සීමාව | විශ්‍රම වැටුප් ගෙවමින් පවතින විශ්‍රාමිකයන් සංඛ්‍යාව |
|---|---|
| 2019.12.31 දිනට | 554,613 |
| 2020.01.01 සිට 2024.12.31 දක්වා | 159,512 |
| 2025.01.01 සිට 2026.04.30 දක්වා | 28,782 |

(ii) සියයට 1.3යි. මෙම ගණනය කිරීම 2025 වර්ෂයට අදාළව සිදු කරන ලදී.

2025 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතය - රුපියල් බිලියන 32,751 (ඇමුණුම 02)

2025 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් වියදම - රුපියල් බිලියන 444.5

ගණනය කිරීම - $\frac{444.5}{32751} \times 100$

ඒ අනුව තමයි සියයට 1.3ක සංඛ්‍යාව ලැබෙන්නේ.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

(iii) 2025 අය වැය යෝජනා මඟින් පහත සඳහන් කාණ්ඩ දෙකට අදාළව විශ්‍රාම වැටුප් සංශෝධනය සිදු කිරීමට ප්‍රතිපාදන සලසා ඇත.

(ඒ) 2025 අය වැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ සිදු කරන ලද වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප් සංශෝධනය 2025.01.01 දින ද සේවයේ සිට ඉන් පසුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා නිලධරයන්ගේ විශ්‍රාම වැටුප මේ අනුව සංශෝධනය කෙරේ.

(බී) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන IIහි 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 දිනට හිමි විය යුතු වැටුප මත විශ්‍රාම වැටුප සංශෝධනය.

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මෙය අදියර 03ක් යටතේ සිදු කෙරේ.

- පළමු අදියර - 2025.07.01 දින සිට ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී 2018.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගන්නා ලද සියලු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන IIහි සඳහන් 2018.01.01 දිනට හිමි විය යුතු වැටුප මත සංශෝධනය කරන ලදී.
- දෙවන අදියර - 2026.07.01වන දින සිට ක්‍රියාත්මක කෙරේ. මෙහිදී 2019.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගන්නා ලද සියලුම විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන II හි සඳහන් 2019.01.01 වන දිනට හිමි විය යුතු වැටුප මත සංශෝධනය කෙරේ. මෙම දෙවන අදියර ක්‍රියාත්මක කිරීම මේ වන විට ආරම්භ කර ඇත.
- තුන්වන අදියර - මෙය 2027.07.01 දින සිට - ලබන අවුරුද්දේ - ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. මෙහිදී 2020.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගන්නා ලද සියලුම විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන II හි සඳහන් 2020.01.01 දිනට හිමි විය යුතු වැටුප මත සංශෝධනය කිරීම සිදු කරනු ලැබේ.

**(ඇ)** ඉහත (ඒ) හා (බී) යටතේ සඳහන් කර ඇති කාණ්ඩවලට අදාළව විශ්‍රාම වැටුප සංශෝධනය කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

**(ඒ) 2025 අය වැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ සිදු කරන ලද වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප සංශෝධනය**

- 2025.01.01 දිනෙන් පසුව 2026.06.30 දක්වා සේවයෙන් විශ්‍රාම ගොස් විශ්‍රාම වැටුප් හිමි ගන්වා ඇති විශ්‍රාමිකයින් සංඛ්‍යාව - 35,400
- ඉහත සඳහන් සියලුම විශ්‍රාමිකයින් වෙත ඔවුන් සේවයෙන් විශ්‍රාම ගන්වන ලද අවස්ථාවේ හිමි වූ වැටුප මත විශ්‍රාම වැටුප හා විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය හිමි ගන්වා ඇත.
- ඉහත විශ්‍රාමිකයින් අතරින් විශ්‍රාමිකයන් 26,884 දෙනෙකු වෙත 2027.01.01 දිනට හිමි විය යුතු වැටුප මත විශ්‍රාම වැටුප සංශෝධනය කර හිමි ගන්වා ඇත.

**(බී) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන II හි 2018.01.01 දිනට හිමි විය යුතු වැටුප මත විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම**

- 2025.07.01 දින සිට මෙම පළමු අදියර ආරම්භ කරන ලද අතර, 2026.06.30 දින වන විට 2018.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගිය විශ්‍රාමිකයන් 432,674 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් සංශෝධන සිදු කර අවසන් කර ඇත.
- මෙහි දෙවන අදියරට අදාළ ප්‍රතිශෝධන කටයුතු 2026.07.01 දින සිට ආරම්භ කර ඇති අතර, 2019.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගිය විශ්‍රාමිකයන් 192,641 දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් සංශෝධන සකස් කර 2026.07.10 දින ගෙවීම් කර ඇත.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

(iv) 2025.01.01 දිනෙන් පසුව 2026.06.30 දින දක්වා සේවයෙන් විශ්‍රාම ගිය විශ්‍රාමිකයන් 8,516 දෙනෙකු වෙත 2027.01.01 දිනට විශ්‍රාම වැටුප සංශෝධනය කර හිමිගැන්විය යුතුව ඇත.

(v) මෙම විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු ඔවුන් අවසන් වරට සේවයේ යෙදී සිටි ආයතන විසින් දත්ත පද්ධතිය මඟින් තහවුරු කිරීම සිදු කළ යුතුය. එම තොරතුරු තහවුරු කිරීමෙන් පසුව එළඹෙන මාස දෙකක කාලසීමාව තුළ ගෙවීම් කිරීමට අපේක්ෂිතය.

(vi) (ඒ) 2025 අය වැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ සිදු කරන ලද වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප සංශෝධනය සඳහා හිමිකම් ලබන්නේ 2025.01.01 දින ද සේවයේ යෙදී සිට ඉන් පසුව විශ්‍රාම ගනු ලබන රාජ්‍ය නිලධරයන්ය.

(බී) 2025.07.01 දින සිට ක්‍රියාත්මක කරන ලද විශ්‍රාම වැටුප් සංශෝධනයේ පළමු අදියර සඳහා හිමිකම් ලබන්නේ 2018.01.01 දින හෝ ඊට පෙර සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ නිලධරයන්ය.

2026.07.01 දින සිට ක්‍රියාත්මක කරන ලද විශ්‍රාම වැටුප සංශෝධනයේ දෙවන අදියර සඳහා හිමිකම් ලබන්නේ 2019.01.01 දින හෝ ඊට පෙර සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ නිලධරයන්ය.

2027.07.01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිත විශ්‍රාම වැටුප සංශෝධනයේ තුන්වන අදියර සඳහා හිමිකම් ලබන්නේ 2020.01.01 දින හෝ ඊට පෙර සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ නිලධරයන්ය.

(vii) 2027.07.01 දින වන විට 2020.01.01 හෝ ඊට පෙර විශ්‍රාම ලද සියලු විශ්‍රාමිකයින්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන II හි 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත විශ්‍රාම වැටුප හිමිවනු ඇත. 2020.01.01 දිනෙන් පසු 2025.01.01 දින තෙක් විශ්‍රාම ගොස් ඇති සියලු විශ්‍රාමිකයින් විශ්‍රාම ගොස් ඇත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි අදියර 5ක වැටුප් වැඩිවීම් ලබාගැනීමෙන් පසුවය. ඒ අනුව 2025.01.01 දින තෙක් විශ්‍රාම ගොස් ඇති සියලු විශ්‍රාමිකයින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි 2020.01.01 දිනට හිමි වැටුප මත විශ්‍රාම වැටුප් ලබමින් සිටී. එබැවින් 2025.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ලබා ඇති සියලුම විශ්‍රාමිකයින් 2027.07.01 දින වන විට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016හි 2020.01.01 දිනට හිමි වැටුප මත විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින් බවට පත් වේ. එබැවින් එම විශ්‍රාමිකයින් අතර විශ්‍රාම වැටුප් විෂමතාවක් නොපවතින බව සඳහන් කරමි.

2025.01.01 දිනද සේවයේ යෙදී සිට ඉන් පසුව විශ්‍රාම ගනු ලබන නිලධරයන්, 2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ සිදු කරන ලද වැටුප් සංශෝධන අනුව සංශෝධිත විශ්‍රාම වැටුප් ලැබීම සඳහා හිමිකම ලබයි.

ඉහත පරිදි විශ්‍රාම වැටුප් සංශෝධනය සඳහා හිමිකම් ලබන ආකාරය අනුව විශ්‍රාමිකයන් වෙත සංශෝධිත විශ්‍රාම වැටුප හිමිගන්වන අතර එක් එක් විශ්‍රාමිකයා හිමිකම් ලබන ආකාරය අනුව ඔවුන් මූල්‍ය ප්‍රතිලාභ ලබා ඇති බව සඳහන් කරමි.

(viii) අදාළ නැත.

(ඇ) අදාළ නැත.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පිළිතුරු ලබා දීම පිළිබඳව ගරු අමාත්‍යතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ගරු අමාත්‍යතුමනි, ඇත්තටම (ආ) (vii) ප්‍රශ්නයෙන් මම බලාපොරොත්තු වුණේ මෙම විශ්‍රාම වැටුප් වැඩිවීමෙන් මූල්‍යමය ප්‍රතිපාදන නොලැබූ විශ්‍රාමිකයන් සංඛ්‍යාව කොපමණද කියන ගැටලුව නිරාකරණය කරගන්නයි. ඔවුන් සුදුසුකම් නොමැතිව වැටුප් වර්ධක ලබා ගෙන තිබියදී, විශ්‍රාම ගියාට පසුව 2024 වර්ෂයේ ඉදිරිපත් කරපු අය වැයෙන් වැඩි කරපු විශ්‍රාම වැටුප අනුව මූල්‍යමය ප්‍රතිලාභයක් ලැබෙන්නේ නැහැ කියලායි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට කථා කරනකොට මට දැනගන්න ලැබුණේ.

ගරු අමාත්‍යතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. 2025 වර්ෂයට අදාළව ඉදිරිපත් කරපු අය වැයෙන් වැඩි කරපු විශ්‍රාම වැටුප විවිධ හේතූන් මත මේ දක්වා නොලබන යම් පිරිසක් ඉන්නවා. කුරුණෑගල වැඩ බලන ප්‍රාදේශීය ලේකම්වරයාට අද උදෑසනත් මම කථා කරලා කිව්වා, ඒ වාගේ වාර්තා වුණු සිද්ධි ගැන. ඒ නිසා මේ අයවලුන්ගේ විශ්‍රාම වැටුප නිවැරදි කරගන්න කටයුතු කරන්නේ කොහොමද, ඔවුන්ගේ වැඩි වුණු විශ්‍රාම වැටුප කොපමණ කාල සීමාවකින් ලබා දීමට හැකියාවක් තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු කාරණය නිවැරදියි. සමහර විශ්‍රාමිකයන්ගේ ලිපි ගොනුවල අඩුපාඩු හෝ ගැටලු පවතින අවස්ථාවලදී ඒ වැඩි වූ විශ්‍රාම වැටුප ඉක්මනින් සකස් කරලා ඔවුන්ට ලබා දීමට නොහැකි වූ අවස්ථා තිබෙනවා. අපි ආසන්න වශයෙන් සියයට 90කට වැඩි පිරිසකට මේ වෙනකොට එය ලබා දී තිබෙනවා. ඉතිරි පිරිසගේ ලිපි ගොනුවල පවතින යම් යම් අඩු ලුහුඬුකම් සම්පූර්ණ කර ගැනීමෙන් පසු ඉතාම කඩිනමින් ඔවුන්ට ඒ අදාළ ගෙවීම් කිරීමට අපි කටයුතු කරනවා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ස්තුතියි ගරු අමාත්‍යතුමනි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රජය විසින් 2025 වර්ෂයේ අය වැයෙන් 2020 වර්ෂයට පෙර විශ්‍රාම ගිය සියලුමදෙනාගේ විශ්‍රාම වැටුප් වැඩි කරන්නට කටයුතු කළා. ඒ සම්බන්ධයෙන් සියලුම විශ්‍රාමිකයන් ලොකු ප්‍රසාදයකින් කථා කරනවා. නමුත්, 2020 සිට 2024 දක්වා විශ්‍රාම ගිය විශ්‍රාමිකයන් බලාපොරොත්තු වෙනවා, ඔවුන්ට වැටුප් වර්ධක ලබා දී විශ්‍රාම වැටුප් වැඩි කරයි කියලා. ඇත්තටම, 2020 සිට 2024 දක්වා වගේම 2020ට කලින් විශ්‍රාම ගිය අයවලුන්ටත් ජීවන වියදමට සරිලන ආකාරයට විශ්‍රාම වැටුප් වැඩි කරන්න අවශ්‍යයි කියන එක අපි පිළිගන්නවා. 2020-2024 කාල සීමාව හෝ 2025 ජනවාරි 01වැනි දාට පෙර විශ්‍රාම ගිය සියලුම විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප් වැඩි වීමක් ලබා දෙන්නට කටයුතු කරනවාද, ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ සැලසුම මොකක්ද කියන එක දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මන්ත්‍රීතුමා සඳහන් කරපු ප්‍රශ්නය නිවැරදියි. එහෙම ගැටලුවක් තිබෙනවා. නමුත්, 2020 වැටුප් වැඩිවීම සහ 2025 වැටුප් වැඩි වීම තමයි අපි පදනම් කරගන්නේ. 2020 වැටුප් වැඩි වීම අනුව තමයි 2020-2024 කාලය තුළ විශ්‍රාම ගිය විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප සකස් වෙන්නේ. 2025 ජනවාරි 01වැනිදායින් පසුව විශ්‍රාම ගිය අයට තමයි 2027 වැටුපට ගැළපෙන විධියට විශ්‍රාම වැටුප සහ අනෙකුත් පාරිතෝෂික සකස් වෙන්නේ. මේ වන විට අපි 2016 ඉඳලා විශ්‍රාමිකයන්ට තිබුණු ගැටලුවක් නිරාකරණය කරලා තිබෙනවා. ඉදිරියේදී ඉතිරි කොටසත් නිරාකරණය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. 2020-2024 කාලය තුළ විශ්‍රාම ගිය විශ්‍රාමිකයන් ඔවුන්ගේ දුක්ගැනවිලි වරින් වර ඉදිරිපත් කර තිබෙනවා.

ඒ පිළිබඳවත් අපි අවධානය යොමු කරලා තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී ඒ සියලුදෙනාගේම විශ්‍රාම වැටුප් වැඩි කරන අවස්ථාවක මේ කණ්ඩායම පිළිබඳවත් අපි අනිවාර්යයෙන්ම අවධානය යොමු කරනවා. ඒ නිසා ඒ ගැටලුව ඉදිරියේදී නිරාකරණය කරන්න කටයුතු කරනවා. අපි බලමු, ඉදිරි වර්ෂවලදී මේ ගැටලුව නිරාකරණය කරන්නේ කොහොමද කියලා. මේ පිළිබඳව පසුගිය සතියේ ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයකට පිළිතුරු ලබා දීමේදීත් මම මේ කාරණය සඳහන් කළා. ඒ අනුව අපි ඉදිරියට කටයුතු කරනවා. විශ්‍රාමිකයින් සියලුදෙනාට තිබෙන ප්‍රශ්න අපි දන්නවා. අද ජීවන වියදම වැඩි වෙලා තිබෙනවා. ඒ සියලු තත්ත්ව සැලකිල්ලට ගනිමින්, අපි ඒ විශ්‍රාමිකයින්ගේ වැටුප් වැඩි කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනවා.

## හඟුරන්කෙත, වලපනේ සහ කොත්මලේ ප්‍රදේශ: අතිරේක ප්‍රාදේශීය සභා
### ஹங்குரன்கெத, வலப்பனை மற்றும் கொத்மலை பிரதேசங்கள்: மேலதிக பிரதேச சபைகள்
### HANGURANKETHA, WALAPANE AND KOTMALE AREAS: ADDITIONAL PRADESHIYA SABHAS

2112/2026

**37. ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අමතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ස්ථාපිත කර ඇති බවත්;

(ii) හඟුරන්කෙත, වලපනේ සහ කොත්මලේ ප්‍රදේශවල එක් එක් ප්‍රදේශයක 120,000කට ආසන්න ජනතාවක් ජීවත් වන අතර, එම ජනතාවගේ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා එක් එක් ප්‍රදේශයේ එක් ප්‍රාදේශීය සභාව බැගින් පමණක් පිහිටා ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එම ප්‍රදේශවල ජන සංඛ්‍යාව අනුව සීමා නිර්ණය කර ප්‍රාදේශීය සභා 02ක් ස්ථාපිත කිරීමේ හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நுவரெலியா மாவட்டத்தில் மேலதிக பிரதேச செயலகங்கள் நிறுவப்பட்டுள்ளன என்பதையும்;

(ii) ஹங்குரன்கெத, வலப்பனை, கொத்மலை ஆகிய ஒவ்வொரு பிரதேசத்திலும் அண்ணளவாக 120,000 பேர் வதிகின்றனர் என்பதையும், அந்த மக்களுக்குத் தேவையான சேவைகளைப் பெற்றுக் கொள்வதற்கு ஒவ்வொரு பிரதேசத்திலும் ஒரு பிரதேச சபை வீதம் மட்டும் நிறுவப்பட்டுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி பகுதிகளில் குடித்தொகையின் அடிப்படையில் எல்லை நிர்ணயம் மேற்கொள்ளப்பட்டு, 02 பிரதேச சபைகளை நிறுவுவதற்கான சாத்தியப்பாடு உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Is he aware that -

(i) additional Divisional Secretariats have been established in the Nuwara Eliya District; and

(ii) nearly 120,000 people reside in each of the Hanguranketha, Walapane and Kotmale areas, and that only one Pradeshiya Sabha has been established in each of those areas to provide services to their residents?

(b) Will he inform this House -

(i) whether it is possible to establish two Pradeshiya Sabhas in such areas by delimitation in accordance with the population of the respective areas; and

(ii) if so, the measure that will be taken therefor?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ අමතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ස්ථාපිත කරලා තිබෙනවා. හඟුරන්කෙත, වලපනේ සහ කොත්මලේ කියන ප්‍රදේශවල.

(ii) ඔව්.

(ආ) (i) නැත.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

ජන සංඛ්‍යාව යනු, පළාත් පාලන ආයතනයක් සංස්ථාපනයේදී සලකා බලනු ලබන එක් සාධකයක් පමණි.

(ii) පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීම විද්වත් කමිටුවක් විසින් හඳුන්වා දී ඇති මූලික නිර්ණායක අනුව අංක අමප/17/1521/744/015 හා 2017.07.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී ඇති අනුමැතිය අනුව සිදු කෙරේ. ඒ සඳහා පහත සඳහන් නිර්ණායක භාවිත කරමින් ලකුණු ලබා දීමේ සහ බර තැබීමේ ක්‍රමයක් භාවිත කරනු ලබන අතර, එහිදී යෝජිත ආයතන බල ප්‍රදේශයේ,

1. ජන සංඛ්‍යාව සහ ජන ඝනත්වය
2. නිවාස ප්‍රමාණය සහ ඝනත්වය
3. සේවා සම්පාදනය සහ යටිතල පහසුකම්වල දියුණුව
4. වාණිජ සහ කර්මාන්ත ආයතනවල ව්‍යාප්තිය
5. සේවා නියුක්තිය
6. ස්වයං ජනිත ආදායම යන සාධක සලකා බලනු ලබයි.

ඉහත නිර්ණායක සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව යාවත්කාලීන කරමින් ප්‍රසිද්ධ කරනු ලබන වාර්ෂික සංඛ්‍යාලේඛන දත්ත වාර්තා මඟින් ලබා ගන්නා අතර, මූලික නිර්ණායක මැනීමට පාදක කර ගත යුතු දර්ශක මොනවාද යන්නත් එකී එක් එක් දර්ශකය අනුව බර තැබිය යුතු ප්‍රතිශතය කවරේද යන්නත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිත කමිටු වාර්තාවේ සඳහන්ව ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

ගරු අමාත්‍යතුමනි, සාමාන්‍යයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තිබෙනවා නම්, එතැන ප්‍රාදේශීය සභාවක් පිහිටුවන්න බාධාවක් නැහැ. නමුත්, නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත, වලපනේ, කොත්මලේ කියන කොට්ඨාසවල ජනගහනය ගත්තොත්, හඟුරන්කෙත 92,000ක්, වලපනේ 107,000ක්, කොත්මලේ 103,000ක් පමණ ඉන්නවා. ඒ වාගේ ජනගහනයක් සිටින මේ කොට්ඨාසවල ප්‍රාදේශීය සභාවක් පිහිටුවන්න ඕනෑය කියලා, අපි 2018-2019 අවුරුදුවලදී කරපු ඉල්ලීම පරිදි නුවරඑළිය සහ අඹගමුවේ පිහිටුවූවා. නමුත්, මේ ප්‍රදේශ තුනේ එහෙම කරලා නැහැ. මම හිතන විධියට, ඒ වෙලාවේ දකුණු පළාතේත් ප්‍රාදේශීය සභා කිහිපයක් ඇති කළා. 25,000ක ජනගහනයක් සිටින ප්‍රදේශවලටත් ප්‍රාදේශීය සභා අනුමත කරලා දුන්නා. කරුණාකරලා මේ ගැන සලකා බලන්න කියන එක තමයි මගේ ඉල්ලීම. මොකද, මේ ප්‍රදේශවල ජනතාව වැඩිපුර ජීවත් වෙන්නේ වතුවල. ඉතින් ඒ වතුවල ජනතාව ඒ ප්‍රාදේශීය සභාවකට යනකොට කාලයක් ගතවනවා. මොකද, කිලෝමීටර 30ක්, 40ක් යන්න තිබෙනවා. ඒ නිසා අමතර ප්‍රාදේශීය සභාවක් පිහිටුවන එක හොඳයි කියලා මම හිතනවා. මොකද, හඟුරන්කෙත ප්‍රදේශය නියෝජනය කරමින් membersලා 42ක්, වලපනේ 64ක්, කොත්මලේ 54ක් සිටිනවා. ඒ නිසා වැඩිම membersලා සංඛ්‍යාවක් නියෝජනය කරන ප්‍රදේශ වෙන් කරලා ඒවා ප්‍රාදේශීය සභාවලට බෙදා ගත්තා නම්, ඒ වැඩ හරියට පිළිවෙළට කරන්න පුළුවන් කියලා මම හිතනවා. ඒ සඳහා මම ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වනවා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා සඳහන් කරන පරිදි භූගෝලීය සාධක මත ජනතාවට යම් අපහසුතාවක් තිබෙනවා නම්, ඒ පිළිබඳව සලකා බලන්න අපි කටයුතු කරනවා. නමුත් ජන සංඛ්‍යාව මත පමණක් පදනම්ව අපි එහෙම කරන්නේ නැහැ. අඩු ජනගහනයක් ඉන්න සමහර ස්ථානවලත් අපි පළාත් පාලන ආයතන ස්ථාපිත කරලා තිබෙනවා. වලපනේ ගත්තොත්, ජනගහනය 129,143යි, හඟුරන්කෙත 103,140යි, කොත්මලේ 103,697යි. හැබැයි, ඒ වාගේ දෙගුණයක ජනගහනයක් ඉන්න ප්‍රදේශත් තනි පළාත් පාලන ආයතන හැටියට කොළඹ, ගම්පහ වාගේ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වනවා. ජනගහනයත් අපි සැලකිල්ලට ගන්න අවශ්‍යයි. නමුත් ඒ ජනතාවට යම් දුෂ්කරතාවකට මුහුණ දෙන්න වෙනවා නම්, ඒ දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් ඉදිරියේදී ඒ පිළිබඳව අවධානය යොමු කරන්න අපි කටයුතු කරනවා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි.

මම හිතන විධියට, වලපනේ සහ නිල්දණ්ඩාහින්න කියන ප්‍රදේශ කොට්ඨාස දෙකකට දමලා තිබෙනවා. වලපනේ කොට්ඨාසයේ වැඩියෙන්ම මුදල් එකතු කරන, වැඩියෙන්ම ජනතාව ගැවසෙන නගරයක් තමයි රාගල. ජනතාවටත් යන්න එන්න ලෙහෙසි නිසා රාගල නගරයේ ප්‍රාදේශීය සභාවක් ස්ථාපිත කළා නම් වඩා සුදුසුයි කියා මා හිතනවා.

ඊට අමතරව, පළාත් සභා මැතිවරණය පවත්වන්නේ කවදාද කියලා ඔබතුමාට අදහසක් තිබෙනවා නම් කියන්න. පළාත් සභා මැතිවරණය පවත්වන්න අදහසක් තිබෙනවා නම්, ඒ කවදාද, කොයි අවුරුද්දේද පවත්වන්න පුළුවන් කියලා කියන්න. එච්චරයි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ ආකාරයට රාගල නගරය නම් වඩා සුදුසු ස්ථානය, ඒ පිළිබඳව අපට සලකා බලන්න පුළුවන්; ගැටලුවක් නැහැ.

අවසාන ප්‍රශ්නය ඍජුව මෙතැනට සම්බන්ධ නොවුණත්, මම පිළිතුරක් දෙන්නම්. පළාත් සභා මැතිවරණය පැවැත්වීමට යම් ක්‍රමයක් ඉදිරිපත් කිරීම සඳහා අපි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරලා තිබෙනවා. ඒ කාරක සභාවේ නිර්දේශ ලැබුණාම අපි පළාත් සභා මැතිවරණය පවත්වනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ප්‍රශ්න අංක 38 - 30/2024 - (1), ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 39 - 675/2025 - (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## 2024.10.01 සිට මේ දක්වා ලැබී ඇති සෘජු විදේශ ආයෝජන: විස්තර

2024.10.01 முதல் இன்றுவரை கிடைத்துள்ள நேரடி வெளிநாட்டு முதலீடுகள்: விபரம்

FOREIGN DIRECT INVESTMENTS RECEIVED FROM 01.10.2024 UP TO NOW: DETAILS

1106/2025

**40. ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2024.10.01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලැබී ඇති සෘජු විදේශ ආයෝජනවල මුළු වටිනාකම ඇමෙරිකානු ඩොලර්වලින් කොපමණද;

(ii) ඊට අදාළ ආයෝජන ව්‍යාපෘති කවරේද;

(iii) එම එක් එක් ආයෝජන ව්‍යාපෘතියේ ස්වභාවය සහ ආයෝජනය කර ඇති මුදල ඇමෙරිකානු ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් ආයෝජන ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය/ආරම්භ කරනු ලබන දිනය, අවසන් වන දිනය සහ එක් එක් ව්‍යාපෘතියෙන් උත්පාදනය කරනු ලබන රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024.10.01ஆம் திகதி முதல் இன்றுவரை இலங்கைக்குக் கிடைத்துள்ள நேரடி வெளிநாட்டு முதலீடுகளின் மொத்தப் பெறுமதி அமெரிக்க டொலர்களில் எவ்வளவு என்பதையும்;

(ii) அதனுடன் தொடர்புடைய முதலீட்டுக் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(iii) அத்தகைய முதலீட்டுக் கருத்திட்டம் ஒவ்வொன்றினதும் தன்மை மற்றும் முதலீடு செய்துள்ள தொகை ஐக்கிய அமெரிக்க டொலர்களில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) அத்தகைய முதலீட்டுக் கருத்திட்டம் ஒவ்வொன்றும் ஆரம்பிக்கப்பட்ட திகதி/ ஆரம்பிக்கப்படும் திகதி, பூர்த்திசெய்யப்படும் திகதி மற்றும் ஒவ்வொரு கருத்திட்டத்தின் மூலமும் உருவாக்கப்படும் வேலைவாய்ப்புகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) total value of the foreign direct investments that have been received by Sri Lanka from 01.10.2024 up to now in US Dollars;

(ii) names of the investment projects related thereto;

(iii) nature of each of those investment projects and the amount invested in each project in US Dollars, separately; and

(iv) date on which each of the said investment projects were initiated/ will be initiated, the date of completion and the number of employment opportunities generated by each project, separately?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| ආයතනය | වර්ගය | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තුගත ආයෝජනය (ඇ.ඩො. මිලියන) | | |
|---|---|---|---|---|---|
| | | | විදේශීය | දේශීය | එකතුව |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BoI) | නව ව්‍යාපෘති | 95 | 605.1 | 1,000.9 | 1,606.1 |
| | පවතින ව්‍යාපෘති පුළුල් කිරීම | 120 | 440.4 | 665.5 | 1,105.9 |
| | මුළු එකතුව | 215 | 1,045.5 | 1,666.4 | 2,712.0 |
| කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව | ව්‍යාපාරික උපායමාර්ගික වැදගත්කම (BSI) | 24 | 73.1 | - | 73.1 |
| | එකඟ වූ හා ගැසට් කර ඇති | 71 | 612 | - | 612 |
| | මුළු එකතුව | 95 | 685.1 | - | 685.1 |
| මුළු එකතුව (BoI & CPCEC) | | 310 | 1,730.6 | 1,666.4 | 3,397.1 |

මේ ක්ෂේත්‍ර හතරටම අදාළව ලැයිස්තුවක් තිබෙනවා. එහි ව්‍යාපෘති 215ක් වාගේ විශාල ප්‍රමාණයක් තිබෙනවා. මම එය සභාගත කරන්නම්. අවශ්‍ය කාරණා මතු කළොත් මට ඒ සම්බන්ධව විස්තර කියන්න පුළුවන්.

(ii)

| ආයතනය | ව්‍යාපෘති ලැයිස්තුව |
|---|---|
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - BoI | විස්තරාත්මක ලැයිස්තුව ඇමුණුම 1හි සඳහන් වේ. |
| කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව - CPCEC | විස්තරාත්මක ලැයිස්තුව ඇමුණුම 2 (උපලේඛනය I) හා ඇමුණුම 3හි සඳහන් වේ. |

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

(iii) 2024.10.01 සිට මේ දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ - BoI - ආයෝජන ව්‍යාපෘතිවල සාරාංශය

| අනු අංක | අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු ගත විදේශීය ආයෝජනය (ඇමෙරිකානු ඩොලර් මිලියන) | ඇස්තමේන්තු ගත දේශීය ආයෝජනය (ඇමෙරිකානු ඩොලර් මිලියන) | ඇස්තමේන්තු ගත මුළු ආයෝජනය (ඇමෙරිකානු ඩොලර් මිලියන) |
|---|---|---|---|---|---|
| 1 | කෘෂි කර්මාන්තය | 13 | 19.3 | 32.6 | 51.9 |
| 2 | ඇඟලුම් | 44 | 118.2 | 83.3 | 201.5 |
| 3 | යටිතල පහසුකම් | 16 | 15.5 | 324.3 | 339.8 |
| 4 | දැනුම පදනම් කරගත් සේවා | 9 | 6.7 | 59.1 | 65.8 |
| 5 | නිෂ්පාදන | 92 | 534.1 | 588.1 | 1,122.2 |
| 6 | සේවා | 7 | - | 150.3 | 150.3 |
| 7 | සංචාරක සහ විවේකී කටයුතු | 11 | 31.0 | 68.1 | 99.1 |
| 8 | උපයෝගිතා සේවා | 23 | 320.7 | 360.6 | 681.3 |
| මුළු එකතුව | | 215 | 1,045.5 | 1,666.4 | 2,711.9 |

2024.10.01 සිට මේ දක්වා කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ - CPCEC - ආයෝජන ව්‍යාපෘතිවල සාරාංශය

| අනු අංකය | ව්‍යාපාරික අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | සෘජු විදේශ ආයෝජන - FDI- (ඇමෙරිකානු ඩොලර් මිලියන) |
|---|---|---|---|
| 1 | තොරතුරු තාක්ෂණය | 17 | 5.1 |
| 2 | උපදේශන සේවා | 3 | 1.0 |
| 3 | ආපනශාලා | 1 | 0.2 |
| 4 | තොග වෙළෙඳාම සහ සේවා | 2 | 1.8 |
| 5 | ව්‍යාපාරික ක්‍රියාවලි බාහිරින් ලබා ගැනීම - BPO | 1 | 65.0 |
| මුළු එකතුව | | 24 | 73.1 |

ඊට අමතරව එකඟ වූ ව්‍යාපෘති 95ක් තිබෙනවා, ක්ෂේත්‍ර කිහිපයක් යටතේ. ඒ 95ම තිබෙන්නේ වැඩිපුර ප්‍රමාණයක් තාක්ෂණය පදනම් කර ගත් ඒවා සහ වෙළෙඳාම පාදක කර ගත් ඒවා. ඒ සියලුම තොරතුරු ලේඛනයේ ඇතුළත් වෙලා තිබෙනවා.

(iv)

| ආයතනය | ව්‍යාපෘති ලැයිස්තුව |
|---|---|
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - BoI | විස්තරාත්මක ලැයිස්තුව ඇමුණුම 3හි සඳහන් වේ. |
| කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව - CPCEC | විස්තරාත්මක ලැයිස්තුව ඇමුණුම 4හි සඳහන් වේ. |

(ආ) පැන නොනඟී.

ඇමුණුම් 1, 2, 3 සහ 4 **සභාගත*** කරමි.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු අමාත්‍යතුමනි, ප්‍රශ්නයේ (අ) (iv) කොටසට අදාළව විස්තර ගොඩක් තිබෙන නිසා එම ලැයිස්තුව ඔබතුමා කියෙව්වේ නැහැ. නමුත් මම අහන්න බලාපොරොත්තු වුණේ කුමන කාලවලදී ව්‍යාපෘති කීයක් දළ වශයෙන් ආරම්භ කරනවාද සහ උත්පාදනය වන සමස්ත රැකියා ප්‍රමාණය කොපමණද කියන එකයි. මගේ පළමුවන අතුරු ප්‍රශ්නයට ඔබතුමා පිළිතුරු ලබා දෙනකොට ඒකටත් පිළිතුර දෙන්න.

ගරු ඇමතිතුමනි, ලංකාවට එන මේ සෘජු විදේශ ආයෝජනවලින් බහුතරයක් සඳහා රුපියල්වලින් තමයි වියදම් කරන්නේ. අපි උදාහරණයක් හැටියට ගත්තොත්, ආයෝජනයක් ආවාම raw materialsවලට ඒ ව්‍යාපෘතියේ තිබෙන ඩොලර්වලින් මුදල් වියදම් වෙනවා. හැබැයි, ඉතුරු ටිකට - labour cost සහ වෙනත් දේවල්වලට - රුපියල්වලින් වියදම් වෙන්නේ. එතකොට ඔබතුමා කිව්ව ආකාරයට ඩොලර් මිලියන 3,000කට වැඩිය ආයෝජන ආවා නම් අපේ සංචිතයටත් ඒ තුළින් යම් ධනාත්මක බලපෑමක් සිද්ධ වෙලා තිබෙන්න ඕනෑ. කලින් පිළිතුරු දීමට නියමිත වූ කාරණයත් එක්කම මේ ප්‍රශ්නයටත් පිළිතුරක් ලබා දෙන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු මන්ත්‍රීතුමනි, ඩොලර්වලින් ලැබෙනකොට ඔබතුමා කිව්වා වාගේ සංචිතවලට එකතු වෙනවා. ඒ වාගේම තමයි මේ ව්‍යාපෘති සඳහා රුපියල් ප්‍රමාණයක් වියදම් වෙනවා. පඩි නඩි දෙනවා. නමුත් මේ ව්‍යාපෘතිවල ආරම්භක අදියරේදී ඉදිකිරීම් සඳහා සහ යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම් සඳහා විශාල මුදල් ප්‍රමාණයක් නැවත ආපස්සට යනවා. එතකොට මෙහි ප්‍රතිඵල විධියට මේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙලා ඉදිරියේදී තමයි සංචිත ගොඩනැඟීම සහ ආර්ථිකයට වන දායකත්වය සෘජු වශයෙන් ප්‍රමාණාත්මකව මනින්න පුළුවන් වන්නේ. දැනට මේ ආපු ප්‍රමාණය, ශුද්ධ වශයෙන් රැඳිලා තිබෙන ප්‍රමාණය අනිවාර්යයෙන් සංචිතවලට එකතු වෙලා ඇති. නමුත්, සම්පූර්ණ ඩොලර් මිලියන 3,300ම එකතු වෙන්නේ නැහැ.

රැකී රක්ෂා සම්බන්ධයෙන් ගත්තොත්, මේ හැම ඇමුණුමකම ඒ, ඒ සමාගම සම්බන්ධයෙන් ජනනය වෙච්ච ප්‍රමාණය තිබෙනවා. උදාහරණයක් විධියට මම ඔබතුමාට එක කාරණයක් සඳහන් කරන්නම්. පළමුවන ව්‍යාපෘතිය හැටියට මම සඳහන් කළා, ආයතන 71ක් පිළිබඳව. ඒ අනුව, එතැනම රැකී රක්ෂා 70,533ක් තිබෙනවා. ඒක ඩොලර් මිලියන 611,713ක ආයෝජනයක්. ඒ ඇමුණුම මම සභාගත කළා. ඇත්තටම ව්‍යාපෘති 215ක ලොකු list එකක් තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මට තේරෙනවා, ඔය ලේඛනය කියවන්න සෑහෙන වෙලාවක් ගත වෙනවා කියන එක. ඒ නිසා ඔබතුමා එම ලේඛනය සභාගත කරපු එක මම පිළිගන්නම්.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට ඔබතුමාගෙන් genuine පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. දැන් ඔබතුමා ව්‍යාපෘති ගණනාවක් ක්ෂේත්‍ර 4කින් පෙන්වූවා. ගිවිසුම්ගත වෙච්ච ඒවා තමයි ඔබතුමා පෙන්වන්නේ. ගිවිසුම්ගත වෙච්ච ඒවායින් සැබෑ

ලෙස දැනට ආරම්භ කර තිබෙන ව්‍යාපෘති කීයක් තිබෙනවාද? එහෙම ආරම්භ නොකර ගිවිසුම්ගත වෙච්ච ව්‍යාපෘති ආරම්භ කරයි කියලා ඔබතුමාට කොච්චර විශ්වාසයක් තිබෙනවාද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මේ තිබෙන තොරතුරු අනුව කොළඹ වරාය නගරය හරහා ගිවිසුම්ගත වෙලා, එකඟ වෙලා ගැසට් කරලා තිබෙනවා, ව්‍යාපෘති 71ක්. එහි ප්‍රමාණය ඩොලර් මිලියන 612කට ආසන්නයි. ඒක විශාල ප්‍රමාණයක් නොවෙයි. අර ඩොලර් මිලියන 3,397න්, ඩොලර් මිලියන 612ක් තමයි ගිවිසුම්ගත වෙලා තිබෙන්නේ කොළඹ වරාය නගරයේ. එතැන සාපේක්ෂව අඩු ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙන්නේ. නමුත්, ආයෝජන මණ්ඩලය හරහා ආපු ප්‍රමාණය තමයි විශාල ප්‍රමාණය. එයින් ගිවිසුම්ගත වීම් නොවෙයි තිබෙන්නේ. නව ව්‍යාපෘතිවලත් යම් අදියර තිබෙනවා. දැනට තැන්පත් කරපු මුදල්, ඒ වාගේම පවතින ව්‍යාපෘති පුළුල් කිරීම සම්බන්ධයෙන් තමයි මේ ප්‍රමාණය ඇවිල්ලා තිබෙන්නේ. මෙයින් කොච්චර ප්‍රමාණයක් විශ්වාසවන්තව එනවාද, නැද්ද කියන එක ඇත්තටම ඒ අදාළ අධිකාරිය විසින් බලන්නට වෙනවා. අවශ්‍ය නම් ඒ තොරතුරු අපට ඉදිරියේදී ලබා දෙන්නට පුළුවන්. මොකද, ඔබ කිව්වා වාගේ සමහර ඒවා ගිවිසුම්ගත වෙනවා, මූලික වැඩකටයුතු කරනවා. එවැනි ප්‍රමාදයන් සිද්ධ වෙන්න පුළුවන්. දැන් ආයෝජන මණ්ඩලය විසින් මේ කටයුතු අධීක්ෂණය කරමින් ඉන්නවා. අතීතයේදීත් මෙවැනි ආකාරයට ප්‍රමාදයන් සිදු වී තිබෙනවා. අනිවාර්යයෙන්ම ඒක සාමාන්‍යයෙන් තිබෙන්න පුළුවන්. මොකද, සමහර ව්‍යාපාර පවත්වාගෙන යනකොට ලාභදායීත්වය කියන කරුණ බලපානවා. අපේ පැත්තෙන් අපි උපරිම උත්සාහ ගන්නවා, ඔවුන්ගේ ආයෝජන වේගවත් කර ගන්න, ආයෝජන විශ්වාසය වැඩි කර ගන්න වාගේම National Single Window එක යටතේ පහසුකම් ලබා ගන්න, ගරු මන්ත්‍රීතුමනි.

ආයෝජකයන් මුහුණ දෙන තව ප්‍රශ්නයක් තමයි, ඔවුන් ආයෝජනය ගෙනාවාට පසුව අවසර ලබා ගැනීමට ආයතන ගණනාවකට යන්න සිද්ධ වන එක. ඒ කටයුත්තත් පහසු කර ගන්න එය එක තැනකට ගෙන ඒමට අපි කටයුතු කරමින් ඉන්නවා. මම පිළිගන්නවා, සියල්ලක්ම සර්ව සම්පූර්ණ ලෙස අවසාන වෙලා නැහැ කියලා. නමුත්, අපි පියවරෙන් පියවර ඉදිරියට මේ අවශ්‍ය පහසුකම් ටික සම්පාදනය කරමින් ඉන්නවා.

## දේශපාලන සිරකරුවන්: විස්තර
அரசியல் கைதிகள்: விபரம்
POLITICAL PRISONERS: DETAILS

235/2024

**41. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'දේශපාලන සිරකරු' යන්න සඳහා ශ්‍රී ලංකා රජයේ අර්ථ නිරූපණය කවරේද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකා රජයේ අත්අඩංගුවේ සිටින දේශපාලන සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් දේශපාලන සිරකරුවාගේ නම සහ අත්අඩංගුවට ගැනීමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම දේශපාලන සිරකරුවන් නිදහස් කිරීමේ කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "அரசியல் கைதி" என்பதற்கு இலங்கை அரசின் பொருள்கோடல் யாது;

(ii) இன்றளவில் இலங்கை அரசால் கைது செய்யப்பட்டு தடுத்து வைக்கப்பட்டுள்ள அரசியல் கைதிகளின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி ஒவ்வோர் அரசியல் கைதியினதும் பெயர் மற்றும் கைது செய்யப்பட்டமைக்கான காரணம் வெவ்வேறாக யாது;

(iv) மேற்படி அரசியல் கைதிகளை விடுதலை செய்யும் காலப்பகுதிகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House the-

(i) definition given by the Government of Sri Lanka for the term "political prisoner";

(ii) number of political prisoners currently in the custody of the Government of Sri Lanka;

(iii) name of each of the political prisoner and the reason for his or her arrest, separately; and

(iv) time frame for the release of the said political prisoners?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) බන්ධනාගාර ආඥාපනත හා අනිකුත් බන්ධනාගාර නීති රෙගුලාසි "දේශපාලන සිරකරුවන්" ලෙස වෙන් කරන ලද කොට්ඨාසයක් සම්බන්ධයෙන් කිසිදු අර්ථ නිරූපණයක් කර නොමැත.

එහෙත් ගරු මන්ත්‍රීතුමා මගෙන් අහන්නේ ආණ්ඩුවේ ස්ථාවරය. ඒ අනුව පැහැදිලි කරන්නට වන්නේ අපි රටක් වශයෙන්, රජයක් වශයෙන් අන්තර්ජාතිකව පිළිගත් නිර්වචනවලට තමයි අනුගත වෙන්නේ කියන එකයි. Amnesty International ආයතනය, Parliamentary Assembly of the Council of Europe සහ United

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

Nations Working Group on Arbitrary Detention කියන තුන විසින් "දේශපාලන සිරකරු" යන්න නිර්වචනය කර තිබෙනවා. අපත් එයටයි අනුගත වන්නේ. මම Amnesty International එකේ අර්ථ නිරූපණය මුලින්ම කියන්නම්. According to "Amnesty International Report 2021/22: The State of the World's Human Rights", "political prisoners" are, "individuals who are imprisoned because of their political beliefs, affiliations or peaceful expression of dissent, provided they have not used or advocated violence". The Parliamentary Assembly of the Council of Europe defines a "political prisoner" as "anyone who is detained for political reasons, such as their political activities, expressions or affiliations, where the detention violates basic international standards of justice, fairness or human rights". Then, the United Nations Working Group on Arbitrary Detention defines that political prisoners include "persons who are deprived of their liberty for exercising rights and freedoms guaranteed under the international human rights law, such as freedom of expression, peaceful assembly and freedom of association". ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අනුව රජයේ ස්ථාවරය වන්නේ අන්තර්ජාතිකව පිළිගත් නිර්වචනයට තමයි අනුගත වෙන්නේ කියන එකයි.

(ii) අධිකරණ මඟින් සිරකරුවන්/ සැකකරුවන් වශයෙන් බන්ධනාගාරගත කරන අතර, දේශපාලන සිරකරුවන් වශයෙන් ගරු අධිකරණ මඟින් රැඳවියන් බන්ධනාගාරගත කර හෝ බන්ධනාගාරයේ රඳවා හෝ නොමැත.

(iii) ඉහත අනු අංක (ii)හි පිළිතුර අනුව අදාළ නොවේ.

(iv) ඉහත අනු අංක (ii)හි පිළිතුර අනුව අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු ඇමතිතුමාගේ පිළිතුර අනුව මේ රටේ දේශපාලන සිරකරුවන් කිසිවෙක් නැහැ. ඒක තමයි එතුමාගේ පිළිතුර අනුව පේන්නේ. මොකද, ප්‍රශ්නයේ (ii), (iii) සහ (iv) කොටස්වලට ඒ ආකාරයෙන් පිළිතුරු දුන්නාම අපට තේරුම් ගන්න තිබෙන්නේ දේශපාලන සිරකරුවන් කිසිවෙක් නැති බව වර්තමාන රජයේ ස්ථාවරය බවයි.

නමුත් පසුගිය ජනාධිපතිවරණයේදීත්, පාර්ලිමේන්තු මැතිවරණයේදීත් විශේෂයෙන්ම උතුරු සහ නැඟෙනහිර ප්‍රදේශවලදී බෙදුම්වාදී ව්‍යාපාරය තුළට දේශපාලන අරමුණක් ඇතිව සහභාගි වෙලා එහි ප්‍රතිඵලයක් හැටියට දිගු කලක් සිරගත වෙලා ඉන්න අය ඉන්නවා. ඒ වාගේම සමහර අය නඩු නැතිව රඳවාගෙන ඉන්නවා, තවත් අය වරදකරුවන් වෙලා දඬුවම් සැහෙන්න විඳලා තිබෙනවා. මේ තැනැත්තන් දේශපාලන සිරකරුවන් වශයෙන් සලකලා ඒ තැනැත්තන්ව රටේ නීතිය අනුව නිදහස් කිරීම සඳහා පියවර ගන්නා බවට ගරු ජනාධිපතිතුමා ජනාධිපතිවරණයේදීත්, ඉන්පසුව පාර්ලිමේන්තු මැතිවරණයේදීත් පොරොන්දු වුණා.

අපි දන්නවා, ජනවාර්ගික සහයෝගිතාව වැඩිදියුණු කරගෙන මේ රටේ ජාතීන් අතර සහයෝගීතාව නැවත ගොඩනඟන්න, එකමුතුකම ගොඩනඟන්න අපි විශේෂයෙන්ම යුද්ධය අවසන් වුණාට පස්සේ නඩු නැතිවම 14,000ක විතර ප්‍රමාණයක් පුනරුත්ථාපනය කළ බව. ඒ වාගේම අත්අඩංගුවේ සිටි විශාල පිරිසක් කොන්දේසි සහිතව මුදා හැරලා පුනරුත්ථාපන කටයුතුවලට යොමු කළා. ඒ වාගේම තවත් පිරිසකට දඬුවම්වල යම් සහනයන් ලබා දුන්නා. දැන් මේ තත්ත්වයන් තුළ විශේෂයෙන්ම උතුරේ සහ නැඟෙනහිර ඒ බෙදුම්වාදී ව්‍යාපාරයට සහභාගි වෙලා දැන් ඒ ගැන පශ්චාත්තාප වන, සාමාන්‍ය සමාජයට එකතු වෙලා මේ රටේ පුරවැසියන් විධියට රැඳී ඉන්න අපේක්ෂාවන් තිබෙන එම තැනැත්තන්ගේ අපේක්ෂාවන් පිළිබඳව ඔබතුමාගේ රජය, අධිකරණ ඇමතිතුමා හැටියට ඔබතුමා දේශපාලනික වශයෙන් ගන්නා ස්ථාවරය කුමක්ද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මට ප්‍රශ්නය තේරුණේ නැහැ, ආපහු අහන්න; ප්‍රශ්නය තේරුණේ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඔබතුමාට මේ ප්‍රශ්නය තේරුම් ගන්න බැරිවීම ගැන මම පුදුම වෙන්නේ නැහැ. මේ රටේ දේශපාලන සිරකරුවන් ඉන්නවා කියන පදනමින් තමයි පසුගිය ජනාධිපතිවරණයේදීත්, පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදීත් තමුන්නාන්සේලාගේ ඡන්ද ව්‍යාපාරය කළේ. ඒ දේශපාලන ව්‍යාපාරය තුළ උතුරු නැඟෙනහිර සන්නද්ධ අරගලය හා විවිධ මට්ටම්වලින් සම්බන්ධ වුණු විශාල පිරිසක් තවමත් සිරගතව ඉන්නවා. ඒ සමහරුන්ට චෝදනා ගොනු කරලාවත් නැහැ. ඒ තැනැත්තන් ඉක්මනින්ම මුදා හැරලා, සාමාන්‍ය සමාජයට අරගෙන ඇවිල්ලා, අවශ්‍ය අය පුනරුත්ථාපනය කරලා මේ රටේ පුරවැසියන් හැටියට ඔවුන්ගේ ජීවිත ගොඩ නැඟීම සඳහා කැප වෙන බවට පසුගිය ජනාධිපතිවරණයේදී පොරොන්දු වුණා. එම පොරොන්දුව පිළිබඳව දේශපාලනික වශයෙන් මේ රජයේ ස්ථාවරය කුමක්ද? ඒකයි මම අහන්නේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

දැන් පැහැදිලි වුණා.

ගරු මන්ත්‍රීතුමනි, අපේ රිමාන්ඩ් බන්ධනාගාරවල නඩු නැතිව රඳවාගෙන ඉන්න කට්ටිය නැහැ. මේ ලැයිස්තු අවස්ථා ගණනාවක්ම මම බලලා තිබෙනවා. හැමෝටම නඩුවක් තිබෙනවා, සමහරු නඩුවලදී වැරදිකාරයෝ වෙලා තිබෙනවා. ඒ, දේශපාලන හේතු මතම නොවෙයි, රටේ අපරාධ නීතියක් උල්ලංඝනය කිරීම මත. කෙසේ හෝ වේවා, ඒ ඇති වෙච්ච සමාජ, ආර්ථික සහ දේශපාලනික පරිසරය පිළිබඳව අපට හැඟීමක් තිබෙනවා, ඒක ඇති වෙච්ච තත්ත්වයන් පිළිබඳව හැඟීමක් තිබෙනවා. ඒ නිසා මේ වන විට Justice Thurairaja ඇතුළු කමිටුව සිරගතව සිටින අයගේ සිර දඬුවම් අඩු කිරීම සහ ජනාධිපති සමාව දීම සම්බන්ධව කටයුතු කරන්න මාස 6ක් විතර රැස් වුණා. දැන් දවස් 10කට පමණ පෙර ඒ කමිටු වාර්තාව ලබා දුන්නා. සියලු රැඳවියන්ට, සියලු සිරකරුවන්ට අදාළ වන පරිදි ඉදිරියේදී ජනාධිපති සමාව පාවිච්චි කරන්නේ කොහොමද කියන එක පිළිබඳව කමිටුවක් පත් කරලා ඒ කට්ටියව තෝරන්න ඕනෑ.

මොකද, ඒ වාර්තා අපට ලැබිලා තිබෙනවා. ඒ නිසා උතුර, නැඟෙනහිර සහ දකුණ කියලා භේදයකින් තොරව දීර්ඝ කාලීනව ඉන්න prisonersලාට දෙන්න පුළුවන් සහන දෙන්න තමයි අපි උත්සාහ කරන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අධිකරණ ඇමතිතුමා දෙන පිළිතුර දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම පිළිබඳව පසුගිය මැතිවරණවලදී රජය ලබා දුන්නු පොරොන්දුවත් එක්ක සම්බන්ධයක් නැහැ. එතුමා කියන්නේ පොදුවේ බන්ධනාගාරවල තදබදය ඉවත් කිරීම පිළිබඳව පත් කළ කමිටුව ගැනයි. මම සඳහන් කරන්නේ එය නොවෙයි. උදාහරණයක් විධියට ප්‍රභාකරන් මිය ගියාට පස්සේ LTTE සංවිධානයේ නායකයා වුණේ KP, කුමරන් පද්මනාදන්. එතකොට කුමරන් පද්මනාදන්ට නඩුත් නැතුව, දේශපාලනික තීරණයක් මත නිදහසේ ස්වේච්ඡා කටයුතු කරගෙන ඉන්න අවසරය දීලා තිබෙනවා; අධිකරණ කටයුතු නැතුව. ඒවා තමයි දේශපාලන තීරණ කියන්නේ. ඒක හරි ද, වැරදි ද කියන එක වෙනම තර්කයක්. ඒ වාගේම උතුරු නැඟෙනහිර අරගළයට සම්බන්ධ වුණු තවමත් තමන්ගේ නිදහස තහවුරු නොවුණු පිරිසක් ඉන්නවා. දැන් දශක ගණනක් ගත වෙලා තිබෙනවා. ඒ තැනැත්තන්ගේ නිදහස තහවුරු කිරීම සඳහා විශේෂිත වැඩ පිළිවෙළක් තිබෙනවාද? මොකද, එය වෙච්ච පොරොන්දුවක්. පසුගිය මැතිවරණවලදී වෙච්ච පොරොන්දුව ඉෂ්ට කරන්න ඔබතුමන්ලාගේ රජයේ කැපවීමක් නැද්ද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඒකද ප්‍රශ්නය?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඔව්.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමා ඇසූ ප්‍රශ්නය, ඒ කියපු කරුණු සියල්ලම සලකා බලලා මේ කියන්නේ. දැනට රිමාන්ඩ්ගතව ඉන්නේ, වැරදිකරු වෙලා තිබෙන්නේ, මේ රටේ නීතිය අනුව. ගරු මන්ත්‍රීතුමනි, අපි පිළිගන්නා වූ අන්තර්ජාතික නිර්වචන අනුව මා ඔබට කලිනුත් කියූ පරිදි, ඔවුන් ඒ ගණයට වැටෙන්නේ නැහැ. කෙසේ හෝ වේවා, අපි උතුරු නැඟෙනහිර ජනතාවට පමණක් නොවෙයි, දකුණේ ජනතාවට පවා සාධාරණයක් කරන්න ඉන්නේ. ජාතික ඒකාබද්ධතාව, සමගිය හා සාමය තිබෙන්නේ. නමුත්, අධිකරණයකින් වැරදිකරුවෙකු වුණු පුද්ගලයෙක්ව නිදහස් කරන්න කියලා අධිකරණ ඇමතිවරයාටවත්, ආණ්ඩුවටවත් නියෝග කරන්න බැහැ. ඒවාට appeal කරන ක්‍රමවේද තිබෙනවා; ඇප ලබා ගන්න ක්‍රමවේද තිබෙනවා. මෑතකදී කෙනෙකුට ඇප ලැබිලා තිබුණා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට මගේ උත්තරය තමයි මෙයයි. ඔව්, අපි ඒ සියල්ල සලකා බලනවා. නමුත්, අධිකරණ තීන්දු වෙනස් කරන්න අපි මැදිහත් වෙන්නේ නැහැ.

## නීතිපති දෙපාර්තමේන්තුව: නිලධාරි හිඟය
### சட்டத்துறை தலைமையதிபதி திணைக்களம்: உத்தியோகத்தர்கள் பற்றாக்குறை
### ATTORNEY-GENERAL'S DEPARTMENT: SHORTAGE OF OFFICERS

746/2025

**42. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාව හැර ගොස් සිටින නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නීතිපති දෙපාර්තමේන්තුවේ විශේෂ දක්ෂතා ඇති නිලධාරීන් මේ වන විට හිඟ වීමෙන් එක් නිලධාරියෙකු විසින් ලිපි ගොනු 200-300ක් පමණ හසුරුවන බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් ඇතිවී තිබෙන ප්‍රමාදය අවම කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) නීතිපති දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை இலங்கையை விட்டு வெளியேறியுள்ள சட்டத் துறை தலைமையதிபதி திணைக்கள உத்தியோகத்தர்களின் எண்ணிக்கை ஒவ்வோர் ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) சட்டத்துறை தலைமையதிபதி திணைக்களத்தில் தற்போது நிலவுகின்ற விசேட திறமையுள்ள உத்தியோகத்தர்களின் பற்றாக்குறை காரண மாக, ஓர் உத்தியோகத்தர் சுமார் 200-300 கோப்புகளை கையாளுகின்றார் என்பதையும்;

(iii) இதன் காரணமாக ஏற்பட்டுள்ள தாமதத்தை குறைப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) சட்டத்துறை தலைமையதிபதி திணைக்களத்தில் நிலவும் வெற்றிடங்களை நிரப்புவதற்கு மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) the number of officers of the Attorney-General's Department who have left Sri Lanka in each year from 2015 to date, separately;

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

(ii) whether he is aware that because of the current shortage of officers with special talents in the Attorney-General's Department, one officer has to handle approximately 200-300 files;

(iii) the measures that will be taken to minimize the delay caused because of the above reason; and

(iv) the steps that will be taken to fill the vacancies existing in the Attorney-General's Department?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2015 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව හැරගොස් දැනට විදේශගතව සිටින නීතිපති දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරින් සම්බන්ධ නිශ්චිත තොරතුරු මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැත. කෙසේ නමුත්, මෙම දෙපාර්තමේන්තුවේ සේවයෙන් ඉවත් වූ සමහර නිලධාරින් විදේශතව සිටින බවට කරුණු වාර්තා වේ. සෑම වසරකම නිලධාරින් අධ්‍යයන කටයුතු සඳහා සහ තාවකාලික විදේශ රැකියාවල නිරත වීම සඳහා වැටුප් රහිත නිවාඩු මත සහ යම් අවස්ථාවලදී අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු මත විදේශගත වේ. ඔවුන් නියමිත නිවාඩු කාලය අවසන් කිරීමෙන් පසු නිසි පරිදි සේවයට වාර්තා කර ඇති අතර, සමහර අවස්ථාවලදී ඔවුන් නැවත සේවයට වාර්තා නොකර සේවයෙන් ඉල්ලා අස් වන අවස්ථා ද ඇත. 2026 වර්ෂය වන විට නිලධාරින් 09දෙනෙකු අධ්‍යයන කටයුතු සඳහා/ රැකියාවක නියැළීම සඳහා විදේශ නිවාඩු මත විදේශගතව ඇත.

2016 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් විශ්‍රාම යාම සහ සේවයෙන් ඉල්ලා අස්වීම සිදුව ඇති ආකාරය පහත දැක්වේ.

| වර්ෂය | ඉල්ලා අස්වීම | විශ්‍රාම යාම |
|---|---|---|
| 2016 | 04 | 0 |
| 2017 | 05 | 01 |
| 2018 | 09 | 03 |
| 2019 | 03 | 02 |
| 2020 | 05 | 01 |
| 2021 | 02 | 04 |
| 2022 | 17 | 04 |
| 2023 | 15 | 03 |
| 2024 | 13 | 03 |
| 2025 | 06 | 02 |
| 2026 | 01 | 04 |
| මුළු | 80 | 27 |

(ii) ගරු මන්ත්‍රීතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට තිබෙන වැඩ රාජකාරි සම්බන්ධයෙන් ඔබතුමා දන්නවා. ඒ ගැන ඔබතුමා ඉතා හොඳ පැහැදිලි කිරීමක් කර තිබෙනවා. ඒ අයට ගොඩක් වැඩ රාජකාරි තිබෙනවා. බේරුම්කරණ විනිශ්චය සභා, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලවල පෙනී සිටීම, ඒ වාගේම චෝදනා පත්‍ර සකස් කිරීම, අපරාධ නඩු පවරන්න උපදෙස් දෙන එක යනාදි කාර්යයන් රාශියක් එම නිලධාරින් සිදු කරනවා. සාමාන්‍යයෙන් ජනාධිපති කොමිෂන් සභාවලට යනවා. ඒ සියල්ලම කරන ගමන් ඒ අය ඔබතුමා කිව්වා වාගේ ගොනු 150ක්, 200ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සම්බන්ධයෙන් කටයුතු කරනවා. ඒ, විශාල වැඩ ප්‍රමාණයක්. එක් නිලධාරියෙකු ගොනු 150ක් හෝ 250ක් කියලා තමයි තොරතුරු තිබෙන්නේ.

අනුමත කාර්ය මණ්ඩලය අනුව, මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරින්ගේ පුරප්පාඩු තිබෙනවා. ඒ අනුව බැලුවොත්, ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් පුරප්පාඩු 02ක්, අතිරේක සොලිසිටර් ජනරාල් පුරප්පාඩු 03ක්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් පුරප්පාඩු 09ක්, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් පුරප්පාඩු 05ක්, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ පුරප්පාඩු 37ක්, රජයේ අධිනීතිඥ පුරප්පාඩු 78ක් සහ රාජ්‍ය නීතිඥ අංශයේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ පුරප්පාඩු 01ක්, සහකාර රාජ්‍ය නීතිඥ පුරප්පාඩු 09ක්, කනිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ පුරප්පාඩු 24ක් තිබෙනවා. ඇත්තටම මේ පුරප්පාඩු ඇති වෙලා තිබෙන්නේ, පහළ ඉන්න කට්ටියට ඉහළට promote වෙන්න විධියක් නැති නිසා. මොකද, Public Service Commission එකේ තිබෙන Scheme of Recruitment සහ promotions පිළිබඳව තිබෙන rules නිසා. ඒ සම්බන්ධයෙන් මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුව අපේ අමාත්‍යාංශය හරහා කරුණු දක්වලා තිබෙනවා.

ඒ අනුව ඉදිරියේදී මේ කියන promotions ටික හදා ගන්න පුළුවන්. නමුත්, එතැන පොඩි පමාවක් වෙලා තිබෙනවා කියන එක පිළිගන්නවා.

(iii) මේ වනකොට සාකච්ඡා කර තිබෙනවා, කොන්ත්‍රාත් පදනම මත තරුණ අධිනීතිඥවරුන් 20දෙනෙකු බඳවා ගන්න. නමුත්, 20ක් ප්‍රමාණවත් නොවන නිසා එය 50ක් දක්වා වැඩි කරලා බඳවා ගන්න තමයි දැන් උත්සාහ ගන්නේ.

(iv) 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලය තුළ රාජ්‍ය ප්‍රතිපත්තිය මත පුරප්පාඩු පුරවා ගැනීමට හැකියාවක් ලැබුණේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඒ බව ඔබතුමාත් දන්නවා. නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරින්, ඒ කියන්නේ නීතිපති, සොලිසිටර් ජෙනරාල්, ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජෙනරාල්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්, නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සහ රජයේ අධිනීතිඥ තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 329ක් වනවා. එකී අනුමත කාර්ය මණ්ඩලයෙන් තනතුරු 134ක පුරප්පාඩු තිබෙනවා.

කෙසේ හෝ වේවා, මා කලින් දක්වපු කරුණු තමයි ඔබතුමාට උත්තරය හැටියට දෙන්න තිබෙන්නේ. ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මේකයි. අලුතින් recruit කර ගැනීමේ කටයුත්ත අපි ආරම්භ කරන්න ඕනෑ. ඒත් ගරු

මන්ත්‍රීතුමනි, ඔබතුමාත් හොඳින්ම දන්නවා, අප අලුතින් 100දෙනෙකු බඳවා ගත්තත් ඒගොල්ලන්ට සංකීර්ණ නඩු දෙන්න බැරි බව. එහෙම නම්, පහළ ඉන්න කට්ටිය promote වෙන්න ඕනෑ. ඒ කටයුත්තේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ යම් පමාවක් තිබෙන බව තමයි කියන්නේ. නමුත් එතැන මට පෙනෙනවා, ලිපි හුවමාරුවක් සිදු වන බවක්.

(ආ) අදාළ නොවේ.

ගරු මන්ත්‍රීතුමනි, මේ කරුණු ටික තමයි මූලිකව මට ඔබතුමාගේ ප්‍රශ්නයට කියන්න තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු ඇමතිතුමනි, බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, එම ප්‍රශ්නයට කාලෝචිත පිළිතුරක් ලබා දීම පිළිබඳව. නීතිඥ වෘත්තියේ යෙදී සිටි නිලධාරියෙකු හැටියට ඔබතුමාට මේ ප්‍රශ්න පිළිබඳව අවබෝධයක් තිබෙනවා. විශේෂයෙන්ම නීතිපති දෙපාර්තමේන්තුවෙනුත් විනිසුරුවරුන් පත් කර ගන්නවා. ඒ අය පත් කර ගැනීම, උසස්වීම් ලබා දීම, ස්ථාන මාරු කිරීම, වැඩ තහනම් කිරීම කියන කාරණා පිළිබඳව වර්තමානයේ රටේ ලොකු කතිකාවක් ඇති වෙලා තිබෙනවා. එවන් තත්ත්වයක් තිබියදී තමයි Special Grade විනිසුරුවරයෙකු වන ඉසුරු නෙත්තිකුමාර මැතිතුමා අඟුණුකොළපැලැස්ස වාගේ ප්‍රදේශයකට මාරු කරලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඒත් එක්කම විනිසුරුවරුන් 20දෙනෙකුට ආසන්න පිරිසකගේ වැඩ තහනම් වෙලා තිබෙනවා. එහෙම නැත්නම්, ඒ අය අධිකරණ සේවාවෙන් ඉවත් වෙලා තිබෙනවා. අපි දැන ගන්න කැමැතියි විනිසුරුවරුන් පත් කිරීම, මාරු කිරීම හෝ වැඩ තහනම් කිරීම සම්බන්ධව නිසි කාර්ය පටිපාටියක් තිබෙනවාද කියලා. මොකද, විනිසුරුවරුන්ගේ විශ්‍රාම කාලය වයස අවුරුදු 62 සිට 65 දක්වා දීර්ඝ කිරීම පිළිබඳව කතිකාවක් දැන් ඇති වෙලා තිබෙනවා. Bar Association එකෙනුත් මේ පිළිබඳව විරෝධතාවක් ප්‍රකාශ කර තිබෙනවා.

අපට හැම වෙලාවේම උදව් කරන රට වන ඉන්දියාවේ අද ඇති වෙලා තිබෙන තත්ත්වය බලන්න. මේ වන විට Cockroach Janta Party එක අරගළයක් සිදු කරනවා. එරට අග්‍ර විනිශ්චයකාරතුමා කියපු වචනයක් නිසා තමයි ඒ තත්ත්වය පවා ඇති වෙලා තිබෙන්නේ. එවැනි තත්ත්වයන් ඇති නොවෙන්න ඔබතුමා ගන්නා වූ ක්‍රියාමාර්ගය මොකක්ද කියා දැනගන්න කැමැතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

Hon. Member, personally, I am very fond of you and I really would like to answer your Supplementary Question. නමුත්, ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 33 (1)හි සඳහන් රීතිය ඔබට පෙන්වන්න මට සිදු වනවා. එහි මෙසේ සඳහන් වනවා:

> "... එම අතුරු ප්‍රශ්න මඟින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු කරනු නොලැබිය යුතු අතර, වාචික පිළිතුරකින් පැන නඟින යම් කාරණයක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුත්තේ ය."

ඒ නිසා ඔබතුමාට උත්තර දෙන්න මම බැඳිලා නැහැ. නමුත්, since I am very fond of you, I might explain to you separately what we are doing. Okay?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

Ah, the second Supplementary Question would be asked by you? Okay, go ahead. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

දෙවැනි අතුරු ප්‍රශ්නය, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ගරු අධිකරණ අමාත්‍යතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා මේ කාරණය සම්බන්ධයෙන් ගොඩක් මහන්සි වෙනවා. ඒ වාගේම ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමාත් කාරක සභාවට මේ කාරණය යොමු කර තිබෙනවා. අදත් ඒ සම්බන්ධයෙන් මම කරුණු විමසුවා. අධිකරණය සම්බන්ධයෙන් සමාලෝචනයක් කිරීම සඳහා මම කරුණු ටිකක් විමසා බැලුවා. ගරු ඇමතිතුමනි, රැඳවියන් භාගයකට අධික පිරිසක් නිදහස් කරන්න පුළුවන්, හොඳ පැවැත්ම මත. රීටා ජෝන්ස් ඝාතන නඩුවෙන් පස්සේ අවුරුදු ගණනක් ඒක සිදු වෙලා නැහැ. මම නියෝජ්‍ය අධිකරණ ඇමතිවරයා වශයෙන් ඉන්න කොටත්,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමා, මේ ප්‍රශ්නයට අදාළව පැහැදිලි කර ගැනීමක් පමණයි කරගන්න පුළුවන් වන්නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ඒක තමයි, ගරු ඇමතිතුමා ඒකට සවන් දෙනවා. ඔබතුමිය බාධා කරන්න එපා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

Standing Ordersවලට අනුව,-

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

කමක් නැහැ, අහන්න ඉඩ දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මම දන්නවා, එතුමා ඒකට ඉඩ දෙයි කියලා. ඒකයි මා අහන්නේ. ඒ නිසා මට බාධා කරන්න එපා.

ගරු ඇමතිතුමනි, අපිත් ඒකට උපරිම සහයෝගය දෙනවා. ඒක ප්‍රායෝගිකව කර ගන්න බැරි වුණු තත්ත්වයක් තමයි තිබුණේ. ඒ කාලයේත් අපි ඔය සංශෝධනය ගෙනාවා. නමුත්, ඒ කටයුත්ත සිදු වුණේ නැහැ. මා හිතන විධියට, ඔබතුමාත්, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවත් ඒ සම්බන්ධයෙන් ලොකු උනන්දුවක් දක්වනවා. කොහොම හරි මේ කාලය තුළ හෝ එය කර ගත්තොත්, බන්ධනාගාරවල පවතින මේ අධික තදබදය නැති කර ගන්න පුළුන්; රැඳවියන්ගෙන් භාගයකට අධික පිරිසක් හිරගෙවල්වලින් ඉවත් කරන්න පුළුවන්. මේ තිබෙන ප්‍රායෝගික

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

අපහසුතාව නිසා තමයි ගැටලු මතු වී තිබෙන්නේ. ඇත්තටම එය ඔබතුමන්ලාගේ හෝ අපේ වරදක් නොවෙයි. එහෙම වෙලා තිබෙන්නේ, අවුරුදු ගණනක් තිස්සේ ඒවාට හරියාකාර විසඳුමක් නොදුන් නිසා. ඉතින් ගරු ඇමතිතුමනි, මම මේ කාරණය කෙරෙහි ඔබතුමාගේ සම්පූර්ණ අවධානය යොමු කරවනවා. අපි දිගින් දිගටම මේ කාරණය මතු කරනවා. ගරු ඇමතිතුමනි, කාරක සභාවත් පාවිච්චි කරලා ඔබතුමා ඒ කටයුත්ත කළොත්, බන්ධනාගාරවල තදබදය නැති කර ගැනීම සඳහා එය බෙහෙවින් හේතු වෙයි කියලා මම මේ වෙලාවේදී ප්‍රකාශ කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, එය ඉතා වැදගත් කාරණාවක්. එය ඇසීම ගැන ස්තුතියි. ඒ කෙරෙහි අපේ අවධානය යොමු වෙනවා. අපි දැන් වැඩ පිළිවෙළ කිහිපයක ඉන්නවා. Prisonsවල තදබදය අඩු කිරීම සහ පුද්ගලයන්ට සමාව දීම සම්බන්ධයෙන් කමිටු වාර්තාවකුත් Justice Thurairaja Committee එකෙන් අපි මේ ළඟදී කැඳෙව්වා. මම විශ්වාස කරනවා, scientifically අපට මේ සඳහා approach එකක් දෙන්න පුළුවන් කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දක්වන දායකත්වයට අපි ස්තුතිවන්ත වෙනවා. අපි ඒ ගැන සොයා බලන්නම්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ප්‍රශ්න අංක 43 -1377/2025- (1), ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

## පූනුගල-වේවැල්තලාව වතු මාර්ගය අසල වන රක්ෂිතය: විස්තර

### பூணுகல - வேவெல்தலாவ தோட்ட வீதிக்கு அண்மையிலுள்ள வன ஒதுக்கம்: விபரம்

### FOREST RESERVE ALONG POONUGALA-WEWELTHALAWA ESTATE ROAD: DETAILS

1549/2025

**44.ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පූනුගල-වේවැල්තලාව වතු මාර්ගය ආශ්‍රිතව වන රක්ෂිතයක් පවතින බව දන්නේද;

(ii) එම වන රක්ෂිතයේ ජෛව විවිධත්වය හා ඊට ආවේණික ලක්ෂණ කවරේද;

(iii) ඉහත වන රක්ෂිතය තුළ අනවසර ඉදි කිරීමක් පවතින බව දන්නේද;

(iv) එම වන රක්ෂිතය තුළ සිදු කරනු ලබන අනීතික ක්‍රියා පාලනය කිරීමට අදාළ වතු සමාගම සහ පොලීසිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ඉහත වන රක්ෂිතය ආරක්ෂා කිරීමට අදාළ වතු සමාගම සහ රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யட்டியந்தோட்டை பிரதேச செயலாளர் பிரிவில், பூணுகல - வேவெல்தலாவ தோட்ட வீதிக்கு அண்மையில் வன ஒதுக்கமொன்று காணப்படுவதை அவர் அறிவாரா என்பதையும்;

(ii) மேற்படி வன ஒதுக்கத்தின் உயிர் பல்வகைத்தன்மை மற்றும் அதன் தனித்துவமான பண்புகள் யாவை என்பதையும்;

(iii) மேற்படி வன ஒதுக்கத்தில் சட்டவிரோத கட்டுமானமொன்று காணப்படுவதை அவர் அறிவாரா என்பதையும்;

(iv) மேற்படி வன ஒதுக்கத்தில் சட்டவிரோத நடவடிக்கைகளை கட்டுப்படுத்துவதற்குச் சம்பந்தப்பட்ட பெருந்தோட்டக் கம்பனியும், பொலிஸாரும் மேற்கொண்டுள்ள நடவடிக்கை கள் யாவை என்பதையும்;

(v) மேற்படி வன ஒதுக்கத்தைப் பாதுகாப்பதற்காக உரிய தோட்டக் கம்பனியும், அரசாங்கமும் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் வெவ் வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) whether he is aware that there is a forest reserve along the Poonugala-Wewelthalawa Estate Road in the Yatiyantota Divisional Secretary's Division;

(ii) the biodiversity of the said forest reserve and its unique characteristics;

(iii) whether he is aware that there is an unauthorized construction in the said forest reserve;

(iv) the measures taken by the relevant plantation company and the police to control the illegal activities carried out in the said forest reserve; and

(v) the measures taken by the relevant plantation company and the Government, separately, to protect the said forest reserve?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පූනගල-වේවැල්තලාව වතු මාර්ගය ආශ්‍රිතව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් 2014.08.19 දිනැති 1876/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින්

සංරක්ෂණ වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත් කොට ඇති අතර, එය අමනාවල (අම්පාන කොටස) සංරක්ෂණ වනාන්තරය ලෙස හැඳින්වේ. එය ඇමුණුමෙහි Google Earth සිතියමේ දම් පැහැයෙන් සලකුණු කර ඇත. එම ඇමුණුම **සභාගත*** කරමි.

ඊට අමතරව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට නියමිත සියයට 60ට වැඩි වන ආවරණයක් සහිත හල්ගොල්ලවත්ත නමැති වනාන්තරය ඒ ආශ්‍රිතව පවතී. එය, ඉහතින් සභාගත කරන ලද ඇමුණුමෙහි Google Earth සිතියමෙහි රතු පැහැයෙන් වර්ණ ගන්වා ඇත.

(ii) මෙම රක්ෂිතය නිවර්තන තෙත් උප කඳුකර ලක්ෂණ දරන පරිසර පද්ධතියක් ලෙස හඳුනාගෙන ඇත. එමෙන්ම, මෙම පරිසර පද්ධතිය හොර, දුන්, ලියන් හා ඇටඹ වැනි ආවේණික ශාකවලින් සමන්විත වන අතර, ක්ෂීරපායින් ලෙස ගෝනා, මුවා, දිවියා, දඬුලේනා වැනි සතුන්ද, කෑදැත්තා, වළි කුකුළා හා බස්සන් විශේෂ, ඒ වාගේම උරගයින් හා උභය ජීවින්ගෙන්ද සමන්විත වේ.

2014.08.19 දිනැති 1876/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් සංරක්ෂණ වනාන්තරයක් බවට ප්‍රකාශයට පත් කොට ඇති අමනාවල (අම්පාන කොටස) සංරක්ෂණ වනාන්තරය, යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පූනගල-වේවැල්තලාව වතු මාර්ගය ආශ්‍රිතව පිහිටා ඇත.

(iii) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු උක්ත අමනාවල (අම්පාන කොටස) සංරක්ෂණ වනාන්තරයේ හෝ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට නියමිත හෙක්ටෙයාර 85කින් යුත් හල්ගොල්ලවත්ත නමැති වනාන්තරය තුළ කිසිදු අනවසර ඉදි කිරීමක් නොමැත.

(iv) අදාළ නොවේ.

(v) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු අමනාවල (අම්පාන කොටස) සංරක්ෂණ වනාන්තරය ගැසට් කර ඇත. ඒ අනුව, එම කොටස වන සංරක්ෂණ ආඥාපනත අනුව ආරක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ.

වතු සමාගමට අයත් හෙක්ටෙයාර 85කින් යුත් හල්ගොල්ලවත්ත කොටස දැනට අත් පත් කර ගැනීමට කටයුතු කරමින් පවතී. එය අත් පත් කර ගැනීමෙන් පසු, වන සංරක්ෂණ ආඥාපනත අනුව ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර, ඉන් පසු ඉහත පරිදි ආරක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
පිළිතුර ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. අතුරු ප්‍රශ්න නැහැ.

## පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ ඛාදනය වැළැක්වීම: ක්‍රියාමාර්ග
## புத்தளம் மாவட்டத்தில் கடலரிப்பைத் தடுத்தல்: நடவடிக்கை
## PREVENTION OF COASTAL EROSION IN PUTTALAM DISTRICT: MEASURES TAKEN

1963/2026

**45.** **ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය දැඩි ලෙස ඛාදනයට ලක් වෙමින් පවතින බවත්;

(ii) ධීවර කටයුතු පවත්වාගෙන යෑමට නොහැකි තත්ත්වයට බෝට්ටු හා තෙප්පම් තොටුපොළවල් මුහුදට ඛාදනය වී ගොස් ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) වෙරළ ඛාදනය වළක්වා ගැනීම සඳහා ගල්වැටි ඉදි කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) වෙරළ සංරක්ෂණය සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) දිවයින වටා වෙරළ ඛාදනය වීමට හේතු, විද්‍යාත්මක තොරතුරු සහ දත්ත ආශ්‍රයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்தின் கரையோரப் பரப்பு பாரிய அரிப்புக்குள்ளாகி வருவதையும்;

(ii) கடற்றொழில் நடவடிக்கைகளை மேற்கொள்ள முடியாத நிலைக்கு படகு மற்றும் தோணி இறங்குதுறைகள் கடலரிப்புக்கு உள்ளாகி உள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) கடலரிப்பைத் தடுப்பதற்காக கல்வேலிகளை நிர்மாணிப்பதற்குத் தேவையான நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) கரையோரப் பாதுகாப்புக்காக கரையோரப் பாதுகாப்பு மற்றும் கரையோர வளங்கள் முகாமைத்துவத் திணைக்களத்துக்குத் தேவையான இயந்திர சாதனங்களை வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු අජිත් ගිහාන් මහතා]

(iii) தீவைச் சூழக் கடலரிப்பு ஏற்படுவதற்கான காரணங்களை, அறிவியல் ரீதியான தகவல்கள் மற்றும் தரவுகளின் அடிப்படையில் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Is he aware that -

(i) coastal belt in the Puttalam District is undergoing severe erosion; and

(ii) boat and fishing craft landing sites have eroded into the sea to a state that it is impossible to carry out fishing activities there?

(b) Will he inform this House -

(i) whether necessary provisions have been allocated for the construction of rock revetments to prevent coastal erosion;

(ii) whether steps will be taken to provide the Department of Coast Conservation and Coastal Resource Management with the machinery required for coast conservation; and

(iii) whether the causes of coastal erosion around the Island will be provided based on scientific information and data?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i), (ii)

ඔව්.

පුත්තලම දිස්ත්‍රික්කයේ අඹකඳවිල, උඩප්පුව, කරුකපනේ, කුඩාව-කල්පිටිය, ඉලන්තඩිය-ආලංකුඩා, කිරිමුන්දලම යන වෙරළ තීර ආශ්‍රිතව වෙරළ ඛාදන තත්ත්වයන් වාර්තා වේ. මෙමඟින්

පුත්තලම දිස්ත්‍රික්කය තුළ ධීවර හා සංචාරක කර්මාන්තයට අහිතකර බලපෑම් එල්ල වී ඇත.

(ආ) (i) • ඔව්.

| වෙරළාරක්ෂක ඉදිකිරීම් වැඩසටහන | | 2026 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රමාණය (රුපියල් මිලියන) |
|---|---|---|
| **1.** | **වාර්ෂික අයවැය ප්‍රතිපාදන** | |
| 1.1. | උඩප්පුව උතුර මීටර් 200.0 රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම | 6.70 |
| 1.2. | මුඳුකටුව ධීවර තොටුපොළ T දියකඩන ව්‍යූහ ඉදිකිරීම | 6.50 |
| 1.3. | ඉරණවිල - අඹකඳවිල වෙරළාරක්ෂක ඉදිකිරීම | 18.00 |
| 1.4. | උඩප්පුව දකුණ (කෝවිල ඉදිරිපිට) මීටර් 200.0 රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම | 32.10 |
| 1.5. | ආරච්චිකට්ටුව, කරුකපනේ T දියකඩන ව්‍යූහ 2ක් ඉදිකිරීම | 18.70 |
| **2.** | **විශේෂ ප්‍රතිපාදන** | |
| 2.1. | මුතුපන්තිය කලපු මෝය ප්‍රතිස්ථාපනය (මෙය "දිට්වා සුළි කුණාටු" ආපදා ප්‍රතිසංස්කරණ විශේෂ ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වේ.) | 9.00 |
| **එකතුව** | | 91.00 |

- ඉහත පරිදි රුපියල් මිලියන 91ක් පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළාරක්ෂක ඉදිකිරීම් කටයුතු සඳහා 2026 වසරට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන වෙන් කොට ඇත.
- ඉලන්තඩිය - නොරොච්චෝලේ ප්‍රදේශයේ වෙරළ ඛාදනය පාලනය සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ග්‍රොයින ව්‍යූහ 09ක් ඉදිකිරීම මඟින් ව්‍යාපෘතියේ පළමු අදියර අවසන් කර ඇත. එහි දෙවන අදියර වශයෙන් නොරොච්චෝලේ විදුලි බලාගාරයේ මූල්‍ය ප්‍රතිපාදන සහිතව තව ග්‍රොයින ව්‍යූහ 04ක් ඉදිකිරීමට නියමිතව ඇත.
- මීට අමතරව, කරුකපනේ T - දියකඩන ව්‍යූහ ඉදිකිරීම, දකුණු උඩප්පුව T - ග්‍රොයින බැම් ඉදිකිරීම, ඉරණවිල, අඹකඳවිල T - දියකඩන ඉදිකිරීම සඳහා 2027 වර්ෂයේදී යෝජිත වැඩ සැලැස්මට ව්‍යාපෘති ඇතුළත් කර ඇත. මෙමඟින් වෙරළ ඛාදන තත්ත්වයන්ට පිළියම් ද, ධීවර කටයුතු සඳහා අවශ්‍ය තොටුපොළ නිර්මාණය වීම ද යන කරුණු දෙකම ඉටු කර ගැනීම අරමුණ වේ.

(ii)

- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා නව වීල් ලෝඩරයක් හා කියුබ් 03 ටිපර් රථයක් මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 53.0ක මුදලක් මෙම වසරේ අය වැය ප්‍රතිපාදන මඟින් වෙන්කර ඇත. එහි ප්‍රසම්පාදන කටයුතු අනුව, 2026.07.06 දින මිල ගණන් විවෘත කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කෙරේ.
- මීට අමතරව යන්ත්‍රෝපකරණ කුලී පදනම මත සපයා ගනිමින් වෙරළාරක්ෂක වැඩබිම් ක්‍රියාත්මක කෙරේ. තවද, ආරක්ෂක කවුන්සලය හරහා ත්‍රිවිධ හමුදාව සතුව පවතින යන්ත්‍රෝපකරණ, විශේෂයෙන් එක්ස්කැවේටර් යන්ත්‍ර හා වීල් ලෝඩර් යන්ත්‍ර වෙරළාරක්ෂක වැඩ සඳහා යොදා ගැනීමේ ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කරමින් පවතී.
- මීට අමතර, 2027 වර්ෂයේ අය වැය ප්‍රතිපාදන මඟින් හෝ මේ වනවිට රජය මඟින් ඉදිකිරීම් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ක්‍රියාත්මක

කෙරෙන ටෙන්ඩරය තුළට ඇතුළත් කර හෝ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා නව යන්ත්‍ර 12ක් ලබා ගැනීම සඳහා යෝජනා වාර්තාවක් මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

(iii) පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරයේ මෑත වසරවල දී වෙරළ ඛාදන තත්ත්වය තීව්‍ර වීමට ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් දෙකම හේතු වී ඇත. ප්‍රධාන වශයෙන්,

- නිරිතදිග මෝසම් සමයේ ඇතිවන ප්‍රබල රළ ක්‍රියාකාරිත්වය සහ කුණාටු තත්ත්වය හේතුවෙන් වෙරළ තීරයට දැඩි රළ බලපෑම් එල්ල වීම.
- දේශගුණික විපර්යාසවල ප්‍රතිඵලයක් ලෙස මුහුදු මට්ටම ක්‍රමයෙන් ඉහළ යෑම සහ අධික කාලගුණික සිදුවීම් වැඩිවීම.
- වෙරළ තීරය ඔස්සේ සිදුවන ස්වාභාවික වැලි ප්‍රවාහනය වෙනස්වීම හෝ බාධා වීම.
- මීට පෙර ඉදිකර ඇති ඇතැම් වෙරළ ආරක්ෂණ ව්‍යුහ හේතුවෙන් ඇතැම් ස්ථානවන වැලි තැන්පත් වීම සහ යාබද ප්‍රදේශවල ඛාදනය වැඩිවීම.
- සීමා උල්ලංඝනය කරමින් අවදානම් කලාපවල වෙරළ ආශ්‍රිත අනවසර ඉදිකිරීම් සිදු කිරීමෙන්, ස්වාභාවික ආපදා තත්ත්වයන්හි දී එම ඉදිකිරීම් හේතුවෙන් වෙරළේ ස්වාභාවික ආරක්ෂණ හැකියාව අඩු වීම.

ඉහත හේතුවල ඒකාබද්ධ බලපෑම හේතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ ඉරණවිල, අඹකඳවිල, උඩප්පුව, කරුකපනේ, කුඩාව, කල්පිටිය, කිරිමුන්දලම සහ ඉලන්තඩිය ආදී ප්‍රදේශවල වෙරළ ඛාදනය මෑත කාලයේදී වැඩි වශයෙන් නිරීක්ෂණය වී ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අතුරු ප්‍රශ්න නැහැ.

## මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සහ නැවත මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වැළැක්වීම: ගෙන ඇති ක්‍රියාමාර්ග

## போதைப்பொருளுக்கு அடிமையானோருக்கு புனர்வாழ்வளித்தல் மற்றும் மீண்டும் போதைப்பொருள் பாவனைக்குத் திரும்புவதைத் தடுத்தல்: நடவடிக்கை

REHABILITATION OF DRUG ADDICTS AND PREVENTION FROM RELAPSING INTO DRUG USE: ACTION TAKEN

2105/2026

**46.ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිව සිටි පුද්ගලයන්, රජයේ හෝ අනුමත පුනරුත්ථාපන මධ්‍යස්ථාන මඟින් සාර්ථකව පුනරුත්ථාපනය කරනු ලැබුවද, රැකියා නොලැබීම, විදේශ රැකියා සඳහා යෑමේදී බාධා ඇතිවීම, පොලිස් නිශ්කාෂණ වාර්තා ලබාගැනීමේ ගැටලු, සමාජයෙන් ප්‍රතික්ෂේපවීම සහ ආරක්ෂක අංශ මඟින් සැක සහිත පුද්ගලයන් ලෙස සැලකීම වැනි හේතු නිසා නැවත මත්ද්‍රව්‍ය භාවිතයට හෝ අපරාධ ජාල වෙත යොමුවීමේ නැඹුරුතාවක් පවතින බව එතුමා පිළිගන්නේද;

(ආ) (i) මේ වනවිට ක්‍රියාත්මක වන පිළිගත් පුනරුත්ථාපන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන මඟින් සාමාන්‍යයෙන් වාර්ෂිකව පුනරුත්ථාපනය කරනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා පුද්ගලයන් යොමු කිරීමේ ක්‍රමය කවරේද;

(iv) පුනරුත්ථාපනය කිරීමෙන් පසු නැවත මත්ද්‍රව්‍ය භාවිතයට සහ අපරාධ වෙත යොමුවීම වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) නිසි පුනරුත්ථාපන ක්‍රියාවලියක් සම්පූර්ණ කිරීමෙන් සහ යම් පරිවාස කාලයකින් අනතුරුව, සුළු චෝදනා සහිත පුද්ගලයන් අපරාධමය චෝදනාවලින් නිදහස් කර පොලිස් නිශ්කාෂණ වාර්තා නිකුත් කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීමේ හැකියාව තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) போதைப்பொருள் பாவனைக்கு அடிமையான ஆட்களுக்கு அரச அல்லது அங்கீகாரம்பெற்ற புனர்வாழ்வளிப்பு நிலையங்களால் வெற்றிகரமாகப் புனர்வாழ்வளிக்கப்பட்டபோதிலும், தொழில் கிடைக்காமை, வெளிநாட்டு வேலைவாய்ப்புகளுக்குச் செல்லும்போது சிக்கல்களை எதிர்நோக்குதல், பொலிஸ் தடைநீக்கச் சான்றிதழ்களைப் பெற்றுக்கொள்வதிலுள்ள சிக்கல்கள், சமூகப் புறக்கணிப்பு என்பவற்றுடன் பாதுகாப்புப் பிரிவால் சந்தேகத்துக்கிடமான ஆட்களாகக் கருதப்படுதல் போன்ற காரணங்களால் மீண்டும் போதைப்பொருள் பாவனையின்பால் அல்லது குற்றச்செயல்களோடு சம்பந்தப்பட்ட வலையமைப்புகளின்பால் ஈர்க்கப்படும் ஒரு போக்கு காணப்படுகின்றது என்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) தற்போது அமுலிலுள்ள அங்கீகாரம்பெற்ற புனர்வாழ்வளிப்பு நிலையங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி நிலையங்களால் சராசரி வருடாந்தம் புனர்வாழ்வளிக்கப்படுகின்ற ஆட்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) ஆட்களைப் புனர்வாழ்வளிப்புச் செயன்முறைக்கு ஆற்றுப்படுத்துவதற்கான முறைமைகள் யாவை என்பதையும்;

(iv) புனர்வாழ்வளிக்கப்பட்ட பின்பு மீண்டும் போதைப்பொருளைப் பாவிப்பதையும் குற்றச்செயல்களின்பால் ஈர்க்கப்படுவதையும்

[ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා]

தடுப்பதற்கு எடுக்கப்படுகின்ற நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) உரிய புனர்வாழ்வளிப்புச் செயன்முறையொன்றைப் பூர்த்தி செய்வதன்மூலம் குறித்தவொரு நன்னடத்தைக் காலத்தைத் தொடர்ந்து சிறிய குற்றச்சாட்டுகள் உடைய ஆட்களை குற்றச்செயல் சார்ந்த குற்றச்சாட்டுக்களிலிருந்து விடுவித்து பொலிஸ் தடைநீக்கச் சான்றிதழ்களை விநியோகிக்கும் முறைமையொன்றை அறிமுகப்படுத்துவதற்கு வாய்ப்புள்ளதா என்பதையும்;

(vi) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he accept that, although the drug addicts are successfully rehabilitated through Government-operated or approved rehabilitation centres, there is a tendency for such persons to relapse into drug use or become involved in criminal networks due to factors such as unemployment, obstacles encountered in seeking foreign employment, difficulties in obtaining police clearance certificates, exclusion from the society and being treated as suspects by security divisions?

(b) Will he inform this House -

(i) the number of recognized rehabilitation centres currently in operation;

(ii) the average number of persons rehabilitated annually through such centres;

(iii) the procedures adopted for referring persons to the rehabilitation process;

(iv) the measures that will be taken to prevent relapse into drug use and re-involvement in crimes after rehabilitation;

(v) whether there is a possibility of introducing a mechanism whereby persons charged with minor offences may, upon the successful completion of a prescribed rehabilitation process and a specified probationary period, be exonerated from such criminal records and issued with police clearance certificates; and

(vi) if not, the reasons therefor?

(c) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)

(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සමීක්ෂණවලට අනුව පුනරුත්ථාපනය කර නැවත මුදාහරින පුද්ගලයන් අතරින් සියයට 40ක් ද පුනරුත්ථාපන කාර්යාංශයට අනුව සියයට 70ක් ද නැවත මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවන බව පෙනී යයි. ඒ අනුව පුනරුත්ථාපනයට යොමු කරන පිරිස අතරින් සියයට 50කට ආසන්න ප්‍රමාණයක් ඔවුන් ඇසුරු කරනු ලබන පුද්ගලයන් හා ජීවත්වන පරිසරය වැනි සාධක මත නැවත මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවන බව අධ්‍යයනවලින් පැහැදිලි වේ.

(ආ) (i) දැනට ක්‍රියාත්මක වන පිළිගත් පුනරුත්ථාපන මධ්‍යස්ථාන ගණන 41කි.

පුනරුත්ථාපන කාර්යාංශය යටතේ පුනරුත්ථාපන මධ්‍යස්ථාන - 03

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ පුනරුත්ථාපන මධ්‍යස්ථාන - 09

බලපත්‍රලාභී පුද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන - 22

නාමෝද්දිෂ්ට පුනරුත්ථාපන මධ්‍යස්ථාන (බන්ධනාගාර) - 07

ඒ සම්බන්ධ සවිස්තර වාර්තාව ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ii) වාර්ෂිකව ආසන්න වශයෙන් පුද්ගලයන් 10,808ක පමණ පිරිසක් පුනරුත්ථාපනය අවසන් කරනු ලබනවා.

(iii) 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතෙහි 9 (1) වගන්තියේ නෛතික ප්‍රතිපාදනවලට අනුව අන්තරාදායක ඖෂධවලට ඇබ්බැහිවීම සම්බන්ධ ප්‍රතිකාර ලැබීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන තැනැත්තෙකුට ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළත් වීම සඳහා ඉල්ලුම් කළ හැකි ය. එම ඉල්ලුම්කරු බාල වයස්කරුවෙකු වුවහොත් දෙමාපියන් හෝ භාරකරු විසින් එම බාලවයස්කරු වෙනුවෙන් ඇතුළත්වීම සඳහා ඉල්ලීමක් කළ හැකි ය.

මේ සම්බන්ධව සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම අනුයුක්ත අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සංවර්ධන නිලධාරියෙකු ස්ථානගතව ඇති අතර, ඔහු හා සම්බන්ධව වී පුනරුත්ථාපනයට යොමු වීමට හැකියාව පවතී.

පනතේ 10 (1), (2), (3), (4) වගන්ති හි නෛතික ප්‍රතිපාදන අනුව ප්‍රතිකාර මධ්‍යස්ථානයකට අනිවාර්යයෙන් ඇතුළත් කිරීමේදී ගත යුතු ක්‍රියාමාර්ග පහත පරිදි ය.

- යම් තැනැත්තෙක් අන්තරායකර ඖෂධ පුරුද්දක් වශයෙන් පාවිච්චි කරන්නෙකු බව හා එයට ඇබ්බැහි වූවකු බව පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධාරියෙකුට තොරතුරු ලැබුණු අවස්ථාවක රජයේ වෛද්‍ය නිලධාරියෙකු ලවා ඒ තැනැත්තා පරීක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

---

* *පුස්තකාලයේ තබා ඇත.*

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

- රජයේ වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව අනුව ඔහු විසින් පරීක්ෂා කරනු ලැබූ තැනැත්තා අන්තරායදායක ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තෙක් නම්, පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරියා විසින් එම තැනැත්තා මහෙස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කළ යුතු හෝ ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු අතර, ඒ තැනැත්තා මහෙස්ත්‍රාත්වරයා විසින් තීරණය කරනු ලබන මෙම පනත යටතේ නාමෝද්දිෂ්ට හෝ බලපත්‍රලත් ප්‍රතිකාර මධ්‍යස්ථානයක දී අනිවාර්ය ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය සඳහා යවන ලෙස ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කළ යුතුය.
- 2022 අංක 41 දරන විෂ වර්ග, අබිං හා අන්තරායදායක ඖෂධ වර්ග පිළිබඳ සංශෝධන පනතේ 86 සහ 87 වගන්ති මඟින්ද පුනරුත්ථාපනයට යොමු කිරීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන දක්වා ඇති අතර ඇබ්බැහි වීමේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන තීරණය කරනු ලබන යම් කාල සීමාවකට අධිකරණය විසින් ඒ තැනැත්තා ප්‍රතිකාර මධ්‍යස්ථානයකට භාර දිය හැක. එම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම මත එම රඳවා තබාගන්නා කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැක.
- පුනරුත්ථාපන කාර්යාංශය යටතේ ඇති පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහාද,
  - ➢ අධිකරණ නියෝග මත ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය සඳහා ඇතුළත් කර ගැනීම හා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන්නන් ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය සඳහා ඇතුළත් කර ගැනීම යන ක්‍රම යටතේ ඉහත ආකාරයෙන්ම පුනරුත්ථාපනය සඳහා යොමු වීමේ හැකියාව පවතිනවා. එසේම 1927 කෙටි දුකරථන අංකය ඔස්සේ මේ සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට අවස්ථාව තිබෙනවා.

(iv) මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීමෙන් පසු නැවත මත්ද්‍රව්‍ය භාවිතයට සහ අපරාධ වෙත යොමු වීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය, පුනරුත්ථාපන කාර්යාංශය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

- පුනරුත්ථාපනලාභියා නැවත සමාජගත වීමේදී මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම තුළින් ඔවුන්ට නිවැරදි මහපෙන්වීම ලබා දීම.
- පුද්ගලයාගේ අවශ්‍යතාව මත අවශ්‍ය අවස්ථාවලදී තනි පුද්ගල, පවුල් උපදේශන සේවා ලබාදෙමින් පවුල් සංස්ථාවේ වැදගත්කම අවබෝධ කරවීම තුළින් පවුල් සංස්ථාව ශක්තිමත් කිරීම.
- ස්වයං රැකියාවක නිරතව සිටින හා ඒ සඳහා කැමැත්තක් දක්වන සමාජගත පුනරුත්ථාපනලාභීන්ට ස්වයං රැකියා උපකරණ කට්ටල ලබා දීම.
- මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- මත්ද්‍රව්‍ය පහසුවෙන් සපයාගත හැකි පරිසරයක ඔවුන් ජීවත් වන්නේ නම් එම පරිසරයෙන් ඔවුන් වෙනත් ස්ථාන කරා යොමු කිරීමට ඇති හැකියාව සොයා බැලීම.
- වෘත්තීය පුහුණු අවස්ථා, දේශීය හා විදේශීය රැකියාගත කිරීමේ වැඩසටහන් සඳහා මඟපෙන්වීම.
- සමාජගත පුනරුත්ථාපනලාභීන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා ආගමික වැඩසටහන් හා ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමේ උපදේශන සේවා පැවැත්වීම.
- සමාජගත පුනරුත්ථාපනලාභීන් සම්බන්ධව කාලීන පසුවිපරම් සිදු කිරීම.

(v) පුනරුත්ථාපනය සඳහා ස්වේච්ඡාවෙන් හෝ නීතිමය ක්‍රියාමාර්ගවලින් යොමු වන පුද්ගලයන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ රෝගීන් ලෙස සලකනු විනා අපරාධකරුවන් ලෙස නොසලකන අතර යම් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක යම් කාලසීමාවක් පුනරුත්ථාපනයට ලක් වීමෙන් පසු යහපත් පුරවැසියෙකු ලෙස සමාජගත වන පුද්ගලයෙකුට පොලිස් නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීමේදී කිසිදු ගැටලුවක් පැනනඟින්නේ නැහැ. නමුත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නීතිමය රාමුව තුළ නිසි පුනරුත්ථාපන ක්‍රියාවලියක් සම්පූර්ණ කිරීම හෝ පරිවාස කාලසීමාවක් ගත කිරීම පමණක් පදනම් කරගෙන පුද්ගලයෙකුට එරෙහිව නීත්‍යානුකූලව වාර්තා වී ඇති අපරාධ චෝදනා හෝ අපරාධ වාර්තා පොලිස් වාර්තා පද්ධතියෙන් ඉවත් කිරීමට හෝ ඒවා නොසලකා පොලිස් නිෂ්කාශන වාර්තාවක් නිකුත් කිරීමට නීතිමය ප්‍රතිපාදනයක් නැහැ.

එසේ වුවත්, අධිකරණ ක්‍රියාමාර්ගයක් හරහා පුනරුත්ථාපනය සඳහා යොමු වන අයට අදාළ වන සේ ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන සුළු වැරදි සඳහා නිශ්චිත කාලයකින් අනතුරුව එම වැරදි සාමාන්‍ය පසුබිම් පරීක්ෂණවලදී අනාවරණ නොවන පරිදි සලකා ඒ සම්බන්ධයෙන් පොලිස් වාර්තා නිකුත් කිරීමට ඇති හැකියාව පිළිබඳ මේ වෙනකොට අධ්‍යයනය කරමින් තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී එම අධ්‍යයනවලින් පසුව නීති පද්ධතියට හා මහජන ආරක්ෂාවට අනුකූල වන පරිදි ප්‍රතිපත්තිමය හා නීතිමය වශයෙන් එම කරුණු සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු වෙලා තිබෙනවා.

(vi) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

නීතිඥ වෘත්තියේ යෙදෙන අය හැටියට සමහර වෙලාවට අපි දකිනවා, ලංකාවේ විශාලතම ප්‍රශ්නයක් වෙලා තිබෙන තරුණ දූ දරුවන් සුළු වැරදිවලට බන්ධනාගාරගත වීම. දැනුත් 20,000කට අධික තරුණ දරුවන් ප්‍රමාණයක්, බාලවයස්කාර ළමයි ගංජා වැනි මත්ද්‍රව්‍ය ඉරීම වාගේ සුළු වැරදිවලට බන්ධනාගාරගත වෙලා, රිමාන්ඩ් බන්ධනාගාරගත වෙලා ඉන්නවා. ඒගොල්ලෝ සුළු වැරදිවලට අපරාධකරුවන් හැටියට වරද පිළිගත්තත්, වරදකරුවන් වුණත් ඒ අයට කිසිදාක පිට රටක වෘත්තියකට

[ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා]

යන්න හෝ අවස්ථාවක් නැහැ. මුළු ජීවිත කාලය පුරාම ඔවුන්ගේ හිස මත ඒ අපරාධමය වරද සටහන් වීම නිසා ජීවිතයේ වෙච්ච අත් වැරදීම නිවැරදි කරගන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. සාම්ප්‍රදායික නීතිය වෙනස් කරලා, වසර කිහිපයක අධීක්ෂණ කාලයකින් පසු ඒ අයට එවැනි අවස්ථාවක් ලබා දීමට ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගත නොහැකිද කියලා මම ගරු අමාත්‍යතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හුඟක් වෙලාවට කෙනෙක් බන්ධනාගාරගත වෙන්නේ අධිකරණයක් හරහා. ස්වේච්ඡාවෙන් පුනරුත්ථාපනය වෙන කිසිවෙකුටත් පොලිස් වාර්තාවක් දීම ප්‍රතික්ෂේප කරන්නට හෝ ඒ පිළිබඳව සඳහනක් කරන්නට අවශ්‍ය නැහැ. පුනරුත්ථාපන මධ්‍යස්ථානයකට ඇතුළු වෙන කෙනෙකු සැබෑ ලෙසම සමාජගත වුණාම ඔවුන්ට පොලිස් නිස්කාශන වාර්තාවක් නිකුත් කිරීමට හැකියාව තිබෙනවා. හැබැයි, බන්ධනාගාරගත වෙන්නේ අධිකරණ නියෝගයක් හරහා නම්, ඒ නියෝගයත් එක්ක දඬුවමක් තිබෙනවා. ඒ වාගේම බන්ධනාගාරයක ගත වෙන කාලය සඳහා නිශ්චිත නියෝගයක් තිබෙනවා. එම නිසා පොලිස් දෙපාර්තමේන්තුවට ඒ නියෝගය සඳහන් නොකර පොලිස් වාර්තාවක් ලබා දීමේ හැකියාවක් නැහැ. නමුත්, මූලික ප්‍රශ්නයට උත්තර සැපයීමේදී මම කිව්වා වාගේම විශේෂයෙන් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ඒ සුළු වැරැදි සම්බන්ධයෙන් අධ්‍යයනයක් කරන්න අවශ්‍යයි. ඒ අධ්‍යයනය අධිකරණ අමාත්‍යාංශය හා ඒකාබද්ධව කරන්න අවශ්‍යයි. එතුමා කියන කාරණය හරි. සමහර පිරිස් ඉතාම සුළු වැරැදිවලට බන්ධනාගාරගත වෙලා ඉන්නවා. ඔවුන්ට පොලිස් වාර්තා ලබා ගැනීමේ අපහසුතාවන් තිබෙනවා. ඒ පිළිබඳව අධ්‍යයනයක් කරලා ඉදිරියේදී පවතින නීති සංශෝධනයකුත් එක්කම ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න ඕනෑ කියන එක අවධාරණය කරනවා.

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)

ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මෙයත් ඒ හා බැඳුණු කාරණාවක්, ගරු අමාත්‍යතුමනි. තමන්ගේ පවුලේ ඥාතියෙක්; පවුලේ ළඟම ඥාතියෙක් අතින් වරදක් සිද්ධ වෙලා තිබුණොත්, ඔහු අපරාධමය වරදක් කරලා තිබුණොත් ඒ කිසිම වරදකට සම්බන්ධ නැති ඉතාම දක්ෂ තරුණයෙකුට තරුණියකට වුණත් ඒ රැකියාවලට - වෘත්තීන්ට - යන්න හම්බ වෙන්නේ නැති වුණු අවස්ථා ලංකාවේ තිබෙනවා. පවුලට සමීප ඥාති පවුලක අපරාධමය වරදක් වාර්තා වෙලා තිබුණොත්, පසුබිම් වාර්තා කැඳවීමේදී එය සලකා බලන නිසා ඒ පුද්ගලයාට ඒ අවස්ථාව අහිමි වෙනවා. මේක ගතානුගතිකව අපි කරගෙන ගිය එකක් වුණත් වර්තමානයේත් මේ තත්ත්වය මෙසේම පැවතීම නිසා ඒ තැනැත්තන්ට විශාල අගතියක් සිද්ධ වෙනවා. මේ සම්බන්ධයෙන් අපට යම් ක්‍රියාමාර්ගයක් ගත නොහැකිද කියලා ගරු අමාත්‍යතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු මන්ත්‍රීතුමනි, පොලිස් දෙපාර්තමේන්තුවට නිලධාරින් බඳවා ගැනීමේදී තමයි විශාල වශයෙන් එවැනි තත්ත්වයන් ඇති වෙන්නේ. ඔබතුමා කියන කාරණය හරි. පොලිස් දෙපාර්තමේන්තුවට බඳවා ගන්නකොට පසුබිම් වාර්තා ලබා ගැනීමේදී ඥාතීන් සම්බන්ධයෙන් අපරාධමය වාර්තා ලබා ගන්න ක්‍රමවේදයක් දීර්ඝ කාලයක් තිස්සේ පවතිනවා. අපි මේ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. මේ ආකාරයෙන් පවුලට අදාළ නොවන ඥාතීන් සම්බන්ධයෙනුත් තොරතුරු ලබා ගන්න අවශ්‍ය ද කියන එක පිළිබඳව සොයා බලන්න දැනට අපි අමාත්‍යාංශය මට්ටමින් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඉදිරියේදී සංශෝධනයක් කරලා එවැනි තත්ත්වයන් ඇති වීම වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්න බව මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

## අරාබි විද්‍යාල ලියාපදිංචි කිරීම: ප්‍රමාදය
### அரபுக் கல்லூரிகளைப் பதிவுசெய்தல்: தாமதம்
### REGISTRATION OF ARABIC SCHOOLS: DELAY

1355/2025

**47.ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අරාබි විද්‍යාල ලියාපදිංචි කිරීම සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත් 130කට පසුගිය වර්ෂ 04 තුළ එම දෙපාර්තමේන්තුව විසින් අනුමතිය ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම අරාබි විද්‍යාල 130 ලියාපදිංචි කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரபுக் கல்லூரிகளைப் பதிவு செய்வதற்காக முஸ்லிம் சமய மற்றும் கலாசார அலுவல்கள் திணைக்களத்திற்குச் சமர்ப்பிக்கப்பட்ட 130 விண்ணப்பங்களுக்குக் கடந்த 04 வருடங்களாக குறித்த திணைக்களம் அனுமதி வழங்கவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி 130 அரபுக் கல்லூரி களையும் பதிவு செய்வதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) whether he is aware that 130 applications submitted to the Department of Muslim Religious and Cultural Affairs for the purpose of registering Arabic schools have not been approved by the said Department in the last four years; and

(ii) if so, whether steps will be taken to register the 130 Arabic schools referred to above?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඒවාට අනුමැතිය ලබා දීලා නැහැ.

ඔව්.

ගරු මන්ත්‍රීතුමනි, නමුත් කරුණක් නිවැරදි කිරීමට තිබෙනවා. අයදුම්පත්‍ර ප්‍රමාණය 130ක් නොවෙයි, 82යි.

(ii) පියවර ගන්නවා.

2019.04.19වැනි දා ඉඳලා මේ දක්වා නව අරාබි විද්‍යාල ලියාපදිංචි කිරීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවා තිබෙනවා. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ උපදෙස් පරිදි අරාබි විද්‍යාල සඳහා වන පනත් කෙටුම්පත, අධ්‍යයන වැඩසටහන සහ විෂය නිර්දේශයන්ට අදාළ කරුණු පිළිබඳව සොයා බැලීම සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ඩී.ඒ. ද සිල්වා මහතාගේ සභාපතිත්වය යටතේ නිලධාරින් 13 දෙනෙකුගෙන් යුත් විද්වත් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ 13දෙනාගේ නාම ලේඛනය ඇමුණුමෙහි දක්වා තිබෙනවා. එම කමිටුවේ නිර්දේශ අනුව අරාබි විද්‍යාල සම්බන්ධයෙන් හා ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව ඔබතුමාට දැනුම් දෙන්න කැමැතියි. එම නිලධාරින්ගේ නම් පහතින් දක්වා තිබෙනවා.

**ඇමුණුම:**

**Committee Members to reform Arabic Colleges**

1. Dr. A.D.A. De Silva (Committee Chairman)
Deputy Director General,
Faculty of Teacher Education and Alternative Education, National Institute of Education.

2. Prof. Fareena Ruzaik (Committee Deputy Chairman)
Head, Department of Geography,
Faculty of Arts, University of Colombo.

3. Ms. M. F. K. Nissa (Committee Secretary)
Senior Assistant Secretary (Land and Administration),
Ministry of Education, Higher Education and Vocational Education.

4. Mr. K.K.P. Ariyasingha (Committee Member)
Additional Secretary (Education Services Establishment),
Ministry of Education, Higher Education and Vocational Education.

5. Ms. H.M. Kumari (Committee Member)
Additional Secretary (Religious Affairs),
Ministry of Buddhasasana, Religious and Cultural Affairs.

6. Ms. Surangi Perera (Committee Member)
Legal Officer, Legal Branch,
Ministry of Education, Higher Education and Vocational Education.

7. Mr. M.S.M. Nawas (Committee Member)
Director,
Department of Muslim Religious and Cultural Affairs, Colombo 10.

8. Ms. B.D. Wickramathilaka (Committee Member)
Director of Education, Government Approved Private Schools Branch,
Ministry Education, Higher Education and Vocational Education.

9. Ash-Sheikh M. Arkam Nooramith (Committee Member)
General Secretary, All Ceylon Jamiyyathul Ulama.

10. Prof. M.S.M. Jalaldeen (Committee Member)
Dean (Rtd.), Faculty of Islamic Studies and Arabic Language, South Eastern University of Sri Lanka,
No.48/14, Dharmashala Mawatha, Obesekarapura, Rajagiriya.

11. Mr. M.U.M. Riswan (Committee Member)
Attorney-at-Law, 334/1A, Bopetta, Gothatuwa.

12. Dr. M.L. Mubarak (Committee Member)
Director, Dharul Huda Ladies College for Arabic and Islamic Studies,
Maruthamunai.

13. Ms. M.H. Fathima Nuskiya (Committee Member)
Lecturer, Department of Geography,
Faculty of Arts and Culture, South Eastern University of Sri Lanka.

(ආ) අදාළ නොවේ.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ அமைச்சர் அவர்களே, குர்ஆன் மத்ரஸாக்களைப் பதிவுசெய்வதற்கான தடை கடந்த 4 வருட காலமாக இருந்துகொண்டிருக்கின்றது. கடந்த அரசாங்கத்தில்

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

திட்டமிட்டு முஸ்லிம் மக்களுடைய விடயங்களுக்குத் தடை விதித்ததன் காரணமாகத்தான் இதுவும் தடைசெய்யப் பட்டிருக்கின்றது. இவற்றை விரைவாகப் பதிவுசெய்வதற்கான ஏற்பாடுகளை நீங்கள் செய்து தருவீர்கள் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. ஆகவே, மத்ரஸாக்களைப் பதிவு செய்வதற்கான தடையை நீக்குவதற் கான ஏற்பாடுகளை நீங்கள் விரைவாகச் செய்ய வேண்டும். ஏனென்றால், எங்களுடைய மார்க்கக் கல்வியைக் கற்பதற்குரிய 130 அரபுக் கல்லூரிகள் தற்போதும் பதிவுக்கான அனுமதியை எதிர் பார்த்துக் கொண்டிருக்கின்றன.

கௌரவ அமைச்சர் அவர்களே, நான் எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன். எங்களுடைய முஸ்லிம் சமூகத்தைப் பொறுத்தவரையிலே, உங்களுடைய அமைச்சின் கீழான இன்னுமொரு விடயம்தான் தற்போது தடுத்து வைக்கப்பட்டுள்ள புனித குர்ஆன் பிரதிகள் தொடர்பானது. பாராளுமன்றத்திலே எதிர்க்கட்சியைச் சேர்ந்த அனைத்து முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களும் இந்த விடயத்தை முன்வைத்தபோது, அந்த குர்ஆன் பிரதிகளைத் தடுத்துவைக்கப் பரிந்துரைத்த அதே குழு அவற்றை மறுபரிசீலனை செய்து விடுவிக்கலாம் எனப் பரிந்துரை வழங்கினால் அரசாங்கத்தால் அவற்றை விடுவிக்க நடவடிக்கையெடுக்க முடியுமென்று தெரிவிக்கப்பட்டது.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ මූලික ප්‍රශ්නයට අදාළවයි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ඔව්, ඒක තමයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මූලික ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ, ඒ පිළිබඳව පැහැදිලි කර ගැනීමක් සඳහා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ඒකට අදාළ අමාත්‍යාංශය. அந்த அமைச்சருக்குரிய விடயம்தான் கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, මම කියන්නම්, මට විනාඩි දෙකක් දෙන්න.

இது தொடர்பில் பாராளுமன்றத்தில் அங்கம் வகிக்கும் 22 முஸ்லிம் MPs கையொப்பமிட்டு அமைச்சருக்கு அனுப்பிய கடிதத்தின் பிரதியையும், தற்போது அதே குழு குறித்த குர்ஆன் பிரதிகளை விடுவிக்கலாம் என்று பரிந்துரை வழங்கியுள்ளதாக பொதுவெளியில் அறிவிக்கப்பட்டுள்ளமை சம்பந்தமான அறிக்கையையும் நான் இந்தப் பாராளுமன்றத்தில் *சமர்ப்பிக்கின்றேன்.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

எனவே, கௌரவ அமைச்சர் அவர்களே, இந்த குர்ஆன் பிரதிகளை விடுவிக்கின்ற விடயத்திலே விசேட கவனம் செலுத்தி, அவற்றை விடுக்க நீங்கள் நடவடிக்கை எடுப் பீர்களா? என்று கேட்கிறேன்.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය නිවැරදියි. එතුමා මූලික ප්‍රශ්නයෙන් විමසා තිබෙන්නේ අරාබි විද්‍යාල පිළිබඳවයි. නමුත් එතුමා දෙවනුවට විමසන්නේ ශුද්ධවූ අල්-කුරානය පිළිබඳවයි. කලින් ප්‍රශ්නය ගැන මම වචනයක් සඳහන් කළ යුතුයි. මම කලිනුත් පිළිතුර ලබා දීමේදී සඳහන් කළා, අයදුම්පත්‍ර සංඛ්‍යාව 130ක් නොවෙයි, 82යි කියලා. මේ 82 තමයි දැන් නතර වෙලා තිබෙන්නේ. මා කලින් පැහැදිලි කළා වාගේ ඒ ටික ලියාපදිංචි කරන්න විශේෂ කමිටුවක් පත් කරලා තිබෙනවා. මා දන්නා තරමින් ඒ කමිටුව රැස් වුණා. අපි නිතර දෙවේලේ ඒ ගැන සොයා බලනවා. ඒ ගැන අධ්‍යාපන අමාත්‍යතුමියගෙනුත් මා විමසුවා. Syllabus එක හදලා ඉවර වෙච්ච ගමන් ඉතා ඉක්මනින් ඒ කටයුත්ත කෙරෙනවා.

ඒ වාගේම මේකෙන් හැඟෙන්න පුළුවන්, මදුසා පාසල්, නැත්නම් අරාබි විද්‍යාල අපේ රටේ ලියාපදිංචි කරලාම නැහැ වාගේ එකක්. මම ඒ ගැන කරුණක් ඉදිරිපත් කරන්නට ඕනෑ. මේ වෙනකොට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති අරාබි විද්‍යාල සංඛ්‍යාව 321ක් වෙනවා. ඉතිරි ටිකට කමිටුවේ නිර්දේශත් එක්ක ඉතා කඩිනමින් ලියාපදිංචිය පිරිනමන්න මා කටයුතු කරනවා. අප කෙරෙහි තබා තිබෙන විශ්වාසය පිළිබඳව ඔබතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා.

ඔබතුමා ඇසූ අතුරු ප්‍රශ්නයට කෙටි උත්තරයක් දුන්නොත්, ශුද්ධ වූ අල්-කුරානය සම්බන්ධව කමිටු ගණනාවක් පත් කරලා, මවිසින්ම රැස්වීම් ගණනාවක් කැඳවලා, සියලු සාකච්ඡා පවත්වා තිබෙනවා. ඒකේ පසුබිම් කථාව කොයි වාගේද කියලා ඔබතුමන්ලා දන්නවා. එසේ වුණත්, ජනාධිපතිතුමාගේ ඉල්ලීම හා මැදිහත්වීම මත, ඔබතුමන්ලාගේ ඉල්ලීම අනුව ඔය කියන කමිටුව දැන් පත්වෙලා තිබෙනවා. අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට මම ඒ කටයුත්ත පවරලා තිබෙනවා. එතුමා ඒ සම්බන්ධයෙන් කටයුතු කරනවා. ඉතාම ඉක්මනින් ඒ ගැටලුව විසඳාගන්න පුළුවන් වෙයි කියලා මට විශ්වාසයක් තිබෙනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! எனது இரண்டாவது மேலதிகக் கேள்வியை கௌரவ பாராளுமன்ற உறுப்பினர் சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் கேட்பார்.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
நன்றி, கௌரவ பாராளுமன்ற உறுப்பினர் உதுமா லெப்பை அவர்களே!

எனது கேள்வி இந்தக் கேள்வியுடன் நேரடியாகச் சம்பந்தப்படாதுவிட்டாலும் அதனைச் சம்பந்தப்படுத்தலாம்; கௌரவ அமைச்சர் அவர்கள் விரும்பினால் அதற்குப் பதிலளிக்கலாம். கௌரவ அமைச்சர் அவர்களே, உங்களுக்குத் தெரிந்திருக்கும் இன்று காலையிலே திருகோணமலையிலே

கன்னியா என்ற பிரதேசத்திலே தொல்பொருள் திணைக்களத்தினால் புதிய கட்டுமான வேலைத்திட்டமொன்றைச் செய்ய ஆரம்பித்திருக்கிறார்கள் என்பது. இது சம்பந்தமாக Director General - DG - அவர்களைத் தொலைபேசி ஊடாகத் தொடர்புகொள்ள முயற்சித்தேன். அண்மையிலேகூட நாங்கள் அவரைச் சந்தித்து, நல்லதோர் ஆக்கபூர்வமான பேச்சுவார்த்தை ஒன்றை நடத்தியிருந்தோம்.

கௌரவ அமைச்சர் அவர்களே, 2020ஆம் ஆண்டு Kanniya Hot Springs விவகாரம் சம்பந்தமாக நீதிமன்றத் தீர்ப்பொன்று இருக்கின்றது. அந்தத் தீர்ப்பின் பிரகாரம், மதம் சம்பந்தமான எந்தவொரு கட்டுமான வேலையும் அங்கே செய்யக்கூடாது என்று குறிப்பிடப்பட்டிருக்கின்றது. அவ்வாறிருக்கின்றபோது கௌரவ அமைச்சர் அவர்களே, இன்றைக்குக் காலையில் அந்த நீதிமன்றத் தீர்ப்பையும் மதிக்காத ஒரு செயலா என்று தெரியவில்லை, மாவட்ட அரசாங்க அதிபர் உட்படப் பல அதிகாரிகள் வந்து கன்னியாப் பிரதேசத்திலே ஒரு மதம் சம்பந்தமான புதிய கட்டுமான வேலை ஒன்றை ஆரம்பித்திருக்கிறார்கள்; இது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயம். 2020ஆம் ஆண்டின் நீதிமன்றத் தீர்ப்புக்கு மாறான ஒரு செயற்பாடாக இது காணப்படுகின்றது. நாங்கள் இப்பொழுது எங்களுடைய கட்சியின் பொதுச் செயலாளரும் ஜனாதிபதி சட்டத்தரணியுமான சுமந்திரன் அவர்களுடன் இணைந்து இதற்கெதிராகச் சட்ட நடவடிக்கை எடுக்கவிருக்கின்றோம். ஆனால், நாங்கள் ஏற்கனவே பேசிக்கொண்டது போன்று இணக்கப்பாட்டின் அடிப்படையில் இந்த விடயங்களைத் தீர்த்துக்கொள்வது என்றிருந்தாலும், இன்று நடந்த சம்பவம் மீண்டும் ஒருமுறை தொல்பொருள் திணைக்களத்தின்மீது சந்தேகங்களை ஏற்படுத்துவதாக இருக்கின்றது. எனது இந்தக் கேள்வி கௌரவ உதுமாலெப்பை அவர்களுடைய கேள்வியுடன் சம்பந்தப்பட்டதல்ல என்றாலும், கௌரவ அமைச்சர் என்ற வகையில் தயவுசெய்து நீங்கள் விரும்பினால், இது சம்பந்தமான உங்களுடைய விளக்கத்தை வழங்கினால் உண்மையிலே நாங்கள் மகிழ்ச்சியடைவோம். இந்த வாய்ப்பை எனக்குத் தந்தமைக்காகக் கௌரவ பாராளுமன்ற உறுப்பினர் உதுமாலெப்பை அவர்களுக்கு மீண்டும் எனது நன்றியைத் தெரிவிக்கின்றேன்.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ ප්‍රදේශයට අදාළ ප්‍රශ්නයක් නිසා මේ සම්බන්ධව ඉතාම කෙටි පිළිතුරක් ලබා දෙන්න මා කැමැතියි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන විධියට ඒ සම්බන්ධව ඒ විධියට අධිකරණ තීන්දුවක් තිබෙනවා නම්, ඒක අනිවාර්යයෙන් ඒ විධියට විමසන්න ඕනෑ. මට මේ වෙලාවේ ඒ සම්බන්ධව ඍජු, නිශ්චිත පිළිතුරක් දෙන්න පුළුවන්කමක් නැත්තේ මා ඒ ගැන සූදානමක් නැති නිසායි. ඒත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ගැන කිසිදු විවිකිච්ඡාවක් ඇති කරගන්න එපා කියලා මම කාරුණිකව ඉල්ලනවා. මොකද, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට දැන් පත්වෙලා ඉන්න අධ්‍යක්ෂ ජනරාල්තුමා ඉතාම කඩිනමින්, කාර්යක්ෂමව ඔබතුමන්ලාගේ පළාත්වලට ගිහිල්ලා, මිනිස්සු මුණගැහිලා, ඇති වෙන්න පුළුවන් ආතති, ඝර්ෂණ නිම කරලා ඉතාම හොඳින් කටයුතු කරමින් ඉන්නවා, තමන්ගේ කාර්ය මණ්ඩලයත් එක්ක. ඒ නිසා කිසිදු කෙනෙකුට අසාධාරණයක් සිදු නොවන්න පුරාවිද්‍යා ආඥාපනතත්, අධිකරණයෙන් ලැබිලා තිබෙන මඟ පෙන්වීමත් අනුව අපි කටයුතු කරන බව මේ වෙලාවේ මම කියන්න කැමැතියි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීවරුනි, හැම විටම මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න කියා ඉල්ලා සිටිනවා. පසුගිය ප්‍රශ්නයේදී අදාළ නැති අතුරු ප්‍රශ්න දෙකක්ම ඇහුවා. ඒක ඒ විධියට දිගටම ගෙනියන්න එපා කියලා අනෙක් මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්න අංක 48 - 1666/2025 - (1), ගරු චාමර සම්පත් දසනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 49 - 2134/2026 - (1), ගරු කිට්නන් සෙල්වරාජ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## නව ජල සම්බන්ධතා: මඩකලපුව දිස්ත්‍රික්කය
## புதிய நீர் இணைப்புகள்: மட்டக்களப்பு மாவட்டம்
## NEW WATER CONNECTIONS: BATTICALOA DISTRICT

1411/2025

**50. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මඩකලපුව දිස්ත්‍රික්කය සඳහා -

(i) 2025 අය වැය මඟින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පානීය ජල ව්‍යාපෘති සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) ලබා දීමට අපේක්ෂා කරන ලද නව ජල සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

(iii) 2025.07.31 දින වන විට ලබා දී ඇති නව ජල සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ පෝරතිවුපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දික්ගොඩ ග්‍රාම නිලධාරි වසමට අයත් තුම්බාල ගම්මානය, සින්නවත්ත ග්‍රාම නිලධාරි වසමට අයත් සින්නවත්ත ඉහළ කොටස, පුදුමුන්මාරිච්චෝලෙ, පාලයියඩිවඩ්ඩෙ, නැඟෙනහිර කන්නපුරම්, කන්නපුරම්, නෙල්ලික්කාඩු සහ මන්මුනෙ බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉලුප්පඩිච්චනෙ ග්‍රාම නිලධාරි වසමට අයත් සින්නක්කාලපෝට්ටමඩු යන ගම්මානවලට මණ්ඩලය විසින් ජල සම්බන්ධතා ලබා දී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම ගම්මානවලට ජල සම්බන්ධතා ලබා දීමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மட்டக்களப்பு மாவட்டத்துக்கு -

(i) 2025 வரவு செலவுத் திட்டத்தினூடாக தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையின் குடிநீர் கருத்திட்டங்களுக்காக ஒதுக்கீடு செய்யப்பட்டிருந்த நிதியின் அளவு எவ்வளவு என்பதையும்;

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

(ii) வழங்க எதிர்பார்க்கப்பட்ட புதிய நீர் இணைப்பு களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) 2025.07.31ஆம் திகதியளவில் வழங்கப்பட்டுள்ள புதிய நீர் இணைப்புகளின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மட்டக்களப்பு மாவட்டத்தின் போரதீவுப்பற்று பிரதேச செயலகப் பிரிவின் திக்கோடை கிராம உத்தியோகத்தர் பிரிவுக்குட்பட்ட தும்பாலை கிராமம், சின்னவத்தை கிராம உத்தியோகத்தர் பிரிவுக்குட்பட்ட சின்னவத்தை மேற்பகுதி, புதுமுன்மாரிச்சோலை, பாலையடிவட்டை, கிழக்கு கண்ணபுரம், கண்ணபுரம், நெல்லிக்காடு மற்றும் மண்முனை மேற்கு பிரதேச செய லகப் பிரிவின் இலுப்படிச்சேனை கிராம உத்தியோகத்தர் பிரிவுக்குட்பட்ட சின்னக்காலப் போட்டமடு ஆகிய கிராமங்களுக்கு நீர் வழங்கல் சபையால் நீர் இணைப்புகள் வழங்கப் படவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி கிராமங்களுக்கான நீர் இணைப்புகளை வழங்க நடவடிக்கை மேற் கொள்ளப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House the -

(i) amount allocated for the drinking water projects of the National Water Supply and Drainage Board in the Budget, 2025 for the Batticaloa District;

(ii) number of new water connections expected to be provided for the Batticaloa District; and

(iii) number of new water connections provided for the Batticaloa District as of 31.07.2025?

(b) Will he also inform this House -

(i) whether he is aware that the Board has not provided water connections to Thumbala village of the Dikgoda Grama Niladhari Division of the Porativu Pattu Divisional Secretary's Division in the Batticaloa District; Sinnawatta Upper Division, Pudumunmarichcholai, Palaiyadivaddai, Kannapuram East, Kannapuram, and Nellikkadu of the Sinnawatta Grama Niladhari Division and Sinnakalaipottamadu village of the Illuppadichenai Grama Niladhari Division of the Manmunai West Divisional Secretary's Division; and

(ii) if so, the specific date by which water connections will be provided to these villages?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2025 වර්ෂයේ දී, CEDE අය වැය යටතේ මඩකලපුව දිස්ත්‍රික්කය සඳහා පහත සඳහන් ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් මිලියන 200ක මුදල් වෙන් කර තිබුණි.

| අ/අ | ව්‍යාපෘතිය | 2025 වර්ෂයේ වෙන් කිරීම (රුපියල් මිලියන) |
|---|---|---|
| 01 | උන්නිච්චෙයි සහ අවට ප්‍රදේශවල සේවා ආවරණය පුළුල් කිරීම | 170 |
| 02 | මඩකලපුව දිස්ත්‍රික්කයේ බෙදාහැරීම් කටයුතු ව්‍යාප්ත කිරීම | 30 |
| | එකතුව | 200 |

(ii) 2025 වර්ෂයේදී සියලුම ජල යෝජනා ක්‍රම 13 තුළ නව ජල සම්බන්ධතා 3,000ක් ලබා දීමට අපේක්ෂා කරන ලදී.

(iii) 2025.07.31 දින වන විට සමස්ත ජල යෝජනා ක්‍රම 13 හරහා නව ජල සම්බන්ධතා 2,512ක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, 2025 වර්ෂය අවසාන වන විට නව ජල සම්බන්ධතා 4,298ක මුළු ප්‍රමාණයක් ලබා දී තිබුණි

(ආ) (i) (1) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - පෝරතිවුපත්තු ගම්මානය - තික්කොඩෙ ග්‍රාම නිලධාරි වසමට අයත් තුම්බාල ගම්මානය සහ පුදුමුන්මාරිච්චෝලෙ

තත්ත්වය -

- පවතින පොම්ප කිරීමේ නළ මාර්ග කොටස් ප්‍රතිස්ථාපනය කිරීම සහ හිමිදුරාව ජල පිරිපහදු මධ්‍යස්ථානයේ සිට තුම්බාල සහ පුදුමුන්මාරිච්චෝලෙ ගම්මාන වෙත ජල සම්බන්ධතා ලබා දීම සඳහා බූස්ටර් පොම්ප කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම මඟින් මෙම ප්‍රදේශ ආවරණය කිරීම තාක්ෂණික වශයෙන් සිදු කළ හැකිය.
- මෙම වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා තත්කාලීන ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 100ක් පමණ වේ.
- ප්‍රසම්පාදන කටයුතු මෙම වසර තුළ අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර, පුනරුත්ථාපන ප්‍රතිපාදන යටතේ භෞතික කටයුතු ඉදිරි වසර තුළ නිම කිරීමට නියමිතය.

(2) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - පෝරතීවුපත්තු ගම්මානය - සින්නවත්ත ග්‍රාම නිලධාරි වසමට අයත් සින්නවත්ත ඉහළ කොටස

තත්ත්වය -

- ➢ හිම්දුරාව ජල පිරිපහදු මධ්‍යස්ථානයේ සිට අපේක්ෂිත පාරිභෝගික සම්බන්ධතා 31ක් ලබා දීම සඳහා අතිරේක නළ මාර්ගයක් (විෂ්කම්භය මි.මී.90, HDPE, දිග කි.මී.1.5) එළීම මඟින් මෙම ප්‍රදේශය ආවරණය කිරීම තාක්ෂණික වශයෙන් සිදු කළ හැකි අතර, දැනට එහි භෞතික කටයුතු O&M - අම්පාර කණ්ඩායම විසින් සෘජුවම සිදු කරනු ලබයි.
- ➢ මි.මී. 90 විෂ්කම්භයෙන් යුත් නළ එළීමේ කටයුතු මීටර් 1,080ක දික ප්‍රමාණයකට නිම කර ඇත.
- ➢ අවසාන සම්බන්ධතාව සහ පාරිභෝගික සම්බන්ධතා ඉදිරි මාස 03 ඇතුළත ලබා දිය හැකිය.

(3) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - පෝරතීවුපත්තු ගම්මානය - පාලයියඩිවඩ්ඩෛ, නැඟෙනහිර කන්නපුරම්, කන්නපුරම් සහ නෙල්ලිකාඩු තත්ත්වය -

- ➢ පවතින හිම්දුරාව ජල පිරිපහදු මධ්‍යස්ථානයේ නළ ජාලය මඟින් මෙම ප්‍රදේශය ආවරණය කිරීම දැනට තාක්ෂණික වශයෙන් සිදු කළ නොහැක.
- ➢ කෙසේ වෙතත්, මෙම ප්‍රදේශයට සපයන ජල ධාරිතාව ඉහළ නැංවීම සඳහා සහ පවතින නළ මාර්ග වෙනුවට විශාල විෂ්කම්භයකින් යුත් නළ මාර්ග සහ බූස්ටර් පොම්ප කිරීමේ ක්‍රමවේද ප්‍රතිස්ථාපනය කිරීම මඟින් උස් බිම් ප්‍රදේශවල ජල සැපයුම අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා වන සැලසුම් කටයුතු/පද්ධති විශ්ලේෂණ දැනට සිදු කෙරෙමින් පවතී.

(4) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - මන්මුනෙ බටහිර

ගම්මානය - සින්නක්කාලපෝට්ටමඩු ගම්මානය

තත්ත්වය - යෝජිත උන්නිච්චෙව පැකේජ ජල පිරිපහදු මධ්‍යස්ථාන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත නළ එළීමේ කටයුතුවල සේවා ආවරණ කලාපය තුළට මෙම ගම්මානය ඇතුළත් කර ඇත. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන යටතේ 2027 වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂා කෙරේ.

(ii)

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - පෝරතීවුපත්තු ගම්මානය - තික්කොඩෛ ග්‍රාම නිලධාරි වසමට අයත් තුම්බාල ගම්මානය සහ පුදුමුන්මාරිච්චෝලෙ

  තත්ත්වය - ප්‍රසම්පාදන කටයුතු මෙම වසර තුළ අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර, පුනරුත්ථාපන ප්‍රතිපාදන භාවිත කරමින් භෞතික කටයුතු ඉදිරි වසර තුළ නිම කිරීමට නියමිතය.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - පෝරතීවුපත්තු
  ගම්මානය - සින්නවත්ත ග්‍රාම නිලධාරි වසමට අයත් සින්නවත්ත ඉහළ කොටස
  තත්ත්වය - අවසාන සම්බන්ධතාව සහ පාරිභෝගික සම්බන්ධතා ඉදිරි මාස 03 ඇතුළත ලබා දිය හැකිය.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - මන්මුනෙ බටහිර
  ගම්මානය - සින්නක්කාලපෝට්ටමඩු ගම්මානය
  තත්ත්වය - යෝජිත උන්නිච්චෙව පැකේජ ජල පිරිපහදු මධ්‍යස්ථාන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන නළ එළීමේ කටයුතු 2027 වර්ෂය අවසාන වන විට නිම කරනු ඇත.

• (ඇ) ලේකම් කොට්ඨාසය - පෝරතීවුපත්තු ගම්මානය - පාලයියඩිවඩ්ඩෛ, නැඟෙනහිර කන්නපුරම්, කන්නන්පුරම් සහ නෙල්ලික්කාඩු තත්ත්වය -

- ➢ පවතින හිම්දුරාව ජල පිරිපහදු මධ්‍යස්ථානයේ නළ ජාලය මඟින් මෙම ප්‍රදේශය ආවරණය කිරීම දැනට තාක්ෂණික වශයෙන් සිදු කළ නොහැක.
- ➢ කෙසේ වෙතත්, මෙම ප්‍රදේශයට සපයන ජල ධාරිතාව ඉහළ නැංවීම සඳහා සහ පවතින නළ මාර්ග වෙනුවට විශාල විෂ්කම්භයකින් යුත් නළ මාර්ග සහ බූස්ටර් පොම්ප කිරීමේ ක්‍රමවේද ප්‍රතිස්ථාපනය කිරීම මඟින් උස් බිම් ප්‍රදේශවල ජල සැපයුම අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා වන සැලසුම් කටයුතු/පද්ධති විශ්ලේෂණ දැනට සිදු කෙරෙමින් පවතී.
- ➢ පෝරතීවුපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජල සැපයුම වැඩිදියුණු කිරීම සඳහා හිම්දුරාව ජල පිරිපහදු මධ්‍යස්ථානය ඉහළ නැංවීම සඳහා හිම්දුරාව ජලාශයෙන් අතිරේක අමු ජලය (වසරකදී වසරකට MCM 5.5ක්) ලබා ගැනීම සඳහා අවසර ඉල්ලා ඇති අතර, ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රතිචාරය අපේක්ෂා කෙරේ. ඉහත සඳහන් කරුණුවලට අමතරව මඩකලපුව දිස්ත්‍රික්කය තුළ පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී.

  1. වාලච්චේනෙ ජල සැපයුම් ව්‍යාපෘතිය මඟින් කෝරළේපත්තු, කෝරළේපත්තු මධ්‍යම, කෝරළේපත්තු බටහිර, කෝරළේපත්තු දකුණ සහ එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන අතර, රාජ්‍ය ආයෝජන වැඩසටහන යටතේ 2027 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
  2. යෝජිත මඩකලපුව දකුණ ජල සැපයුම් ව්‍යාපෘතිය මඟින් පෝරතීවුපත්තු සහ මන්මුනෙ දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කෙරේ. අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි හිම්දුරාව වැව මෙහි යෝජිත ජල මූලාශ්‍රය වේ.

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

3. යෝජිත මඩකලපුව උතුර ජල සැපයුම් ව්‍යාපෘතිය මඟින් කෝරළේපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආවරණය කෙරේ. මෙහි යෝජිත ජල මූලාශ්‍රය වන්නේ කට්ටුමුරිච්චි වැවයි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය ඇසීමට පෙර මම කාරණාවක් කියන්න ඕනෑ. අපි යම් අතුරු ප්‍රශ්නයක් අහනකොට එය ප්‍රධාන ප්‍රශ්නයට අදාළ නොවෙයි කියලා මූලාසනයෙන් කියනවා නේ. එම පූර්වාදර්ශය පාර්ලිමේන්තුවේදී අපිට ලබා දුන්නේ වත්මන් ජනාධිපතිතුමා. එතුමා ඉස්සර විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට සිටියදී කිව්වා, මුදල් අමාත්‍යාංශයෙන් තමයි බන්ධනාගාරයට මුදල් වෙන් කරන්නේ, එතකොට බන්ධනාගාරය පිළිබඳ ප්‍රශ්න මුදල් අමාත්‍යාංශයෙනුත් අහන්න පුළුවන් කියලා. ඒ පූර්වාදර්ශය අනුව අපටත් අහන්න පුළුවන්. හැබැයි, මම එතැනට යන්නේ නැහැ. ඒ කියන්නේ, ඒක හොඳ පූර්වාදර්ශයක්. මුදල් අමාත්‍යාංශයෙන් නේ බන්ධනාගාරයට,- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද වෙලාවත් තිබෙන නිසා ඒ විධියේ අතුරු ප්‍රශ්න අහන්න අවස්ථාව දෙන්න. ඒ වාගේම Parliamentary Business Committee එකේදී මම කිව්වා, න්‍යාය පත්‍රයට ප්‍රශ්න 60ක්, 70ක්වත් දමමු කියලා. අද 50වැනි ප්‍රශ්නය පස්වරු 2.30 වනකොටම අහලා ඉවරයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ அமைச்சர் அவர்களே, விளக்கமாகப் பதிலளித் தமைக்கு நன்றி! என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டம் முழுவதும் குடிநீர் கிடைக்க வேண்டும் என்பதுதான் எங்களுடைய நோக்கமாகும். அது கடினமான ஒரு விடயமென்பது எங்களுக்கும் தெரியும்! ஏனென்றால், அங்கு பல பிரதேசங்களில் ஏற்றமும், சில பிரதேசங்களில் பள்ளமும் இருக்கின்றது. அம்பாறை மாவட்டத்திலிருந்து மட்டக்களப்புக்கு குடிநீர் வழங்கப் படுகின்றது. சில இடங்களில் community water supply project என்று சொல்லி, கடந்த காலத்தில் கொடுத்த தரம் குறைந்த குழாய்கள் போடப்பட்டு இருக்கின்றன. கௌரவ அமைச்சர் அவர்களே, நான் இது சம்பந்தமாகத் தொடர்ச்சியாகக் கேட்கின்ற விடயம் என்னவெனில், எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்துக்கென தனியான design unit ஒன்று தேவை என்றுதான். திருகோணமலையிலிருந்து design பண்ண முடியாது. அந்த வகையில், நீங்கள் மட்டக்களப்பு மாவட்டத்துக்கென design unit ஒன்றை நியமித்தால், அதனூடாக இந்த எல்லா விடயங்களையும் இணைக்கலாம். குடிநீர் வழங்குவதற்கான இணைப்புகளை வழங்கினாலும் - pipeline வழங்கினாலும் - அதற்குத் தேவையான water supply இருக்க வேண்டும். If there is no water supply, you cannot provide drinking water.

கௌரவ அமைச்சர் அவர்களே, 2017-2018ஆம் ஆண்டு காலப்பகுதியில் French Development Agency ஊடாக மட்டக்களப்பு மாவட்டத்துக்கு Mundeni Aru River Basin Development Project என்ற project வந்தது. இதனூடாக irrigation சம்பந்தமான project ஒன்றும் drinking water project ஒன்றும் மேற்கொள்ளப்பட்டது. Mundeni Aru River Basin Development Projectமூலம் குடிநீர் வழங்குவதற்கென கொண்டுவரப்பட்ட projectஆனது, 2020ஆம் ஆண்டுக்குப் பிறகு ஏற்பட்ட பொருளாதார நெருக்கடி காரணமாக, IMFஇன் நிபந்தனைகளின்கீழ் புதிய திட்டங்களை மேற்கொள்ளக்கூடா தென்ற அடிப்படையில் மட்டுப்படுத்தப்பட்டது. ஆனால், கடந்த 18 மாதங்களாக French Development Agencyஆனது நிதியைக் கொண்டுவந்து இந்த projectஐ மீண்டும் ஆரம்பிப்பதற்குத் தயாராக இருந்தாலும், இன்னும் இலங்கை அரசாங்கம் அந்த Agency உடன் ஒப்பந்தம் செய்யாத படியால் இந்த Project சம்பந்தமான வேலைகள் இழுபறியில் இருக்கின்றன. நீங்கள் எப்பொழுது French Development Agency ஊடான ஒப்பந்தத்தில் கைச்சாத்திடப் போகின் றீர்கள்? அந்த ஒப்பந்தத்தில் கைச்சாத்திட்டால், மட்டக்களப்பு மாவட்டத்துக்கு குடிநீர் வழங்கக்கூடிய இந்த Mundeni Aru River Basin Development Projectஐ மீண்டும் ஆரம்பிப்பீர்களா? என்பதை என்னுடைய முதலாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමා ප්‍රධාන ප්‍රශ්නයට සෘජුව සම්බන්ධ වන අතුරු ප්‍රශ්නයක් නොවෙයි ඇහුවේ. එතුමා කිව්වා නේ, වත්මන් ජනාධිපතිතුමා කලින් මන්ත්‍රීවරයෙක් විධියට කටයුතු කළ කාලයේ පූර්වාදර්ශ තිබෙනවා, එම පූර්වාදර්ශ අනුව අහනවා කියලා. ඒක බොහොම හොඳයි. ජනාධිපතිතුමාගේ සියලු දේවල් ආදර්ශයට ගන්න කියා අපි ඉල්ලනවා. ඒක හොඳයි. අපි ඒ වෙනුවෙන් සුබ පතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා අතුරු ප්‍රශ්නයෙන් ඇහුවේ මුන්දෙනිආරු ජලාශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවාද කියායි. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, මුන්දෙනිආරු ජලාශ ව්‍යාපෘතිය අප විසින් අත්හැර දමා නැහැ. ඔබතුමා කිව්වා වාගේ ප්‍රංශයේ ආධාර දෙන සංවිධානයක් වන French Development Agency එක අපට උදවු කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. නමුත් ඔවුන් තවම මෙය තහවුරු කර නැහැ. අපි ඒ සම්බන්ධව උත්සාහ දරනවා. ඇත්තටම අපි මෑත කාලයේදීත් සාකච්ඡා කළා, Department of External Resources හරහා සාකච්ඡාවකට යෑමට. මුන්දෙනිආරු ජලාශ ව්‍යාපෘතිය සඳහා වන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ budget line එක එහෙමම තිබෙනවා. මට මතක විධියට මිලියන 100ක් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා වෙන් කර තිබෙනවා. අපි මේ සඳහා funds ගෙන්වා ගැනීමට උපරිම උත්සාහ දරා තිබෙනවා. ඒ සම්බන්ධව සාකච්ඡා කරනවා. එය අත්හැර නැහැ. අපි පිළිගන්නවා, මුන්දෙනිආරු ජලාශ ව්‍යාපෘතිය අනිවාර්යයෙන්ම අත්‍යවශ්‍ය බව. අපි ඒ සඳහා උත්සාහ දරමින් ඉන්නවා වාගේම ඒ ගැන අවධානය යොමු කර තිබෙනවා.

ඒ වාගේම මඩකලපුව දිස්ත්‍රික්කයේ ආරම්භ කරන්න පුළුවන් ජල ව්‍යාපෘති තව කිහිපයක් තිබෙනවා. ඒ සඳහා අපි සැලසුම් සකස් කර තිබෙනවා. මුන්දෙනිආරු ජලාශ ව්‍යාපෘතිය අපි අත්හැර නැහැ. ඒ සඳහා උපරිම උත්සාහ දරමින් තිබෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
පිළිතුරු ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. අර French agreement එක අත්සන් කළොත් විතරයි ඔය දේවල් කරන්න පුළුවන් වන්නේ, මුන්දෙනිආරු ජලාශ ව්‍යාපෘතිය විතරක් නොවෙයි. මම යෝජනා කරන්නේ ඒකයි.

ගරු ඇමතිතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා විසින් අසනු ලබනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ அமைச்சர் அவர்களே, எமது அம்பாறை மாவட்டத்திலே சாகாமம் என்கின்ற ஒரு குளம் இருக்கின்றது; நீங்கள் நீர்ப்பாசன அமைச்சராக இருந்த காலத்தில் அந்த குளத்தைப் பற்றி அறிந்திருப்பீர்கள் என நான் நினைக்கின்றேன். அந்தக் குளத்துக்கு வருகின்ற தண்ணீர் வீணாகக் கடலுக்குள் போகின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. அதேவேளை, திருக்கோவில், தம்பிலுவில், தாண்டியடி போன்ற பிரதேசங்ககளிலுள்ள மக்கள் குடிநீர் இல்லாமல் மிகவும் கஷ்டப்படுகின்றார்கள். எனவே, அந்தக் குளத்தில் நிரந்தரமாக நீர் தேங்கி நிற்கக்கூடியவாறு அதனைப் புனரமைப்பதன்மூலம், அம்பாறை மாவட்டத்தின் கரையோரப் பிரதேசத்தில் வாழுகின்ற மக்களுடைய குடிநீர்ப் பிரச்சினைக்குத் தீர்வு காணலாம். அதுமட்டுமல்ல, அந்தக் குளத்துக்குரிய தண்ணீர் பனலகமவில் இருந்து வருகின்றது. எனவே, இதனை ஒரு திட்டத்தின்கீழ் கொண்டுவந்து, குளத்திலிருந்து வீணாகப் போகின்ற தண்ணீரைச் சேமிப்பதற்குரிய ஏற்பாடுகளை நீங்கள் முன்னெடுக்க வேண்டும்.

அடுத்தது, எமது அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற நாவிதன்வெளிப் பிரதேசமானது, கடந்தகால யுத்தத்தால் 30 வருடங்களாகப் பாதிக்கப்பட்ட ஓர் இடமாகும். அங்கே மூவின மக்களும் வாழுகின்றார்கள். அங்கே 16 கிலோ மீற்றர் தூரத்திற்குள்ளாக வாழும் மக்களுக்கான நீர் வழங்கல் திட்டம் சம்பந்தமாக DCC கூட்டங்களிலும் கதைத்து இருக்கின்றோம். எனவே, இந்த இரண்டு விடயங்களையும் இந்த வருடத்தில் செய்வதற்கான ஏற்பாடுகளை மேற்கொள்வீர்களா? என எங்களுடைய மாவட்ட மக்கள் சார்பிலே கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ ප්‍රශ්නය ප්‍රධාන ප්‍රශ්නයට සෘජුව සම්බන්ධ නැහැ. ඉස්සෙල්ලා මම දැක්කා, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් අහපු ප්‍රශ්නයට රාසමාණික්කම් මන්ත්‍රීතුමා සම්බන්ධ කර ගත්තා. දැන් එතුමා අහන ප්‍රශ්නවලට- *[බාධා කිරීමක්]* ඔව්, හොඳයි. සහයෝගය හොඳයි. අපි දැක්කා එක මේසයේත් වාඩි වෙලා ඉන්නවා. ඒක හොඳයි. ඔහොම තමයි. ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ ප්‍රශ්නයට සෘජුව පිළිතුරක් ලබා දෙන්න දැන් මා ළඟ තොරතුරු නැහැ. මම ඒ සම්බන්ධයෙන් සොයා බලන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි උත්තර දුන්නාම එතුමන්ලාට අහන්න අතුරු ප්‍රශ්න නැහැ. ඒකයි මේ වෙලා තිබෙන්නේ. අපි හොඳට උත්තර දෙනවා නේ. අහන ප්‍රශ්නයට සම්පූර්ණ උත්තරයක් දුන්නාම අතුරු ප්‍රශ්න නැහැ නේ. මම හිතන විධියට ඒකයි වෙලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මා මේ සම්බන්ධයෙන් සොයා බලන්නම්. මේ සම්බන්ධයෙන් දැන් පිළිතුරක් දෙන්න මා ළඟ තොරතුරු නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දෙවන වටය.

## ශ්‍රීලංගම මගින් සපයනු ලබන මගී ප්‍රවාහන සේවා: මහනුවර දිස්ත්‍රික්කය

இ.போ.சபையால் அளிக்கப்படும் பயணிகள் போக்குவரத்துச் சேவை: கண்டி மாவட்டம்
PASSENGER TRANSPORT SERVICES PROVIDED BY SLTB: KANDY DISTRICT

1376/2025

**6. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney at Law)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් මහනුවර දිස්ත්‍රික්කය තුළ මගී ප්‍රවාහනය සිදු කළ යුතු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම මාර්ග අතරින් මණ්ඩලයේ බස්රථ මගින් මගී ප්‍රවාහනය සිදු කරනු ලබන මාර්ග සංඛ්‍යාව සහ මගී ප්‍රවාහනය සිදු කරනු නොලබන මාර්ග සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මගී ප්‍රවාහනය සිදු කරනු නොලබන මාර්ගවල එම මණ්ඩලයේ බස්රථ මගින් මගී ප්‍රවාහනය සිදු නොකිරීමට හේතු කවරේද;

(iv) මහනුවර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ ධාවනය ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) මහනුවර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ සංවර්ධනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை போக்குவரத்துச் சபைமூலம் கண்டி மாவட்டத்துக்குள் பயணிகள் போக்குவரத்து மேற்கொள்ளப்பட வேண்டிய வீதிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி வீதிகளில் இலங்கை போக்குவரத்துச் சபையின் பேருந்துகள்மூலம் பயணிகள் போக்குவரத்து மேற்கொள்ளப்படும் வீதிகளின்

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

எண்ணிக்கை மற்றும் பயணிகள் போக்குவரத்து மேற்கொள்ளப்படாத வீதிகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) பயணிகள் போக்குவரத்து மேற்கொள்ளப்படாத வீதிகளில் மேற்படி இலங்கை போக்குவரத்துச் சபையின் பேருந்துகள்மூலம் பயணிகள் போக்குவரத்து மேற்கொள்ளப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) கண்டி மாவட்டத்தில் இலங்கை போக்குவரத்துச் சபையின் பேருந்துச் சேவைகளை முன்னேற்றுவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) கண்டி மாவட்டத்தில் இலங்கை போக்குவரத்துச் சபையின் டிப்போக்களை அபிவிருத்தி செய்வதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the number of defined routes in the Kandy District, on which the Sri Lanka Transport Board (SLTB) is mandated to provide passenger transportation services;

(ii) out of those roads, the number of routes on which the SLTB buses provide passenger transport and the number of routes on which passenger transport is not provided, separately;

(iii) the reasons for the non- provision of passenger transportation services on the routes identified as currently not being served by the SLTB;

(iv) the measures that will be taken to increase the bus operations of the SLTB in the Kandy District; and

(v) the measures that will be taken to develop the depots of the SLTB in the Kandy District?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මාර්ග සංඛ්‍යාව 454යි.

එයින් 324ක මාර්ගවල බස් රථ ධාවනය කරනු ලබයි.

(ii) මෙම එක් එක් ඩිපෝ බලප්‍රදේශ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ මගී ප්‍රවාහනය කළ යුතු මාර්ග පහත පරිදි වේ.

| ඩිපෝව | මාර්ග | මගී ප්‍රවාහනය වන | මගී ප්‍රවාහනය නොවන |
|---|---|---|---|
| මහනුවර උතුර | 85 | 65 | 20 |
| මහනුවර දකුණ | 58 | 41 | 17 |
| යටිනුවර | 52 | 27 | 25 |
| වත්තේගම | 31 | 31 | 0 |
| තෙල්දෙණිය | 51 | 42 | 09 |
| උඩුදුම්බර | 23 | 23 | 0 |
| ගම්පොල | 76 | 52 | 24 |
| නාවලපිටිය | 78 | 43 | 05 |
| එකතුව | 454 | 324 | 100 |

මෙම මාර්ග අතරින් දැනට ශ්‍රීලංගම බස්රථ ධාවනය වන මාර්ග හා ධාවනය නොවන මාර්ගවල සමස්ත එකතුව පහත පරිදි වේ.

සමස්ත මාර්ග සංඛ්‍යාව - 454

මගී ප්‍රවාහනය සිදුවන මාර්ග - 324

මගී ප්‍රවාහනය සිදු නොවන මාර්ග - 100

(iii) මෙම මාර්ගවල බස් රථ ධාවනය නොවීමට හේතු පහත පරිදි වේ.

- රියැදුරු - කොන්දොස්තර හිඟය
- පවතින බස් රථ හිඟය
- ඇතැම් මාර්ගවලට අවශ්‍ය වන බස් රථ දැනට නොමැතිකම

  උදාහරණ: D type බස් රථ හිඟය
- සමහර මාර්ගවල තත්ත්වය හේතුවෙන් ඒ සඳහා බස් රථ ධාවනයේදී පවතින ගැටලු
- "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ඇතැම් මාර්ග තවමත් සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කර නොමැති වීම.

(iv) නව බස් රථ 200ක් ග්‍රාමීය මාර්ග සඳහා කුලී පදනම මත ලබා ගැනීමට පියවර ගනිමින් සිටින අතර ශ්‍රී ලංගමට නිත්‍ය වශයෙන් ග්‍රාමීයව මාර්ග සඳහා කුඩා C, D කාණ්ඩයේ බස් රථ ලැබෙන තුරු මෙම පියවර ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- 2026.03.19 සහ 2026.03.24 යන දිනයන්හි බඳවා ගන්නා ලද රියැදුරන් 28ක් හා කොන්දොස්තරවරුන් 16කට මහනුවර දිස්ත්‍රික්කයේ බස් රථ ධාවනය සඳහා පත්වීම් ලබා දී ඇත. ඉදිරියේදී පවතින පුරප්පාඩු මත රියැදුරු 128ක් හා කොන්දොස්තර 117ක් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ බස්රථ ධාවනය කිරීම සඳහා පියවර ගැනීමට සැලසුම් කර ඇත.
- විනය හේතූන් මත සිටින රියැදුරු - කොන්දොස්තර වෘත්තිකයින් සඳහා අදාළ විනය පියවර කඩිනමින් අවසන් කිරීම.
- බස් රථ පුනරුත්ථාපන කටයුතු යටතේ අලුත්වැඩියා කර ගත හැකි බස් රථ ධාවනයට යෙදවීම.

- මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රධාන බස් මෙහෙයුම් පර්යන්තය බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සංශෝධනය කිරීම මඟින් දැනට පවතින බස් රථ ධාවන සැලැස්ම කාලීනව වෙනස් කර මඟීන්ට වඩාත් සුවපහසු සේවාවක් ලබා දීම සඳහා විධිමත් කිරීමට සැලසුම් කර ඇත.

(v)
- ආදර්ශ ඩිපෝ ව්‍යාපෘතිය මඟින් මේ වන විටද මහනුවර උතුර ඩිපෝවේ සංවර්ධනය පිළිබඳ පියවර ගනිමින් සිටියි.
- ඩිපෝවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2027 අය වැය යෝජනා ක්‍රමයට සැලසුම් ඉදිරිපත් කර ඇත.
- නව බස් රථ ලබා දීම. (ග්‍රාමීය සේවා සඳහා ආසන 33 -35 බස් රථ 200ක් හා ආසන 22 බස් රථ 50ක්) ග්‍රාමීය මාර්ගවල ප්‍රවාහන කටයුතු විධිමත් කිරීම සඳහා යෝජිත මාර්ගවල බස්රථ ධාවනයට යෝජනා කර ඇත.

(ආ) අදාළ නොවේ.

## කථිකාචාර්යවරුන් සහ මහාචාර්යවරුන් සඳහා අනුමත තනතුරු: පුරප්පාඩු
## விரிவுரையாளர்கள் மற்றும் பேராசிரியர்களுக்கான அங்கீகரிக்கப்பட்ட பதவிகள்: வெற்றிடங்கள்
## APPROVED POSITIONS FOR LECTURERS AND PROFESSORS: VACANCIES

608/2025

**14.ගරු ගයන්ත කරුණාතිලක මහතා(ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Dayasiri Jayasekara, Attorney at Law)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමස්ත විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා අනුමත, මේ වන විට සේවයේ යෙදී සිටින සහ පුරප්පාඩුවී පවතින ආචාර්ය සහ මහාචාර්ය තනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වැඩිම පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින අධ්‍යයන අංශ කවරේද;

(iii) එම පුරප්පාඩු ඇති වීමට හේතු කවරේද;

(iv) මෙම පුරප්පාඩු ඇතිවීම හේතුවෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන සිසුන් සඳහා ඇතිවී ඇති බලපෑම කවරේද;

(v) එකී පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) ஒட்டுமொத்தப் பல்கலைக்கழகக் கட்டமைப்புக்காக அங்கீகரிக்கப்பட்டுள்ளதும், இன்றளவில் சேவையிலுள்ள அத்துடன் வெற்றிடங்கள் காணப்படுகின்றதுமான விரிவுரையாளர் மற்றும் பேராசிரியர் பதவிகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அதிகப்படியான வெற்றிடங்கள் காணப்படுகின்ற கல்வித் துறைகள் யாவை என்பதையும்;

(iii) அத்தகைய வெற்றிடங்கள் ஏற்பட்டமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) இவ்வெற்றிடங்கள் ஏற்பட்ட காரணத்தால் பல்கலைக்கழக கல்வியைத் தொடரும் மாணவர்களுக்கு ஏற்பட்டுள்ள தாக்கம் யாது என்பதையும்;

(v) அத்தகைய வெற்றிடங்களை நிரப்புவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of positions approved for lecturers and professors for the entire university system, indicating the number currently filled and vacant, separately;

(ii) departments with the highest number of vacancies;

(iii) reasons for the creation of the aforesaid vacancies;

(iv) impact made on the university students due to the existence of the aforesaid vacancies; and

(v) steps that will be taken to fill the said vacancies?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සහ සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| විශ්වවිද්‍යාලය | අනුමත ආචාර්ය සහ මහාචාර්ය තනතුරු සංඛ්‍යාව | සේවයේ යෙදී සිටින ආචාර්ය සහ මහාචාර්ය තනතුරු සංඛ්‍යාව | පුරප්පාඩු වී පවතින ආචාර්ය සහ මහාචාර්ය තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන විශ්වවිද්‍යාල | 9479 | 7005 | 2474 |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 65 | *59 | 08 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 70 | **59 | 18 |

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

| විශ්වවිද්‍යාලය | අනුමත ආචාර්ය සහ මහාචාර්ය තනතුරු සංඛ්‍යාව | සේවයේ යෙදී සිටින ආචාර්ය සහ මහාචාර්ය තනතුරු සංඛ්‍යාව | පුරප්පාඩු වී පවතින ආචාර්ය සහ මහාචාර්ය තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | 56 | 48 | 8 |
| සාගර විශ්වවිද්‍යාලය | 40 | 36 | 04 |
| ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 404 | 279 | 124 |

* ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයෙහි දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටී.

** ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙහි අනියම් පදනම මත 07 දෙනෙකු දැනට සේවයේ යෙදී සිටී.

(ii) <u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන විශ්වවිද්‍යාල</u>

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි පවතින ආචාර්ය, මහාචාර්ය තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් අධ්‍යයන අංශ අනුව යාවත්කාලීන තොරතුරු ගෙන්වා ගැනීම සඳහා යම් කාලයක් ගතවන බැවින් ඒ සඳහා පිළිතුරු ඉදිරි දිනකදී ඉදිරිපත් කරමි.

<u>ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය</u>

- සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය

<u>ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය</u>

- වැඩිම පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින අධ්‍යයන අංශ පහත දක්වා ඇත.

Vacancy List - Buddhist and Pali University of Sri Lanka - Academic

| | Faculty | Department | Designation | Approved Cadre | Actual Cadre | Vacancies | Reason |
|---|---|---|---|---|---|---|---|
| 1 | | Office of the Vice Chancellor | Venerable Vice Chancellor | 1 | 1 | 0 | |
| 2 | | Library | Librarian | 1 | 1 | 0 | |
| | | | Senior Assis-tant Librar-ian/ Assistant Librarian | 1 | 1 | 0 | |
| 3 | | Buddhist Philosophy | Chair Professor | 1 | 0 | 1 | Failure to receive applications from suitably Qualified candidates. |
| | | | Professor/ Associate Professor/ Senior Lecturer/ Lecturer/ Lecturer (Probationary) | 9 | 8 | 1 | Due to the death of a lecturer |
| | | | Temporary Lecturer | 1 | 0 | 1 | End of the term of appointment |
| 4 | | Buddhist Culture | Chair Professor | 1 | 0 | 1 | Failure to receive applications from suitably qualified candidates. |
| | | | Professor/ Associate Professor/ Senior Lecturer/ Lecturer/ Lecturer (Probationary) | 9 | 8 | 1 | Resignation of a lecturer |
| | | | Temporary Lecturer | 1 | 1 | 0 | |
| 5 | Faculty of Buddhist Studies | Religious Studies and Compara-tive Philosophy | Chair Professor | 1 | 1 | 0 | |
| | | | Professor/ Associate Professor/ Senior Lecturer/ Lecturer/ Lecturer (Probationary) | 5 | 5 | 0 | |
| | | | Temporary Lecturer | 1 | 1 | 0 | |
| 6 | | Computer Teaching Unit | Professor/ Associate Professor/ Senior Lecturer/ Lecturer/ Lecturer (Probationary) | 1 | 1 | 0 | |
| | | | Computer Instructor | 1 | 1 | 0 | |
| 7 | | Archaeolo-gy | Chair Professor | 1 | 0 | 1 | Failure to receive applications from suitably qualified candidates. |
| | | | Professor/ Associate Professor/ Senior Lecturer/ Lecturer/ Lecturer (Probationary) | 4 | 4 | 0 | |
| | | | Temporary Lecturer | 1 | 0 | 1 | End of the term of appointment |
| 8 | Faculty of Language Studies | Pali | Chair Professor | 1 | 0 | 1 | Failure to receive applications from suitably qualified candidates. |
| | | | Professor/ Associate Professor/ Senior Lecturer/ Lecturer/ Lecturer (Probationary) | 7 | 6 | 1 | Resignation of a lecturer |

| | Faculty | Department | Designation | Approved Cadre | Actual Cadre | Vacancies | Reason |
|---|---|---|---|---|---|---|---|
| | | | Temporary Lecturer | 1 | 0 | 1 | End of the term of appointment |
| 9 | | Sinhala | Professor/ Associate Professor/ Senior Lecturer/ Lecturer/ Lecturer (Probationary) | 5 | 5 | 0 | |
| 10 | | Sanskrit | Professor/ Associate Professor/ Senior Lecturer/ Lecturer/ Lecturer (Probationary) | 5 | 4 | 1 | Dismissal from service |
| | | | Temporary Lecturer | 1 | 0 | 1 | End of the term of appointment |
| 11 | | English | Professor/ Associate Professor/ Senior Lecturer/ Lecturer/ Lecturer (Probationary) | 3 | 3 | 0 | |
| | | | Temporary Lecturer | 1 | 1 | 0 | |
| 12 | Faculty of Language Studies | Language Skills Development | Professor/ Associate Professor/ Senior Lecturer/ Lecturer/ Lecturer (Probationary) | 10 | 8 | 2 | Due to the Government's suspension of recruitment to fill vacant posts |
| | | | Temporary Lecturer | 2 | 0 | 2 | End of the term of appointment |
| 13 | | English Language Teaching | Professor/ Associate Professor/ Senior Lecturer/ Lecturer/ Lecturer (Probationary) | 3 | 2 | 1 | Retirement of a lecturer |
| | | | Temporary Lecturer | 1 | 0 | 1 | End of the term of appointment |
| | | | Total | 80 | 62 | 18 | |

<u>වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය</u>

- ඉදිකිරීම් තාක්ෂණ දෙපාර්තමේන්තුව
- කර්මාන්ත කළමනාකරණ දෙපාර්තමේන්තුව
- මෘදුකාංග තාක්ෂණ දෙපාර්තමේන්තුව
- භාෂා (ඉංග්‍රීසි) අධ්‍යයන දෙපාර්තමේන්තුව
- කෘෂිකර්ම හා ආහාර තාක්ෂණ දෙපාර්තමේන්තුව
- අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයන දෙපාර්තමේන්තුව

<u>සාගර විශ්වවිද්‍යාලය</u>

- නාවික ඉංජිනේරු අධ්‍යයන අංශය (Marine Engineering)
- සමුද්‍රීය ප්‍රවාහන හා කළමනාකරණ අධ්‍යයන අංශය (Maritime Transportation Management and Logistics)
- සමුද්‍රීය කටයුතු අධ්‍යයන අංශය (Maritime Affairs and Fisheries and Marine Sciences)

<u>ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය</u>

- වෛද්‍ය පීඨය
- ඉංජිනේරු පීඨය
- නිර්මිත පරිසරය සහ අවකාශීය විද්‍යා අධ්‍යයන පීඨය
- පරිගණක පීඨය

(iii) විශ්‍රාම යාම, මිය යාම, සේවයෙන් ඉල්ලා අස්වීම, සේවය අතහැර යාම, සේවයෙන් පහ කිරීම වැනි හේතූන් මත පුරප්පාඩු ඇති වී ඇති අතර බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලදී සුදුසුකම් ලත් අයවලුන් නොමැති වීම මතද, බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොමැති වීම හා බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වී නොමැති වීම මත ද පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත.

(iv) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සතුව දැනට පවතින මානව සම්පත යොදා ගනිමින් අධ්‍යයන කටයුතුවලට බලපෑමක් ඇති නොවන පරිදි කළමනාකරණය කරගනු ලබයි.

(v) <u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන විශ්වවිද්‍යාල</u>

රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන මඟින් ඉදිරිපත් කරන ලද අත්‍යවශ්‍යයෙන්ම සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සම්බන්ධ ඉල්ලීම් (ආචාර්යවරුන් ද ඇතුළත්ව) නිර්දේශ සහිතව යොමු කරමින් පවතී.

2025.01.01 දින සිට 2026.06.15 දක්වා විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි පවතින ආචාර්ය, මහාචාර්යවරුන්ගේ තනතුරු පුරප්පාඩු 1471 ක් පිරවීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද නිලධාරි කමිටුව අනුමැතිය ලබා දී ඇති අතර එම බඳවා ගැනීම් අදාළ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන් සිදු කරමින් පවතී.

අග්‍රාමාත්‍ය ලේකම් විසින් යොමු කරන ලද අංක PMO/RRPPS/2025 දරන 2025.01.08 හා 2025.01.15 දාතමින් යුතුව යොමු කරන ලද ලිපි අනුව, ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා වෙන්කර ඇති අය වැය ප්‍රතිපාදන සීමාව ඇතුළත කළමනාකරණය කර ගැනීමට යටත්ව එක් එක් තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටීන්වලට අනුකූලව විධිමත් පරිදි බඳවා ගැනීමට අනුමැතිය හිමිවුණු අධ්‍යයන තනතුරු 1,471 අතරින් අධ්‍යයන තනතුරු 769ක් සඳහා, එනම් සියයට 52ක් සඳහා බඳවා ගැනීම්, විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන විසින් සිදුකොට ඇත.

<u>ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය</u>

අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/25/1174/802/004-VII හා 2025.07.07 දිනැති ලිපියට අනුව අනුමැතිය ලබා දී තිබූ පරිදි 2026.01.18 දින පළ කරන ලද පුවත් පත් දැන්වීමට අනුව මහාචාර්ය (ප්‍රමුඛ) තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පරිපාටි අනුව සිදු කරමින් පවතී.

අනෙකුත් පුරප්පාඩුගත තනතුරුවලට බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට 2026.06.23 වන දින අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

උපදේශක (බෞද්ධ), උපදේශක (චීන) හා උපදේශක (ජපන්) යන තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පරිපාටි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර මේ වනතෙක් අනුමැතිය ලැබී නොමැත.

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති බැවින් පුරප්පාඩු පිරවීමට පුවත් පත් දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවා ඇත.

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

පුරප්පාඩු සියල්ල පිරවීම අවසන් අදියරේ පවතී.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

පුවත් පත් දැන්වීම් මඟින් නැවත අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණ කමිටුව වෙත කොඅපි විසින් 2024 දෙසැම්බර් මස 31 වන දිනට තිබූ අධ්‍යයන පුරප්පාඩු 54 ක් සඳහා බඳවා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කළ ඉල්ලීම සඳහා 2025 අගෝස්තු මස 19 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය හරහා තනතුරු 30ක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, එම බඳවා ගැනීම් සඳහා පුවත් පත් දැන්වීම් පළකොට ඇතිවන පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත. එසේ වුවද, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිරන්තරයෙන් සිදු වන සේවයෙන් ඉල්ලා අස්වීම්, විශ්‍රාම යෑම, සේවය අත්හිටුවීම්, සේවය අතහැරයාම් ආදිය හේතුවෙන් ඇති වන පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් නව යෝජිත කාර්ය මණ්ඩල වාර්තාවක් 2026 මාර්තු 06 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය වෙත ඉදිරිපත් කර ඇත.

(ආ) පැන නොනඟී.

## මහවැලි අධිකාරියට අයත් ඉඩම්වල කළුගල් කැණීම: හිඟ ඉඩම් පරිහරණ ගාස්තුව

## மகாவலி அதிகாரசபைக்குச் சொந்தமான காணிகளில் கருங்கல் அகழ்வு: நிலுவையிலுள்ள காணிப் பயன்பாட்டுக் கட்டணம்

## GRANITE QUARRYING ON MAHAWELI AUTHORITY LANDS: OUTSTANDING LAND USE FEE

831/2025

**22.ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු කිංස් නෙල්සන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு கிங்ஸ் நெல்சன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Kins Nelson)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩම්වල කළුගල් කැණීම් කටයුතු සිදු කරන ව්‍යාපාරිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාලසීමාව තුළ ඒ සඳහා ඉඩම් පරිහරණ ගාස්තු වශයෙන් අය කර ඇති මුදල කොපමණද;

(iii) තවදුරටත් අය කර ගැනීමට හිඟව පවතින මුදල කොපමණද;

(iv) එම මුදල් අය කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் இற்றைவரை, இலங்கை மகாவலி அதிகாரசபைக்குச் சொந்தமான காணிகளில் கருங்கல் அகழ்வு நடவடிக்கைகளில் ஈடுபட்டுள்ள வர்த்தகர்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி காலப்பகுதியில் அதற்கான காணிப் பயன்பாட்டுக் கட்டணமாக அறவிடப்பட்டுள்ள தொகை யாது;

(iii) மேலும், அறவிடப்பட வேண்டியுள்ள நிலுவைத் தொகை யாது;

(iv) குறித்த பணத் தொகையை அறவிடுவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) number of businessmen who have been engaged in granite quarrying on lands belonging to the Sri Lanka Mahaweli Authority since the year 2015 up to now;

(ii) amount of money that has been collected as land use fee during the said period;

(iii) amount of money that is still outstanding; and

(iv) measures that will be taken to recover the said outstanding amount?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දැනට ක්‍රියාකාරී සංඛ්‍යාව 47කි.

(ii) රුපියල් 641,538,323.29

(iii) රුපියල් 3,890,237.98

(iv) අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ගෙවීම් කිරීම අවසන් කර නොමැති ආයෝජකයින් සඳහා පොදු දේපළ පනත යටතේ නීතිමය පියවර ගැනීම සඳහා අදාළ වන පොලිස් බලප්‍රදේශවල පැමිණිලි ගොනු කිරීමට අදාළව කටයුතු සිදු කර ඇත.

(ආ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

## 2017.01.01 සිට 2025.03.31 දක්වා ඉඩම් සඳහා අයදුම්කරුවන්: වාලච්චේන ප්‍රා.ලේ. කොට්ඨාශය
## 2017.01.01 - 2025.03.31 வரை காணிக்காக விண்ணப்பித்தோர்: வாழைச்சேனை பிரதேச செயலாளர் பிரிவு
APPLICANTS FOR LAND FROM 01.01.2017-31.03.2025: VALAICHCHENAI DS DIVISION

883/2025

**23.ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் சார்பாக )
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Dr.) M.L.A.M. Hizbullah)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වා වූ කාලසීමාවේදී කෝරළේපත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කෝරළේපත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචි වී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணியற்ற மக்கள் தங்களுக்குக் காணியொன்றைப் பெற்றுக்கொள்வதற்காக 2017.01.01 முதல் 2025.03.31ஆம் திகதி வரையான காலப்பகுதிக்குள் கோரளைப்பற்று, வாழைச்சேனை பிரதேச செயலகத்தில் விண்ணப்பித்துள்ளார்கள் என்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை, பெயர்கள் மற்றும் விபரங்கள் யாவை;

(iii) அம்மக்களுக்கு அளிப்பு உறுதி அல்லது காணி உரிமம் வழங்கப்பட்டுள்ளதா;

(iv) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை, பெயர்கள் மற்றும் விபரங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கோரளைப்பற்று, வாழைச்சேனை பிரதேச செயலாளர் பிரிவிலுள்ள அரச காணிகளில் குடியிருப்பவர்களில் பலருக்கு இன்றுவரை அளிப்பு உறுதி அல்லது காணி உரிமம் வழங்கப்படாதுள்ளது என்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், அம்மக்களின் எண்ணிக்கை, பெயர்கள் மற்றும் விபரங்கள் யாவை;

(iii) அம்மக்களுக்கு இதுவரை காணி உறுதி அல்லது காணி உரிமம் வழங்கப்படாமைக்கான காரணங்கள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that the landless persons have applied to the Koralaipattu, Valaichchenai Divisional Secretariat with the aim of acquiring land, during the period from 01.01.2017 to 31.03.2025;

(ii) if so, the number of such persons, their names and relevant details;

(iii) whether such persons have been issued with Deeds of Grant or Land Permits; and

(iv) if so, the number of such persons along with their names and relevant details?

(b) Will he also inform this House -

(i) whether he is aware that the majority of the persons who have settled down in government lands in the Koralai Pattu, Valaichchenai Divisional Secretary's Division have not been issued with Deeds of Grant or Land Permits so far;

(ii) if so, the number of such persons, their names and relevant details; and

(iii) the reasons for not issuing Deeds of Grant or Land Permits to the aforementioned persons so far?

(c) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.
(ii) පුද්ගලයින් 439
(iii) ඔව්. බලපත්‍ර 125යි - දීමනා පත්‍ර 229යි.
(iv) **ඇමුණුම 01හි**** දක්වා ඇත.

(ආ) (i) ඔව්.
(ii) පුද්ගලයින් 426යි. **ඇමුණුම 02හි**** දක්වා ඇත.
(iii) එම පුද්ගලයන් අයදුම් කරන්නේ නම් චක්‍රලේඛ අංක 2008/4 ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කරනු ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ප්‍රශ්න අංක 24 - 885/2025 - (2), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ප්‍රශ්න අංක 25 - 945/2025 - (1), ගරු හෙක්ටර් අප්පුහාමි මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

---

***පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ප්‍රශ්න අංක 26 - 1268/2025 - (1), ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நான் அந்த வினாவைக் கேட்கின்றேன்.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මඩකලපුව කළපුව අසල කුඹුරු ඉඩම්වලට ලවණ ජලය මුසු වීම: ලවණ බාධක ඉදිකිරීම
## மட்டக்களப்பு வாவிக்கருகிலுள்ள வயற் காணிகளில் உப்புநீர் உட்புகுதல்: உவர்நீர்த் தடுப்பணைகளை அமைத்தல்
## INTRUSION OF SALTWATER INTO PADDY LANDS NEAR BATTICALOA LAGOON: CONSTRUCTION OF SALINITY BARRIERS

1449/2025

**27. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජල පෝෂිත ප්‍රදේශවලට ආසන්නව පිහිටා ඇති කුඹුරු ඉඩම්වල ජලයට ලවණ මුසු වන බවත්, මහ කන්නයේදී කුඹුරු ගංවතුරට යට වීමෙන් වගාවන් විනාශයට පත්වන බවත් දන්නේද;
(ii) එසේ නම්, එම තත්ත්වයන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මඩකලපුව, පට්ටිරුප්පු ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අයත් මහිලූර් පෙරියකුලම සහ කුඹුරු ඉඩම් අතර ද, මණ්ඩූර් 1

හා 2 කුඹුරු ඉඩම් සහ ගඟ අතර ද ලවණ බාධක ඉදිකිරීම මඟින් කන්න දෙකේදීම වගා කටයුතු කළ හැකි බව දන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය යථා තත්වයට පත් කිරීම සඳහා ලවණ බාධක ඉදිකිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நீரேந்துப் பிரதேசங்களுக்கு அண்மையிலுள்ள வயற் காணிகளின் நீரில் உவர்ப்புத் தன்மை கலப்பதையும், பெரும்போகத்தின்போது வயற் காணிகளில் வெள்ள நீர் நிரம்புவதால் பயிர்கள் அழிவடைவதையும் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அதனைத் தடுப்பதற்காக மேற் கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மட்டக்களப்பு, பட்டிருப்புப் பிரதேச நீர்ப்பாசனப் பொறியியலாளர் அலுவலகத்துக்குரிய மகிழூர், பெரிய குளத்துக்கும் வயற்காணிகளுக்கு இடையிலும், மண்டூர் 1 மற்றும் 2 வயற் காணிகளுக்கும், கங்கைக்கிடையிலும் உவர்நீர்த் தடுப் பணைகளை அமைப்பதன்மூலம் இரு போகங்களிலும் பயிர்ச்செய்கை நடவடிக்கைகளை மேற்கொள்ள முடியும் என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அதனை வழமை நிலைக்குக் கொண்டுவருவதற்கு உவர்நீர்த் தடுப் பணைகளை அமைப்பதற்கு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that saltwater intrudes the water in paddy fields located closer to catchment areas, and that crops are destroyed since paddy fields get submerged due to floods during *Maha* season; and

(ii) if so, the measures that will be taken to prevent the said conditions?

(b) Will he also inform this House -

(i) whether he is aware that it would be possible to cultivate paddy during both seasons by constructing salinity barriers between Mahiloor Periyakulam and the paddy fields, and also between Mandur 1 and 2 paddy fields and the river, which come under the Pattiruppu Divisional Irrigation Engineer's Office in Batticaloa; and

(ii) if so, the measures that will be taken to construct salinity barriers in order to reinstate that condition?

(c) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

- මඩකලපුව දිස්ත්‍රික්කයේ මඩකලපුව කළපුවට - Batticaloa Lagoon- ආසන්නව ඇති කුඹුරු ඉඩම්වල කලපුවේ ජල මට්ටම වැඩි වන අවස්ථාවලදී ලවණ තත්ත්වය සහිත ජලය කුඹුරු ඉඩම්වලට ඇතුළු වන බැවින් කුඹුරු ඉඩම් විනාශ වන තත්ත්වයක් දක්නට ඇත. මෙයින් මඩකලපුව කලපුවට ආසන්නව ඇති තුරයිනීලාවණයි සිට ඒරාවූර් දක්වා ඇති කලපුවේ දෙපැත්තෙන්ම පිහිටි කුඹුරු ඉඩම් මෙලෙස හානියට පත් වේ.

- මඩකලපුව කළපුව දෙපසම පිහිටි කුඹුරු ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ඉදිකර තිබූ ලවණ බාධක අමුණු විනාශ වීම සහ බොහෝ ස්ථානවල අමුණු සම්පූර්ණයෙන්ම විනාශ වී ඇති බැවින් කළපුවේ ලවණ ජලය පහසුවෙන් කුඹුරු ඉඩම්වලට ඇතුළු වී කුඹුරු ඉඩම් දැඩි ලෙස හානියට පත් වේ.

(ii) ගොවීන් විසින් මෙම ලවණ බාධක අමුණු යථාවත් කර දෙන ලෙස අඛණ්ඩව ඉල්ලීම් කර ඇතත්, ඒවා යථාවත් කිරීමට ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොලැබේ. එහෙත් ගොවි සංවිධානවල ඉල්ලීම් අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ලවණ ජල බාධක අමුණු අලුත්වැඩියා කර ලබාදී ඇත.

- SAARC වැඩසටහනේ අරමුදල යටතේ WASH Project මගින් 2015 වසරේ තේත්තාත්තිවු ප්‍රදේශයේ මීටර් 2200ක් දිග ලවණ බාධක අමුණක් ඉදිකිරීම.

- 2018 වසරේ ONUR ව්‍යාපෘතිය යටතේ මඩකලපුව එරුමයිත්තිවු කෘෂි යායේ මීටර් 653ක් දිග ලවණ ජල බාධක අමුණක් කොන්ක්‍රීට් බැම්මක් ලෙස ඉදිකිරීම.

- 2025 වසරේ විමධ්‍යගත අය වැය වැඩසටහන යටතේ මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කිරාන්කුලම් උතුර සිට කිරාන්කුලම් දකුණ දක්වා මීටර් 408ක් දිග ලවණ ජල බාධක අමුණක් ඉදිකිරීම.

- 2025 වසරේ විමධ්‍යගත අය වැය වැඩසටහන යටතේ මණ්මුනයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එරුමයිත්තිවු බාධක අමුණක් පුනරුත්ථාපනය කිරීම.

- 2026 වසරේ ප්‍රජා ශක්ති දිළිඳු බව තුරන් කිරීමේ ජාතික වැඩසටහන යටතේ එරුමයිතිවු කෘෂි යායේ ලවණ ජල බාධක අමුණ සඳහා රුපියල් මිලියන 15ක මුදලක් වෙන් කර ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කිරීම.

- තුරයිනීලාවණයි සිට පෙරියකල්ලාරු දක්වා ලවණ ජල බාධක අමුණක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු වාර්තාවක් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කිරීම.

(ආ) (i) එහි කුඹුරු ඉඩම්වලින් අක්කර 60ක් පමණ දැනට වගා කරනු ලබන්නේ යල කන්නයේදී පමණි.

[ගරු නාමල් කරුණාරත්න මහතා ]

(ii) වැසි කාලය තුළ මණ්ඩූර් 1 හා 2 ප්‍රදේශයේ පවතින බැමි මාර්ගය -bund road- ජලයෙන් යටවීම නිසා යාබද කුඹුරුවලට යන ප්‍රවේශ මාර්ගය අවහිර වේ. ඒ අනුව මුණයිවරම් අමුණ ප්‍රවේශ මාර්ගය (ලවණ ජලය බැහැර කිරීමේ බැම්ම ලෙස හැඳින්වෙන) ඉදිකිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබූ අතර, තෝරා ගත් ප්‍රධාන වාරි ව්‍යාපාරවල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ මුදල් වෙන් කිරීම් අනුමත කර ඇත. ඒ අනුව ජූලි මස අවසානය වන විට බලාපොරොත්තු වන යල කන්නයේ අස්වනු නෙළීම අවසන් වීමෙන් පසු මෙම ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය. එසේ නමුත් ඉහත කුඹුරු ඉඩම් කළපුවට ආසන්නයේ පිහිටා ඇති නිසා මහ කන්නය තුළ වගා කිරීම සුදුසු නොවේ.

(ආ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

## 2015 සිට කුරුඳු අපනයන: වාර්ෂික ආදායම
2015 முதல் கறுவா ஏற்றுமதி: வருடாந்த வருமானம்
CINNAMON EXPORTS SINCE 2015: ANNUAL REVENUE

1909/2026

**29.ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු බී. ආරියවංශ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு பி. ஆரியவங்ஷ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. B. Ariyawansha)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා කුරුඳු අපනයනයෙන් ඉපැයූ ආදායම වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වන විට කුරුඳු වගාවේ නිරතව සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) කුරුඳු වගාකරුවන් මුහුණ දෙන ගැටලු විසඳීමට සහ කුරුඳු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரையான காலப்பகுதியில் கறுவா ஏற்றுமதிமூலம் ஈட்டப் பட்ட வருமானம் ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) தற்போது கறுவாச் செய்கையில் ஈடுபட்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) கறுவா உற்பத்தியாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகளைத் தீர்ப்பதற்கும் கறுவாச் செய்கையை மேம்படுத்துவதற்கும் எடுக்கப் படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) annual revenue earned from cinnamon exports in each year from the year 2015 to date, separately;

(ii) number of families who are currently engaged in cinnamon cultivation; and

(iii) measures that will be taken to resolve the problems faced by cinnamon cultivators and to promote cinnamon cultivation?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | අපනයන ආදායම රුපියල් මිලියන | අපනයන ආදායම ඇමෙරිකන් ඩොලර් මිලියන |
|---|---|---|
| 2015 | 17,959 | 132 |
| 2016 | 23,177 | 159 |
| 2017 | 30,873 | 203 |
| 2018 | 34,853 | 214 |
| 2019 | 31,463 | 176 |
| 2020 | 38,219 | 206 |
| 2021 | 45,879 | 248 |
| 2022 | 71,716 | 217 |
| 2023 | 70,064 | 214 |
| 2024 | 67,982 | 226 |
| 2025 | 79,932 | 260 |
| 2026 මැයි දක්වා | 35,640 | 108 |

(ii) ආසන්න වශයෙන් 35,000කි.

(iii) (a) කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස කුරුඳු කර්මාන්තය සඳහා වෙන් වූ වෙනම ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කර තිබීම.

(b) ලෝක වෙළෙඳ පොළේ ශ්‍රී ලංකා කුරුඳු සඳහා ඇති ඉල්ලුම වර්ධනය වන බැවින් සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල කුරුඳු වගා කිරීම ආරම්භ කිරීම.

(c) කුරුඳු වගා කරන ගොවීන් වෙත සහනාධාර පදනම යටතේ ගුණාත්මක කුරුඳු පැළ නිකුත් කිරීම.

(d) කුරුඳු සැකසුම් කාර්මික ශිල්පීන්ගේ හිඟය මඟ හැරලීම සඳහා කුරුඳු කාර්මික ශිල්පීන් පුහුණු කිරීම.

(e) කුරුඳු සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම. ඒ හා සම්බන්ධ උපකරණ, යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ආයෝජන ආධාර ලබා දීම.

(f) ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති සහතික කුරුඳු කර්මාන්තකරුවන්ට ලබා ගැනීම සඳහා ආයෝජන ආධාර ලබා දීම.

(g) කුරුඳු වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම.

- පාළු සිටුවීම සඳහා ආයෝජන ආධාර ලබා දීම.
- ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධතිය / විසුරුම් ජල සම්පාදන පද්ධති කුරුඳු වගාකරුවන්ට හඳුන්වා දීම සහ ඒ සඳහා ආයෝජන ආධාර ලබා දීම.
- පෘෂ්ඨවංශික පරපෝෂිතයින්ගෙන් හානි වැළැක්වීම සඳහා ආරක්ෂිත වැට / සූර්ය කෝෂ විදුලි වැට ලබා ගැනීමට ආධාර සැපයීම.

(ආ) අදාළ නොවේ.

## නාගොඩ ප්‍රා.ලේ. කොට්ඨාසයේ "ඇප්තොප් වත්ත": විස්තර

## நாகொடை பிரதேச செயலாளர் பிரிவிலுள்ள "எப்தோப் தோட்டம்": விபரம்

## "APTHOP WATTA" IN NAGODA DS DIVISION: DETAILS

1926/2026

**30.** ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "ඇප්තොප් වත්ත" රජයේ ඉඩමක් බව පිළිගන්නේද;

(ii) එම ඉඩම අතීතයේ සිට මේ දක්වා පවරා ඇති ආකාරය කවරේද;

(iii) එම ඉඩමේ බිම් ප්‍රමාණය කොපමණද;

(iv) මේ වන විට මෙම ඉඩමේ පදිංචිකරුවන් සංඛ්‍යාව කොපමණද;

(v) එම පදිංචිකරුවන් විසින් භුක්ති විඳින බිම් ප්‍රමාණය කොපමණද;

(vi) පදිංචිවී නොමැති, වගා කටයුතු පමණක් සිදු කරන සංඛ්‍යාව කොපමණද;

(vii) ඔවුන් භුක්ති විඳින බිම් ප්‍රමාණය කොපමණද;

(viii) ඉහත ඉඩමේ දළ සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) ඉහත ඉඩම තුළ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය මඟින් හඳුනාගෙන ඇති අවදානම් කලාප පිහිටා තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி மாவட்டத்தின் நாகொடை பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள "எப்தோப் தோட்டம்" அரசாங்கத்தின் காணி என்பதை ஏற்றுக்கொள்வாரா;

(ii) அந்தக் காணி ஆரம்பத்திலிருந்து இதுவரை உரித்து மாற்றம் செய்யப்பட்டுள்ள விதம் யாது;

(iii) மேற்படி காணியின் பரப்பளவு யாது;

(iv) மேற்படி காணியில், இன்றளவில் குடியிருப்பவர்களின் எண்ணிக்கை யாது;

(v) அத்தகைய குடியிருப்பாளர்கள் அனுபவிக்கும் காணியின் அளவு யாது;

(vi) காணியில் வசிக்காது, பயிர்ச்செய்கையை மட்டும் மேற்கொள்பவர்களின் எண்ணிக்கை யாது;

(vii) அத்தகைய நபர்கள் அனுபவிக்கும் காணியின் அளவு யாது;

(viii) மேற்படி காணியின் மாதிரி வரைபடத்தை சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி காணியினுள் தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவகத்தால் அடையாளம் காணப்பட்டுள்ள ஆபத்தான வலயங்கள் காணப்படுகின்றனவா என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he accepts that the land "Apthop Watta" in the Nagoda Divisional Secretary's Division of the Galle District is a State land;

(ii) the manner in which the said land has been transferred from the past to the present;

(iii) the extent of the said land;

(iv) the number of residents who reside on the said land at present;

(v) the extent of the land that is occupied by the said residents;

(vi) the number of persons who are not settled, but only carry out cultivation activities on the said land;

(vii) the extent of the land that is in their possession at present; and

(viii) whether the rough plan of the said land will be presented?

(b) Will he also inform this House whether disaster-prone areas identified by the National Building Research Organization (NBRO) are located within the said land?

(c) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) 1921 වන විට රජය සතුව පැවති මෙම ඉඩම ෂෝ වොල්ස් සමාගම - Show Wallace and Company - වෙත 99 අවුරුද්දක් සඳහා බදු දී ඇති අතර, එකී සමාගම විසින් එම බදු අයිතිවාසිකම ඇප්තෝප් වතු සමාගම වෙත පවරා ඇත. පසුව 1999 වසරේදී ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ මෙම ඉඩම රජයට අත්පත් කරගෙන ඇත.

(iii) අක්කර 467යි, රූඩ් 01යි, පර්චස් 26යි.

(iv) පදිංචිකරුවන් සංඛ්‍යාව 72කි.

(v) මැනුම් කටයුතු සිදු කර නොමැති බැවින් පදිංචිකරුවන් භුක්ති විඳින ප්‍රමාණ නිශ්චිතව සඳහන් කළ නොහැක. මෙම ඉඩම මැනුම් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත මැනුම් ඉල්ලීම් අංක 2130, 2025.07.31 දිනෙන් මැනුම් ඉල්ලීම යොමු කර ඇති අතර, 2025.10.13 හා 2026.04.20 දිනැතිව සිහි කැඳවීම් ලිපි ද නාගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් යොමු කර ඇත.

(vi) වගා කටයුතු කරන සංඛ්‍යාව 608කි.

(vii) මැනුම් කටයුතු සිදු කර නොමැති බැවින් වගා කටයුතු කරන බිම් ප්‍රමාණය නිශ්චිතව සඳහන් කළ නොහැක.

(viii) අත්පත් කර ගැනීමේ පනතේ 6වැනි වගන්තිය යටතේ සකස් කරන ලද අ.ග.පි. 528හි කැබලි අංක 1404 හා 1405 පිඹුර මඟින් මෙම ඉඩම නිරූපණය වේ. (**ඇමුණුමෙහි**** දක්වා ඇත.)

(ආ) ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය මඟින් අවදානම් කලාප හඳුනාගෙන නොමැත.

(ඇ) හඳුනාගත් අවදානම් කලාප නොමැති අතර, පදිංචිකරුවන් කිහිප දෙනෙකුගේ ඉල්ලීම පරිදි ඉඩම්වල අවදානම ඉවත් කිරීම සඳහා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය වෙත යොමු කර නිර්දේශ ලබාගෙන ඒ අනුව කටයුතු කර ඇත.

## තේ පොහොර සහනාධාර බෙදා හැරීම සඳහා QR කේත ක්‍රමය: සාර්ථකත්වය
## தேயிலை உர மானிய விநியோகத்துக்கான QR குறியீட்டு முறைமை: வெற்றி
## QR SYSTEM FOR DISTRIBUTION OF TEA FERTILIZER SUBSIDIES: SUCCESS

1770/2025

**31.** ගරු ගයාන් ජනක මහතා (ගරු ලාල් ප්‍රේමනාත් මහතා වෙනුවට)
(மாண்புமிகு கயான் ஜனக - மாண்புமிகு லால் பிரேமநாத் சார்பாக)
(The Hon. Gayan Janaka on behalf of the Hon. Lal Premanath)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(අ) (i) තේ වගාව සඳහා පොහොර සහනාධාරය ලබා දීමේදී හඳුන්වා දුන් QR කේත ක්‍රමය මඟින් අපේක්ෂිත අරමුණු සපුරාගෙන තිබේද;

(ii) එසේ නම්, එම සාර්ථකත්වය තහවුරු කරන දත්ත කවරේද;

(iii) දැනට පවතින එම QR කේත යෝජනා ක්‍රමයේ ප්‍රායෝගික ගැටලු කවරේද;

(iv) මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී අපේක්ෂිත ඉලක්ක සපුරා නොගත් අවස්ථා තිබේද;

(v) එසේ නම්, එයට හේතු වූ මූලික සාධක කවරේද;

(vi) පොහොර ලබා ගැනීමේදී QR කේත ක්‍රමය හේතුවෙන් පීඩාවට පත්වූ තේ වැවිලිකරුවන් සඳහා රජය මඟින් ලබාදී ඇති විකල්ප පහසුකම් හෝ සහන කවරේද;

(vii) QR කේත ක්‍රමය වැඩි දියුණු කිරීම හෝ වඩාත් ඵලදායී ක්‍රමයක් කරා යොමු කිරීම සඳහා ඉදිරියේදී රජය මඟින් ගනු ලබන ක්ෂණික ක්‍රියාමාර්ග තිබේද;

(viii) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேயிலை பயிர்ச்செய்கைக்கான உர மானியம் வழங்கும்போது அறிமுகப்படுத்தப்பட்ட QR குறியீட்டு முறைமை ஊடாக எதிர்பார்க்கப்பட்ட குறிக்கோள்கள் அடையப்பெற்றுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அந்த வெற்றியை உறுதிப்படுத்தும் தரவுகள் யாவை என்பதையும்;

(iii) தற்போது நடைமுறையிலுள்ள மேற்படி QR குறியீட்டு முறைமையில் காணப்படுகின்ற நடைமுறைச் சிக்கல்கள் யாவை என்பதையும்;

(iv) இந்த முறைமையை நடைமுறைப்படுத்துகின்ற போது எதிர்பார்க்கப்பட்ட இலக்குகள் அடையப் பெறாத சந்தர்ப்பங்கள் காணப்படுகின்றனவா என்பதையும்;

(v) ஆமெனில், அதற்கான அடிப்படைக் காரணிகள் யாவை என்பதையும்;

(vi) உரத்தைப் பெற்றுக்கொள்கின்றபோது QR குறியீட்டு முறைமை காரணமாகப் பாதிக்கப் பட்ட தேயிலை பெருந்தோட்டத் துறையினருக்கு அரசாங்கத்தால் வழங்கப்பட்டுள்ள மாற்று வசதிகள் மற்றும் நிவாரணங்கள் யாவை என்பதையும்;

(vii) QR குறியீட்டு முறைமையை முன்னேற்று வதற்கோ அல்லது மிகவும் பயனுறுதி மிக்க முறைமையாக முன்னெடுப்பதற்கோ எதிர்காலத்தில் அரசாங்கத்தால் மேற்கொள்ளக் கூடிய துரித நடவடிக்கைகள் உள்ளதா என்பதையும்;

(viii) ஆமெனில், அவை யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) whether the objectives of introducing a QR system on distributing fertilizer subsidy for tea plantations has been fulfilled;

(ii) if so, the available data to demonstrate such success;

(iii) the practical limitations of the current QR code system;

(iv) whether there have been instances where the objectives were not achieved by implementing this system;

(v) if so, the main reasons for such an outcome;

(vi) the alternative facilities or reliefs provided by the Government to the tea planters who were placed at a disadvantage by the said QR code system;

(vii) whether the Government is to take prompt measures to improve or enhance the efficiency of the said QR code system; and

(viii) if so, such measures that will be taken?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) QR කේතය සඳහා දැනට ලියාපදිංචි වී ඇති ගොවීන් සංඛ්‍යාව 226,511කි. එම සංඛ්‍යාවෙන් 190,408ක ගොවීන් පිරිසක් වෙත මෙට්‍රික්ටොන් 21,500ක පොහොර ප්‍රමාණයක් ලබා දී ඇත.

(iii) කප්පාදු කළ වගාවන් සඳහා පොහොර ලබාදීමට නොහැකි වීම.

පොහොර ලබාදීමේදී මාර්ගගත ක්‍රමය භාවිත කිරීමට කටයුතු කළ ද, අදාළ පොහොර සමාගම්වලට ගෙවීම් කිරීමේදී අත්‍යවශ්‍ය ලේඛන නිවැරදිව ඉදිරිපත් නොවීම නිසා අදාළ ආයතන වෙත මුදල් ගෙවීම ප්‍රමාද වීම.

(iv) ඔව්.

(v)

- ඇතැම් ගොවීන්ට QR කේතය ලබා ගැනීමේදී අවශ්‍ය අන්තර්ජාල පහසුකම් වැනි යටිතල පහසුකම් නොමැති වීම.
- ඇතැම් ගොවීන්ගේ දලු ලබාදීම් පිළිබඳ දත්තයන් දළු එකතු කරන්නන් විසින් කර්මාන්තශාලා වෙත නිවැරදිව ලබා නොදීම හේතුවෙන් QR කේත සකස් කිරීමට නොහැකි වීම.
- උදාහරණයක් වශයෙන් QR කේත සකස් කිරීම සඳහා 269,000ක පමණ ගොවීන් පිරිසක් පද්ධතියෙහි ලියාපදිංචි වුවද, මේ අතරින් QR කේත නිකුත් කර ඇත්තේ 226,511ක ගොවීන් පිරිසක් සඳහා පමණක් වීම.
- දලු සැපයීම පදනම් කර ගන්නා නිසා කප්පාදු කළ අවස්ථාවලදී ගෙවීම් කිරීමට තොරතුරු ඉදිරිපත් නොවීම.

(vi) පීඩාවට පත්වූවන්ට QR ක්‍රමවේදය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී ඊට අදාළ විසඳුම් ලබාදෙන ලදී.

(vii) ඔව්.

(viii) QR කේතය ලබා ගැනීම සඳහා දත්ත ඇතුළත් කිරීම ගොවීන් විසින්ම සිදු කර ගත හැකි වන පරිදි පද්ධතිය වැඩිදියුණු කිරීම හා මාර්ගගත ක්‍රමය ඔස්සේ අදාළ පොහොර සමාගම් වෙත ඉතා කෙටි කාලයක් තුළ ගෙවීම් කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

## සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන්: වගකීම් සහ රාජකාරි
## அபிவிருத்தி உத்தியோகத்தர்கள் மற்றும் முகாமைத்துவ சேவை உத்தியோகத்தர்கள்: ஒதுக்கப்பட்ட பொறுப்புகளும் கடமைகளும்
## DEVELOPMENT OFFICERS AND MANAGEMENT SERVICE OFFICERS: RESPONSIBILITIES AND DUTIES

1020/2025

**33. ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සංවර්ධන නිලධාරීන් සඳහා අනුමත සේවා ව්‍යවස්ථා නොමැතිකම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අංශය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන පියවර කවරේද;

(ii) උපාධි සුදුසුකම් සහිතව සේවයට ඇතුළත්වූ සංවර්ධන නිලධාරීන්ට (MN 4) පවරා ඇති මූලික කාර්යභාරය සහ වගකීම් කවරේද;

(iii) උසස් පෙළ සුදුසුකම් සහිතව සේවයට ඇතුළත් වූ කළමනාකරණ සේවා නිලධාරීන්ට (MN 3) පවරා ඇති නිශ්චිත රාජකාරි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாகம், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ)(i) அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கான அங்கீ கரிக்கப்பட்ட சேவைப் பிரமாணக் குறிப்புகள் இல்லாத குறையை நிவர்த்தி செய்வதற்கு பொது நிருவாகம், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் இணைந்த சேவைகள்

[ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා]

பிரிவு மற்றும் அரசாங்க சேவை ஆணைக் குழு ஆகியவற்றால் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) பட்டப்படிப்புத் தகைமைகளுடன் சேவையில் இணைந்த அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு (MN 4) வழங்கப்பட்டுள்ள முதன்மைப் பணிகள் மற்றும் பொறுப்புகள் யாவை என்பதையும்;

(iii) உயர் தர தகைமைகளுடன் சேவையில் இணைந்த முகாமைத்துவ சேவை உத்தியோகத் தர்களுக்கு (MN 3) ஒதுக்கப்பட்டுள்ள குறிப்பான கடமைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the steps taken by the Combined Services Division of the Ministry of Public Administration, Provincial Councils and Local Government and the Public Service Commission to address the absence of approved Service Minutes for Development Officers;

(ii) primary role and responsibilities assigned to Development Officers (MN 4), who entered the service with degree qualifications; and

(iii) specific duties assigned to Management Service Officers (MN 3), who entered the service with G.C.E. Advanced Level qualifications?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සේවා ව්‍යවස්ථාවක් පවතී. 2011.08.01 දින සිට ක්‍රියාත්මක වන එම සංවර්ධන නිලධාරි සේවයට අදාළ සේවා ව්‍යවස්ථාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර අංක 1745/11 හා 2012.02.14 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද අතර, එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර අංක 1774/31 හා 2012.09.07 දිනැති ගැසට් පත්‍රය මඟින් සංශෝධනය කර ඇත.

(ii) සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන යෝජනා ක්‍රමයන්හි අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමේ කාර්යයන්හිදී විධායක මට්ටම්වල කාර්යභාරයට උපස්ථම්භක වන්නාවූ විමර්ශන, තොරතුරු හා දත්ත රැස් කිරීම / විශ්ලේෂණය / වාර්තා සම්පාදනය / සමීක්ෂණ වැනි කාර්යයන්ගෙන් සමන්විත වූ කාර්යභාරයක් මෙම තනතුරු දරන්නන්ට පැවරේ.

(iii) 1840/34 හා 2013.12.11 දිනැති ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශිත කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථාවෙහි අංක 4 දරන වගන්තිය යටතේ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ කාර්යභාරය දක්වා ඇත. ඒ අනුව කළමනාකරණ සේවා නිලධාරි සේවයේ MN 2 නිලධාරින්ට පැවරෙන නිශ්චිත කාර්යභාරය / රාජකාරි පහත පරිදි වේ.

ආයතනයන්හි විධායක, කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වරූපයේ නොවන්නා වූ ද, බහුකාර්ය -Multifunctional - ස්වරූපයේ වූ ද, තාක්ෂණික නිපුණතා හැර වෙනත් විශේෂිත නිපුණතාවන් අවශ්‍ය වන්නා වූ ද, කාර්යයන් මෙම සේවයට අයත් නිලධරයන්ට පැවරේ. මෙම සේවයේ කාර්යයන් අතුරින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවයට අයත් නිලධරයන් ඉටු කරනු ලැබිය යුතුය.

කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථාවෙහි 5 වගන්තිය මගින් ප්‍රකාශිත පරිදි කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III, II සහ I ශ්‍රේණි සඳහා වැටුප් කේත අංකය "MN-02-2026-A" වන හෙයින් මෙම ප්‍රශ්න අංක: 1020/2025 හි (අ) (iii) කොටසෙහි සඳහන් MN 3 යන්න නිවැරදි නොවේ.

(ආ) අදාළ නොවේ.

## සංවර්ධන නිලධාරින් සහ කළමනාකරණ සේවා නිලධාරින් : රැකියා කාර්යභාරයන්හි වෙනස
### அபிவிருத்தி உத்தியோகத்தர்கள் மற்றும் முகாமைத்துவ சேவை உத்தியோகத்தர்கள்: வேலைப் பொறுப்புகளுக்கு இடையேயான வேறுபாடு
### DEVELOPMENT OFFICERS AND MANAGEMENT SERVICE OFFICERS: DISTINCTION OF JOB ROLES

1021/2025

**34.ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සංවර්ධන නිලධාරින් සහ කළමනාකරණ සේවා නිලධාරින් අතර රැකියා භූමිකාවන්හි ප්‍රායෝගික තත්ත්වය තුළ පිළිගත් වෙනස්කම් තිබේද;

(ii) එසේ නම්, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු තුළ එවැනි වෙනස්කම් ක්‍රියාත්මක කරනු ලබන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ව්‍යුහගත විභාග සහ සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් හරහා ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල තනතුරු සඳහා සුදුසුකම් ලබන්නේ කළමනාකරණ සේවා නිලධාරින් පමණක්ද;

(ii) එසේ නම්, සංවර්ධන නිලධාරින් සඳහා ඒ හා සමාන යන්ත්‍රණයක් හඳුන්වා නොදීමට හේතු කවරේද;

(iii) කළමනාකරණ සේවා නිලධාරින් හා සමානව සංවර්ධන නිලධාරින් සඳහා ද විදේශ රැකියා අවස්ථා ඇතුළුව සමාන වෘත්තීය සංවර්ධන අවස්ථා සහතික කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நடைமுறையில் அபிவிருத்தி உத்தியோகத்தர்கள் மற்றும் முகாமைத்துவ சேவை உத்தியோகத்தர்களுக்கு இடையிலான தொழில்சார் பணிகளில் நிலைபெற்ற வேறுபாடுகள் காணப்படுகின்றனவா என்பதையும்;

(ii) ஆமெனில், அத்தகைய வேறுபாடுகள் அமைச்சுக்கள் மற்றும் திணைக்களங்களுக்குள் எவ்வாறு நடைமுறைப்படுத்தப்படுகின்றன என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஒரு கட்டமைக்கப்பட்ட பரீட்சை மற்றும் நேர்முகப் பரீட்சை நடைமுறையின் ஊடாக, வெளிநாடுகளிலுள்ள இலங்கைத் தூதரகங்களுக்கு நியமிக்கப்படுவதற்கு முகாமைத்துவ சேவை உத்தியோகத்தர்கள் மாத்திரமே தகுதிபெறுகின்றார்களா என்பதையும்;

(ii) ஆமெனில், அபிவிருத்தி உத்தியோகத்தர்களுக்காக அத்தகையதொரு பொறிமுறை அறிமுகப்படுத்தப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) முகாமைத்துவ சேவை உத்தியோகத்தர்களுக்கு நிகராக, அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கும் வெளிநாட்டு வேலைவாய்ப்பு வாய்ப்புகள் உள்ளிட்ட சமமான தொழில்முறை மேம்பாட்டு வாய்ப்புகளை உறுதிப்படுத்த நடவடிக்கைகள் எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether there are established distinctions in job roles between Development Officers and Management Service Officers in practice; and

(ii) if so, how such distinctions are implemented within Ministries and Departments?

(b) Will he also inform this House -

(i) whether only Management Service Officers are eligible for postings to Sri Lankan Foreign Missions through a structured examination and interview process;

(ii) if so, the reasons for not introducing a similar mechanism for Development Officers; and

(iii) whether steps will be taken to ensure equal professional development opportunities, including overseas employment opportunities, for Development Officers on par with Management Service Officers?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සංවර්ධන නිලධාරීන් ආශ්‍රිත සේවා නිලධාරි ගණයට අයත් ක්ෂේත්‍රගත නිලධාරීන් පිරිසක් වන අතර, කළමනාකරණ සේවා නිලධාරීන් කාර්යාලගත නිලධාරි පිරිසට අයත් වේ.

සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව, රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන යෝජනා ක්‍රමයන්හි අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමේ කාර්යයන්හිදී විධායක මට්ටම්වල කාර්යභාරයට උපස්ථම්භක වන්නා වූ විමර්ශන, තොරතුරු හා දත්ත රැස් කිරීම / විශ්ලේෂණය / වාර්තා සම්පාදනය, සමීක්ෂණ වැනි කාර්යයන්ගෙන් සමන්විත වූ කාර්ය භාරයක් මෙම තනතුරු දරන්නන්ට පැවරේ.

කළමනාකරණ සේවා ව්‍යවස්ථාවේ පරිදි ආයතනයන්හි විධායක, කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වරූපයේ නොවන්නා වූද, බහුකාර්ය (multifunctional) ස්වරූපයේ වූද, තාක්ෂණික නිපුණතා හැර වෙනත් විශේෂිත නිපුණතාවන් අවශ්‍ය වන්නා වූද, කාර්යයන් මෙම සේවයට අයත් නිලධරයන්ට පැවරේ. මෙම සේවයේ කාර්යයන් අතුරින් සුවිශේෂීකොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවයට අයත් නිලධරයන් ඉටු කරනු ලැබිය යුතුය.

(ii) එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් නිලධාරීන්ට රැකියා ලැයිස්තු නිකුත් කරනු ලබන්නේ එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අනන්‍ය වන පරිදි අදාළ ආයතන ප්‍රධානීන් විසින් වේ. එම රැකියා ලැයිස්තු නිලධාරියා අයත් වන සේවා ව්‍යවස්ථාව අනුව සැකසීම සිදු කළ යුතුය.

(ආ) (i) කළමනාකරණ සේවා නිලධාරීන් විදේශ දූත මණ්ඩලවල තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළ ගැසට් නිවේදනය නිකුත් කරනු ලබන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් වන අතර, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය එම බඳවා ගැනීම් සඳහා මැදිහත් වීමක් සිදු කරනු නොලබයි. විදේශ කටයුතු අමාත්‍යාංශය සම්මුඛ පරීක්ෂණ මඟින් තෝරාගනු ලබන කළමනාකරණ සේවා නිලධාරීන් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු කිරීම පමණක් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්: බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය සහ තනතුරු නාම
## இலங்கை நிருவாக சேவை உத்தியோகத்தர்கள்: ஆட்சேர்ப்பு நடைமுறை மற்றும் பதவிப் பெயர்கள்
OFFICERS OF SRI LANKA ADMINISTRATIVE SERVICE: RECRUITMENT PROCEDURE AND DESIGNATIONS

2062/2026

**35.ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු ජේ.සී. අලවතුවල මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஜே.சீ. அலவத்துவல சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. J.C. Alawathuwala)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(අ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයට ඇතුළත් වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් කවරේද;

(ii) එම සේවයට නිලධාරින් බඳවා ගනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) එම සේවයට අයත් තනතුරු නාම කවරේද;

(iv) පරිපාලන සේවයට අයත් වුවද, දැනට වෙනත් සේවාවන්ට අයත් නිලධාරින් විසින් දරන තනතුරු හෝ වැඩ බලන තනතුරු නාම සහ සේවා ස්ථාන කවරේද;

(v) පරිපාලන සේවය විධිමත් රාජ්‍ය සේවාවක් ලෙස පවත්වාගෙන යෑම සඳහා, එම නිලධාරින් සුදුසු ස්ථානවල ස්ථානගත කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை நிருவாக சேவைக்கு உள்ளீர்க்கப்படுவதற்குப் பூர்த்தி செய்யவேண்டிய தகைமைகள் யாவை;

(ii) மேற்படி சேவைக்கு உத்தியோகத்தர்களை ஆட்சேர்ப்புச் செய்வதற்கான முறைமை யாது;

(iii) மேற்படி சேவைக்கு உரிய பதவிப் பெயர்கள் யாவை;

(iv) நிருவாக சேவைக்கு உரிய பதவிகளைத் தற்போது வேறு சேவைகளைச் சேர்ந்த உத்தியோகத்தர்கள் வகிப்பார்களாயின், அவ்வாறு வகிக்கின்ற பதவிகள் அல்லது பதிற்கடமையாற்றும் பதவிப் பெயர்களும் பணியிடங்களும் யாவை;

(v) நிருவாக சேவையை முறையான ஓர் அரச சேவையாக முன்னெடுத்துச் செல்வதற்காக, மேற்படி உத்தியோகத்தர்களைப் பொருத்தமான இடங்களில் அமர்த்துவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) qualifications that must be fulfilled to enter the Sri Lanka Administrative Service;

(ii) procedure for the recruitment of officers to that Service;

(iii) designations to which the officers of that Service are appointed;

(iv) designations or acting designations that belong to the Administrative Service, but are currently held by officers belonging to other services along with their places of work; and

(v) measures that will be taken to place the said officers in appropriate work places in order to maintain the Administrative Service as a proper public service?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත ධාරාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම්:-

පොදු සුදුසුකම්:

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.
ii. විශ්ෂ්ට චරිතයකින් යුක්ත වීම.
iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා වයස් සීමාව:

| සේවය | වයස | අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | |
|---|---|---|---|
| | | අධ්‍යාපන | වෘත්තීය |
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කරන දිනට හෝ එදිනට පෙර වයස අවුරුදු විසිදෙකට (22ට) නොඅඩු විය යුතු අතර, අවුරුදු විසිඅටට (28ට) නොවැඩි විය යුතුය. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් / ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් උපාධියක් ලබා තිබීම. | අදාළ නැත. |

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත ධාරාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම්.

පොදු සුදුසුකම්

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්

හෝ

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්

හෝ

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් උපාධියක්

සහ

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක හෝ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි වැටුප් කේත අංක MN 2-2025 හෝ ඊට ඉහළ MN වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන SL 1-2025 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක / තනතුරක අවම වශයෙන් වසර 5ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම.

හෝ

ii. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක හෝ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි වැටුප් කේත අංක MN 2-2025 හෝ ඊට ඉහළ MN වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන SL 1-2025 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක / තනතුරක අවම වශයෙන් වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ කුසලතා ධාරාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම්.

අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද:

i. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි පන්තියේ හෝ පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයක අධි පන්තියේ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරක නිලධාරියකු වීම.

හෝ

ii. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ හෝ පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයක හෝ පළමුවන ශ්‍රේණියේ (I ශ්‍රේණියේ) වසර දහයක (10ක) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත එම සේවයක වසර විස්සකට (20කට) නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරියකු වීම.

සටහන:

මෙහිදී සේවා කාලය ගණනය කිරීමේදී රාජ්‍ය සේවයේ සහ / හෝ පළාත් රාජ්‍ය සේවයන්හි අදාළ අඛණ්ඩ සේවා කාලයන්හි එකතුව ගණන් ගනු ලැබේ. අධි සේවක පදනම මත කිසියම් තනතුරකට පත් කරනු ලැබූ අවස්ථාවන් හෝ පත්වීම් පෙරදාතම් කරනු ලැබූ අවස්ථාවන් හෝ තනතුරක වැඩ බැලීමක් / රාජකාරි ඉටු කිරීමක් සිදු කරනු ලැබූ අවස්ථාවන් හෝ ජ්‍යෙෂ්ඨතා ලකුණු ගණනය කිරීමේදී සලකා නොබලන අතර, ඒ සඳහා නිත්‍ය තනතුර පමණක් පදනම් කරගනු ලැබේ.

අංක 1842/2 දරන 2013.12.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවේ අංක 10 යටතේ සඳහන් පරිදි විවෘත / සීමිත / කුසලතා පදනමින් බඳවා ගැනීමට අදාළ සුදුසුකම් වැඩිදුරටත් සඳහන් කර ඇත. (ඇමුණුම 01**).

(ii) අංක 1842/2 දරන 2013.12.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවේ අංක 10.2.6 යටතේ සඳහන් පරිදි විවෘත / සීමිත / කුසලතා යන පදනමින් තරග විභාගය හා සම්මුඛ පරීක්ෂණය මගින් බඳවාගනු ලැබේ. (ඇමුණුම 02**)

තවද, අංක අමප/23/0160/605/012 හා 2023.02.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විවෘත තරග විභාගය දීපව්‍යාප්ත සේවාවන් සඳහා පොදු තරග විභාගයක් ලෙස 2021 වර්ෂයේ සිට පැවැත්වීමට කටයුතු කර ඇත.

(iii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ / I/II/III ශ්‍රේණියේ තනතුරු පිළිබඳ සේවා ව්‍යවස්ථාවේ "අ" උපලේඛනයේ ඇතුළත් වේ. (ඇමුණුම 03**)

මෙම තනතුරු උපලේඛනය සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක SC FR 23/2014 හි තීන්දුවට අදාළව ක්‍රියා කිරීමට යටත් වේ.

(iv) අමාත්‍ය මණ්ඩලය පත් කිරීම් බලධරයා වශයෙන් ක්‍රියා කරනු ලබන දෙපාර්තමේන්තු ප්‍රධානී වැනි තනතුරු ශ්‍රී ලංකා පරිපාලන සේවා තනතුරු උපලේඛනයට අයත් තනතුරු වුවද, වෙනත් සේවාවන්ට අයත් නිලධාරීන් පත් කර ඇත. එලෙස පත් කරන ලදුව, මෙම අමාත්‍යාංශයට වාර්තා වී ඇති තනතුරු පහත දක්වා ඇත.

සුරාබදු අධ්‍යක්ෂ ජනරාල් - සුරාබදු දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල් - මූල්‍ය ප්‍රතිපත්තිදෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල් - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව

කොමසාරිස් ජනරාල් - බන්ධනාගාර දෙපාර්තමේන්තුව

නාගරික කොමසාරිස් - කොළඹ මහ නගර සභාව

(v) ශ්‍රී ලංකා පරිපාලන සේවය, අනෙකුත් දිප ව්‍යාප්ත සේවාවල මෙන්ම III, II, I හා විශේෂ ශ්‍රේණි ලෙස ශ්‍රේණිගත කර ඇත. ඒ අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති තනතුරු සැලකිල්ලට ගෙන සේවාවේ අවශ්‍යතාවන්ද පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති ප්‍රතිපාදන ප්‍රකාරව ස්ථාන මාරු කිරීම් මත කරනු ලබන පත්වීම් ලෙස උසස් කිරීම් මගින් කරනු ලබන පත් කිරීම් ලෙස හා නවක පත්වීම් මගින් කරනු ලබන පත් කිරීම් ලෙස නිලධාරීන් ස්ථානගත කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මකව ඇත. තවද, 2021 වර්ෂයේ තරග විභාග පැවැත්වීමෙන් පසු මෙම සේවාවට අදාළ බඳවා ගැනීමේ කටයුතු සිදුවී නොමැති වීම මත සේවා ස්ථානවල III ශ්‍රේණියේ පුරප්පාඩු පවතින අතර, මෙම වසරේ නව බඳවා ගැනීම් තුළින් එම තත්ත්වයන් අවම කිරීමට පියවර ගනිමින් පවතී.

(ආ) අදාළ නොවේ.

## දිස්ත්‍රික් ක්‍රිකට් සංගම්: කාර්ය මණ්ඩල සහ වැටුප් විෂමතා

மாவட்ட கிரிக்கெட் சங்கங்கள்:

பணியாட்டொகுதியும் சம்பள முரண்பாடும்

DISTRICT CRICKET ASSOCIATIONS: STAFF AND SALARY DISPARITIES

30/2024

38. **ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney-at-Law)

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන දිස්ත්‍රික් ක්‍රිකට් ක්‍රීඩා සංගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් සංගමයේ සේවයේ නියුතු නිලධාරීන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

* * පුස්තකාලයේ තබා ඇත.
* * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* * Placed in the Library.

* * පුස්තකාලයේ තබා ඇත.
* * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* * Placed in the Library.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iv) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවකයින්ගේ වැටුප් තල හා දිස්ත්‍රික් ක්‍රීඩා සංගම්වල සේවකයින්ගේ වැටුප් තල අතර විෂමතාවක් පවතින බව දන්නේද;

(v) එසේ නම්, එම විෂමතාව නිවැරදි කිරීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போது இயங்கு நிலையிலுள்ள மாவட்ட கிரிக்கெட் சங்கங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு சங்கத்திலும் பணிபுரியும் உத்தியோகத்தர்களின் எண்ணிக்கை மற்றும் அவர்களின் பெயர்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) இலங்கை கிரிக்கெட் நிறுவனத்தின் ஊழியர்களின் சம்பளப் படிநிலைக்கும் மாவட்ட விளையாட்டுச் சங்கங்களின் ஊழியர்களின் சம்பளப் படிநிலைக்கும் இடையில் முரண்பாடுள்ளதை அறிவாரா;

(v) ஆமெனில், மேற்படி முரண்பாட்டைத் திருத்துவதற்கு மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House -

(i) the number of district cricket associations currently operating in Sri Lanka;

(ii) the names of the said associations;

(iii) the number of officers employed in each of those associations and their names separately;

(iv) whether he is aware that there is a disparity between the salary scales of the employees of the Sri Lanka Cricket and the salary scales of the employees of the district sports associations; and

(v) if so, the measures that will be taken to rectify the said disparity?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට අදාළ පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් 25ක් ක්‍රියාත්මක වේ.

(ii) ඇමුණුම 01 ලෙස පහතින් දක්වා ඇත.

ඇමුණුම 01

| No. | Name of DCA |
|---|---|
| 1 | Ampara DCA |
| 2 | Anuradhapura DCA |
| 3 | Badulla DCA |
| 4 | Batticaloa DCA |
| 5 | Colombo DCA |
| 6 | Galle DCA |
| 7 | Gampaha DCA |
| 8 | Hambantota DCA |
| 9 | Jaffna DCA |
| 10 | Kalutara DCA |
| 11 | Kandy DCA |
| 12 | Kegalle DCA |
| 13 | Kurunegala DCA |
| 14 | Matale DCA |
| 15 | Matara DCA |
| 16 | Moneragala DCA |
| 17 | Nuwara Eliya DCA |
| 18 | Polonnaruwa DCA |
| 19 | Puttalam DCA |
| 20 | Ratnapura DCA |
| 21 | Trincomalee DCA |
| 22 | Vavuniya DCA |
| 23 | Kilinochchi DCA |
| 24 | Mulativu DCA |
| 25 | Mannar DCA |

(iii) ඇමුණුම 02 වශයෙන් පහතින් දක්වා ඇත.

ඇමුණුම 02

| No. | Name of DCA | | Name | Designation |
|---|---|---|---|---|
| 1 | Ampara DCA | Emp. 1 | R A Sinhabahu | Admin Officer |
| | | Emp. 2 | N U V R S S Bandara | Accounts Cleark |
| | | Emp. 3 | W P A S C Wijeratne | Cricket Development Trainer |
| 2 | Anuradhapura DCA | Emp. 1 | D M R Jayashantha | Coordinator |
| | | Emp. 2 | R M P S Rajakaruna | Accounts Officer |
| | | Emp. 3 | R M H Priyantha | Ground Staff |
| | | Emp. 4 | K T J Perera | Ground Staff |
| | | Emp. 5 | R A Premachandra | Ground Staff |
| | | Emp. 6 | G L Pelaketiya | Ground Staff |
| 3 | Badulla DCA | Emp. 1 | S L Unantenna | Admin Assistant |
| | | Emp. 2 | V Kirusika | Accounts Assistnat |
| 4 | Batticaloa DCA | Emp. 1 | R Nithuna | Accountant |
| | | Emp. 2 | V Rukshana | Head of Admin |
| | | Emp. 3 | K Thanushanth | Coach Assistant |
| 5 | Colombo DCA | Emp. 1 | J M V R Jayamanne | Administration Executive |
| | | Emp. 2 | R A G Nimesha | Accounts Clerk |
| 6 | Galle DCA | Emp. 1 | Office not in operation | |
| | | Emp. 2 | | |
| 7 | Gampaha DCA | Emp. 1 | M.A.Gauravi Rashmi Prabha | Office Clerk |
| 8 | Hambantota DCA | Emp. 1 | N Rangana | Administrative Officer |
| | | Emp. 2 | G B V K Chathuranga | Accounts Officer |
| 9 | Jaffna DCA | Emp. 1 | P.Rajkumar | Accountant |
| | | Emp. 2 | R.Kajaneethan | Admin Staff |
| | | Emp. 3 | T.Sentharan | Ground Assistant |
| | | Emp. 4 | N.Arankannan | Ground Assistant |
| 10 | Kalutara DCA | Emp. 1 | P W K C P Rodrigo | Accountant |
| | | Emp. 2 | U K M K Udawaththa | Admin Officer |
| 11 | Kandy DCA | Emp. 1 | S.P.D.C. Jayaweera | Administrative Assistant |
| | | Emp. 2 | D. Alexander | Office Assistant |
| 12 | Kegalle DCA | Emp. 1 | K P G K Senanayake | Administrative Assistant |
| | | Emp. 2 | W R Gayan Nisansala | Accounts Assistant |
| 13 | Kurunegala DCA | Emp. 1 | A.B.T.M Sulanka Bandaranayaka | Account Executive |
| | | Emp. 2 | M.A.Janaka Priyadarshana Jayathilake | Executive officer |
| 14 | Matale DCA | Emp. 1 | P G S B Wijekoon | Accountant |
| | | Emp. 2 | H K Hewapathirana | Admin Assistant |
| 15 | Matara DCA | Emp. 1 | A.P Arvin Kawshika | Account Assistant |
| | | Emp. 2 | K.H Kavindu Umesh | Admin Assistant |
| 16 | Moneragala DCA | Emp. 1 | K P Sugandhi Thamaransi Dalpathadu | Accountant Assistant |
| | | Emp. 2 | A K G M Sandaruwan Ambalakanda | Administration and Management Assistant |
| | | Emp. 3 | D M Sameera Chathuranga | Ground Assistant |
| | | Emp. 4 | Kalimuththu Tille Nadaraja | Ground Laborer |
| 17 | Nuwara Eliya DCA | Emp. 1 | R Vinoth | Admin Officer |
| | | Emp. 2 | R Krishanthini | Account Assistant |
| 18 | Polonnaruwa DCA | Emp. 1 | R L A W Sooriyaarachchi | Admin Officer |
| | | Emp. 2 | Rashmika Akarshana Withanage | Accounts Officer |

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

| | | | | |
|---|---|---|---|---|
| **19** | **Puttalam DCA** | **Emp. 1** | **P.K.Kandegedara** | **Accountant** |
| | | **Emp. 2** | **H.P.D.D.Pathirana** | **Administrative Officer** |
| **20** | **Ratnapura DCA** | **Emp. 1** | **M P N Udayangani** | **Accounts Officer** |
| | | **Emp. 2** | **M G A Kumara** | **Administrative Officer** |
| | | **Emp. 3** | **B C N Liyanage** | **Ground Labour** |
| | | **Emp. 4** | **L N N Liyanage** | **Ground Security** |
| **21** | **Trincomalee DCA** | **Emp. 1** | **R Ushananthini** | **Accountant** |
| | | **Emp. 2** | **T Puvaneswary** | **Admin Officer** |
| **22** | **Vavuniya DCA** | **Emp. 1** | **N.Sanjeevan** | **Accounts Officer** |
| | | **Emp. 2** | **R.Akash Gregary** | **Office Assistant** |
| **23** | **Kilinochchi DCA** | **Emp. 1** | **S.Santhiny** | **Accounts Assistant** |
| **24** | **Mulativu DCA** | **Emp. 1** | **Sivasara Tharmakesan** | **Accounts Assistant** |
| **25** | **Mannar DCA** | **Emp. 1** | **Sivanantham Sujeevan** | **Accounts Assistant** |

(iv) ඔව්.

(v) දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් මෙහෙයුම් තුළ පවතින පරිපාලන ව්‍යුහය සහ ශ්‍රී ලංකා ක්‍රිකට් මෙහෙයුම් තුළ පවතින පරිපාලන ව්‍යුහය සහ විෂය පථය වෙනස් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස වැටුප් ව්‍යුහයන් ද වෙනස් වේ.

එකී දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තුළ පවතින අනුකූලතාව සහ සාධාරණත්වය සහතික කිරීම සඳහා, රැකියා විෂය පථයන් සහ අනුරූප වැටුප් ව්‍යුහයන් සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ස්වාධීන තෙවන පාර්ශ්වයක් සම්බන්ධ කරගනිමින් සමාලෝචන ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. එකී සමාලෝචනය දැනට සිදුවෙමින් පවතින අතර, එය අවසන් වූ පසු යම් නිර්දේශයක් ඇත්නම් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සහ වැටුප් විෂමතා විධිමත් කිරීමට සහ අවශ්‍ය තැන්වලදී ප්‍රතිව්‍යුහගත කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය බලාපොරොත්තු වේ.

(ආ) පැන නොනඟී.

## ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය: 2015 සිට පාඩුව සහ භාණ්ඩාගාරය විසින් යෙදවූ මුදල්
## ஸ்ரீலங்கன் எயார்லைன்ஸ் நிறுவனம்: 2015 முதல் ஏற்பட்ட நட்டமும் திறைசேரியால் வழங்கப்பட்ட நிதியும்
SRILANKAN AIRLINES: LOSSES INCURRED AND TREASURY INFUSIONS MADE FROM 2015

675/2025

**39.ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Nalin Bandara Jayamaha)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් ආයතනය ලැබූ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අලාභය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් ආයතනයට ලබා දුන් මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් ආයතනය අලාභ ලබන අවස්ථාවකදී, එම ආයතනය තවදුරටත් රජයේ ආයතනයක් ලෙස පවත්වාගෙන යාමට තීරණය කරන ලද දිනය කවරේද;

(iv) එම තීරණය ගැනීම සඳහා හේතු වූ කරුණු කවරේද;

(v) එම ආයතනය රජයේ ආයතනයක් ලෙස පවත්වාගෙන යාමට ගනු ලැබූ තීරණය නැවත සලකා බැලීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் இற்றைவரை ஸ்ரீலங்கன் எயார்லைன்ஸ் நிறுவனம் அடைந்துள்ள நட்டம் ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு;

(ii) மேற்படி நட்டத்துக்காக பொதுத் திறைசேரியால் ஸ்ரீலங்கன் எயார்லைன்ஸ் நிறுவனத்துக்கு வழங்கப்பட்ட நிதி ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு;

(iii) ஸ்ரீலங்கன் எயார்லைன்ஸ் நிறுவனம் நட்டம் அடைந்த சந்தர்ப்பத்தில், மேற்படி நிறுவனத்தை தொடர்ந்தும் அரச நிறுவனமாகப் பேணிவருவதற்குத் தீர்மானிக்கப்பட்ட திகதி யாது;

(iv) மேற்படி தீர்மானத்தை மேற்கொள்ள காரணமாக அமைந்த விடயங்கள் யாவை;

(v) மேற்படி நிறுவனத்தை ஓர் அரச நிறுவனமாகப் பேணிவருவதற்கு மேற்கொண்டுள்ள தீர்மானத்தை மீள்பரிசீலனை செய்ய நடவடிக்கை மேற்கொள்ளப்படுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ)இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the losses incurred by the SriLankan Airlines from 2015 to date, separately for each year;

(ii) the amounts provided to SriLankan Airlines by the General Treasury to cover those losses, separately for each year;

(iii) the date that the Government decided to continue operating SriLankan Airlines as a State-owned entity at a time when it was incurring losses;

(iv) the reasons that led to that decision; and

(v) whether the decision to operate it as a government institution will be reconsidered?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | ශුද්ධ ලාභය/බදු ගෙවීමට පෙර ලාභය/(අලාභය) රු. මිලියන |
|---|---|
| 2015/16 | (12,622) |
| 2016/17 | (28,930) |
| 2017/18 | (17,214) |
| 2018/19 | (44,023) |
| 2019/20 | (47,198) |
| 2020/21 | (45,231) |
| 2021/22 | (166,370) |
| 2022/23 | (73,265) |
| 2023/24 | 3,872 |
| 2024/25 | (7,595) |
| 2025/26 (විගණනය නොකළ කෙටුම්පත) | (23,211) |

(ii) මහා භාණ්ඩාගාරය එක් එක් වර්ෂයේ අලාභය පියවීම සඳහා සෘජුව ප්‍රතිපාදන ලබා දී නොමැත. කෙසේ වෙතත්, අවශ්‍යතාව පරිදි ශ්‍රීලන්කන් ගුවන් සමාගම වෙත හිමිකම් නිකුතු ලබා දී ඇති අතර එම අවශ්‍යතා සහ ලබාදුන් ප්‍රතිපාදන පහත ඇමුණුමෙහි දක්වා ඇත.

**Annexure 01**

**Equity Infusion to Sri Lankan Airlines Ltd**

| Year | Month | Amount in Rs. | Form of Receipt | Reason |
|---|---|---|---|---|
| 2012 | February | 14,286,321,889.00 | Bond | Working capital Requirements |
| 2013 | March | 12,600,082,115.80 | Bond | Working capital Requirements |
| 2014 | March | 19,584,685,242.15 | Bond | Working capital Requirements |
| 2020 | November | 27,734,985,510.57 | Bond | Working capital Requirements during Covid 19 Pandemic Period |
| 2021 | April | 17,999,977,276.08 | Bond | Working capital Requirements during Covid 19 Pandemic Period |
| 2023 | December | 102,500,000,000.00 | Cash | Settlemet to CPC |
| 2024 | March | 3,500,000,000.00 | Cash | Working capital Requirements to settle immediate lease obligations to lessors |
| 2024 | April | 1,500,000,000.00 | Cash | Working capital Requirements to settle immediate lease obligations to lessors |
| 2024 | September | 2,400,000,000.00 | Cash | State Bank loan interest reimbursement |
| 2025 | January | 2,388,560,000.00 | Cash | State Bank loan interest reimbursement |
| 2025 | December | 25,275,824,900.00 | Cash | 1st installment of the equity infusion on the restructuring of state bank loans |
| 2026 | April | 13,674,434,946.67 | Cash | 2nd installment of the equity infusion on the restructuring of state bank loans |
| 2026 | May | 1,300,000,000.00 | Cash | Part payment of USD 30 Mn approved by the Cabinet of Ministers |
| 2026 | May | 4,080,000,000.00 | Cash* | Part payment of USD 30 Mn approved by the Cabinet of Ministers |

* Ex. Rate 1 USD = 340 LKR

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

(iii) ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගමේ අනාගත දිශාව තීරණය කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින්, 2026 ජුනි 08 දිනැති අංක 26/1134/804/130-1 දරන තීරණය මඟින් අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ උපායමාර්ගික සමාලෝචනය සහ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කමිටුවක් පත් කිරීම අනුමත කරන ලදී. ප්‍රතිව්‍යුහගත කිරීමේ විකල්ප සහ දිගුකාලීන තිරසරභාවය ඇතුළුව ගුවන් සමාගම සඳහා අනාගත ක්‍රියාමාර්ග ඇගයීම කමිටුවට පැවරී ඇත.

(iv) පැන නොනඟී.

(v) ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය දැනටමත් රජයට අයත් ආයතනයක් වන අතර, එහි කොටස්වලින් සියයට 99.77ක් ශ්‍රී ලංකා රජය සතු ය.

ශ්‍රීලන්කන් ගුවන් සේවයේ ඉදිරි ගමන තීරණය කිරීම සඳහා, 2026.06.08 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව අංක 26/1134/804/130-I තීරණය මඟින් ශ්‍රීලන්කන් ගුවන් සේවයේ උපායමාර්ගික සමාලෝචනය සහ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී.

(ආ) පැන නොනඟී.

## හීලෑ අලි-ඇතුන් සහ හිමිකරුවන් මුහුණ දෙන ගැටලු: විසඳුම්
## பழக்கப்படுத்தப்பட்ட யானைகள், கொம்பன் யானைகள் மற்றும் அவற்றின் உரிமையாளர்கள் முகங்கொடுக்கும் பிரச்சினைகள்: தீர்வுகள்
## ISSUES FACED BY DOMESTICATED ELEPHANTS/ TUSKERS AND THEIR OWNERS: SOLUTIONS

1377/2025

**43.ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින හීලෑ අලි-ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම හීලෑ අලි-ඇතුන් සහ හිමිකරුවන් මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போதுள்ள பழக்கப்படுத்தப்பட்ட யானைகளினதும் கொம்பன் யானைகளினதும் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அப்பழக்கப்படுத்தப்பட்ட யானைகள் மற்றும் கொம்பன் யானைகளும் அவற்றின் உரிமையாளர்களும் எதிர்கொள்ளும் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House the -

(i) number of domesticated elephants and tuskers in Sri Lanka at present; and

(ii) measures that will be taken to resolve the problems faced by those domesticated elephants and tuskers, and their owners?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ලියාපදිංචි ලිපිගොනු පදනම් කර ගනිමින් නෛතික ගැටලු නොමැති හීලෑ අලි ඇතුන් 56දෙනෙකු දැනට හඳුනාගෙන ඇත.

(ii) හීලෑ අලි ඇතුන්හට යම් හිංසාවක් හෝ අකටයුත්තක් සිදුවන බවට යම් පැමිණිල්ලක් ලද විට ඒ සම්බන්ධව සොයා බලනු ලබයි. එසේම හීලෑ අලි ඇතුන් හිමිකරුවන් විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ගැටලුව වන්නේ ඔවුන්ගේ ලියාපදිංචි හීලෑ අලි ඇතුන් සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කරන්නේ ද යන්නය. වර්තමානය වනවිට හීලෑ අලි ඇතුන් ලියාපදිංචිය සහ වාර්ෂික බලපත්‍ර සම්බන්ධව නෛතික ගැටලුකාරී තත්ත්වයක් පවතින හෙයින් හීලෑ අලි ඇතුන් සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් නොකරන අතර, නීතිපති උපදෙස් මත මේ සම්බන්ධ නව රෙගුලාසි සම්පාදනය කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

## ජාතික චිත්‍රපට සංස්ථාවේ සාමාන්‍යාධිකාරී සහ නීති නිලධාරී තනතුරු: සුදුසුකම්
## தேசிய திரைப்படக் கூட்டுத்தாபனத்தின் பொது முகாமையாளர் மற்றும் சட்ட அலுவலர் பதவிகள்: தகைமைகள்
## POSTS OF GENERAL MANAGER AND LEGAL OFFICER OF NATIONAL FILM CORPORATION: QUALIFICATIONS

1666/2025

**48.ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චාමර සම්පත් දසනායක මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chamara Sampath Dasanayake)
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික චිත්‍රපට සංස්ථාවේ සාමාන්‍යාධිකාරී තනතුර සහ නීති නිලධාරී තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ වනවිට සංස්ථාවේ නීති නිලධාරී තනතුරේ කටයුතු කරන නිලධාරියා එම සුදුසුකම් සපුරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய திரைப்படக் கூட்டுத்தாபனத்தின் பொது முகாமையாளர் மற்றும் சட்ட அலுவலர் பதவிகளுக்குத் தேவையான தகைமைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) இன்றளவில் கூட்டுத்தாபனத்தில் சட்ட அலுவலர் பதவியில் கடமையாற்றும் அலுவலர் மேற்படி தகைமைகளைப் பூர்த்திசெய்து இருக்கின்றாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) the qualifications required for the post of General Manager and the post of Legal Officer of the National Film Corporation, separately; and

(ii) whether the officer currently serving as the Legal Officer of the Corporation has fulfilled the aforementioned qualifications?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2012.09.14 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති ජාතික චිත්‍රපට සංස්ථාවේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සංස්ථාවේ සාමාන්‍යාධිකාරී තනතුර සහ සහකාර සාමාන්‍යාධිකාරී-නීති සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (නීති නිලධාරි) තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් පහත දක්වා ඇත.

(ජාතික චිත්‍රපට සංස්ථාවේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව නීති නිලධාරි ලෙස තනතුරක් නොමැති අතර එම තනතුර - "සහකාර සාමාන්‍යාධිකාරී නීති සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්" වශයෙන් දක්වා ඇත.)

<u>සාමාන්‍යාධිකාරී තනතුර</u>

සුදුසුකම්:

<u>බාහිර අයදුම්කරුවන්</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් සහිතව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10ක් පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව සම්පූර්ණ කළ පළපුරුද්ද.

<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් සහිතව ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර 05ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. (ඇමුණුම 01** )

<u>සහකාර සාමාන්‍යාධිකාරී - නීති සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්</u>

සුදුසුකම්:

<u>බාහිර අයදුම්කරුවන්</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් නීතිය පිළිබඳ උපාධිය සමඟ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී වසර 03ක පළපුරුද්ද

හෝ

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීති ඇටර්නි විභාගය සමත් වී ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසු වසර 03ක පළපුරුද්ද. (ඇමුණුම 02**)

(ii) සුදුසුකම් සපුරා ඇත.

දැනට සංස්ථාවේ පවතින සහකාර සාමාන්‍යාධිකාරී - නීති සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුරේ කටයුතු කරන නිලධාරිනිය ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීති ඇටර්නි විභාගය සමත් වීමෙන් පසු ජ්‍යෙෂ්ඨ නීතිඥයෙකු යටතේ ආධුනික නීතිඥයෙකු ලෙස පුහුණුව ලැබීමෙන් පසුව 1999.07.06 වන දින ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී ඇත. (ඇමුණුම 03**)

එසේම ඇය බඳවා ගන්නා ලද දිනය වන 2009.09.07 දින වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම්දීමෙන් පසු වසර 03ක පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සේවා සහතික ද මේ සමඟ අමුණා ඇත.

(ඇමුණුම 04**)

(ආ) අදාළ නොවේ.

## හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව: සංස්කෘතික මධ්‍යස්ථාන
## இந்து சமய, கலாசார அலுவல்கள் திணைக்களம்: கலாசார நிலையங்கள்
## DEPARTMENT OF HINDU RELIGIOUS AND CULTURAL AFFAIRS: CULTURAL CENTRES

2134/2026

**49.ගරු ගයාන් ජනක මහතා (ගරු කිට්නන් සෙල්වරාජ් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயான் ஜனக - மாண்புமிகு கிட்ணன் செல்வராஜ் சார்பாக)
(The Hon. Gayan Janaka on behalf of the Hon. Kitnan Selvaraj)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවල පරිපාලන ව්‍යුහය (සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික) සැකසී ඇති ආකාරය කවරේද;

(iii) ඉහත මධ්‍යස්ථානවල මූල්‍ය ප්‍රකාශන (ගිණුම් වාර්තා) වාර්ෂිකව විගණනය කරනු ලබන්නේද;

(iv) එම මධ්‍යස්ථාන මහජන භාවිතයට සුදුසු ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේද;

**** * පුස්තකාලයේ තබා ඇත.***
** * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** * Placed in the Library.*

[ගරු ගයාන් ජනක මහතා]

(v) බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන රජයේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන්නේද;

(vi) 2025 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව හරහා රජය විසින් හින්දු සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා වියදම් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இந்து சமய, கலாசார அலுவல்கள் திணைக்களத்தின்கீழ் பதிவு செய்யப்பட்டுள்ள கலாசார நிலையங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி நிலையங்களின் நிருவாகக் கட்டமைப்பு (தலைவர், செயலாளர், பொருளாளர்) அமைக்கப்பட்டுள்ள விதம் யாது என்பதையும்;

(iii) மேற்படி நிலையங்களின் நிதிக் கூற்றுகள் (கணக்கறிக்கைகள்) வருடாந்தம் கணக்காய்வு செய்யப்படுகின்றனவா என்பதையும்;

(iv) மேற்படி நிலையங்கள் பொதுமக்களின் பயன்பாட்டுக்குப் பொருத்தமான வகையில் தொழிற்படுகின்றனவா என்பதையும்;

(v) பதுளை மற்றும் நுவரெலியா மாவட்டங்களில் அமைந்துள்ள கலாசார நிலையங்கள் அரசாங்கத்தின் நிருவாகத்தின்கீழ் தொழிற்படுகின்றனவா என்பதையும்;

(vi) 2025ஆம் ஆண்டினுள் திணைக்களத்தின் ஊடாக அரசாங்கத்தால் இந்து கலாசார நிலையங்களுக்காகச் செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) the number of cultural centres registered under the Department of Hindu Religious and Cultural Affairs;

(ii) the manner in which the administrative structure (Chairman, Secretary, Treasurer) of the said centres is constituted;

(iii) whether the financial statements (Statement of Accounts) of the above centres are audited annually;

(iv) whether the said centres are functioning in a manner suitable for public use;

(v) whether the cultural centres located in the Badulla and Nuwara Eliya Districts are functioning under Government administration; and

(vi) the amount of money spent by the Government for Hindu cultural centres through the Department in the year 2025?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

(ii) අදාළ නැත.

(iii) නැත.

(iv) අදාළ නැත.

(v) නැත.

(vi) අදාළ නැත.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ශකිලා බානු අසරක් මහත්මියට එරෙහි චෝදනා
### திருமதி சகிலா பானு அசரக் மீதான குற்றச்சாட்டு
### ALLEGATIONS AGAINST MRS. SHAKILA BANU ASARAK

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! நிலையியற் கட்டளை 27(2) இன்கீழ் கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் அவர்களிடம் எனது கேள்வியைக் கேட்க எண்ணுகிறேன்.

எமது நாட்டில் இலங்கை விவசாய சேவை உத்தியோகத்தர்கள் மிகவும் குறைந்த அளவில் இருக்கின்றமை ஒரு பாரிய பிரச்சினையாகக் காணப்படுகின்றது. அவர்களுடைய சேவை என்பது குறிப்பாகத் தமிழ் பேசும் மக்கள் வாழ்கின்ற வடக்கு, கிழக்கு மாகாணங்களில் பாரிய அளவில் தேவைப்படுகின்றது. அதற்கமைய அந்த வெற்றிடங்கள் நிரப்பப்படவில்லை. இருந்தாலும் சேவையில் இருக்கின்ற அதிகாரிகளுக்கு ஏற்படுகின்ற அசௌகரியங்கள் காரணமாக, அவர்களுடைய சேவையைப் பெறுவதில் பாரிய பிரச்சினைகள் இருக்கின்றன.

குறிப்பாகச் சொல்வதென்றால், திருமதி சகிலா பானு அசரக் என்பவர் 1997 மார்ச் மாதம் 19ஆந் திகதி அன்று வடக்கு மாகாணத்தில் விவசாயப் போதனாசிரியராக நியமனம் பெற்று, தற்போது மன்னார் மாவட்டத்துக்கான பதில் விவசாயப் பணிப்பாளராகக் கடமையாற்றி வருகிறார். இவர் கிழக்குப் பல்கலைக்கழகத்தின் விவசாய விஞ்ஞானப் பட்டதாரி என்பதோடு, சூழல் விஞ்ஞானம் மற்றும் அபிவிருத்திக் கற்கை என்பனவற்றில் முறையே இரண்டு முதுமாணிப் பட்டங்களையும் பெற்றுள்ளார். விவசாய விஞ்ஞானத்தில் கலாநிதிக் கற்கைவரை எட்டியுள்ள இவர், வட மாகாண விவசாயத் திணைக்களத்தின் கீழ் வவுனியா மாவட்டத்திற்கான பிரதி மாகாண விவசாயப் பணிப்பாளராகக் கடமை புரிந்துவந்த நிலையில், இவர்மீது எவ்வித அடிப்படைகளுமற்ற பல்வேறு குற்றச்சாட்டுகளைச் சுமத்தி, மத்திய விவசாயத் திணைக்களத்தின் கீழ் இயங்கும் இலங்கை விவசாயக் கல்லூரிக்கு உடனடியாக இடமாற்றம் செய்யப்பட்டார். பின்னர், 2020ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் மன்னார் மாவட்டத்துக்கான பதில் விவசாயப் பணிப்பாளராக நியமிக்கப்பட்டுள்ளார்.

மாகாணம் மற்றும் தேசிய அளவில் விவசாய அபிவிருத்திக்கான பல ஆராய்ச்சிகளை மேற்கொண்டு கட்டுரைகளை வெளியிட்டுள்ள இவர், மும்மொழி ஆளுமை போன்ற பல திறமைகளையும் கொண்ட ஓர் அதிகாரியாவார். இவரின் சேவையைப் பாராட்டி, மத்திய விவசாயத் திணைக்களத்தினால் 'சிறந்த விவசாயவியலாளர்' பட்டத்துடன் தங்கப் பதக்கமும் வழங்கிக் கௌரவிக்கப்பட்டார். இந்த நிலையில் -

1. பொருத்தமான அடிப்படைக் காரணங்கள் இல்லாமலும் பொதுச் சேவை ஆணைக்குழுவின் ஒப்புதலைப் பெறாமலும் தாபனவிதிக் கோவைக்கு முரணான வகையில் வட மாகாண விவசாயத் திணைக்களத்திலிருந்து மத்திய விவசாயத் திணைக்களத்திற்கு இவர் இடமாற்றம் செய்யப்பட்டது சரியான நடைமுறையா?

2. கடந்த ஆறு வருடங்களுக்கு முன்பாக, 2020ஆம் ஆண்டு எவ்விதமான அடிப்படைகளுமற்ற பல்வேறுவிதமான குற்றச்சாட்டுகளைக் குறிப்பிட்டு, வட மாகாண நிர்வாகத்தினால் பொதுச் சேவை ஆணைக் குழுவுக்குச் சமர்ப்பிக்கப்பட்ட குற்றப் பத்திரமொன்று தொடர்பான விசாரணை இதுவரை நிறைவு செய்யப்படவில்லை என்பதை அறிவீர்களா? விசாரணை முடிவுறுத்தப்படாததற்கான காரணம் என்ன?

3. பொது நிர்வாகச் சுற்றறிக்கை இலக்கம் 30/2019இன் பிரகாரம் இவ்வாறான ஒழுக்காற்று விசாரணைகள் ஆறு மாத காலத்திற்குள் நிறைவுறுத்தப்பட வேண்டும் என்பதை அறிவீர்களா? ஏன், அந்தச் சுற்றறிக்கையின் பிரகாரம் இந்த விடயம் நடைமுறைப்படுத்தப்படவில்லை?

4. இந்த விடயங்கள் தொடர்பான ஆரம்பப் புலன்விசாரணைகளின் பிரகாரம் திருமதி சகிலா பானு அசரக் உட்பட நான்கு உத்தியோகத்தர்கள் குற்றவாளிகளாக இனங்காணப்பட்டாலும், திருமதி சகிலா பானு அசரக் அவர்களுக்கு மட்டும் குற்றப்பத்திரம் சமர்ப்பிக்கப்பட்டமை தனிப்பட்ட ஒரு பழிவாங்கல் என்பதை அறிவீர்களா? ஏன், குற்றவாளிகளாகக் காணப்பட்ட ஏனைய உத்தியோகத்தர்களுக்கு எதிராகக் குற்றப்பத்திரம் சமர்ப்பிக்கப்படவில்லை?

5. வட மாகாண கௌரவ ஆளுநர் அவர்களாலும் விவசாய அமைச்சின் செயலாளர் அவர்களாலும் இக்குற்றப்பத்திரமும், திருமதி சகிலா பானு அசரக் அவர்களால் வழங்கப்பட்ட விளக்கங்களும் ஆராயப்பட்டதன் பின்பு, அவை எவ்விதமான அடிப்படைகளுமற்ற குற்றச்சாட்டுகள் எனக்கூறி, கௌரவ வட மாகாண ஆளுநரால் அனைத்துக் குற்றச்சாட்டுகளும் மீளப்பெறப்பட்டமையையும், இவருக்கு எதிரான அனைத்துக் குற்றச்சாட்டுக்களும் அடிப்படையற்றவை எனக் கூறி, இது தொடர்பான விசாரணையை நிறைவுசெய்து, அதனை மேற் கொண்டு செல்லத்தேவையில்லை எனப் பொதுச் சேவை ஆணைக்குழுவுக்கு அமைச்சின் செயலாளர் அவர்கள் பரிந்துரை செய்திருந்தும் இவ்விசாரணை நிறைவு செய்யப்படவில்லை என்பதையும் அறிவீர்களா? அதற்கான காரணம் என்ன?

6. மனித உரிமைகள் ஆணைக்குழுவும் மேற்படி கருத்தை முன்வைத்து அறிக்கை சமர்ப்பித்துள்ளதுடன், இவ்வுத்தியோகத்தருக்கு வழங்கப்பட்ட இடமாற் றத்தினை இரத்துச்செய்து அவருக்குரிய பாதுகாப்பான சூழலை வழங்குமாறு அறிவுறுத் தியிருந்தும் இதுவரை எவ்வித நடவடிக்கையும் எடுக்கப்படவில்லை என்பதை அறிவீர்களா? நான்கு மாதங்களாகியும் ஏன் மனித உரிமை ஆணைக்குழுவின் அறிவுறுத்தலின் பிரகாரம் நடவடிக்கை எடுக்கப்படவில்லை?

7. மேலும் மனித உரிமைகள் ஆணைக்குழு மேற்படி அறிக்கையில், வட மாகாண முன்னாள் மாகாண விவசாய பணிப்பாளர் மற்றும் முன்னாள் பிரதம செயலாளர் ஆகியோருக்கு எதிராக ஒழுக்காற்று விசாரணையை ஆரம்பிக்குமாறு வட மாகாண ஆளுநர் அவர்களுக்கு அறிவுறுத்தியிருந்தும் இதுவரை எவ்வித நடவடிக்கைகளும் எடுக்கப்படாமை பற்றியும் அறிவீர்களா? அதன் விளக்கத்தையும் தரவும்.

மேற்கூறிய விடயங்களைக் கருத்திற்கொண்டு, மக்களுக்குப் பாரிய சேவைகளை வழங்கும் அரச அதிகாரிகளுக்கு எதிராக எதிர்காலங்களில் இவ்வாறான செயற்பாடுகள் ஏற்படாமல் பாதுகாக்கக்கூடிய பொறி முறையை ஏற்படுத்த என்ன நடவடிக்கை மேற்கொள்ளப் பட்டுள்ளது என்பதனை இச்சபைக்கு விளக்குவீர்களா?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ශකිලා බානු අසරක් මහත්මිය ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට අයත් නිලධාරිනියක වේ. එම සේවයට අයත් නිලධාරීන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය වශයෙන් රාජකාරියේ යොදවන අතර, පළාත් සභාවල අවශ්‍යතාව මත එම පළාත් සේවයේ පවත්නා තනතුරුවල රාජකාරි සඳහා මධ්‍යම රජයෙන් මුදා හරිනු ලබයි. එසේ උතුරු පළාත් සභාවේ නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා ශකිලා බානු මහත්මිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිදහස් කර තිබූ අතර, පසුව යම් විනය කරුණක් මත එම පළාත් සේවයෙන් ශකිලා බානු

[ගරු නාමල් කරුණාරත්න මහතා]

මහත්මිය 2020.03.04වන දින සිට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීමට පළාත් සේවයෙන් මුදා හැර ඇත. මෙය විනය ක්‍රියාමාර්ගයට අදාළ කාර්යයකි.

2. මෙම නිලධාරිනිය සිදු කළ යම් විෂමාචාරයකට අදාළව මූලික විමර්ශනයක් පවත්වා මේ වන විට විධිමත් විනය පරීක්ෂණයක්, අදාළ විනය බලධරයා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙතෙක් එම පරීක්ෂණය අවසන් වී නොමැත. පරීක්ෂණය අවසානයේ ලබා දෙන තීරණය අනුව පමණක් අදාළ චෝදනා පදනම් විරහිතද යන්න දැක්වීම කළ යුතු වේ. එබැවින් මේ අවස්ථාවේදී එය සඳහන් කිරීමට හැකියාවක් නොමැත.

3. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2019 හි 22.11හි විධාන අනුව විධිමත් විනය පරීක්ෂණයක් මාස 6ක් ඇතුළත නිම කළ යුතු බවත්, අමතර කාලයක් අවශ්‍ය නම් පරීක්ෂණ නිලධාරින් විසින් ප්‍රමාණවත්, පිළිගත හැකි හේතු ඉදිරිපත් කරමින් විනය බලධාරියා වෙතින් අනුමැතිය ලබා ගත හැකි බවත් දන්වා ඇත.

4. නැත.

ශකිලා බානු අසරක් මහත්මිය ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට අයත් බැවින් එම නිලධාරිනියට අදාළ විනය කරුණු එම සේවයේ පරිපාලන බලධාරියා වන කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත උතුරු පළාත් ප්‍රධාන ලේකම් විසින් යොමු කර ඇත. මෙම ක්‍රියාමාර්ග ගැනීම රාජ්‍ය සේවයේ නිලධාරින්ගේ විනය පවත්වා ගෙන යාමට අදාළව ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල වන අතර, පෞද්ගලික පළිගැනීමක් සේ සැලකීමක් ලෙස ගත නොහැක.

5. ශකිලා බානු අසරක් මහත්මිය අයත් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විනය බලධරයා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වන අතර, විනය කරුණුවලට අදාළ මූලික විමර්ශන වාර්තාවක සඳහන් කරුණු සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීමට පමණක් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයාට අවස්ථාව පවතී. එසේ වුවත්, නිලධාරියාට එරෙහිව විනයානුකූලව ක්‍රියා කිරීමට තරම් ප්‍රමාණවත් චෝදනා බැලූ බැල්මට හෙළිදරව් වන්නේ නම් චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට විනය බලධරයා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලතල පවතී. ඒ අනුව පවත්වන විධිමත් විනය පරීක්ෂණයේදී නිලධාරියාගේ නිර්දෝෂීභාවය පිළිබඳ කරුණු ඉදිරිපත් කර නිදොස් බව සනාථ කර ගැනීමට අවස්ථාව පවතී. මේ වන විට විධිමත් විනය පරීක්ෂණය අවසන් වී නොමැත.

6. මානව හිමිකම් කොමිෂන් සභාවේ 2026.03.20 දිනැති තීරණයේ සඳහන් නිර්දේශ අනුව මීට වසර 6කට පූර්වයෙන් උතුරු පළාත් සේවයෙන් ඒ මහත්මිය දරමින් සිටි III/II ශ්‍රේණියේ තනතුරට නැවත මුදා හැරිය යුතුව ඇත. මෙම නිලධාරිනියගේ ඉල්ලීමද සලකා මේ වන විට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I වන ශ්‍රේණියේ තනතුරක් වන මන්නාරම දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරක රාජකාරි ආවරණය කරන බැවින් පූර්වයෙන් දරමින් සිටි තනතුරට නැවත මුදා හැරීමට නිලධාරිනියගේ එකඟතාව ලබා ගෙන දන්වන ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ **ජනරාල්** වෙත දන්වා ඇත. නිලධාරිනියගේ එකඟතාව ලද පසු උතුරු පළාත් ප්‍රධාන ලේකම් වෙත දැනුම් දීමක් කළ හැක.

7. 2026.03.20වන දිනැති මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ උතුරු පළාත් ආණ්ඩුකාරවරයා වෙතද යොමු කර ඇත. ඒ අනුව පළාත් රාජ්‍ය සේවයට අදාළ කරුණක් බැවින් ඉදිරි ක්‍රියාමාර්ග එම පළාත් සභාව විසින් ගනු ඇත.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමාට යම් පැහැදිලි කර ගැනීමක් කර ගත හැකියි.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! இந்த அதிகாரியைப் பொறுத்தவரையில், இந்த அறிக்கையின்படி அவர் இடமாற்றம் செய்யப்பட்டு ஆறு வருடங்களின் பின் மீண்டும் பழைய பதவி நிலைக்கே அனுப்புவதென்பது, அவருடைய promotion போன்ற விடயங்கள் அனைத்தையும் பாதிக்கும். அதுமட்டுமன்றி, இது தொடர்பான ஒழுக்காற்று விசாரணைகள் 6 மாதத்துக்குள் மேற்கொள்ளப்பட்டிருக்க வேண்டும். ஆனால், 6 வருடங்களாக அது இழுத்தடிக்கப்பட்டுள்ளது. இந்த அதிகாரி தொடர்பான விடயத்தில் இனவாதமும் பெண் என்ற பாலின வேறுபாடும் காட்டப்பட்டுள்ளதாக மனித உரிமைகள் ஆணைக்குழுவின் அறிக்கையில் குறிக்கப்பட்டுள்ளது. உண்மையில் அங்கு அதுதான் நடந்துள்ளது

வட மாகாணத்திற்கு கிட்டத்தட்ட 22 அதிகாரிகள் தேவைப்படுகின்றார்கள்; அங்கிருப்பது 7 பேர்தான். அவ்வாறு 7 பேர் பணிபுரிகின்ற நிலைமையிலும் இவ்வாறான ஒரு பழிவாங்கும் நடவடிக்கைகள் இடம்பெற்றால் எப்படி? மனித உரிமைகள் ஆணைக்குழு அறிக்கை பற்றித்தான் நான் இந்த இடத்தில் பேசுகின்றேன். அந்தப் பெண் அதிகாரியின் விடயத்தில் இனவாதமும் பெண் என்ற பாலின வேறுபாடும் காட்டப்பட்டிருப்பதாக அவர்கள் தெளிவாகச் சொல்லியிருக் கின்றார்கள். எனவே, கௌரவ அமைச்சர் அவர்களே, இது தொடர்பாக நீங்கள் அவசரமாகத் தலையிட வேண்டும். மனித உரிமை ஆணைக்குழு சுயாதீன ஆணைக்குழுவாக இருந்தாலும் அதன் அறிக்கையின்படி விசாரணையை விரைவுபடுத்த நடவடிக்கை எடுக்க வேண்டும். நாங்கள் தவறுசெய்த நபர் ஒருவரை விடுதலை செய்யச் சொல்லவில்லை. ஆனால், இவ்வாறு 6 வருடங்களாக விசாரணைகள் மேற்கொள்ளப் படாமல் இருந்தால் இதனுடைய நிலைமை என்ன? அவருடைய சுயாதீனம் என்ன? இவ்வாறான நிலைமைகளால் அரச அதிகாரிகள் பாதிக்கப்படுகின்றார்கள். உங்களுடைய அமைச்சுக்கீழ் உள்ள ஓர் அதிகாரிக்கு இவ்வாறு நடைபெறும்போது, கடந்த 6 வருடங்களாக என்ன நடந்துள்ளது என்பதை ஆராய்ந்து பார்த்து, அரச அதிகாரிகளை இவ்வாறான பாதிப்புகளிலிருந்து பாதுகாப்பதற்கான பொறிமுறை ஒன்றைக் கையாளுமாறு கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කාරණයට අදාළ ශකිලා මහත්මිය අපි පෞද්ගලික මට්ටමින් දන්නවා, රාජකාරි කටයුතුවලදීත් අපට හමු වෙනවා. ඇත්තටම මේ සිද්ධිය පරණ සිද්ධියක්. නමුත්, අපි ආණ්ඩුව පිහිටුවූ දා සිට අපි එක්ක එතුමිය වැඩ කරනවා. ඒ වැඩ කළ කාලසීමාව තුළ එතුමියගේ දෝෂයක්, වරදක් අපි දකින්නේ නැහැ. එතුමිය හොඳින් වැඩ කරගෙන යනවා, රාජකාරි කටයුතු කරනවා. ඒ සහතිකය අපට දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ අනුව අපට එතුමියගේ රාජකාරි කටයුතු සම්බන්ධයෙන් ගැටලුවක් මතු වෙලා නැහැ. නමුත්, මේ සිදුවීම ගත්තොත්, ඒක අතීතයට අදාළ

කාරණාවක්. ඊට අදාළ පරීක්ෂණ කටයුතු ඉවර වුණාට පස්සේ තමයි අපට අදහසක් කියන්න වෙන්නේ. මේක ටිකක් පරණ කාරණයක් නිසා ඉතා කඩිනමින් ඊට අදාළ නිර්දේශ නිකුත් කිරීම සඳහා අමාත්‍යාංශය විධියට අපි මැදිහත්වීමක් කරන්න සූදානම් කියන එක මේ වෙලාවේදී මතක් කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

## II

## සංචාරක කර්මාන්තයේ කාර්ය සාධනය සහ සංවර්ධනය
### சுற்றுலாக் கைத்தொழிலின் அபிவிருத்தியும் செயலாற்றுகையும்
### PERFORMANCE AND DEVELOPMENT OF TOURISM INDUSTRY

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Presiding Member, I would like pose the following Question under Standing Order No. 27(2) to the Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism.

Tourism performance is frequently measured by the arrivals, although earnings estimates depend on assumptions about the average stay and the daily expenditure. Parliament also lacks an accessible district-level account of tourism investment, hotel turnover, Tourism Development Levy compliance, and whether public spending in the Northern and the Eastern Provinces benefits local enterprises. Therefore, as a matter of urgent public importance, I ask the following Question from the Hon. Minister. I am glad that our Friend from the Eastern Province is responding to my Question.

(1) For each year from 2018 to 2026, will the Government inform the tourist arrivals, the average duration of stay, the average daily expenditure and the estimated tourism earnings, identifying all revisions made and the evidence used to arrive at that?

Hon. Minister, that is in terms of the entire country's tourism arrivals since 2018. And, we would explicitly like to know the evidence that had been used to arrive at that figure. You have estimated that each tourist spends around US Dollars 148. But, I feel that each tourist does not spend US Dollars 148 while being in the country. That is my assessment.

(2) For each year from 2018 to 2026, will the Hon. Minister provide a district-wise breakdown of tourism development expenditure in the Northern and Eastern Provinces, stating the amounts budgeted and actually spent, the projects and the implementing agencies and how much was spent on archaeological sites compared to facilities directly benefiting local tourism businesses?

கௌரவ அமைச்சர் அவர்களே! நான் இந்த விடயம் சம்பந்தமாகக் கேள்வி எழுப்புவதற்கான காரணம், Department of Archaeology ஊடாக, tourismஐ development பண்ணுவதற்குச் சில பிரதேசங்களுக்கு நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கிறது. இன்று காலையில்கூட அந்தத் திணைக்களத்தினால் திருகோணமலை, கன்னியா பகுதியில் ஏற்படுத்தப்பட்ட ஒரு பிரச்சினை பற்றி அறிந்திருப்பீர்கள். உண்மையில், வடக்கு, கிழக்குப் பிரதேசங்களில் tourismஐ development பண்ணுவதற்கு, போக்குவரத்துத் துறையை அல்லது tourism zoneஐ மேம்படுத்தும் விடங்களுக்கான நிதி ஒதுக்கீடு என்பது, என்னைப் பொறுத்தளவில் - உங்களுடைய ஆட்சிக் காலத்தில் அல்ல - கடந்த ஆட்சிக் காலத்தில், அதாவது 2018இல் இருந்து போதியளவு மேற்கொள்ளப்படவில்லை என்பதுதான் என்னுடைய நிலைப்பாடு.

(3) In each district, how many hotels and tourist accommodation establishments are operating; how many are registered or licensed by the Sri Lanka Tourism Development Authority and how many submitted returns and paid the Tourism Development Levy in each year from 2018 to 2026?

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මා මේ ප්‍රශ්නය විශේෂයෙන්ම අහන්නේ මේ නිසායි. පාසිකුඩාවල තිබෙනවා hotels 17ක්. මම උදාහරණයක් හැටියට ඒ hotels 17 ගැන කියන්නම්. ඔවුන් Sri Lanka Tourism Development Authority එකට 1 per cent ගෙවනවා ඇති. නමුත් මම හිතන හැටියට ප්‍රාදේශීය සභා පනත අනුව ප්‍රාදේශීය සභාවට ගෙවන්න ඕනෑ සියයට 1 මේ වෙනකල් ගෙවලා නැහැ; රුපියලක්වත් ගෙවලා නැහැ. ප්‍රාදේශීය සභාවෙන් අපි ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයට ලියුමක් එවා තිබෙනවා, ඒ

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ලේඛන දෙන්න කියලා. නමුත් එක ලේඛනයක්වත් දීලා නැහැ. ඒ නිසා ඒ ගැන වහාම පරීක්ෂණයක් කරන්න, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. මඩකලපුවේ, පාසිකුඩාවල ඉන්නවා, Sri Lanka Tourism Development Authority එකේ මාහිර් කියලා මහත්මයෙක්. එතුමා අවුරුදු 12ක් ඒ දිස්ත්‍රික්කයේ වැඩ කරනවා. එතුමා කිසිම සහයෝගයක් දෙන්නේ නැහැ අපට. මම හිතන විධියට, එතුමා Sri Lanka Tourism Development Authority එකට - රජයට - නොවෙයි වැඩ කරන්නේ. එතුමා පාසිකුඩාවල ඒ hotelsවලට වැඩ කරන්නේ. මොකද, අපට ලැබී තිබෙන සංඛ්‍යාලේඛන අනුව පාසිකුඩාවල තිබෙන සමහර තරු පහේ හෝටල්වල මාසික ආදායම රුපියල් ලක්ෂයයි, ඒගොල්ලන් දීලා තිබෙන වාර්තා අනුව. ඉතින් අපි රජයට අහිමි වන ඒ මුදල් ටික ලබා ගන්න ඕනෑ. රජය කියන්නේ මධ්‍යම රජය විතරක් නොවෙයි. ප්‍රාදේශීය සභාවත් රජයේ කොටසක්. ඒ නිසා ඒ මුදල් ටික ලබා ගන්න. ඒක තමයි තුන්වැනි ප්‍රශ්නය.

(4) Will the Government inform for each establishment, its room capacity, the annual turnover, the applicable levy rate, the levy amount due, the amount paid, the outstanding arrear, and numbers of Sri Lankan and foreign employees?

I think the question should be on the number of local employees and employees from other districts rather than foreign employees. If you look at a country like the Maldives, there is a certain percentage of Maldivians that should work in a hotel. In our case also, Hon. Deputy Minister, we should adopt a procedure that star-class hotels employ locals from that area as opposed to employing people from outside the area. At present, star-class hotels employ locals from areas mainly for gardening, cleaning and for other odd jobs. You have to train them at some point to upskill them and bring them up to the required standard.

(5) Before establishing new tourism zones or allocating further State land for hotel development, will the Government introduce enforceable requirements on local employment, local procurement and community benefits and publish annual district-level information on compliance?

ඉතා ඉවසීමෙන් මගේ ප්‍රශ්නය අහගෙන හිටපු නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතියි. නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේ ප්‍රශ්නයේ අවසන් කොටස මේකයි. ඔබතුමා දන්නවා, පාසිකුඩාවල මේ කියන hotels ටික ගැන. 2010න් පස්සේ ප්‍රධාන පෙළේ ලොකු ව්‍යාපාරිකයන්ට hotels 17ක් හදාගන්න දුන්නා. කිසිම වියදමක් නැතුව ඉඩම ලබාගෙන, කෝටි ගණනක ඉඩම ලබාගෙන, හෝටල් හදාගෙන තිබෙනවා. දැන් බදු ගෙවන්නේත් නැහැ. සමහර හෝටල් ගෙවනවා. ඉතින් ඒගොල්ලන් ඉදිරි අනාගතයේදීත් එහෙමද කරන්නේ?

මම හිතන විධියට නැඟෙනහිර පළාතේ ඉඩම් හඳුනා ගන්න ජනාධිපතිතුමා කමිටුවක් පත්කරලා තිබෙනවා. එතකොට ඒවා හෝටල්වලට දෙනවා නම්, ඒ සඳහා මොනවා හරි ක්‍රමයක් තිබෙනවාද කියන එක තමයි මම මේ ප්‍රශ්නය තුළින් දැන ගන්න බලාපොරොත්තු වෙන්නේ.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

Hon. Presiding Member, I ask for two weeks' time to answer this set of questions.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත
### இலங்கை ஊடக உயர்தொழிலர்களின் பட்டயம்பெற்ற நிறுவகம் சட்டமூலம்
### CHARTERED INSTITUTE OF MEDIA PROFESSIONALS OF SRI LANKA BILL

"මාධ්‍ය වෘත්තිකයන් සඳහා වෘත්තීමය ප්‍රමිති හඳුන්වා දීමේ සහ පවත්වාගෙන යාමේ අරමුණින් ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසිනි.***

***2026 අගෝස්තු 05වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*சுகாதார அமைச்சர் மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 ஓகஸ்ட் 05, புதன்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் சுகாதாரம், வெகுசன ஊடகம் மற்றும் மகளிர் வலுவூட்டல் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. (Dr.) Nalinda Jayatissa, Minister of Health and Mass Media; to be read a Second time upon Wednesday, 05th August, 2026 and to be printed;*

*and to be referred to the Sectoral Oversight Committee on Health, Media and Women's Empowerment.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඇත්තටම මාධ්‍ය වෘත්තිකයන් සහ මාධ්‍යවේදීන් වෙනුවෙන් ඉතා වැදගත් අවස්ථාවක්. මේ පාර්ලිමේන්තුවත්, ජනමාධ්‍ය අමාත්‍යාංශයත් වසර ගණනාවක් තිස්සේ උත්සාහ කරලා, මේ ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත අද දිනයේ ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව අපි ඉතාම සතුටු වෙනවා.

## ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
## பெண்களையும், இளம் ஆட்களையும் மற்றும் பிள்ளைகளையும் தொழிலுக்கமர்த்துதல் (திருத்தம்) சட்டமூலம்
## EMPLOYMENT OF WOMEN, YOUNG PERSONS AND CHILDREN (AMENDMENT) BILL

"1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා විසිනි.***

***2026 අගෝස්තු 05වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 ஓகஸ்ட் 05, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கல்வி, ஊழியப் படை மற்றும் மனித மூலதனம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. (Dr.) Anil Jayantha, Minister of Labour and Deputy Minister of Finance and Planning; to be read a Second time upon Wednesday, 05th August, 2026 and to be printed;*

*and to be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ස - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පළමුවැනි ප්‍රශ්නය, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් මා මෙම ප්‍රශ්නය අහනවා.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ විදුහල්පතිවරුන් හා ගුරුවරුන් පිරිසක් මේ වන විට වෘත්තීය ගැටලු කිහිපයකට මුහුණ දීම හේතුවෙන් දැඩි මානසික ව්‍යාකූලතාවකටත්, වෘත්තීමය අපහසුතාවකටත් මුහුණ දී තිබේ.

1. ශ්‍රී ලංකා ගුරු සේවයෙන් විදුහල්පති සේවයට පැමිණීම උසස්වීමක් ලෙස පිළිගෙන තිබුණද, 2026.06.08 දිනැති 03/2014(i) චක්‍රලේඛය මඟින් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව එය පත් කිරීමක් ලෙස සංශෝධනය කිරීම හේතුවෙන් විදුහල්පතිවරුන්ගේ ආරම්භක වැටුපට සහ වෘත්තීය ගෞරවයට අගතියක් සිදුව ඇති බව ඔබ පිළිගන්නේ ද? මීට අදාළව ඔවුන්ට සාධාරණයක් ඉටු කිරීමට රජය අපේක්ෂා කරන්නේ ද?

   මෙම චක්‍රලේඛය අධ්‍යාපනඥ සේවයටත්, ඒ වාගේම අධ්‍යාපන පරිපාලන සේවයටත් බලපාන ලෙස තිබුණු චක්‍රලේඛයක්. එයින් විදුහල්පතිවරුන් ඉවත් කිරීම කරලා තිබෙනවා කියන එකත් මම මේ වෙලාවේ සඳහන් කරන්න ඕනෑ. එය අසාධාරණයක් හැටියටත් දකිනවා. ඉහත සඳහන් කරපු සේවාවල අයටත් අවදානමකට පත්වීමේ ඉඩ හැකියාව මේ පූර්වාදර්ශය තුළ තිබෙනවා කියන එකත් සඳහන් කරන්න ඕනෑ.

2. 2015දී නිකුත් කළ වැටුප් පරිවර්තන චක්‍රලේඛය අනුව ගෙවූ වැටුප් වර්ධක සියල්ල වාරික 60කින් අයකර ගැනීමට පියවර ගන්නේ ද? නැතහොත් එම වගන්තිය අවලංගු කරන්නේ ද?

   මොකද, එම චක්‍රලේඛයේ අන්තිම වගන්තියේ තිබෙනවා වාරිකවලින් එය ඉවත් කර ගන්න ඕනෑ කියලා. වැටුප් සකස් කරනකොට වැරැදීමක් වෙලා තිබුණොත් අදාළ කෙනාගෙන් එය අය කර ගන්නවා කියලා එහි අවසානයේ සඳහන්ව තිබෙනවා. නමුත්, මෙය වැරැදීමක් නොවෙයි. කලින් රජයෙන් ගෙන ආපු චක්‍රලේඛයක් අනුව සකස් කරපු වැටුපක්, නව රජයෙන් ගෙන ආපු චක්‍රලේඛයක් මත වෙනස්වීමක් තිබෙන්නේ. එතකොට, සමහර අයට අද වන විට රුපියල් ලක්ෂ දෙකකට අධික මුදලක් ගෙවන්නට සිද්ධ වෙලා තිබෙනවා.

3. ශ්‍රී ලංකා ගුරු සේවයේ උසස්වීම්වලදී මොඩියුල ක්‍රමවේදය වෙනුවට කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් පැවැත්වීම මඟින් මොඩියුල ක්‍රමවේදය අනුගමනය කළ පිරිසක් අසාධාරණයට ලක්වන බව පිළිගන්නේ ද?

4. එකම දින පත්වීම් ලැබූ පිරිසක් මොඩියුල මඟින් උසස්වීම් ලබා ඇති පසුබිමක පරිපාලනමය දුර්වලතා හේතුවෙන් ඇතැම් පිරිසකට මොඩියුල ක්‍රමවේදය සම්පූර්ණ කර ගැනීමට නොහැකිවීම මත උසස්වීම් සඳහා විභාගයකට මුහුණදීමට සිදුවීම වෙනස්කොට සැලකීමක් නොවේද?

5. එබැවින් ශ්‍රේණි උසස් කිරීමේදී පරිපාලන දුර්වලතා මත මොඩියුල ක්‍රමවේදය ප්‍රමාද වී තිබෙන ගුරුභවතුන්ට එම ක්‍රමවේදය ඔස්සේම ශ්‍රේණි උසස්වීමට අවස්ථාව ලබා දීමට පියවර ගන්නේ ද? නොඑසේ නම් ඒ මන්ද?

   මොකද, මේවායේ සහතික තව වෙනතුරු ලැබිලා නැහැ. ඔබතුමා ඒක දන්නවා. ඒ නිසා වැටුප් වර්ධක සහ උසස්වීම් සම්බන්ධයෙන් ඒ අයට ගැටලු ඇති වෙලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය විසින් සභාව කල් තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්නවලට ගරු අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පිළිතුරු ලබා දෙනවා.

1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 05/2017 ඇමුණුම 01 මඟින් දක්වා තිබෙනවා. එහි තිබෙන්නේ රාජ්‍ය සේවයේ එක් සේවාවක හෝ තනතුරක සිට රාජ්‍ය සේවයේ වෙනත් සේවාවකට හෝ තනතුරකට පත් වූ නිලධරයන්ගේ වැටුප් සැකසීම සම්බන්ධයෙන්. ඒ අනුව රාජ්‍ය සේවයේ එක් සේවාවක හෝ තනතුරක සිට රාජ්‍ය සේවයේ වෙනත් සේවාවකට හෝ තනතුරකට පත් වූ නිලධරයන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ 7 පරිච්ඡේදයේ 5 වගන්තිය අනුව සකස් කළ යුතු බව දැක්වුවද, එහි කිසිදු ස්ථානයක එය උසස්වීමක් ලෙස සැලකිය යුතු බව දක්වා නැත. එසේම අමාත්‍ය මණ්ඩල තීරණයක් මත අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 03/2014/ හි 01 වගන්තිය සංශෝධනය කරමින්, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින්ගේ ආරම්භක වැටුප සංශෝධනය කර ඇත. එම චක්‍රලේඛය ඇමුණුම 02 මඟින් දක්වා තිබෙනවා.

   එම චක්‍රලේඛය නිකුත් කරනු ලැබුවේ ඉහත සඳහන් ප්‍රතිපාදන මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින්ගේ ආරම්භක වැටුප සංශෝධනය කිරීමටයි. ඒ අනුව අදාළ වගන්ති මඟින් චක්‍රලේඛය සංශෝධනය කිරීමේ අරමුණ ඉටුව ඇති අතර, එමඟින් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින්ට අගතියක් හෝ අසාධාරණයක් සිදුව ඇති බවක් නිරීක්ෂණය නොවේ.

   මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පත්කිරීම සම්බන්ධයෙන් විදුහල්පති සේවා ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් වෙලා තිබෙනවා.

2. එවැනි වැටුප් පරිවර්තන චක්‍රලේඛයක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර නොමැත. එසේ වුවද, අංක ED/2/29/2/2/5(ii) හා 2015.01.19 දිනැතිව ලිපියක් නිකුත් වෙලා තිබෙනවා. ඒ, ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්. එය ඇමුණුම 03 මඟින් දක්වා තිබෙනවා.

   එමඟින් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින්ගේ ආරම්භක වැටුප ආයතන සංග්‍රහයේ 7 පරිච්ඡේදයේ 5 වගන්තිය ප්‍රකාරව සංශෝධනය කරන ලෙස එවකට අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවය කරන ලද අතිරේක ලේකම්වරයෙකු උපදෙස් ලබා දී තිබුණද, එයින් අමාත්‍ය මණ්ඩල තීරණයක් මඟින් නිකුත් කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 03/2014 හි අංක 1 වගන්තිය උල්ලංඝනය කිරීමක් සිදුකර ඇති බැවින් අදාළ උපදෙස් ක්‍රියාත්මක කළ නොහැකි බව නිරීක්ෂණය වූ අතර, එය ගරු අමාත්‍ය මණ්ඩලයට දැන්වීමෙන් පසු එම ලිපිය ආශ්‍රයෙන් ගෙවා ඇති මුදල් නිලධාරියා විශ්‍රාම යාමට පෙර සමාන වාරික 60කින් හෝ ඔවුන් එම වාරික 60 අවසන් වන දිනට පෙර විශ්‍රාම ගන්නේ නම් සමාන වාරික ලෙස විශ්‍රාම ගැනීමට පෙර අයකර ගන්නා ලෙස දන්වා ඇත. එය ඇමුණුම 04 ලෙස දක්වා ඇත.

   මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමුණුම 01, 02, 03 සහ 04 මම **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

   අමාත්‍ය මණ්ඩල තීරණයකට පටහැනිව ගෙවා ඇති එම මුදල් අය කරගත යුතුව ඇත.

3. එතුමිය මේ ප්‍රශ්නය අහන්නේ මොඩියුල සම්බන්ධයෙන්. ප්‍රශ්න අංක 4ට ලබා දෙන පිළිතුර යටතේ මේ සඳහාත් පිළිතුර තිබෙනවා.

4. අංක 1885/38 හා 2014.10.23 දිනැති නව ගුරු සේවා ව්‍යවස්ථාවේ 15(අ) වගන්තිය අනුව අන්තර්කාලීන විධිවිධාන යටතේ ගුරු සේවයේ නිලධරයන්හට වෘත්තිය සමාලෝචනය සහ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවෙන් නිදහස් කර උසස්වීම් ලබා දීමට කටයුතු කරන ලද අතර, - මෙතැනදී නිදහස් කිරීමක් සිද්ධ වනවා - එම අන්තර්කාලීන විධිවිධාන දීර්ඝ කිරීම සඳහා අවස්ථා කිහිපයකදීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලද අතර, එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගුරුවරුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ මොඩියුල 20 වෙනුවට ලිඛිත විභාගයක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ද නියම කර ඇත. ඒ අනුව ගුරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කරමින් 2444/21 හා 2025.07.08 දිනැතිව හා අංක 2493/61 හා 2026.06.19 දිනැති සංශෝධිත ගුරු සේවා ව්‍යවස්ථා ප්‍රකාරව ගුරු සේවයේ නිලධරයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්බන්ධ විධිවිධාන සඳහන් කර ඇත. ඒ අනුව මොඩියුල ක්‍රමය හඳුන්වා දීම මත දිවයිනේ පිහිටි ගුරු මධ්‍යස්ථානවල එම මොඩියුල අධ්‍යයනයට අවස්ථාව සලසා තිබූ අතර ඇතැම් කාලවලදී මාර්ගගත ක්‍රමයටද - විශේෂයෙන් කොවිඩ් වසංගතය අවස්ථාවේදී - අධ්‍යයනයට ඉඩ සලසා තිබුණි. එම අවස්ථාවන්හිදී අදාළ මොඩියුල සම්පූර්ණ නොකළ ගුරුවරුන්ට පමණක් මෙම විභාගයට පෙනී සිටීමට සිදු වී ඇත.

   එමෙන්ම ගුරු සේවයේ නිලධරයන් අතුරින් මේ වන විට එකී මොඩියුල සියල්ල සම්පූර්ණ නොකළ, එහෙත් යම් ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇති ගුරුවරුන් සඳහා ද තවදුරටත් ඉතිරි මොඩියුල සම්පූර්ණ කිරීමට අවස්ථාව සලසා දෙන ලෙස කරන ලද ඉල්ලීම ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් දැනට නියමිත මොඩියුලවලින් සියයට 40ක ප්‍රමාණයක් සම්පූර්ණ කරන ලද ගුරුවරුන්ට තවදුරටත් මොඩියුල සම්පූර්ණ කිරීමට අවස්ථාව සලසා දීම සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් විමසා ඇත. ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ සම්බන්ධයෙන් තීරණයක් බලාපොරොත්තුව සිටිනවා. එකී උපදෙස් ලද පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත වේ.

   තවද, සංශෝධිත ගුරු සේවා ව්‍යවස්ථාව අනුව ගුරු සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය I හා II පැවැත්වීමට - I කියන්නේ 3-I සිට 2-II දක්වා, II කියන්නේ 2-II සිට 2-I දක්වා - අදාළව ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කර මේ වන විට අයදුම්පත් කැඳවීමට කටයුතු කර ඇති අතර, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය III සඳහා ඉදිරි මස තුළ අදාළ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

5. ගුරු සේවා ව්‍යවස්ථාවේ 15(අ) වගන්තියේ සඳහන් අන්තර්කාලීන විධිවිධාන 2025.06.30 දින දක්වා දීර්ඝ කර ඇති අතර, එමඟින් තමන් දැනට සිටින ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් මත උසස්වන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීමේ කොන්දේසියට යටත්ව මේ වන විටත් උසස්වීම් ලබා දීමට කටයුතු කර ඇත.

   මේ වෙද්දි උසස්වීම් ලබා දීමට කටයුතු කර තිබෙනවා. කොන්දේසිය වන්නේ, කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කරගැනීම, නැත්නම් සමත්වීම කියන එක.

බොහොම ස්තුතියි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පිළිතුර ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මට දැනගන්න ඕනෑ මෙයයි. දැන් ඔය මොඩියුල ප්‍රශ්නයේදී මොඩියුල සම්පූර්ණ කරපු අයටත් සහතිකය ලබා ගැනීම පරක්කු වෙලා තිබෙනවා. ඒගොල්ලන්ගේ යම් යම් වැටුප් වර්ධක ලබා ගැනීමේදී, ඒ වාගේම උසස්වීම්වලදී එහි බලපෑමක් ඇති වනවා. ඒකයි මම ඔබතුමාගෙන් ඉස්සෙල්ලා ඇහුවේ කඩිනමින් මේ සහතික ලබා දෙන්න මොකක් හෝ වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා. ඒ පිළිබඳව ඔබතුමා පැහැදිලි කරන්න. ඊට කලින් ප්‍රශ්නයේදී මම ඒකයි ඇහුවේ, මේ වැටුප් සකස් කිරීමේදී වැඩිපුර ගෙවලා තිබෙනවා නම්, ඒක ගෙවලා තිබෙන්නේ කලින් තිබුණු චක්‍රලේඛයකට අනුව නේ. ඒ චක්‍රලේඛය 03/2014 නේද? ඒ චක්‍රලේඛය මත තමයි කලින් වැටුප සකස් කළේ. නව වැටුප සකස් කිරීම සිද්ධ වනවා, දැන් ඔය කියන චක්‍රලේඛය අනුව. ඒ අනුව තමයි ඔය කියන කොන්දේසි ඇතුළේ වාරික 60කින් ගෙවන්න සිද්ධ වන්නේ. සමහර අයට ලක්ෂ 2ක් වාගේ මුදලක් ගෙවන්න වෙලා තිබෙනවා. ඒකයි මම ඔබතුමාට කිව්වේ, ඒක ඒ නිලධාරියාගේ වරදක් නොවෙයි කියලා. රාජ්‍ය සේවයේ ඉඳලා තමයි ඔබතුමාත්, මාත් ආවේ. ගණනය කිරීමේ වරදක් තිබෙනවා නම් අපි ගෙවන්න ඕනෑය කියලා එහි සඳහන් වනවා. හැබැයි චක්‍රලේඛයක් නිසා වුණු සිදුවීමක් නිසා ඒක ඒ අයගෙන් ආපහු අය කර ගැනීම සාධාරණද, එතැන ගැටලුවක් තිබෙනවා නේද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

අපි මේ පැහැදිලි කිරීම කෙටියෙන් ඉවර කරමු, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදි පැහැදිලිව සඳහන් කළා, වැටුප් පරිවර්තන චක්‍රලේඛයක් නිකුත් කර නොමැත කියලා. 2වෙනි ප්‍රශ්නයට අදාළවයි මා මේ කියන්නේ. එතැනදේ මම ඇමුණුම 03 සභාගත කරලා තිබෙනවා. ඇමුණුම 03හි තිබෙන්නේ ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ලිපියක්. ඒ අනුව මේක චක්‍රලේඛයක් නොවෙයි.

අනෙක් කාරණාව, මොඩියුල සම්බන්ධයෙන් අපි දීර්ඝව සාකච්ඡා කළා, විශේෂයෙන් ගුරු වෘත්තීය සමිති එක්ක. මූලිකව මොඩියුල අවසන් කර ගැනීම, විභාග ක්‍රමයකට ඇතුළත් කිරීම සහ අමතරව මොඩියුලවලින් සියයට 40ක් සම්පූර්ණ කරන ලද ගුරුවරුන්ට සහනයක් සැලසීම සම්බන්ධයෙන් කටයුතු කරන්න අපි ලැහැස්ති වෙලා ඉන්නවා. ඔබතුමිය සඳහන් කළ මොඩියුල සම්පූර්ණ කර ගත් සහ ඒ සම්බන්ධයෙන් අදාළ සහතික නොලද පිරිස සම්බන්ධව අපි කටයුතු කරමින් ඉන්නවා. අපි බලාපොරොත්තු වනවා, ලබන අවුරුද්ද වනකොට කාර්යක්ෂමතා කඩඉම ගුරුවරුන්ට බාධාවක් නොවන්න ඒ අදාළ කටයුතු සියල්ල කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ 2වන ප්‍රශ්නය, ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා.

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මා මෙම ප්‍රශ්නය අහන්නේ මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන්.

මෙරට බදු පරිපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම, බදු දැල පුළුල් කිරීම සහ බදු ගෙවීම් පිළිබඳව මහජනතාව දිරිගැන්වීමේ අරමුණින් රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. මෑත ඉතිහාසයේ මෙරට මුහුණ දුන් දරුණුතම ආර්ථික අර්බුදයෙන් රට මිදිලා මේ වනකොට ඒ ස්ථාවර ආර්ථික වර්ධනයත් එක්ක අනෙක් සියලු ආර්ථික දර්ශකවල කැපී පෙනෙන ප්‍රගතියක් අපි අත්පත් කරගෙන තිබෙනවා. රජයේ පැවැත්මට, පොදු මහජනතාවගේ සුබසාධන කටයුතුවලට සහ රටේ පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමට අපට ශක්තිමත් මූල්‍ය පදනමක් අවශ්‍යයි. ඒ ශක්තිමත් මූල්‍ය පදනම ස්ථාපිත කිරීමේදී ප්‍රධාන සාධකය වන්නේ රජයේ බදු ආදායමයි. රජයේ බදු ආදායම ස්ථාවරව වාගේම ශක්තිමත්ව වර්ධනය වන තත්ත්වයක අපි පවත්වා ගත යුතු වනවා. රටේ දිගු කාලීන ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීමට, රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමට සහ ආර්ථික මාර්ගය විධිමත් කිරීමට බදු ප්‍රතිපත්ති රැසක් රජය ක්‍රියාවට නංවා තිබෙනවා. ඒ අනුව, මම පහත ප්‍රශ්න යොමු කරනවා.

1. පුරවැසියන් සහ ව්‍යාපාරික ආයතන නීතිගරුකව සහ ස්වේච්ඡාවෙන්ම බදු ගෙවීමට යොමු කරවා ගැනීමට, නැත්නම් බදු අනුකූලතාව වැඩිදියුණු කිරීමට හඳුන්වා දී ඇති නව ප්‍රායෝගික උපායමාර්ග සහ දිරිගැන්වීම් මොනවාද?
2. මෙරට ක්‍රියාත්මක බදු ලිපි ගොනු සංඛ්‍යාව ඉහළ නැංවීමට ගත් පියවර කෙබඳුද? ඒ වාගේම අලුතින් ආරම්භ කළ බදු ලිපි ගොනු ප්‍රමාණයෙහි වත්මන් ප්‍රගතිය කුමක්ද?
3. බදු එකතු කිරීම සම්බන්ධ ආයතනවල පවතින පරිපාලනමය ප්‍රමුඛතා සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත්, දූෂණය සහ නාස්තිය අවම කිරීමටත් වත්මන් රජය ලබා ඇති ප්‍රගතිය කුමක්ද?
4. මෙතෙක් බදු ක්‍රියාවලියට දායක නොවූ නව පාර්ශ්ව හඳුනා ගනිමින් සමස්ත "බදු පදනම" සාධාරණ ලෙස පුළුල් කිරීමට රජය මෙතෙක් ගෙන ඇති විධිමත් පියවර මොනවාද?
5. රාජ්‍ය ආදායම් ඉලක්ක සපුරා ගන්නා අතරතුරම, රටේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ටත් - SMEsවලටත්, සාමාන්‍ය ජනතාවටත් බදු ප්‍රතිපත්තිය තුළ ලැබෙන සහන මොනවාද?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ගරු මන්ත්‍රීතුමා කාලීන වැදගත් කරුණක් තමයි මතු කළේ. මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

1. පුරවැසියන් සහ ව්‍යාපාරික ආයතන ස්වේච්ඡාවෙන් බදු ගෙවීමට යොමු කිරීම සහ බදු අනුකූලතාව වැඩිදියුණු කිරීම සඳහා රජය විසින් විවිධ ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. ඒ අනුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ e-Services පහසුකම පුළුල් කිරීම මඟින් බදු ලියාපදිංචිය, බදු වාර්තා

[ගරු නිශාන්ත ජයවීර මහතා]

ඉදිරිපත් කිරීම සහ බදු ගෙවීම් ක්‍රියාවලිය වඩාත් පහසු හා කාර්යක්ෂම කර ඇත. එමෙන්ම, මාර්ගගත - online - බදු ගෙවීම් ක්‍රම හඳුන්වා දීම මඟින් ද බදු අනුකූලතාව ඉහළ නංවා ගැනීමට කටයුතු කර ඇත.

ඒ අනුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පුරවැසියන් සහ ව්‍යාපාරික ආයතන නීතිගරුකව ස්වේච්ඡාවෙන් බදු ගෙවීමට පෙලඹවීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

(i) දිවයින පුරා බදු ගෙවන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ii) පහත ආර්ථික කාර්යයන් ඉටු කර ගැනීමට TIN අංකය - බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය - අනිවාර්යය කිරීම.

මූල්‍ය ආයතනයක යම් ගිණුමක් විවෘත කරන අවස්ථාවකදී, ගොඩනැඟිලි සැලැස්මක් සඳහා අනුමැතිය ලබා ගන්නා අවස්ථාවකදී, මෝටර් වාහනයක් ලියාපදිංචි කරන අවස්ථාවකදී, ඊට අමතරව ඉඩමක් හෝ ඉඩම් හිමිකමක් ලියාපදිංචි කරන අවස්ථාවකදී, පැවරුම්ලාභියෙකු හෝ පැවරුම්කරුවෙකු විසින් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක කොටස් පැවරීමක් සිදු කරන අවස්ථාවකදී සහ credit card එකක් ලබා ගන්නා අවස්ථාවකදී TIN අංකය අනිවාර්ය කර තිබෙනවා.

(iii) වෘත්තීන් වර්ග 33ක් සඳහා රඳවා ගැනීමේ බද්ද පැනවීම.

(iv) බදු ගෙවන ජනතාව වෙනුවෙන් වරප්‍රසාද කාඩ්පත් හඳුන්වා දීම.

2. වාර්ෂික බදු ගෙවිය යුතු සීමාවට අයත් වන නමුත් මෙතෙක් බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී නොමැති පුද්ගලයන් සහ බදු සඳහා ලියාපදිංචි වී ඇතත් නිසි පරිදි බදු නොගෙවන පුද්ගලයන් හඳුනා ගැනීම සඳහා ආයතන අතර තොරතුරු හුවමාරු කිරීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීමට මේ වනවිට පියවර ගෙන ඇත.

මූල්‍ය ආයතන, සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ කොළඹ කොටස් වෙළෙඳ පොළ ඇතුළු ආයතන රැසකට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ තොරතුරු හුවමාරු කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සලසා දී ඇත. මෙම තොරතුරු හුවමාරු කිරීමේ යන්ත්‍රණය මඟින් බදු ජාලයෙන් බැහැරව සිටින පුද්ගලයන් හා ආයතන හඳුනා ගැනීම තුළින් බදු අනුකූලතාව වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත.

ඒ අනුව, අලුතින් ආරම්භ කරන ලද බදු ලිපි ගොනු ප්‍රමාණයෙහි වත්මන් ප්‍රගතිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන දත්ත අනුව අඛණ්ඩව අධීක්ෂණය කරනු ලැබේ. TIN එක ලියාපදිංචිය පුළුල් කිරීම සහ ආයතන අතර දත්ත හුවමාරුව වැඩිදියුණු කිරීම මඟින් බදු පදනම තවදුරටත් පුළුල් කිරීමට කටයුතු කරමින් පවතී.

ඒ අනුව, 2023 වසරේ සිට පැවති බදු ලිපි ගොනු සංඛ්‍යාව හා එහි ප්‍රගතිය පරිදි වේ.

| බදු වර්ගය | 2023 | 2024 | 2023/ 2024% | 2025 | 2024/ 2025 % | 2026.06.30 | 2025/ 2026 % |
|---|---|---|---|---|---|---|---|
| තනි පුද්ගල ආදායම් බදු | 539,862 | 976,498 | 80.9 | 1,159,505 | 18.7 | 1,248,801 | 7.7 |
| සංස්ථාපිත ආදායම් බදු | 82,437 | 100,409 | 21.8 | 125,432 | 24.9 | 139,521 | 11.2 |
| එකතු කළ අගය මත බදු | 13,851 | 21,227 | 53.3 | 33,187 | 56.3 | 36,656 | 10.5 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 8,107 | 12,097 | 49.2 | 16,206 | 34.0 | 18,332 | 13.1 |

මේ සියලුම බදු ලිපි ගොනු සංඛ්‍යාව ඉහළ ගිහිල්ලා තිබෙන්නේ බදු අනුපාත වැඩි කිරීම, thresholds අඩු කිරීම ඇතුළේ නොවෙයි, පවතින බදු නීතිය ඇතුළේ මේ බදු ගෙවන්න ස්වේච්ඡාවෙන් සහ දත්ත මඟින් ලබා ගත් තොරතුරු ඇසුරින් බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම මඟින් තමයි.

3. ආදායම් එකතු කරනු ලබන ආයතනවල නිලධාරින්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම හා එම ආයතන ඩිජිටල්කරණය කිරීමේ කටයුතු වේගවත් කිරීමට මෙන්ම අදාළ ආයතනවල පවතින මානව සම්පත් හිඟය පියවීම සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීමටත් කටයුතු කර තිබෙනවා.

දූෂණය හා නාස්තිය අවම කිරීමට ඒ සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා සෑම ආදායම් එකතු කරනු ලබන ආයතනයක් තුළම අභ්‍යන්තර ඒකක පිහිටුවන ලදී. එමෙන්ම, 2025 අගෝස්තු මස සිට ආදායම් එකතු කරනු ලබන ආයතන විසින් දූෂණය අවම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගවල ප්‍රගතිය කාර්තුමය වාර්තා වශයෙන් මුදල් අමාත්‍යාංශ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර තිබෙනවා.

4. ඉහත 1 පිළිතුර මඟින් දැක් වූ ක්‍රියාමාර්ග ගැනීම නිසා බදු පදනම සාධාරණ ලෙස පුළුල් කිරීමට රජයට හැකියාව ලැබී ඇත. ඒ අනුව, ඒක පුද්ගල බදු ලියාපදිංචි ලිපි ගොනු සංඛ්‍යාව 2025.12.31 පැවති මිලියන 1.1 සිට 2026.06.30 වනවිට මිලියන 1.2 දක්වා වැඩි කරන්න හැකියාව ලැබී තිබෙනවා.

5. මේ වනවිට සහල්, පිටි, සීනි ආදී අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සහ අධ්‍යාපනය, සෞඛ්‍ය ඇතුළු අත්‍යවශ්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද අය කිරීම සිදු නොකෙරේ. තවද, එකතු කළ අගය මත බදු ලියාපදිංචි සීමාව 2024 වසරේ සිට තවදුරටත් රුපියල් මිලියන 60 සීමාවේ පවත්වාගෙන යනු ලැබේ. එමෙන්ම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා සහන පොලී අනුපාත යටතේ ණය යෝජනා ක්‍රම කිහිපයක්ම ලබා දී තිබෙනවා.

මීටත් අමතරව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් තමන් ආයෝජනය කරනු ලබන යන්ත්‍ර සූත්‍ර වෙනුවෙන්, ආයෝජනය කරනු ලබන මුදල් වෙනුවෙන් විශේෂයෙන්ම

ක්ෂය දීමනා ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ඊට අමතරව මම මුලින්ම සඳහන් කළා වාගේ credit cards, ඒ කියන්නේ ඔවුන්ට වරප්‍රසාද කාඩ්පත් ලබා දීමේ වැඩ පිළිවෙළක් සම්බන්ධයෙනුත් මේ වනකොට සාකච්ඡා වෙමින් පවතිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 3.46ට, 2026 ජූලි 23වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 3.46 மணிக்கு பாராளுமன்றம், 2026 யூலை 23, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 3.46 p.m. until 9.30 a.m. on Thursday, 23rd July, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1වන ප්‍රශ්නයට - 890/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 890/2025 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 01 - 890/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah, appearing in today's Order Paper.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 2වන ප්‍රශ්නයට - 891/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 2ஆம் இலக்க வினாவுக்கு - 891/2025 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 02 - 891/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah, appearing in today's Order Paper.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 3වන ප්‍රශ්නයට - 892/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 3ஆம் இலக்க வினாவுக்கு - 892/2025 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 03 - 892/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah, appearing in today's Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.